All rights Reserved
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
VIDYADARSA PRESS, COLOMBO

සිතියම් සහිත

ජිනරාජ වංශය

හෙවත්

ගෞතම බුද්ධ චරිතය.

ඩී. එච්. ඇස්. අභයරත්න මහතා විසින්
සඞ්ග්‍රහ කරණ ලදී.

සප්තම සංස්කරණය

විද්‍යෝදය පරිවෙණාධිපති ශ්‍රීපාදස්ථානයෙහි සහ කොළඹ
නාවකෝරළයෙහි ප්‍රධාන සඞ්ඝනායක ධුරන්ධර

ත්‍රිපිටක වාග්විශවරාචාර්ය්‍ය සිද්ධාර්ථුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන

සබ්‍රහ්මචාරීවරුන්ගේ මහාසත්කාරය සඞ්ගම්පාදයන් වහන්සේ
විසින් සමාදරයෙන් ප්‍රතිග්‍රහිතයි.

කේ. ඩී. පෙරේරා සහ පුත්‍රයා ඒ්ඩ්

සවීය 'විද්‍යුදයී' යන්ත්‍රාලයෙහි
මුද්‍රණය කරණ ලදි.

බු: ව: 2474.
ක්‍රි: ව: 1930.

All Rights Reserved.

ප්‍රකාශනා

සුපරිශුද්ධ බෞද්ධසමය පැවැති ස්ථාන අනුරෙන් ලඞ්කාවද ප්‍රධාන ස්ථානයක්බවට ගණන්ගෙණ තිබේ. මීට අවුරුදු සිය ගණනකට අතීත කාලය දක්වා ලංකාපාලනයෙහි නියුක්තවූ බොධ කරශ්‍රේෂ්ඨයෝ අනවරතයෙන් බුද්ධසමය ලක්තුළ එකා ලොකකොට පැතිරවීමෙන් ශාසන සම්බුද්ධ කළෝය; ධර්ම සඞ්ගායනා කරවීම්, විහාරාරාම චෛත්‍යාදිය නිර්මිත කරවීම්, නොයෙක් දෙස සංඝයාගයවා ධර්මදේශනා පැවැත්වීම්, මහාජනයා දැන ශීල භාවනාදියෙහි යෙදවීම්, දහම් පොත්පත් ලියවා ප්‍රකට කරවීම් ආදි සත්‍යානාත්‍ය රාශියක් කළාවූ යුරොක්තා භූපතීන්ගේ අභාවයෙන් ලක්තුළ බුද්ධසමය [illegible] පරිහීනවිය; මෙය කරණකොටගෙණ පිළිවෙළින් පැවත ආ බෞද්ධ සඞ්ගීය විසිර යාමෙන් ඔවුනොවුන් කෙරෙහි පරමපරාගත. දෘෂ්ටදඞ්ගමෙන් ප්‍රවර්තීතවූ ධර්මයද ඛණ්ඩව පිහිටියාමට හේතුවිය; මෙය මේ දක්වාත් ප්‍රකෘතිමත් කරගත නොහැකිව පවතී; වර්තමාන කාල යෙහි බෞද්ධ සඞ්ඛ්‍යාවෙන් ලක්තුළ ලක්ෂගණන් ජනයා විද්‍යමාන නමුත් තම තමන් විසින් එකාග්‍රතයෙන් දැනගතයුතු ධර්ම අවබොධ කළ කෙනෙක් හෝ ඒ ගැණ උත්සාහ වඩන්නෙක් හෝ සොයාගැණීම අතිශයින් දුෂ්කරවේ.

"පාණ්ඩිත්‍යෙ සෙවයෙදකිං ජඨරෙන ක්‍ෂුධාශමං
ස්වාමිනං භීභාවෙන පරලොකෙ මමාශයා."

"පිට පාණ්ඩිත්‍යයෙන් සුගතියා සෙවනය කරන්නේය; ජඨර යෙන් ගින්න සෙවනය කරන්නේය; සියලුම භාවයෙන් හෙවත් හැම අතින් ස්වාමියා සෙවනය කරන්නේය; **පරලොව මාගා රකින්නව සෙවනය කරන්නේය**" යනු මෙහි භාවයි.

මෙම පණ්ඩිත වාක්‍යයෙහි ක්‍රමයට පරලොව සෙවනය කරන්නේ කෙසේදැයි අප බොධ සොහොවුරන් විසින් අවබොධ කළයුතුයි; යමෙක් බෞද්ධයාය යන නාමමාත්‍රය දරා පමණ කින්වත් බුබාගම ගැණ ගාථා සවලපයක් හෝ කථා සවලපයක් හෝ දැනගත් පමණකින්වත් කිසිසේත් බෞද්ධයෙක් නොවේ; නියම බෞද්ධයෙක් වීමට නම් කුඩා කාලයෙහි පටන් ශ්‍රද්ධාවෙන් යුක්තවූ ධර්මධර පණ්ඩිතයන්ගෙන් සවසමය මනාසේ අවබොධ කොට එහි ප්‍රතිපත්ත්‍යානුකූලව දිවිහිමියෙන් පිළිපැදීම කට යුතුයි; ක්‍රියාකියානි ශීල මහමත් ආදී නා නා ගුණධර්මත් අය ලක් තුළ සිටින්; ඔවුහු සවකීය ප්‍රාණාදමෙන් ආගමද රක්ෂාකරත්;

මේවුන් අතුරෙන් බොහෝදෙන සවකීය දෘෂ්ටිය උදෙසා ප්‍රාණ පරිත්‍යාග කිරීමෙහි පවා නියැලිව සිටිත්; මොවුන්ගේ සිත්වලින් කිසිදිනක සවකීය දෘෂ්ටිය තුරන්ව නොපැවතේ; බෞද්ධයෝ වූකලී මෙසේ නොවීමට හේතු කවරේදැයි නොදැනීමෙන් මුළාවී සිටිත්.

යම් දෘෂ්ටියක්කෙරෙහි හකතිය ඇතිවීමට එහි ප්‍රධාන ශාසනාවරයා කෙබඳු කෙනෙක්ද, ඒ තැනැත්තාගේ චරිතය කෙසේ දැයි මුලින් අවබොධකළයුතුයි; එසේ නොකිරීමෙන් කිසි වෙකුගේ සිතෙහි ධර්මයක් මනාසේ පිළිපැදීමට ධෛර්‍ය්‍ය නූපදීම සත්‍යයකි; යම්සේ ප්‍රදෙශපාලනයෙහි නියුක්ත රජ කවරේද, හේ කොසිප්‍රමාණ සෙනාබලයකින් යුක්තවේද, ඔහු විසින් පණවන ලද පිළිපැදියයුතු ආඥාකවරේද, එය නොපිළිපැදීමෙන් කුමන දණ්ඩනයකට ඇතුළත් වන්නේදැයි නොදත් අය රාජනීතියෙහි මුළාවන්නේද, එමෙන් දෘෂ්ටියෙහි ශාසනාවරයා කවරේදැයි නොදැනීමෙන් දෘෂ්ටි නීතියෙහිද මුළාවේ; ඒ හෙයින් අප බෞද්ධ සමයෙහි නියැලි අය විසින් එහි ශාසනාවරයාවූ තෙලොක්‍යක නායක සර්ව්වඥරාජෝත්තමයාණන්ගේ චරිතය තමනුත් මනාසේ අවබොධකර සවකීය දුදරුවන්වද එය නිතරහැදෑරවිය යුතුයි. මෙසේකිරීමෙන් ඒ ඒ අය නිරායාශයෙන් බුද්ධාගමෙහි තත්පරව එහි ධර්මය ඉගෙණීමෙහි ආශා ඇතිවන්නෝ වෙත්; මේ හෙතුකොටගෙණ ඔවිහු මිථ්‍යාදෘෂ්ටිපාශයට අසුනොවීමෙන් ධර්මයෙහි හැසිර උභයාර්ථසිද්ධිය ලබත්; අපගේ ශාසනාවරයාවූ ගෞතම බුදුරජාණන්වහන්සේගේ සම්පූර්ණ චරිතය අත්‍යන්ත ප්‍රකරණයක් ලොක නිතෙෂිභාවයෙන් මුද්‍රණයකරවීමට අප සිත්තුළ බොහෝ කලකසිට රැඳීගියෙන් එය මනාසයි වැදගත් බෞද්ධ මිත්‍රවරු කීපදෙනෙකු විසින් ආරාධනාකරණලදින් "ජිනරාජවංශය" හෙවත් "ගෞතම බුද්ධචරිතය" නමැති මෙම ධර්ම ග්‍රන්ථය සම්පාදනය කෙළෙමු.

තවද දිනකලද ඉදුරන් ඇති රජහුගේ වංශය යනාර්ථයෙන් "ජිනරාජවංශය" යනුද ගෞතම ලොත්තරාදිභූත බුදුන්ගේ චරිතය යනාර්ථයෙන් "ගෞතම බුද්ධචරිතය" යනුද සිද්ධයි; මෙහි බුද්ධ චරිතයට අයත් කරුණු අත්‍යන්ත වැදගත් ධර්ම ග්‍රන්ථ යන්හෙන් හා වෙනත් තොයෙක් පෙළ අටුවා ආදිය බලා එසින්ද මේ සම්බන්ධව කාරණා උපුටා රැගෙණ එය යථාස්ථාන යෙහි නියුක්තකොට මෙය ගළපනලදී; මෙහි පළමුකොට සුමේධ තාපසයාණන්ගේ නියතව්‍යවරණගැණීම විස්තරවශයෙන් දක්වා තදනන්තරව අනාගතවාරයෙහි බෝධිසත්වයන් වහන්සේගේ

දිව්‍යලොකොත්පත්තියද, නැවත එයින් චුතව සිඛාඡීකුමාර භාවයෙහි ඉපදීමද, එතැන්පටන් මහාභිනිෂ්ක්‍රමණය කරනතුරු සිඛවූ සියල්ලද, මහණවීමද, දුෂ්කරක්‍රියා කිරීමද, මාර පරාජය කර බුඩත්වයට පැමිණීමද, එතැන්පටන් පන්සාලිස් වසක් තුළ කළ කී දේද, ඉක්බිති පිරිනිවන් පෑමද, ධාතු බෙදීමද, ලක්දිව සම්බුඩශාසනය ප්‍රතිෂ්ඨාපනයද යන මේ කාරණාරාශිය කින් සම්පූර්ණ කොට මේ රචනාව නිමකරණලදී.

බුඩසමය එකාලොකව භ්‍රාජිතවූ පුරාණ බෞඩ රජදරුවන්ගේ කාලයෙහිපවා, බුඩාදී උතුමන්ගේ ඡායාරූප, විශෙෂයෙන් අනාගතයෙහි විද්‍යමානවන්න මහා ජනයාගේ සිත්හි රැඳී පවතිනුවස් යථොක්ත මහීපාලයන් විසින් ප්‍රතිමා ශීලාලෙඛනාදි ක්‍රමයෙන් ස්ථාපිත කරණලදී; මෙය වර්තමාන ලොකවාසිහු සමාදරයෙන් පිළිගෙණ ඒ ඒ උතුමන්ගේ නම් සිහිකරමින් සතුටට පැමිණෙත්; යළිදු මේ ක්‍රමය බෞඩසමය චිරාත්කාලයක් නවබුන්නොවී ලොව පැවැත්මටද ප්‍රධාන හෙතුවක්විය. මෙපරිද්දෙන් මේ රූප සටහන් පොත්පත්වල බහා පසිදුකිරීමද ලොකාමිසයි හෙයින් අප විසිනුදු බොහෝ පරිශ්‍රම රැගෙණ යථොක්ත උතුමන්ගේ සිතියම් රූශියක් මනාවූ ක්‍රමයකට පිළියෙළකොට මේ පොතට ඇතුළත්කරණලදී; **රාජේඳ්‍රලාල් මිත්‍ර පඩිතුමා** විසින් ඉංග්‍රීසි භාෂාවෙන් ලියා මුද්‍රණය කරවන්නලද "බුඩගයා" නම් ප්‍රකරණයෙහි දක්‍ෂිව බොහෝ පුරාණසිට පැවතඑන ශිලාලෙඛනාදියෙන් ගන්කාලද ඡායාරූප සිතියම් රාශියක්ද ප්‍රසිඩකරතිබේ; මේවාද බෞඩයන්ට විපුල ප්‍රයොජන වනු නියතයි; මහානුභාව සම්පන්නවූ වසවර්තීමාර මහාකාල නාගරාජාදීන්ටපවා ඝනපුණ්‍යශ්‍රියෙන් සාරවූ දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණ අසූඅනුව්‍යඤ්ජනයෙන් යුක්තවූ බුඩ ශ්‍රී ශරීර ලීලාව ඇති සැටියට දිව්‍යමය සෘඩියෙන්පවා මවාපානට නොහැකිවිනම් ලොව කිසිම ශිල්පියෙකු විසින් නියම බුඩ ශරීර සමහන කැටයම් කරණුලැබීයයි නොසිතිය හැකිවේ; මෙය මෙසේ නුමුත් පුරාතන පවත් ලක්තුළ සහ ඉන්දියාවේද පැවතඑන මේ සම්බන්ධවූ සිතියම්වලට එකඟවන මෙන් මෙහි අනාගතවූ සිතියම්ද අප විසින් පිළියෙළකරණලදී. මෙහි අංශුමාලා හෙවත් සිතියම්වල හිස්වටේට රශ්මිමාලා විලාශයෙන් යොදූ තිබෙන ආලොකය* වනාහි දකුණුදිග බුඩාගමෙහි ලකුණක් වශයෙන් යොදනලදී; මේ ක්‍රමය ඉන්දියාවේ බෞඩ ලෙඛනවල ලිඛිත කොට ඇති සිතියම්වල විද්‍යමාන බැව් **රාජේඳ්‍ර ලාල්මිත්‍ර** නම් පඩිතුමාගේ "බුඩගයා" නම් ප්‍රකරණයෙහි සිතියම්වලින් දක්නා ලැබෙයි; මේ පිළිවෙළ ඉන්දියාවේ මීට අවුරුදු දහස් ගණනකට

*මීට ඉංග්‍රීසියෙන් "අව්රිඕලා"(*Aureola*)යයි නම්වේ.

පුරාණ සිව පැවතඑන හෙයින් ඇතම්විට ක්‍රියාකියානි ආනමේ සිතියම්වලවද මෙය යථොක්ත ශිලාලෙඛනවලින් බලා ඒ අනුව යොදන්ට ඇතිබවද සිතියහැකිවේ; † මෙහි අනාගතීත සිතියම් සියල්ලම දැනට ලක්තුළ සහ දෙශදෙශාන්තරයන්හිද චිත්‍ර ලෙඛා ශාස්ත්‍රයෙහි අති දක්ෂයෙක් මෙන් පිළිගෙණ තිබෙන **ජිවර්ඩ් හැන්ට්‍රික්ස්** මහතාද; කොළඹ රාජකීය ශාස්ත්‍රශාලාවේ සිතියම් කම්‍යාත්‍යය උගන්වන්නාවූ ආචාර්‍යවරයෙක්වූද කථා ශෙෂ්‍යතාවොපගත ලොකප්‍රසිඛ **ජෝර්ජ් හැන්රිකස්** මහතාගේ අගතැන්පත් ශිෂ්‍යයෙක්වූද උගත් **ජේ. විජේසිංහ** මහතාද, **ආර්. ඇස්. මර්නොස්** මහතාද යන මේ මහතුන්ලවා ලෙඛාකොට යවා එඛගලන්තයෙහි රාජකීය ශිල්පින්ලවා කැටයම්කරවා ගෙන්වනලදී. තවද මේ පොත සම්පාදනය කිරීමේදී අප මිත්‍ර බුඛශාසන මහාසූරසෙනාපති **ඇම්. ධම්මරත්න** ලක්මිණිපහණ් කතුතුමා විසින් මෙහි මූලසිව සිඛිපත්‍රාවලොකනය කිරීමෙන් උපස්තම්භකළඛව සහ මෙය මුද්‍රණයකළ පළමුවෙනි දෙවෙනි වාරයන්හිදී **විද්‍යොදය පරිවෙණාධිපති නිප්පිටකවාගීශ්වරාචාර්‍ය ශ්‍රී සුමඞ්ගලාභිධාන** සපරගමු දිසාවේ ප්‍රධාන සඞ්ඝනායක මාහිම්පානන්වහන්සේ සිඛිපත්‍ර බලාදීමෙන් උපකාර කළඛව අසමදීය අවඞ්ක සූත්‍රය පුදකිරීමෙන් මනක්කරමු. යළිදු දෙශදෙශාන්තරයන්හි පහළාවූ සත්කීර්තියෙන් යුත් ශ්‍රීපාදස්ථානය ඇතුළුවූ කොළඹනවකෝරළය සහ ගාලුපළාතේද ප්‍රධාන සඞ්ඝනායකපදප්‍රාප්තව වැඩවිසූ විද්‍යොදය පරිවෙණාධිපති **නිප්පිටකවාගීශ්වරාචාර්‍ය සිද්ධාර්ථවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන** සවගීහසථවි වදාළ **මාහිම්පානන්වහන්සේ** වෙත මේ පොත ඔප්පුකරනලදින් මැනවයි සමාදරයෙන් පිළිගත්බවද සතුටින් දන්වමු.

ලක්වැසි බෞඛයන්ගේ ප්‍රයෝජනය පිණිස සම්පාදනය කිරීමට දීර්ඝකාලයකසිට අප විසින් අදහස්කරතිබුන මේ පොත බොහෝ වෙහෙස සහ වියදම් දරා සම්පාදනය කළමුත් බෞඛ මහාජනයාට ඇති කරුණාව නිසා මිට පහසු මිලගණනක් නියමකළෙමු; මෙහි ප්‍රමාද භ්‍රමාදුදියෙන් ජාන යම්කිසි දෙෂාංශුවක් විද්‍යමානවුයේ නුමුදු එය ලොකානුකම්පා පිණිස සුධීන් විසින් ශුඛකරනුලැබේවා.

---

†අවශෙෂ සිතියම්ද ලක්දිව ප්‍රතිස්ථාපනය කරනිබෙන ප්‍රතිමාදියෙහි ක්‍රමයට ඉඩහැරිලා හෙවත් සිරස්ථානික් යුඛතඉඩාව මෙහි සොදු ඇත්තේහි

තාවද මෙම සිතියම් සහිත ජිනරාජවංශය මනු වාරයන්හි මුද්‍රණයකොට පළකිරීමේ සම්පූර්ණඵලය කේ. ඩී. පෙරේරා මහතුන් වෙත පවරණලදබව මෙසින් දන්වමු.*

ඩී. එච්. ඇස්. අභයරත්න

වෂී 1911 ක්වූ සැප්තැම්බ්‍ර මස 30 වෙනි දින
පානදුරේ මහවිල "අභයමන්දිර"යේ දීය.

---

* මෙහි යොදුතිබෙන සිතියම්වලට සමානව ය්මී සිතියමක් අපෙන් අවසර නැතිව අන්කිසිවෙකුට ප්‍රසිඩ නොකළහැකි වනසේ අප විසින් අනුමතකරණලද හෙයින් එසේ අවසරයක් නොමැතිව යමෙක් විසින් එය ප්‍රසිඩ කරණු ලැබුවොත් ඔහුට විරුඩව නීතිමාර්ගප්‍රකාර ක්‍රියාකරණුලැබේ.

K. D. P.

අනුක්‍රමණිකාව.

පිටේ

1 නියත විවරණ කථාව
8 දෙවාරාධනාව
12 මහබෝසතානන්ගේ ප්‍රතිසන්ධිග්‍රහණය හා මහාමායා දෙවීන්වහන්සේ දුටු සිහිපාය
14 මහබෝසතානන් මව්කුස වසීම හා බිහිවීම
17 බොධිසත්වොත්පත්ති කාලයෙහි පහළවූ දෙතිස් පුර්‍වනිමිති
20 බොධිසත්වයන් කාලදෙවල සෘෂින්ට දක්වීම
23 නාමකරණ මඩහල්‍යය හා බ්‍රාහ්මණයන්ගෙන් පුණ්‍යලක්ෂණ පිළිවිසීම
25 වප්මගුල් දිනයෙහි දක්වූ ප්‍රාතිහාර්‍යය
27 ශිල්ප දක්වීම හා රාජ්‍යාභිෂෙක මඩහල්‍යය
29 කාමසුඛානුභවය හා සතරපුර්‍වනිමිති දැකීම, නිබ්බුතපද ඇසීම
34 ගෘහාභිනිෂ්ක්‍රමණය
38 මහණවීම, රජගහනුවර පිණ්ඩපාතයකරමින් හැසිරීම, බිම්බිසාර රජුන් හමුවීම
47 මහබෝසතානන්දුටු සීනය හා ක්ෂීරපායාසය පිළිගැණීම
53 මාරසඞ්‍ග්‍රාමය
62 සම්බුදුපදප්‍රාපනීය
63 පළමුවන සතිය
64 දෙවෙනි තුන්වෙනි සිව්වෙනි සති ගතකිරීම
65 පස්වන සතිය ගතකිරීම
73 සවන සතිය
,, සත්වන සතිය
74 මධුපිණ්ඩික දානය
75 ධම්මචාරිකාභිය්‍යය මෙනෙහිකිරීම හා බ්‍රහ්මාරාධනාව
77 දහම්දෙසීමට යොග්‍යයන් පරීක්ෂාකිරීම
78 උපකනම් ආජීවකයා හමුවීම
79 උපකනම් ආජීවකයා නැවත බුදුන්කරා පරිදි
82 පඤ්චවග්ගීයික තිසුන්කරා වැඩීම
84 දම්සක් පැවැත්වීම
86 අඤ්ඤාකොණ්ඩඤ්ඤ පුබ්බජන්ම කථාව
87 යසතම් කුලපුත්‍රයාගේ ප්‍රව්‍රජ්‍යාව
89 භද්‍රවග්ගීය රජකුමරුවන් පැවිදිකරවීම

පිටේ.

90 සහොදර තපසුන් නිදෙන දමනාඅකිරීම.
95 බුදුහු රජගහනුවරට වැඩීම, සක්දෙවිරජ බුදුගුණකථනය කිරීම, බිම්සරනරපතීන් වෙළුවනාරාමය පිළිගැන්වීම.
96 මහාකාරදකාශ්‍යප ජාතකය.
103 අගසව්දෙනම පැවිදිකරවීම.
105 සම්බුදුයන්වහන්සේගේ කිඹුල්වත්පුර ප්‍රවේශය.
108 සම්බුදුයන්වහන්සේ යෘද්ධිප්‍රාතිහාර්‍යය දක්වා නැයන් වැන්දවීම.
110 සම්බුදුයන්වහන්සේ පියමහරජුගේ මාලිගාවට පැමිණීම.
114 නන්දකුමාරයන් පැවිදිකිරීම.
116 රාහුලකුමාර ප්‍රව්‍රජ්‍යාව හා පැවිදිකිරීමට අනුදැන වදාළ පරිදි.
120 ජේතවනාරාමය පිළිගැණීම.
123 ගිහිවිනය ධර්ම්ම.
125 සතර කර්ම්ම ක්ලේශයෝ.
,, දශ අකුශල්.
126 සතර අගතිය.
127 වස්තුවිනාශයට හෙතු කාරණා සය.
128 මත්පැන් පිමෙහි ආදීනව.
,, භක්‍ෂතු පරිභොගකටයුතු විධි.
129 නොකල්හි වීථි සඤ්චාරණයෙහි ආදීනව
,, නාට්‍යදර්ශීනය පිණිස යාමෙහි දොෂ.
,, දූකෙළීමෙහි දොෂ සය.
130 පාපමිත්‍ර සංසර්ගය.
,, කුසීතභාවයෙහි දොෂ.
131 දුරුකටයුතු මිත්‍රයෝ.
132 ඉෂ්ටමිත්‍රයෝ සතරදෙන.
133 ආරක්‍ෂාකටයුතු සදිසාවෝ.
133 දෙමව්පියන්ට කටයුතු උපස්ථාන.
134 දරුවන්ට කටයුතු පරෙස්වාපකාර.
,, ගුරුවරයන්ට කටයුතු උපස්ථාන.
135 ශිෂ්‍යයන්ට කටයුතු පරෙස්වාපකාර.
,, භාර්‍යාවට කටයුතු උපස්ථාන.
,, සවාමිපුරුෂයාහට කටයුතු උපස්ථාන.
136 ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට කටයුතු උපස්ථාන.
,, කුලපුත්‍රයන්ට කටයුතු උපස්ථාන.
,, කුලපුත්‍රයන්ට කටයුතු උපකාර.
137 මිත්‍රාමාත්‍යාදීන්ට කටයුතු උපකාර.

පිටේ.

137 දැසිදසුන් විසින් සවාමියාට කමයුතු උපසථාන.
138 සවාමිනු විසින් දැසිදසුන්ට කමයුතු උපකාර.
,, වසතුව ප්‍රයොජන ගතයුතු ආකාරය.
139 භාරවාජ සථවිර කථාව.
144 සපතාය්‍යධනය.
147 මහාපරිනිර්‍වාණ කථාව.
,, සම්භූයන්වහන්සේ ගිලන්බවට පැමිණීම.
148 මාරයා පිරිනිවණට ආරාධනා කිරීම.
150 චුන්දකම් කම්මාරපුත්‍රයාගේ දානප්‍රතිග්‍රහණය හා පිරිනිවන් පෑමට කුසිනාරානුවරට වැඩමවීම.
152 පිරිනිවන් මඤ්චකයෙහි සිංහශය්‍යාවෙන් සැතපීම.
156 පිරිනිවන්පෑම, දෙවියන් අනිත්‍ය ලක්‍ෂණ මෙනෙහි කිරීම, ආදාහනය, ද්‍රෝණ නම් බ්‍රාහ්මණයා කලහ සංසිදුවා ධාතු බෙදීම.
161 බුඩාගම ලඹකාවේ පිහිටීම.

සිතියම්වල පටුන.

පිටේ.

2 වසතුපරිත්‍යාගය.
6 දීපඞ්කර විවරණය.
8 දෙවාරාධනාව.
14 සිඞ්ඛාළකුමාරොත්පත්තිය
20 සිඞ්ඛාළකුමාර දර්‍ශනය.
25 චප්මඩගල්‍යය.
27 සිඞ්ඛාළකුමාර විවාහ මඞ්ගල්‍යය.
29 නිබ්බුනපද ඇසීම.
34 මහාභිනිෂ්ක්‍රමණය.

පිටේ.

37 මාර ප්‍රවේශය.
38 අනොමාවෙන් එතරවීම.
39 කෙශවෙජ්දනය.
47 ක්‍ෂීරපායාස දානය.
53 මාරසඞ්ග්‍රාමය.
82 දම්සක්පැවතුම් සූත්‍රය දෙශනාකිරීම.
114 නන්දකුමාර ප්‍රව්‍රජ්‍යාව.
116 රාහුල කුමාර ප්‍රව්‍රජ්‍යාව.
152 පරිනිර්‍වාණය.

බුදුරජාණන් වහන්සේගේ මහානුභාව චරිතය.

"සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්ත පරියොදපනං එතං බුද්ධානුසාසනං."

නිදන විවරණ කථාව.

මහාභද්‍රකල්පයෙහි **සාරසඞ්ඛ්‍ය** කල්ප ලක්ෂයකින් මත්තෙහි **සාරමණ්ඩ** නම් කල්පයෙහි **සතරවෙනි** අතුරුකප ජම්බුද්වීපයෙහි මුත්තා මාණික්‍යාදි දශ විධ රතනයන්ට ආකරවූ උතුන විමාන පුෂ්කරණී ආදියෙන් හෙබියාවූ, ශක්‍රපුරය හා සමාන සකල ශ්‍රී සමෘඩියෙන් සමලඞ්කෘතවූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි උත්තම වංශික නරනාරී සමූහයාගෙන් සමාකීර්ණවූ අනාල මරණාදියෙන් තොරවූ හෙයින් * අමරවතී යයි ලද නම් ඇති එක්තරා නගරයෙක් විය. එහි ඉසුරුමත් බ්‍රාහ්මණ වංශයෙක්හි අප මහබෝසතාණන් වහන්සේ ඉපිද සුමේධ නමින් ප්‍රසිද්ධව වැඩිවිය පැමිණ තමන්ගේ පිතෘවූ "ආනන්ද" නම් අග්‍ර පුරෝහිත බමුණා විසින්ද මාතෘවූ "වාසි" නම් බැමිණිය විසින්ද

* එතුවරට ශත්‍රු ප්‍රත්‍යාමණය පිණිස කරණලද නිස්ත්‍රියන් උස ඇති මනොඥ ලාවණ්‍ය ප්‍රාකාරයෙහි අතුරු නැතිව "අමරණ" යන නමක් ඇති මහාසරුපවලිස් අලඞ්කාරව හැවසිගත් බැවින් එතුවර "අමරවතී" නම් විය; සඤ්ඤ ශ්‍රී සද්ධම්මාවවාද සංග්‍රහයෙහි.

මේ හෙයින ලදුව ශිල්ප උගත්නා පිණිස කහවනු දහසක්ගෙණ "නක්ඝලා"නුවරටහොස්දිග්ප්‍රමුඛාචාරීන්ගෙන් වෙදනුය සහිත සියලු ශිල්පයන් අසා නොබෝකලකින් නිමවා ඉගෙණ ගුරුන් වැඳ අවසරගෙණ සිය නුවරට අවුත් දෙමව්පියන්ට ශිල්ප දක්වා සතුටුවූ දෙමව්පියන් විසින් කුටුම්බඅණ්ඩාපනාය කරණලදුව බොහෝ සියඹණන් මාණවකයන්ට මන්ත්‍ර හදාරමින් ගෘහවාස යෙහි වසනුවෝ, මව්පිය දෙදෙන මියපරලොව ගිය කල්හි ඔවුන්ගේ ශරීර ආදාහනකරවා හිස්සෝදා නහා සියලු ධනය පිළිපදිනුයේ, ඔහුගේ වසනු රජාණකිරීමෙහි නියුක්ත වූ රාසිවඩ්ඪන නම් අයකැමි අමාත්‍යයා විසින් එක්දිනක් අයපුඝාකයගෙණ රන් රිදී මුතුමැණික් ආදියෙන් පිරුණාවූ වසනු ගබඩාවල දෙරහරවා, සවාමීන්වහන්ස!මේ ධන රාශියෙන් මෙපමණෙක් ඔබවහන්සේගේ මව් සන්තක ධනය, මෙපමණෙක් පිය සන්තක ධනය, මෙපම ණෙක් ඔබවහන්සේගේ මුතුන් මිමුතුන්ගෙන් උරුමව ආවාවූ ධනය, ඔබවහන්සේගේ සත්මුතුන් පරම්පරාවක පටන් පැවත එන්නාවූ මේ ධන රාශිය බැලුව මැනවයි කීය. එකල සුමේධ පණ්ඩිතතෙම සිතනුයේ, "අනේ මාගේ දෙමව්පිය ආදිවූ නැයෝ මේ ධන රැස්කොට තබා, මී බැඳ පියා හා බැඳි මීයෙන් කිසිවකුත් නොගෙණ යන මීමැස්සන්මෙන් මිය පරලොව යන්නාහු ඉන් එක මදවකුදු නොමගෙණ ගියහ; උන්හැම හැරගෙණයන්ට නිසි උපදෙස් නොදුන නොගෙණ ගියත් උපදෙස් දන්නා මා විසින් වනාහි මේ ධනසම්පත් දුගී මගී යාචකාදීන්ට දන්දී පින් ලබාගැණීමෙන් කැටුවම ගෙණයායුතුය"යි සිතා, "ධන ධාන්‍ය යෙන් ප්‍රයෝජන ඇති කෙණෙක් සුමේධ පණ්ඩිතයන්ගේ ගෙදෙ රට පැමිණේව"යි සියලු නුවර බෙරහසුරුවා යාචකයන් සිත් ලෙස ධන ගෙණයාමට රුවන් ගලඩාවල වාරයන් විවෘතකර තැබීය :—

"හෙරිනාදා සුගණෙන යාචකාලි සමාගතෙ
දුනකිඤ්ඤකඛ ඔසෙන සන්තානං පිණයි තතො."

සතුහෙයින් හෙරිනාද නමැති සුවඳින් රැස්වූ යාචක ජන නමැති ඛමරුන් දන නමැති රෙණුවින් සන්තර්පණය කොට, එසේ දීන් වසනුව නොනිමෙන නියාව දැක, ඉතිරිය අන්තපුර සිත්පුරා හැර ගණුවයි විධාන කිරීමෙන්, මේසේ ඒ සවාමිදරුවූ සුමේධ පණ්ඩිත තෙමේ ඒ ධන රාශිය අතිත්ව පරිත්‍යාගකොට, දිව්‍යවිමානයක් සෙයින් අලඞ්කාරවූ මිතුමහල්තලයෙහි හුදකලාව වැඩහිඳ තම හට අවවාදකරන්නේ මෙසේ සිතිය :—කෙසේදයත්? එම්බා සුමේධ පණ්ඩිතයෙනි, නැවත නැවත භවයෙහි ඉපදීම දුක් වන්නේය. එසේම ඒ උපනුපන් ස්ථානයෙහි ශරීරයාගේ



Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo,*

විනාශවීම් හෙවත් මරණයද දුක්වන්නේය, මම්බ ජාතිය සවභාවි කොට ඇත්තෙම්, ජරාව සවභාවකොට ඇත්තෙම්, ව්‍යාධිය සවභාව කොට ඇත්තෙම්, මරණය සවභාවකොට ඇත්තෙම්, මෙසේ ජාති ජරා ව්‍යාධි මරණ ඇති සංසාරයෙහි දුක්විඳිනා මා විසින්, ජාති නැත්තාවූද ජරා නැත්තාවූද ව්‍යාධි නැත්තාවූද මරණ නැත්තාවූද එකාන්ත සැපවූ, රාගාදීන් තැවීමක් නැතිහෙයින් සිහිල්වූ අමෘත මහා නිර්වාණය සෙවිය යුතුයයි සිතුසේක; ඝම්සේ අසූචි මලමූත්‍ර ලේ සෑරව සෙම් සොටු ආදි නොයෙක් කුණපයෙන් පිරුණාවූ මේ කුණු ශරීරය කිසිසේත් නොබලා ආලය නොකොට හැරපියා උත්තම නිර්වාණයට යන්නෙම්ද, එසේද වුවත්, ඒ නිර්වාණය කැමැත්තවුන් විසින් ඊට මාගීයක් නැතුව පැමිණිය නොහැකිය; එහෙයින් සසරදුකින් මිදීම සඳහා නිවණට පමුණුවන මාගීය සොයම් :—භේ කොසේදයන්?

යම්සේ මේ ලෝකයෙහි සිත කය පීඩාකරන්නාවූ දුකයයි යන යම් ධර්මයක් ඇත්තේද, එපරිද්දෙන් ඒ දුකට ප්‍රති විරුඬවූ සුවපහස් දෙන සැපතක්ද ඇතිවිය යුතුය; එමෙන්ම ඒ භවය හෙවත් උපපත්ති ස්ථානයක් ඇති කල්හි, එය විනාශයට හෙතුවූ විභවය හෙවත් නූපදනා ස්ථානයක්ද ඇතිවිය යුතුය; තවද යම්සේ මේ ලොකයෙහි අවිශිනි ආදි නොඉවසියහැකි උෂ්ණය ඇති කල්හි එය නැසිය හැකිවූ ජල පවන් ආදි සිහිල් දෙයකුත් ඇතිවිය යුතුද, එපරිද්දෙන්ම සිතෙහි හවඟන්නා රාගාදිනි ලෙඟ ගිනි මොහ ගිනි යන ත්‍රිවිධ කෙලෙස් ගින්න සංහිදුවන ඊට ප්‍රති විරුඬවූ ජරාමරණ ආදියෙන් තොරවූ නිර්වාණයකුදු ඇතිවිය යුතුය; තවද යම්සේ මේ ලොකයෙහි සත්ව සාතනය ආදි ලාමකවූ පාපකර්මයක් ඇතිකල්හි, එය නැසියහැකිවූ කල්‍යාණවූ නිවැරදිවූ කුශලධර්මයකුත් ඇතිවිය යුතුද හෙවත් අකුසල් නසන කුසල් නම් දෙයක් ඇත්තේ වේද; එමෙන්ම ඒ ඒ තන්හි උපදවන ජාතිය ඇතිකල්හි, ඒ ජාතිය නැතිකරන්නාවූ නිර්වාණයකුත් ඇත්තේම යයි, නිවන් ඇතිබව සථිරවශයෙන්ම සිතුසේක.

මෙසේ බුඬාදි උතුමන් හැර පරොපදෙශ රහිතව සෙස්සන් විසින් සිතිය නොහැකිවූ උත්තම නිවන් පුරය ඇතිබව අනෙක ප්‍රකාර උපමාවලින් ඒ සුමෙධ පණ්ඩිතයන්වහන්සේ නිශ්චය කොට සොයා දැන, පස්කම් සැපෙන් වෙන්ව ඒ නිවන්සැප ලැබිය යුතුබව නැවතත් උපමාවෙන් සිතනුයේ:—එම්බා සුමෙධ පණ්ඩිතයෙනි, ඝම්සේ පුරුෂයෙක් මහත්වූ අශුචි වලෙක්හි ගැලී අපවිත්‍රවූ ශරීර ඇතිව සිටිනුයේ, පස්පියුමෙන් හැවසිගත් සිහිල් ජලයෙන් පිරිතිබෙන විලක් දැක, ඒ විලට බස්නව මඟ නොසොයා නම් හෙවත් ශරීරයෙහි වැකුනාවූ අශුචිමල සෝදා ශුඬවෙම් සිතා විලට බස්නව උත්සාහ නොකෙරේ නම්, ඒ අඥාන පුරුෂයාගේ

දෙෂයෙක්මිස විලෙහි දෙෂයක් නොවන්නේය; එපරිද්දෙන්ම, ගඩොා, යමුනා, අචිරවතී ආදි ගඞ්ගාදහයෙහුදු සෝදා ශුඩි කොට ගත නොහැකි රාගාදි කෙලෙස් නමැති මල පිරිසිදුකිරීමට හැකිවූ නිවන් නමැති විලට බැස කෙලෙස්මල සෝදා හැරීමට උත්සාහ නොකෙරේ නම්, එම්බා සුමෙධ පණ්ඩිතයෙනි, තොප ගේම දෙෂය මිස නිර්ාණ නමැති විලෙහි දෙෂයක් නොවන්නේය; යම්සේ සොරුන් විසින් වටකොට ගන්නාලද පුරුෂයෙක් ගැලවී යන්නට සුදුසු මාගීයක් තිබියදී, ඉදින් ඒ මග නොයේ නම්, ඒ පුරුෂයාගේ දෙෂයවිනා මාගීයෙහි දෙෂයක් නොවන්නේද, එපරිද්දෙන්ම කෙලෙස් නමැති සොරුන් විසින් වටකොට ගන්නා ලදුයේ නිවන්මග නමැති උපද්‍රව රහිත මාගීය තිබියදීම ඒ මග නොයා නම් ඒ පුද්ගලයාගේම දෙෂය විනා නිර්ාණ මාගී යෙහි දෙෂයක් නොවන්නේය; තවද යම්සේ රොගයකින් පෙළෙන්නාවූ පුරුෂයෙක්, සකල රොග නිරාකරණයෙහි සමර්ථවූ වෛද්‍යවාය්‍යයෙක් සමීපයෙහි සිටියදීත් ඒ වෛද්‍යවාය්‍යයා කරා පැමිණ රොගයට සුදුසුවූ ප්‍රතිකාර නොගන්නේ නම්, ඒ ඔහුගේම දෙෂය විනා වෛද්‍යවාය්‍යයාගේ දෙෂයක් නොවන්නේද; එපරිද් දෙන්ම සර්වෛද්‍යශාස්ත්‍රයෙහි දක්ෂ ජීවකාදීන් විසිනුදු සුව කොට ගත නොහැකි කෙලෙස් නමැති රොගයෙන් පීඩාවිඳින්නාවූ සත්වයෙම ඒ කෙලෙස් සංඝිඳවන්නට සමර්ථ නිවන්මග නමැති වෛද්‍යවාය්‍යයා සෙවනය නොකෙරේ නම්, ඒ රොගීවූ පුද්ගලයා ගේම දෙෂය විනා නිවන් මග නමැති වෛද්‍යවාය්‍යයාගේ දෙෂ යක් නොවන්නේය; තවද වර්ෂ භූමියෙහි පහරණලද මලමූත්‍ර යෙහි සත්‍රී පුරුෂයෝ කිසි ආලයක් නොකොට නිදුකොට ඒ දිහාව නොබලා, එය රෙදිකොන දවටාගෙණ හෝ හිණෙන් හෝ ගෙණ නොයෙද්ද, එපරිද්දෙන් ඔබද නොයෙක් කුණප යෙන් පිරුණු මේ කුණු ශරීරය කෙරෙහි කිසිම ආලයක් නොකොට හැරදමා නිවන්පුර යායුතුය; තවද යම්සේ නාවික පුරුෂයෝ වතුර උණන දිරාගිය නැව හැරදමා යෙද්ද, එමෙන්ම මමද ඇස් කන් නාසා ආදි නව දොරකින් වැහෙන මේ කුණු ඇති ශරීරය, දිරුණු නැව හරණ නාවික සවාම්හුමෙන් හැරපියා නිවන්පුර පැමිණිය යුතුය; තවද යම්සේ පුරුෂයෙක් නොයෙක් රත්නයන්ගෙණ සොරුන් හා කාටුව යන්නේද, ඒ තමාගේ රත්නභාණ්ඩයන් සොරු පැහැර ගණිද්දෝ යන භයෙන් ඔවුන් හා නොයොස් නිරුපද්‍රවූ මාගීයකින්යේද, එසේහෙයින් මා විසිනුදු මහ සොරෙකු වැනි මේ ශරීරය හැර නිවන් නමැති නිරුපද්‍රවූ මාගීයට ප්‍රවිෂ්ටවිය යුතුය; ඉදින් මේ ශරීරය කෙරෙහි ලොභ කෙළේ නම් කුසල් නමැති රත්නයන් නැතිවන්නේය, එබැවින් මා විසිනුදු කුසල් නමැති රුවන් නැතිවීමට භයින් මේ ශරීරය හැර නිවන් නමැති නගරයට යායුතුයයි සිතුසේක.

මේ ආදි නොයෙක් උපමාවලින් ගිහිගෙන් නික්මෙන්නට සුදුසු කරුණු සිතින් සලකා, තමන්ගේ ප්‍රමාණාතික්‍රාන්තාවූ ධන රාශිය යටකී පරිද්දෙන් යාචකාදීන්ට දන්දී විසතුකාම කෙලෙස කාමය හැර ගිනිගත් වනයකින් නික්මුණු හස්තිරාජයක්හු පරිද්දෙන්ද ශත්‍රු මධ්‍යගතවූ නිරුකා පුරුෂයෙකු මෙන්ද ඥති සමූහයා ඇඩමින් සිටියදී සිත්කළුවූ ගෘහයෙන් නික්ම හුදකලාව හිමාලය වන ප්‍රදෙශයට වැද, ධම්මිෂ්ඨවූ තමන්වහන්සේගේ විසිමෙහි පවිත්‍රවූ නෙයින් දෝහෝ "ධම්මිකා" නම්වූ ගල්බඩ ජායා උදක පුෂ්ප ඵලපල්ලවාඞ්කුරයෙන් සමලඞ්කෘතවූ ශුභ්‍රවර්ණී මව සිළුවූ පුලින්තලායෙහි සක්දෙව්රජහුගේ විධානයෙන් මවන්නලද උතුම්වූ පන්සල හා තවුස් පිරිකරද දැක, සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වෙසෙමින් සැපයට කාරණාවූ සන්තොෂයට උත්පත්ති ස්ථානවූ මාලිගා සම්පත් හැර අවුත් මේ පන්සැලෙහි විසීම දෙවෙනි ගිහිගෙයකැයි ඒ ශෛලි වාසයෙන් අට මහා පළිරොධයක් දැක, ඒ අභිරම්‍යවූ පර්ණශාලාවත් හැරපියා ජායා සම්පන්න රුකක් මූලට එළඹ එහි නිත්‍ය වාසයකිරීමෙන් දසමහාගුණ විපාකයක් දැක එහි විසීමට නිශ්චයකොට, දිව්‍යඕජනයක් වැනි ආහාර විශෙෂ හැර වනයට අවුත් ටුටු දුටු ඵලාඵල ජාතියක් අනුභව කිරීම තරම් නොවන්නේය, අට තපස් අතුරෙන් අති අල්පචෙෂ්ටවූ උපෙක්ෂාෂ්ඨවූ වීර්‍ය්‍ය තමන්ට ඇති බැවින් එකම ගසෙක්හි තුවටුයෙන් ගිළිගි බිම්හි වගුළ පත්‍ර ඵල ආහාරකොට ඇති තාපස ප්‍රව්‍රජ්‍යාව සමාදන්ව අනිත්‍ය දුඃඛ අනාත්ම ය‍න ලක්ෂණයන් සිහිකිරීමෙන් සෙර්‍ය්‍යාව හැර, භිඳීම් සිටීම් සක්මන් කිරීම් යන ඉරියව් තුනින්ම දිවා රාත්‍රිය ඉක්මවන්නේ කසිණ පරිකර්මකොට සදවසක් ඇතුළතදී පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ඉපදවූසේක. එසමයෙහි තුන්ලොවට ප්‍රදීපයමානවූ "දීපඞ්කර" නම් සම්බුදුරජාන්වහන්සේ "සුදර්ශිතා" මහ විහාරයෙහි වැඩවසන සේක්, "රම්භවතී" නගරවාසී සැදැහැවත් ජනයෝ බුදු දුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන්කරා එළඹ පසඟ පිහිටුවා වැඳ, සුවඳ මල් ආදියෙන් පුදා බණ අසා, ගැත්තවුන් කෙරෙහි අනුකම්පාවෙන් හෙටදින දානය පිළිගන්නා පිණිස වඩිනාසේක්වසි ආරාධනාකොට, නුවරට හොස් දෙවෙනි දින මඞ්ගල් සරහා නුවර අලඞ්කෘතකොට, නැවත බුදුන් වඩනා මග සරහන්නාහු වළකැන් හොඬකරමින් සිටියාහුය.

එසමයෙහි ධ්‍යාන සැපතින් කල්යවන්නාවූ ඍද්ධිමත් සුමේධ තවුස්තෙමේ, ලුණු ඇඹුල් සෙවනා පිණිස "රම්‍යා" නම් නුවර මුදුනෙහි ආකාශචාරීව යනසේක් තුටුපහටු සිත් ඇතිව වැඩ කරන්නාවූ ඒ මිනිසුන් දැක ආකාශයෙන් බැස, තෙපි කවර කාරණයකින් සිත්කළුවූ මේ මග සරහව්දැයි ඒ ජනසමූහයා

අසින් විවිංලේඛ; ඒ ඇසූ ජනයෝ කියන්නාහු, සඛාමිනී සුමේධ තාපසයන්වහන්ස, නුඹවහන්සේ තව නොදන්සේක්ද? මොහ නමැති අඳුකාර දුරැකිරීමෙහි ලතරුම්ඵල වැනිවූ අසාරවූ සංසාරයට සාරයක් වැනිවූ බුදුරජානන්වහන්සේ, කෙලෙස් මාර නමැති ලදපලලවයට ලැවී ගිනිකලඹක්මෙන් අභිසංසකාර මාර නමැති ශබ්දයට භෙද මන්ත්‍රයක්මෙන් සකඛ්මාර නමැති ජල ධාරාවට සම්මකාලයක්මෙන් වසවත්තිමාරයා හිසහුනු සෙනක් මෙන් සත්ත්වලෝකයෙහි පහළුව සියලු සතුන් දුකින් මුදා දනව් සැරිසරා වඩනාසේක් "රම්‍යවතී" නුවරට පැමිණ තෙලෙ සිත් කළුවූ "සුදර්ශන" මහවිහාරයෙහි වාසය කරණසේක; අපි ඒ සම්බුදුරජානන්වහන්සේ ඇතුළුවූ මහසංඝයාවහන්සේට දන්දෙනු පිණිස ආරාධනාකොට වඩනා මාගීය සරහම්හයි කිහ; ඒ ඇසූ සුමේධ තාපසයන්වහන්සේ සිතනසේක්; කල්ප ශතසහශ්‍රයකින් නුදුබුදුනැයි යන ශබ්දමාත්‍රයක් ඇසීම දුර්ලභය; එබදු සම්බුදුරජානන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූතවූසේකැයි ඇසීම්, නොබෝ චිරාවකින් දක්නට ලැබෙයි, ප්‍රීතීන් පිණාගිය සිත් ඇතිව මේ මාගීයෙන් එක් ප්‍රදෙශයක් මා විසිනුත් සැරසිය යුතු යයි සිතා, එසේවීනම් උපාසකවරුනි, මවත් මින් ප්‍රදෙශයක් දෙවයි ඉල්වීය; උපාසකවරුන් සුමේධ තාපසයන්වහන්සේ සෘඩිබල ඇති උතුමෙක් බැව් දැන කඩිනමින් සරහාගත නොහැකිවූ ජලයෙන් පිරුණු, පළිත ප්‍රාන්තයක්සේ ගැඹුරු කඳුරැලි යක්දී, ඔබවහන්සේ සැරසුව මැනවයි කීවාහුය.

එකල්හි සුමේධ තවුස්තෙමේ සිතනසේක්, මම වනාහි මෙම සථානය සෘඩියෙන් සැරසීමටවුවත් සමර්ථයෙමි, එසේම ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ පරසතුරුක සොලවා මල් ගෙණවුත් වළ පුරාලීමට හෝ මෙරපත්ලෙන් රුවන් උකාගෙණවුත් හෝ කප්රුකින් දිව දුහුල් ගෙණවුත් හෝ සරහන්ට ශකති ඇත්තෙමියි, ඒ සැරසීමෙන් මා සතුටුකොවලන්නේ නොවෙයි, බුදුන්ට අද කාය වෙය්‍යාවතක් කෙරෙම්යි සිතා සසර නමැති මහවළ පිළිවෙත් නමැති පසින් පුරන්නට ශකති ඇති ඒ උතතමයානෝ බුදුන් කෙරෙහි භවගත් ගෞරවයෙන් උදුල්ලක් සහ කුඩයක්ද ගෙණ මෘදු කොමල හසතයෙන් පස් ගෙණවුත් ඒ කඳුරැලියෙහි දමා බිම සමකරමින් සිටිසේක; එය නොනිමී කල්හිම දශබලධාරිවූ සම්බුදුරජානන්වහන්සේ සාරලක්ෂණයක් පමණ මහරහත් භික්ෂුසංඝයා විසින් පිරිවරණලදුව අසදෘශවූ බුබලීලායෙන් ඒ මාගීයෙහි වඩිනාසේක් සුමේධ තාපසයන් විසින් සරහන්නාවූ මාගී ප්‍රදෙශයවද වැඩිසේක; මේබැව් දුටු තවුස්තෙමේ බදවැඩියාවූ සිත් ඇතිව, අද මා විසින් මේ උතුමානන් වහන්සේට දිවිපිදීම වට නුයි, එබැවින් මාගේ පිට මැඩගෙණ වඩිනාසේක්වා ! මම්ද මේ

Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

සම්බුදුරජාණන් වහන්සේ මෙන් බුඩත්වයට පැමිණ දිව්‍ය බ්‍රහ්මයන් ඇතුළුව මේ ජනසමූහයාද ධම්ම නමැති නැවින් සංසාර නමැති සාගරයෙන් එතරකොට නිම්වාණ නමැති ක්ෂේමපුරයට පමුණුවමැයි ප්‍රාර්ථනාකරමින් කලල්මත්තෙහි අදුන් දිවිසම අතුට බුදුන් දිසාවට හිසලා අධොමුඛව වැදහොත්සේක.

එකල "දීපඩඹර" නම් සම්බුදුරජාණන්වහන්සේ සවණක් බුදුරැසින් දිලිහි දිලිහි සුමෙධ තාපසයන් සමීපයට වැඩ විශුඩවූ බුඩ චක්ෂුසින් ඒ තාපසයන්ගේ චරිතය බලා ජටාධරවූ උග්‍ර තපොතෙජස් ඇති මේ තපස්වීනු බුදුබව පතා වැදහොත්තේය; මොහුගේ ඒ ප්‍රාර්ථනාව ඉඩවේදෝ නොවේදෝහෝයි දිවැසින් බලනසේක්, මෙයින් සාරාසඩඩ්‍ය කල්පලක්ෂයක් ගියකල සිල් නමැති පොළව ප්‍රතිඥ නමැති මුල් ඇති සිහිනුවණ නමැති තොතැන්නක් ඇති කරුණා නමැති පැනින් ඇතිවූ සමාධි නමැති කඳක් ඇති මෙත් නමැති ලතායෙකින් වළඳනාලද පඤ්චවිධ විමුක්ති නමැති අතුපතර ඇති ත්‍රිවිධ එශ්‍ර්‍ය නමැති පල්ලව ඇති අභිඥ නමැති මල් ඇති බොධිසම්භාර නමැති කල්ප වෘක්ෂය සම්බුදුනාඥන නමැති අමාපල ගන්වයි හෙවත් බුදුවේයයි දැක, සුමෙධ පණ්ඩිතයන්ට විවරණදෙවා වදාරණ දීපඩඹර ජිනෙන්ද්‍රයානන්වහන්සේ අඡාඩය සමන්විත අත්‍යන්ත කණීරසායන බ්‍රහ්මස්වර විහිදුවා භික්ෂුසඩඝයාට ආමන්ත්‍රණයකොට :—මහණෙනි! උග්‍රවූ තෙජස් ඇති මේ සුමෙධ තාපසයන් බලව්, මේ තෙමේ සෙසු සත්වයෙක් නොවෙයි, මේ තෙම් මතු එන්නාවූ කාලයෙහි හෙවත් මේ කල්පයෙන් සාරාසඩඩ්‍ය කල්පලක්ෂයක් ගියකල, සකල වසතුවෙන් පරිපූර්ණවූ "කපිලවස්තු" නම් නගරයෙහි "සුඩොධන" මහරජුන් නිසා "මහාමායා" නම් දෙවින් කුස ඉපිද "සබ්බාර්ථසිද්ධ" නම් කුමාරිකාවන් අග්‍රමහෙසුන් බිසවකොට ගෙණ ඇය "රාහුල" නම් පුතනුකෙනෙකුන් වැදූකල විසිතව අවුරුද්දක් රාජ්‍යශ්‍රීවළඳා අශ්ව යානයකින් මහාභිනිෂ්ක්‍රමණය කොට හෙවත් පැවිදිවීම පිණිස පිටත්ව, මහඩඹු විසින් දෙනලද සිව්රු පිළිගෙණ පැවිදිව සාවුරුද්දක් දුෂ්කරක්‍රියාකර අජපල් නුග මූලදී "සුජාතා" නම් සිටුදුවක විසින් පිළිගන්වනුලබන කිරිපිඩු වළඳා තුදුස්රියන් වප්‍රාසනාරූඪව "අශ්වත්ථ" නම් බොධි ගස පිවලා නැගෙණහිර බලා තණ අස්නෙහි වැඩහිඳ මරසෙන් පරදවා, සකලකෙලශයන් ප්‍රහීනකොට "ගෞතම" නමින් බුදුවන්නේයයි යනාදීන් වදාරා නියතවිවරණදී ඉක්බිති ඒ තාපසයන්ට පුදනු කැමතිව බුදුරජානන්වහන්සේ සාමණේරයන් බලා වදළසේක. එකල්හි ඒ බව දන් යෘඩ්ධිසම්පන්නා සාමණේරයෝ ඇසිල්ලකින් හිමවතට ගොස් ජලජ ඵලජ මහා සුවඳැති මල්

ගෙණවුත් එළවූහ; භාග්‍යවතුන්වහන්සේ ශ්‍රී හස්තයෙන් එයින් සමන් මල් අටමිටක් ගෙණ තාපසයන් මත්තෙහි වහුරුවා කෙළමින් පූජාකළසේක. මෙසේ දීපඞ්කර සම්බුදුරජාණන්වහන්සේ කෙරෙන් ලබනලද නියතවිවරණ ඇති සුමේධ තවුස්තෙමේ සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි පහළවූ සුවිසි බුදුවරයන්වහන්සේලා ගෙන්ම විවරණ ශ්‍රී ලබා, සංසාරයෙහි අනෙක ජාතිවල ඉපිද දැනදී පාරමීධර්මයන් පුරන්නේ අහස තරුපරයා සිය ඇස් දුන, පොළවෙහි පසඟත් වඩා ශරීරමාංස දුන, සමුද්‍රජලයටත් වඩා ඇඟ ලේ දුන, මහාමේරුපර්වතයටත් වඩා ඔටුහු සහිත හිස් කපා දුන, එහෙයින් කියනලදී :—

"සෝ සාගරෙ ජලඛිකං රුධිරං අදාසි
භූමිං පරාජිය සමං සමදාසි දානං
මේරූපමාණ මඛිකංච සමොලි සීසං
ඛේ තාරකාඛිකතරං නයනං අදාසි."

මෙසේ සිය‍ලු පාරමීධර්මයන් පුරා, බුදුවීමට පළමු තුන්වන ආත්මභාවයේදී, එනම් වෙස්සන්තරාත්මභාවයේදී "ජාලිය" "කණ්හාජිනා" යන දරුවන්ද සවකීය භාර්‍යාවවූ මද්‍රීදෙවියද පූජාකිරීමෙන් සිත් පිත් නැති මහා පෘථිවිය පවා කම්පාකරවා ආයු කෙළවර, එයින් චුතව "තුසිත" දිව්‍යලෝකයෙහි දිව්‍යපුරවත් පිරිවරකොට ඇති "සන්තුසිත" නම් දිව්‍යරාජව උපන්සේක.

දෙවරාධනාව.

මෙසේ අප මහබෝසතාණන් තුසිත භවනයෙහි දිව්‍ය ශ්‍රී සම්පත් වළඳමින් සිටියදීම, බුඩකොලාහල නම්වූ කොලාහලයක් ලොකයෙහි පහළවිය; ලොකයෙහි වනාහි කල්පඞ්කාලාහලය, චක්‍රවර්ත්තී කොලාහලය, බුඩකොලාහලයයි කියා කොලාහල තුනෙක් වන්නේය; ඒ ත්‍රිවිධ කොලාහලයන් අතුරෙන් කල්ප කොලාහලය නම්, කල්පවිනාශයට අවුරුදු ලක්ෂයක් තිබියදී "ලොකබ්‍යූහ" නම් කාමවචර දෙවනාකෙනෙක් රත්පිළියක් හැඳ, එසේම රතුවූ වස්ත්‍රයක් එකාංශකොට පොරවා ඉසකේ මුදු පිවහෙළා කඳුළු වැගිරෙන ඇස් ඇතිව ඉතා විරූපවූ අවමඟුල් වෙසක් ගෙණ, මනුෂ්‍යපථයෙහි ඇවිද, "පින්වත්වූ සත්වයෙනි! මෙයින් අවුරුදු ලක්ෂයක් ගියකල කල්පවිනාශය වන්නේය; මේ ලොකය විනාශවන්නේය, සමුද්‍රය වියලෙන්නේය, මේ මහා පෘථිවිය දැවෙන්නේය, බඹලොව දක්වා ලොව නස්නේය; ඒ කල්පාන්තවිනාශයෙන් ගැලවෙනු කැමති පින්වතුනි, මවුන්ව උපස්ථාන කරව්, පියන්ව උපස්ථාන කරව්, මෛත්‍රීභාවනා කරව්, පස්පව් නොකරව්, පන්සිල් රක්ෂා කරව්, යනාදීන්



Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

ඔවාතෙපුලෙන් ලොකයාව අනුශාසනා කොට ඇවිදිති; එකල් කෙළ ලක්ෂයක් සක්වල වසනා සතල සත්වයෝම, වෙසින් ලක්ෂයක් අවුරුදු ඉකුත්වූ කල කල්පවිනාශය වන්නේයයි භයට පැමිණ "අහෝ දුකඛං! අහෝ දුකඛං!" යනාදීන් මහත්වූකොලාහළය බඹලොව දක්වා පැතිරසිටියි; මේ කල්පකොලාහල නම් වේ. චක්‍රවර්තී කොලාහලනම් කවරහයත්; චක්‍රවර්තීරජෙකුඉපදී මව පළමු, අවුරුදු සීයක් තිබියදී, පෙරමෙන් කාමාවචර දෙව් කෙනෙක් රන්වන්වූ පළඳනා සහ මිණිඔටුන්නක් දරා, මෙසේ රාජමඩලය වෙසක්ගෙණ චක්‍රවර්තීන් උපදනා මේ මගුල් සක්වල සතර මහා ව්පය වවා ඇවිද, පින්වත්වූ ජනයෙනි! මෙයින් සියක් අවුරුදු ගියකල සක්විති රජෙක් මේ සක්වල උපදින්නේය. ඔහු උපන්කල මත්පැන් බිය නොහැක්ක, බොරු කියනොහැක්ක, සොරකම් කළ නොහැක්ක, සතුන් මැරිය නොහැක්ක, පරදාර සෙවනය කළ නොහැක්ක හෙවත් අන්සතු සත්‍රීන් සෙවනය කළ නොහැක්ක, යමෙක් තමා රහසින්වත් ඉහත දැක්වූ පස්පවින් එකක් පමණ කෙළේනම්ද ඔහුගේ හිස පැළීගෙයි; මතු නොප නොකිරීමම දැන් පවන් පුරුදු කරවී, පන්සිල් රකිව්යයි ඔවාතෙපුලෙන් අනුශාසනාකරමින් ඇවිදිති. මේ චක්‍රවර්තීනිකොලාහල නම්වේ. බුඩකොලාහලයනම් කවරහයත්:—බුදු කෙණෙඳුන් ලොව පහළවීමට දහසක් අවුරුදු තිබියදී ශුඛාවාසිකවූ දෙවතා කෙනෙක් සුදුපිළියක්ඇඳ එසේම සුදුපිළියක් එකාංශකොට පොරවා සුදුමල් පැලඳගෙණ ශුභවූ මඩලය වෙශධාරීව, පින්වත්වූ සභීයෙනි! මෙහෙන් පවන් අවුරුදු දහසක් ගියකල ලොවුතුරා බුදුකෙනෙක් ලොව ඉපිද ධම්මය නමැති චක්‍රී වස්වා සංසාර නමැති සම්මය නිවා නිවන් පුරෙහි දෙරහරිති. ඒ බුදුන්ගේ බුදුරු හා බුදුසිරි දක්නා කැමති සත්පුරුෂ කෙනෙක් ඇත්නම් පාපකම්ම නොකරව්, මව්පියන්ට ආක්‍රොශ පරිභව නොබණව්, මිථ්‍යාදෘෂ්ටි නොගණිව්, පඤ්ච ශීලය රක්ෂාකරව්. අවසිල් රක්ෂාකරව්, දශපුණ්‍යක්‍රියාවෙහි යෙදී සිටිව්, ඒ බුදුන් දක්නාසේ ප්‍රාර්ථනාකරව්, යනාදීන් තණ මී හෝනාසේ ප්‍රියවූ මේ තෙපුල් කිය කියා දශදහසක් සක්වළ වවා ඇවිදිති. එකල දශදහසක් සක්වළ මනුෂ්‍යයෝද, දෙවියෝද, බඹහුද, මේතෙපුල් අසා, දහසක් අවුරුදු ගියකල බුදුකෙනෙක් ලොව පහළව මොහ නමැති අඳුකාරය දුරුකරමින්ද, බොහෝ කාලයක් හැලිවතුබූ අපායමාර්ගයට අකුල්හෙළීමෙන්ද, බුඩානන්තර කාලයක් මුලුල්ලෙහි වල්ව තුබූ නිවන් මග පහදවා දීමෙන්ද, ලොකයාට ශාසනියක් කරන්නේයයි සන්නුෂ්ඨවූවානු අත්පොළ සන්දී ඔල්වරහඬදී සාධුනාද පවත්වා, ඒමාගේ සවාමිදරුවානන් වහන්සේ දහසක් අවුරුද්දෙන් උපදින්නේයයි කියා ඇවිදිති. ඒ ශබ්දය බ්‍රහ්මාණ්ඩය දක්වා පැතිර පවතියි. මෙය වනාහි **බුඩකොලාහල නම් වේ.**

මේ ත්‍රිවිධ කොලාහලශ්‍රයන් අතුරෙන් බුඩකොලාහලය පහළවූ කල, දශදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයෝ බුදුවන්නාවූ ඒ වීරපුරුෂයා කවරෙක්දෝහෝයි සොයන්නාහු පාරමිතා සාගරයෙන් නැගී "තුසිතපුර" යෙහි දිව්‍ය ශ්‍රී සම්පත් අනුභව කරමින් හුන්නාවූ බුඩාඩකුරයානන් දැක සියලු දෙව් බඹ සමූහයා තුසිත පුරයෙහි රැස්ව ඒ බෝසතානන්කරා එළඹ දෙවහාත් මුදුන්දී සිව:—

"කාලොයං නෙ මහාවීර උප්පජ්ජ මාතු කුවශියං
සදෙවකං නාරයතෙනා බ්‍රජඩ්ඪස්සු අමතං පදං."

යන මේ ගාථාව සියා, මහත්වූ වීරශ්‍රීඇති බුඩාඩකුරයානන් වහන්ස! සාරාසඩ්ඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි සමත්‍රිංශත් පාරමී ධර්මයන් පූරණයකිරීම පිණිස සංසාරයෙහි ඇවිද පින් රැස්කළාවූ ඔබ විසින් ශක්‍ර බ්‍රහ්මාදි සම්පත් ප්‍රාර්ථනා කරමින් පිරුසේක් නොවෙයි ඇස්, ඉස්, මස්, ලේ, අඹුදරුවන් දන්දුන් නාවූ ඔබ විසින් බුදුබවම පතා පින් රැස්කරණ ලද්දේය. ඒ හෙයින් දැන් ඔබවහන්සේගේ පාරමිතාවෝද මස්තකප්‍රාප්තවූහ. පසේබුදුකෙනෙකුන්හෙන් හෙබියාවූ මේ මහාභද්‍රකල්පයෙහි කකුසඳස, බොනාගමනස, කාශ්‍යපයයි තුන් බුඩානන්තරයන් වහන්ස දැන් මේ ඔබ බුදුවීමට සුදුසු කාලය පැමිණියේය. එබැවින් පෙර බුදුවරයන්ගේ චාරිත්‍රානුකූලව නරලොව මව්කුසෙක පිළිසිඳ, ලොව්තුරා බුදුව දෙව් මිනිසුන් සංසාරකාන්තාරයෙන් එතරකොට නිවන්පුරය පුරවන්සේක්වයි ආරාධනා කළාහුය. මෙසේ දිව්‍ය බ්‍රහ්මයන් විසින් ආරාධිතවූ ඒ මහ බෝසතානෝ:—

"කාලං දීපඤ්ච දෙසඤ්ච කුලං මාතර මෙවච
එතෙ පඤ්ච විලොකෙත්වා උප්පජ්ජතති තථාගතා."

යනු කී පරිද්දෙන් පඤ්ච මහා විලෝකන නම්වූ පස් මහ බැලුම් බලනුවෝ, මනුෂ්‍යලොකයෙහි යම් කාලයක මනුෂ්‍යයන්ගේ ආයු ලක්ෂයක් අවුරුද්දව වැඩිවීනම්, එකල ජරා මරණ මදහෙයිනුත්, රොගානතරාය බොහෝ නොවන හෙයිනුත් මනුෂ්‍යයන්ට දුක් මද වේයි. දුක් උදෙසාම ශ්‍රද්ධා උපදින හෙයින් දුක් අඩුවීමෙන් කුසල් සිත් හිනවෙයි. මෙසේ ජරා මරණාදිය වහා නොපැමිණෙන්නාවූ දීඝායු ඇතිකල්හි මනුෂ්‍යයන්ට තිලකුණු සලකුණුකරවා ගිවිස්මාලිය නොහැක්ක, කෙවත් අනිත්‍යය, දුඃඛය, අනාත්මය යන ත්‍රිලක්ෂණයන්ගේ විශෙෂ විභාගාදිය අවබෝධකර දීලිය නොහැක්ක, දීඝායුෂ්ක මනුෂ්‍යයන්ට වනාහි අනිත්‍යාදිය නොපෙණෙන්නේය; අනිත්‍යාදිය ප්‍රකාශකොට වදාරන්නාවූ ධර්මය අසන්වත් නොසිතති.

නොකැමැතිවෙති, එසේකල්හි මාගධිගමය නොවන්නේය, මාගධිගමයකට පැමිණීම නැතිකල්හි බුදුන්ගේ අවවාදනු ශාසනා නොපිළිගැන්මෙන් සඩයා නිවීණයට නොපැමිණෙයි. මේ කාරණයෙන් ලක්ෂයක් අවුරුද්දට අධිකවූ ආයුෂ ඇති කාලය බුදුකෙනෙක් ලොවපහළවීමට සුදුසුකල් නොවන්නේය. තවද අවුරුදු සියයකින් අඩුවූ ආයුෂ ඇති කාලයත් බුදුන්ට කල්නම් නොවන්නේය. හේ කුමක්නිසාද යත්?

එසමයෙහි සඩයෝ උතුසන්න කෙලසයන්ගෙන් හෙවත් ලොභ චෙෂාදි සිත් කිලුටුකරණ පාපවෙතසාවලින් යුකත වන්නාහ. එබඳු සඩයන්ට දෙනලද අවවාදයෙහි නොපිහිටයි, දියෙහි ඇදි ඉරක්මෙන් අසනලද ධර්මකථාවද වහා සිතින් නැතිවී යන්නේය. මේ කාරණයෙන් සියක් අවුරුද්දට නිතායු ඇති කාලය බුදුවරයන්ගේ ඉපදීමට කල් නොවෙයි බලන්නාවූ බෝධිසඩයෝ, එකල මිනිස්ලොව එක්සිය විසිඅවුරුද්දට ආයු ඇතිබව දැක මේ බුදුවීමට සුදුසු කාලයයි කාලවිලොකනය කිරීමද; මනුෂ්‍ය ලොකයෙහි මේ මගුල් සක්වළට අයත් සතර මහාවීපයන් අතුරෙන් සියලු බුදුවරයන්ගේ උතපතති සථානයවූ ප්‍රවර ජමබුවීපයෙහි උපදීමැයි වීපය බැලීමද, දශදහසක් යොදුන් ප්‍රමාණවූ එම ජමබුවීපයට නාභිමණඩලයක් බදුවූ (ජය ශ්‍රී මහා බොධිය පිහිටි) බොධි මණඩලයට පූර්වදිශාභාගයෙන් "කජඩගල" නම් නියම්ගමද, අග්නිදිගින් "සලලවති" නම් ගඩගාවද, දකුණුදිගින් "සෙවනකණණිකා" නම් නියම්ගමද පශ්චිමදිගින් "ථූන" නම් බමුණුගමද, උතුරුදිගින් "උසීරමජ" නම් පර්වතයද සීමාකොට මොවුන්ගේ මධ්‍යයෙහිවූ බැවින් 'මධ්‍යදෙශ' යයි ප්‍රකටවූ ඉතා මහත්වූ හිමාල පර්වත රජයාගේ කුළු පඩුකීයක්වැනි සුධාධවල ප්‍රාකාරමණඩලයෙන් පරිකෂෙප කරණලද, අනෙක ප්‍රකාර වෘක්ෂ සමූහයෙන් ගැවසීගත් උදාන පරමපරාවෙන් විභූෂිතවූ මදයෙන් මත් හංසයන් හා විල්ලිහිණි නමැති මෙවුල්දම් සමූහඇති, නිල්වූ වනරෙඛාවෙන් විරාජිතවූ දෙහංතෙර හවහත් රැකින් ගිළිහුනු පුෂ්පාහරණයෙන් සම් ලඩකෘත "රොහිණී" නම් ගඩගාව විසින් සසඩාමික කරණ ලද්දාවූ සපත රතනාදි විපුල වසතු ඇති 'කපිලවසතු" නම් උතතම නගරය පිහිටි මෙම මධ්‍යදෙශයෙහි උපදිමැයි දෙශය බැලීමද, ඉක්බිත්තෙන් ඉපදියයුතු කුලය බලන්නාවූ මහා බෝසතාණන්වහන්සේ සමීඥවරයන් උතුම් කුලවංශයන්හි ඉපදීම ධර්මතාහෙයින්, බ්‍රාහමණ කුලයෙහි හෝ රජකුලයෙහි හෝ උපදනාහ. එබැවින් දැන් කවර කුලයක් උතුම්දෝහෝයි බලතුයේ, රජකුලය උතුමැයි දැන, එසමයෙහි දඹදිවිතෙලෙහි ඉතසැවදහසක් රාජධානිවල තෙසැවදහසක් රජුන් අතුරෙන්

බුදුකෙනෙකුන්ට පිතෘස්ථානයෙහි සිටීමට සුදුසුවූ කපිලවස්තු පුරයෙහි සියලු ක්ෂත්‍රියකුල නමැති තාරකාවන්ට තාරුපතිභූතවූ ධෞත ශඛ ප්‍රක්ෂිප්තාවූ ක්ෂීර ජලයක් මෙන් නිර්මලවූ ශාක්‍ය වංශයෙහි අනෙක භූමිපාලයන්ගේ කීර්තියෙහි බබුළුවනලද චරණ යුගල ඇති ගුණ සමූහයන්ට වාසස්ථානවූ කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පුරණලද පාරමිතා ඇති "සුඛොදන" නරපතීන්ට පුත්‍රව උපදිමැති කුලවංශයබැලීමද, එසේම උභයකුල පරිශුද්ධවූ කප්ලක්ෂයක් මුළුල්ලෙහි පුරණලද පාරමිතා ඇත්තාවූ අකණ්ඩවූ පඤ්චශීලය ඇති "ඛොලිය" නම් නුවර "මහාසුප්‍රබුද්ධ" නම් අනුශාක්‍ය රජව දුව එම "සුඛොදන" නම් මහරජුට අග මෙහෙසුන්වූ සියලු සත්‍රී ලක්ෂණයෙන් හෙබියාවූ පඤ්චශීලානුරක්ෂණයෙන් සම්කාලයෙහි විභූෂිතවූ ශාක්‍යවංශ නමැති නභස්තලයෙහි චන්ද්‍රරේඛාවක් බදුවූ "මහාමායාදෙවි" නම් වරාඞ්ගනාවගේ ආයුෂය සත්දිනක් අධිකවූ දසමසක් ශෙෂව තිබේදැයි මාතෘ විලොකනය කිරීමද, මෙසේ ඒ "තුෂිතපුර" යෙහිවූ මහ බෝසතා නෝ දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන් ආරාධනාකර සිටියදීම යළිපොකන පස් මහ බැලුම් බලා, තමන්වහන්සේ මිනිස්ලොව ඉපිද බුදුවීමට සුදුසු කාලයයි දැන, එතනට රැස්වූ සියලු දෙව් බඹ පිරිසට බුදුවන්නට මිනිස්ලොවට යෙමියි ප්‍රතිඥා දුන්සේක.

මහබෝසතානන්ගේ ප්‍රතිසන්ධිග්‍රහණාදිය මහාමායාදෙවීන් වහන්සේ දුටු සැටියෙන්.

එසේ අප මහබෝසතානන්වහන්සේ ආරාධනාවට රැස්වූ දිව්‍ය බ්‍රහ්මයන්ට සමුදිඝවා තුසිතස්තෙන් නැගිට, "තුසිත" දිව්‍ය ලොකයෙහි දෙවිගන් විසින් පිරිවරණලදුව එහි "නන්දනෝද්‍යාන ශෛල" වැඩසේක. මෙසේ ක්‍රීඩා සුව විඳිමින් හුන්නාවූ ඒ මහා බොධිසත්වයන් කෙරෙහි, සියලු දෙවතාවන් චුතවන කාලයේදී පෙණෙන්නාවූ පඤ්චමහා පූර්වනිමිති පෙණී සිටියේය. මේකවරේද යත්? ඒ බෝසතුන්ගේ සත්පණස්කෙළ සැවලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි නොකිලිටිව නිර්මලව පැවති දිවසළු එදවසෙහි මලිනවගියේය. එතෙක්කල් මුළුල්ලෙහි පරනොව තුබූ පැලඳි දිවමල් එදින පරව ගියේය. තවද කිසිකලෙකත් දත්වැටීම්, හිසකේපැසීම්, ඇඟ රැළිනැගීම් වශයෙන් ශරීර විවර්ණතාවක් නොමැතිව සූර්‍ය රශ්මිකදම්බයක් වැනිව තුබූ ශරීර ප්‍රභාව නිෂ්ප්‍රභාව ගියේය. දිව්‍යමයවූ මාලිගාවෙහිවාසයට රිසි නැතිවිය. උපන්තැන්පටන් ශීතොෂ්ණාදි කිසි පීඩාවෙක් නැතිව විසූ ඒ බෝසතුන්ගේ ශ්‍රී ශරීරයෙහි, පිණිඟත් රැකකින්මෙන් ඛඟකිදු සෙල්විය. එකල "තුසිතපුර" දෙවියෝ බෝසතානන්ගේ චුතවදා

මේ පඤ්චවිධා පූජිතිම්හි දූත පිරිවරාසිව 'ඉතෝ හෝ සුගතිං ගච්ඡ' යනාදීන් මෙයින් චුතව සුගති ඉඛ්‌ඛ්‍යාත මිනිසත්බවට පැමිණුන මැනවැයි, යනාදි මඟඵල්‍ය වචනයන් කිහ. එකෙණෙහි බෝසතා නෝ පවනින් පැහැර නිවියන පානක්සේ තුසිපුරෙන් අනතඹා නව ඇසළමස මැදි පොහොදිනයෙහි යෙදුනු උතුරුසළ නකතින් අළුයම් රාත්‍රියේහි ඒ "මහාමායාබිසව" ගේ කුස ප්‍රතිසන්ධි ග්‍රහණය කළසේක. එහි පිළිවෙළ කථාව මෙසේයි:—

එසමයෙහි වනාහි "කපිලවස්තු" පුරයෙහි උතුරුසළ නකත ලද ඇසළමස මැදිපොහොයෙහි කරණලද විශත සුරාපානය ඇති ඇසළකෙළිනම් සන්දිනක් පවත්වන්නාවූ මහත්වූ උත්සව ක්‍රීඩාවෙක් වූයේය. එකල මහජනයා ඉස්සෝදම්න්, ජලසන්‍යා ය කරම්න්, සුවඳමල් පළඳිම්න්, සුවඳසුණු ඇඟ ගල්වම්න් කෑමෙන් පීමෙන් නැටීමෙන් ගී කීමෙන් යනාදි වශයෙන් ක්‍රීඩාවෙන් දවස් යවා ශක්‍රපුරයසේ එනුවර සරහා සත්දවසක් උත්සව ක්‍රීඩා පවත් වසි. එකල "සුඛොදන" රජද සොළොස්කලයක් සුවඳපැනින් නහා ලක්ෂයක් අගනා සළුවක් හැඳ සූසැවක් ආභරණයෙන් සැරහී "ශක්‍රදෙවෙන්ද්‍ර" ලීලාවෙන් සිංහාසනාරූඪව හිඳ, ඇමති සමූහයා පිරිවරා සැන කෙළි සිරිවිදී. එකල මහාමායාදෙවිද සත්වෙනි දවසෙහි දිව්‍යප්‍රාසාදයක්සේ සැරසී පන්සියයක් පරිවාර ස්ත්‍රීන් කැටුව මගුල්පොකුණට වැද "නාඳුන්පොකුණට" වන් "නාඤ්ඤ" නම් දෙවඟනමෙන් ජල ක්‍රීඩාකොට ලක්ෂයක් අගනා කසිසළුවක් හැඳ සුපිපි මල්රැකක්සේ සළිලඤ්ඤාරයෙන් විභූෂිතව රජගෙට හොස් රන්පහයෙහි මතුමහලට නැගී ශ්‍රියහන් ගබඩාවෙහි සුවඳමල් අතුරණලද යහන්මතුයෙහි දකුණ කිදුරුවට පවන්ගත්හ. එදවස් රැ අප මහබෝසතාන්ගේ ප්‍රතිසන්ධි වේලා වෙහි "මහාමායාදෙවි" මෙබඳු සිහිප්තයක් දුටහ. හේ කවරේද යත්? "සතරවරම්" මහරජහු අවුත් බිසව් යහනින් ඔසවා හිමාලය පර්වත ප්‍රදේශයට ගෙණ ගොස් සැදයොදුන් සිරියෙල් ගල්තලා කෙළවර පිහිටි සත්යොදුන් මහසල්රුක්මූල තබා එකත්පස්ව සිටියාහුය; ඉක්බිති ඒ වරම් රජදරුවන්ගේ අග මෙහෙසිවරු අවුත් දෙවිය අතවනප්තවිලට ගෙණගොස් මිනිස් මල හරණ පිණිස නහවා දිවසළු හඳවා, දිවඟඳ විලවුන් ගන්වා දිවමල් පළඳවා, ඊට නුදුරුතන්හි රිදිපර්වතයක පිහිටි රන්ප යෙහි නැගෙණහිරදෙසටසිරසලා සැතපෙනලෙසට දිවයහනක් පණවා දෙවින් එහි සැතැප්පවූවාහුය; ඉක්බිති හැලිඇත්පැට වෙකු රිදීදමක්වන් සොඬින් සුදුමලක් ගෙණ රන්විමනට ප්‍රවිෂ්ටව බිසව් වැදහොත් යහනවටා තුන්යලක් ඇවිද දකුණැල යෙන් කුසයට පැමිණියාක්මෙන් විය. ඉක්බිති පිබිදියාවූ දෙවිය දැන්වූකල තම සවාමියාවූ සුඛොදන මහරජ වෙතව ගොස්

දුටුවාවූ සඵජනය ඔහට දැන්වීය; එකල්හි රජතෙම වතුමෙදය ගෙවාදත් බ්‍රාහ්මණ පඬිවරු සුඳැටදෙනෙකු ගෙන්වා, මිහැඟි අසුන් පණවා, බමුණන් එහි හිඳුවා, හිතල් මී සකුරු ආදී වතු මධුරයෙන් පැන්නොවකා පිසූ කිරිබත් පිරූ රන්තලි සැසැවක් බමුණන් පෙරට තබා කිරිබත් කවා රන්තලි සමගින් බමුණන්ට දන්දී, බමුණන් සතුටුකරවා ඔසව් දුටු සඵජනය කියා එහි විපාක කිමදැයි පිළිවිසූහ. ඒ බදිණෝ සඵජනය පරීක්ෂාකොට කියන්නාහු, මහරජානන්වහන්ස! ඔබගේ දෙවින් දුටුයේ දරු සීන යෙක, අයකුස දරුගැබක් පිහිටියේය, හෙද වනාහි පුරුෂ ගර්භ යෙක, ඔබවහන්සේට ඇතිවූයේ පින්වත් පුත්රුවනෙක, හේතෙම ඉදින් ගිහිගෙයි විසුවහොත් සක්විති රජවෙයි, ගිහිගෙන් නික්ම පැවිදිවුවහොත්, ලොවුතුරා බුදුව තුන්ලෝවාසීන්ගෙන් පූජා ලබන්නේයයි කීවාහුය. මෙසේ ඒ ශ්‍රී මහා බෝධිසත්වයන් මව්කුස පිළිසිඳගත් අනන්තරයෙහිම පෘථිවි කම්පාවීම් ආදි ආශ්චර්‍ය්‍ය මත් දෙතිසක් පූර්වනිමිති පහළවිය. මැනියන්වහන්සේවද, දරු ගැබවද වන්නාවූ උපද්‍රව වලක්වනු පිණිස සතරවරම් මහරජ දරුවෝ මහුල්කඩුගත් අත් ඇතිව ශ්‍රීගර්භ ගබඩාවට සතර දිශාවෙහි රැකවල් ගත්තාහුය. එපමණෙක් නොවැයි, දස දහ සක් සක්වළ සතළිස් දහසක් වරම් රජහුද ගෘහවාර ප්‍රාසාදවාර නගරවාරයෙහි පවත් සක්වළගල දක්වා හාත්පසින් කඩුනත් අත් ඇතිව රැකවල්ගෙණ සත්කාර කළාහුය. එතැන් පටන් බෝසතාණන්වහන්සේට සහ මැනියන්වහන්සේවද, පෙර ගිල නුත්ව කළාවූ ඖෂධ බලයෙන් ජනිතවූ කුශලානුභාවයෙන් සහ දෙවානුභාවයෙන්ද රෝගාදි කිසි පීඩාවෙක් නොවීය. දඹදිව සියලු රජුන් විසින් සතුටු පඬුරුකොට එවනලද අප්‍රමාණවූ රතනවර්ෂයෙන් අතරක් නොමැතිවිය.

මහබෝසතාණන් මව්කුස විසිම හා බිහිවීම.

තවද ඇතුල් කුස මැනියන්වහන්සේගේ නාභිමණ්ඩලයට මුණලා පළක්බැඳ වැඩහුන් මහසතානන්වහන්සේ, පහන් පැහැ ඇති මාණික්‍ය රත්නයෙක්හි ඇවුනු රත්පලස්හුයක් පරිද්දෙන්ද, ධර්මාසනයක හුන් ධර්මකථිකයෙකුසේද, පිළිම්ණි කරඬුවක වඩාලූ කතක රූපයක්මෙන්ද විය. බෝධිසත්ව මාතාවෝ ඇතුළු කුස වසන මහසතානන්ගේ මුඛශොභා බලබලා අදට මෙතෙක් වැඩියේය, අදට මෙතෙක් උසම්මතවූයේය. ඇතුළු කුස වසන මපුතනුවන්ගේ රැසිරූ මෙසේ වනකල නිලුපුල්පෙනිවන් ඇස් සඟළින් මාමුහුණ බලබලා ලදබොලඳ තෙපුල්කියකියා කෙළනා කල මපුතනුවන්ගේ රූපශ්‍රී කෙසේනම් ප්‍රිය නොවේද? කවුර

Printed & Published by **K. D. PERERA & SON**, *Vidyadarsa Press, Colombo.*

කෙනෙකුගේ සිත නොපිණවාද? කවර දවසක් මපුතනුවන්ගේ සුරතල් බස් අසම්ද? කවර දවසෙක මපුතනුවන් උරහිදුවාගෙණ දරු සුරතල් විඳිම්දැයි, බොහෝ කලක් බඹසායෙන් හුන්නාවූ සිංහඩෙනුවක් විසින් දුරදී දක්නාලද ගොදුරක් පරිද්දෙන් පුත්‍රලාභයෙන් දරුසිරි බල බලා ප්‍රීතීන් පිණමින් පිරුණු තෙල් පාත්‍රයක් දරන්නාසේ, දසමසක් මුලුල්ලෙහි බොධිසත්ව කුමාරයන් කුසින් පරිහරණයෙහාව සමසූණිණවූ ගැබ් ඇත්තී, සියලු බුදුවරයන්ගේම උත්පත්ති කාලයවූ වෙසඟ මැදි පොහොදින සඳු විශාඛ නම් නකත් යොගය ඇතිකල්හි, තමන් ජාතවූ "දෙව් දහ" නම්වූ "කෝලියනුවරට" හොස් මව්පියන් දක්නට මන දෙළ ඇතිවිය. මෙපවත් ඇසූ සුදෙවුන් මහරජ තෙමේ යහපතැයි සතුටුව "කපිලවස්තුපුරයෙහි" පටන් දෙව්දහනුවර" දක්වා බිම සමකරවා සුදුවැලි අතුරුවා පුන්කලස් ධජ පඩාකියෙන් මග දෙපස අලඞ්කාරකොට සරසවා, ඳදවින් සතරන් සිවිගෙයෙක්හි සුදු මොළොක් යහන්හි වඩාහිදුවා ශුභ මඞ්ගල්‍ය වෙශධාරීවූ දහසක් ඇමති සමූහයා ලවා යටොකන සිවිගෙය උසුලවා, එසේම දහස් ගණන් සත්‍රීන්ද පිරිවරකොට ඇති චතුරඞ්ගිණී සෙනාවත් සමග මහත්වූ ආරක්ෂාදී ඇවූහ. මෙසේ මහා මහොත්සව සහිත පුද පෙළහරින් යන්නාවූ ඒ බුඩ මාතාවෝ කපිලවස්තු පුරයවද දෙව්දහ නගරයවද අතර දෙනුවර වැස්සන් විසින් සැණකෙළි පවත්නාවූ විචිත්‍ර පුෂ්ප ඵල පල්ලවයෙන් සම්ලඞ්කෘතවූ අනෙක ප්‍රකාර වෘක්ෂ සමූහයෙන් ගැවසීගත්තාවූ බඹර මධුකර සමූහ යන්ගේ මනොඥවූ නාද ඇති, මල් සුවඳින් පරිවාසිතවූ සැපවූ පවන් ඇති, ජනයන්ගේ මනනයන පැහැරගන්නාවූ "ලුම්බිනී' නම් මහුල් සල්උයනකරා පැමිණියෝය. එසඳ උද්‍යානයෙහිවූ සියලුම වෘක්ෂ ලතාවෝද ඒ මහා බොධිසත්වොත්තමයානන්ගේ උත්පත්ති ශ්‍රී බලමහයි නික්මුනවුන්සේ මුළ පටන් අග දක්වා සුපුෂ්පිත කුසුමයන්ගෙන් අතුරු සිදුරු නොමැතිව සැරසී සිට ගත්හ. එසේම මල්රෙන් ගන්නා බඹරුන්ගේ නාදයෙන් හා කවපුරා කෙසරුගෙණ ඔවුනොවුන් පරයා තුරු අග හිඳ ලියගී නහන මත් මොණර කොවුල් ආදී සියොතුන්ගේ නාදයෙන් එකතින්නාදව ඉතා රම්‍ය විය. තවද තමාකරා එහා ප්‍රියවූ බිසවෙකුගේ පෙරමහව සතුටු පඬුරු යවන්නාවූ රජෙකුසේ, ලුම්බිනී පතිවූ වසුනතරජද, ඒ දෙවිය උයනකරා සම්පවූ වේලෙහි, පෙර මහව සුවඳ මදපවන් නමැති සතුටු පඬුරු යැවීය. මෙසේ ඒ මහාමායාදෙවී නොමෝ සුවඳ මදපවන් ලදින් උද්‍යාන ශ්‍රී දැක එම සල් උයනෙහි ක්‍රීඩාකරණු කැමතිවිය. එබවදත් ඇමති සමූහයාද දෙවියගේ මනදෙළවූ පරිද්දෙන් මහුල් උයනට වඩාලූසේක. මෙසේ ඒ දෙවිනොමෝ දහස් ගණන් පරිවාර සත්‍රීන් සහ ඇමති

සමූහයාද කැටුව උයනටවන්නී, "චිත්‍රලතාවනයට" වන් විචිත්‍රවූ "චිත්‍රාඛනාවසේ" බොහෝ කලකින් වැඩී සවාමිදියනියෝයයි ආදරයෙන් වදකාක්මෙන් පවසින් නැගී බසිනා රැක්පෙළද, තමන් ගැවසූ කෙශකලාපය ශොභාවට පැරදී හෙයින් වෙව්ලන්නාක් වැනි මෘදඔඝ මෙඝධ්වනියට මොණරුන්ද, දසදෙස නිල් මහතෙල් මල් වඩන් සිසාරන්නාක්මෙන් බලන්නවුන් බැල්මට පැරද දිවන්නාවූ මෘගාඔඝනාවන්ද, ලීලාපෙතට ලැසිගමනට පැරද විල්වදනාක් වැනි හංසාඔඝනාවන්ද, අවලෝකනය කෙරෙමින්, උයන්කෙළිමසින් ගමනය කරන්නී, මුළු පවත් අතු අඟ දක්වා මලින් සැදුම්ලද "මඩගල සාලවෘක්ෂරාජයා" දැක ප්‍රීතියෙන් හරිතවූ සිත් ඇති ඕතොමෝ, එහි විශාලවූ සාල ශාඛාවක් අතින් ගතැටිව රන්ලියක් වන් අත දිගුකළහ එකෙණෙහිම පුණ්‍යානුභාවයෙන් මනාකොට තම්බනලද වේඛඔයක් පරිද්දෙන් සිත්ලෙස ඒ සාලශාඛාතොමෝ නැමී දෙවියගේ හස්තයට උපගත විය. ඇය සල්අත්ත ගත් විගස ප්‍රසවය පිණිස කම්මජ වාතයෝ වලිතවූහ. එකල්හි ඇමැත්තෝ දෙවියගේ භාත්පස්හි කඩතුරා බැඳ පිටතවී රැකවල්හෙණ සිටියාහුය. තවද ඒ බොධිසත්වොත්තමයාගේ ප්‍රසව මඩගල්‍ය කාලයයි දසදහසක් සක්වළ දෙවියෝද රැස්ව පිරිවරා සිටගත්හ. එකල ඒ මහාමායා දෙවින් සල්අත්ත දකුණතින් හෙණ නැගෙණහිර දිසාව බලා සිටියදීම, බඹලොවින් බස්නා බ්‍රහ්ම කුමාරයකුසේද, දිව්‍යලොකයෙන් බස්නා දිව කුමරෙකුසේද, ධර්මාසනයකින් බස්නා මහතෙර කෙනෙකුසේද, අන්‍ය සත්ත්වයින්මෙන් පිළිකුල්වූ මළ මූ ආදී මවිකුස කිසි දැයකින් මුසුනොවී, කසී වස්ත්‍රයකින් වසා තබනලද ජාතිරඔඝ මාණික්‍යයක්මෙන් පිරිසිදු සිරුරු ඇතිව මව්හැඹින් බිහිවූ සේක. මෙසේ සව්නේගෙවාදත් ලොවුතුරා බුඩඔඝව පැමිණි සිඛාසීකුමරු තෙමේ කලියුග වර්ෂයෙන් 2417 ක් ගිය කල, හෙවත් මිට අවුරුදු * 2452 කින් ඔබ වර්තමාන කාලයෙහි "කොහණා" නමින් ප්‍රසිඩ "රොහිණී" නදීතීරයෙහි සුපිහිටි කපිලවස්තු නගරයෙහිවූ ලුම්බිනීනම් මගුල් සල්උයනේදී, වෙසඟ පුර පුණු පොහොයලත් කුජදින විසාහකනින් උපන්සේක.

එකෙණෙහිම ප්‍රගිණකරණලද කාම රූප ඇති සුඛවාසික බ්‍රහ්මරාජයන් සතරදෙනෙක් මඩගලසම්මතවූ රන් දැලින් බෝසතුන් පිළිගෙණ රූප ශ්‍රී බලා සතුටුවූ මැනියන් පෙරට සිට, 'දෙවිනී, සොම්නස් වෙව! මුලුලොවට මුදුන් මල් කඩක් බදුවූ මහානුභාව සම්පන්න පුත් රුවණෙක් නිව උපනැ'යි කීහ. ඒ මහා බ්‍රහ්මයන්

* මෙහි දක්වනලද ශ්‍රී බුඩ වර්ෂය, මෙම පොත පළමුව මුද්‍රණය කරණලද වර්ෂය දක්වා බැව් දතයුතුයි.

අතින් සතරවරම් මහ රජදරුවෝ මඞ්ගල සම්මතවූ උතුම් සුව පහස් ඇති අදුන් දිවිසමකින් පිළිගත්හ. ඒ වරම් රජදරුවන් අතින් මහුල් මහ ඇමතියෝ දුහුල් සුඹුලුවෙන් පිළිගත්තු. ඔවුන් අතින් බසිමිසි පෘථිවිය දෙසට සිරිපතුල් දිගුකළ කල්හි පොළව පලා පැහැනැගී පද්ම මසෘකයෙහි වැඩසිටිනසඳ මහ බෝසතාන්ව හා මහාමායාදේවීන්වද සත්කාර පිණිස අහසින් ජල ධාරාවෝ දෙදෙනෙක් නික්ම මාතෘ පුත්‍ර දෙදෙනාවහන්සේගේ ශීතීසනාතය කරවීමෙන් සෘතුගන්වා සතුටුකලෝය.

බොධිසත්ත්වොත්පත්ති කාලයෙහි පහළවූ දෙතිස් පූර්වනිමිති.

නවද සිද්ධාර්තකුමාරයාණන්ගේ බිහිවීමේදී ආශ්චර්‍ය්‍ය අද්භූත දෙතිසක් මඞ්ගල්‍ය පූර්වනිමිතිද පහළවිය. හේ නවවේදයන්! (1) **එදවස්** දසදහසක් **සක්වළ** මහපොළොව නිගුම්දී පැවතුනාවූ මහිඝජිනාව වනාහි සම්බෙතාඥනයාගේ ලැබීමට පූර්වනිමිත්තවූ ප්‍රථම ආශ්චර්‍ය්‍ය අද්භූත මඞ්ගල්‍ය කාරණයෙක; (2) දසදහසක් **සක්වළ** දිව්‍ය බ්‍රහ්මාදී සියල්ලන්ගේම ආලෝක මැඩපවත්වා, එදවස් එකාලොකවීම දෙවි මිනිස් සහිත බොහෝ ජනයන්ගේ **සිත්** පිණවන බවට පූර්වනිමිත්තය; (3) දිවැස් ලැබීමට පූර්වනිමිත්තවූ සියලු ජාත්‍යන්ධයන් උපන් තැන් පටන් නොදුටුවිරූ ආලෝක සහ අනෙකවිධවූ රූපයන් දැකීමෙන්, අහෝ සාධු! **අහෝ** සාධුයි! ප්‍රිය තෙපුල් කියමින් **සතුටුවීමය**; (4) ධර්ම චක්‍රය **පවත්වන** කාලයෙහි එකහෙළා සාධුනාද පැවැත්වීමට පූර්වනිමිත්තවූ සියලු ජාති **ගොලුවන්** එ දවස් කුරවීකනාද පරදවා **එකෙණෙහි** ලීලා පෙතකොට ගී කීමය; (5) දිව්‍යශ්‍රෝත්‍ර (දිවකන්) ධාතුවගේ ලැබීමට පූර්වනිමිත්තවූ සියලු ජාති බිහිරන්ම එදින බෙරහඬ සක්හඬ ආදිය කෙරෙහි වැඩි ඇල්මක් නොකොට ගොලුවන් විසින් **කරණු** ලබන ගායනා ශබ්ද ඇසීමෙන් **සතතුෂ්ටිභාවයට පැමිණීමය**; (6) චතුර්විධ ඍද්ධිපාදයන්ගේ ලැබීමට පූර්වනිමිත්තවූ දෙපයෙන් යානොගී උපන්තැන් පටන් පිළුව (කොරව) විසූ අය, එදවස් සතුටුව අන්පොළසන් දෙමින් සිත්සේ ගමනා ගමනය කිරීමය; (7) බොහෝදෙන අභිගමලාභීව **නිවන්** දක්නා බවට පූර්වනිමිත්තවූ උපන්තැන පටන් කුරුකුදුව උන් අය විශෙෂවූ ගාත්‍ර ලදින් උස්තැන්වල තුබූ ඵලා ඵල බිඳ කමින් එදවස් මහත් **සතොෂයට** පැමිණීමය; (8) නවද ඒ ඒ තන්හි බඹනගත ඇත්, අස්, මොණර, පරවි ආදී සියලු සඞ්ඝයන්, එදවස් තම තමන්ගේ බැදුම් මිදීමෙන් රැවිවූ පරිද්දෙන් ගමනය කිරීම වනාහි අසම්මානයාගේ සිදීමට පූර්වනිමිත්තය, (9) දසදහසක් **සක්වළ** තෙළෙස් **ලක්ෂ** සැවදහසක් තරකවල ගිනි නිවී නිම්

පිඹක්සේ සිහිල්ව කපක් කල් මුලුල්ලෙහි ගින්නෙන් දවන නිරිසතුන්ගේ ගිනිගත් සිරුරු එක පැහැර දියකඳසේ සිහිල්වූ බැව් ඔවුනොවුන්ට දනී, මේ කෙසේවූ විසමයෙක්ද? කොළ, මේ නරක දුකින් අපි මිදියයම්හයි ඔවුන් දෙනලද්දුවූ සාධුකාරය වනාහි, රාගදෝෂාදී එකලොස් ගිනි නිවීමට පූජනිමිත්තය; (10) කායගතාසති අමෘත ප්‍රතිලාභයට පූජනිමිත්තවූ කලපයක් මුලුල්ලෙහි බත් පැන් නොලත් ප්‍රෙතයින්ගේ, එදවස් සා පිපාසා සන්සිඳී බත් පැන් ලදින්, අහෝ සුඛං! අහෝ සුඛං! කියා අධික ශබ්ද පැවැත්වීමය; (11) ආශ්‍රී අෂ්ටාඞ්ගික මාර්ගයෙන් නිර්‍ය කරණ බවට පූජනිමිත්තවූ, උපන් තැන් පටන් මරණභයින් ඇවිදින තිරිසන් අපායික සත්වයන්, එදවස් ඔවුනොවුන් කෙරෙහි භය නැතිව සිත්සේ ඇවිදීමය; (12) චතුරාසත්‍ය ධර්ම ප්‍රතිලාභයෙන් "අහෝ සුඛං"යි ප්‍රීතිවචන කීමට පූජනිමිත්තවූ, දසදහසක් සක්වළ සියලු සතුන්ගේ අසංඛ්‍ය රොදයන් එ දවස් සන්සිඳී, අහෝ සුඛං! අහෝ සුඛං!යි ප්‍රිය තෙපුල් බිණීමය; (13) ධර්මය පිළිගෙණ සතුටුව ප්‍රීති වචන කීමට පූජනිමිත්තවූ, කාලාම කාදී දස කුලයෙහි ඇතුන් එ දවස් සතොසයෙන් කුසඳවනාද කිරීමය; (14) සතර ඉහම්විහාර භාවනාවගේ ප්‍රතිලාභයට පූජනිමිත්තවූ, සියලු සතුන් ඔවුනොවුන් අප්‍රිය වචන නොකියා එ දවස් ප්‍රියවචන කීමය; (15) අනුපූර්ව විහාර භාවනා ප්‍රතිලාභයට පූජනිමිත්තවූ සත්කුල සියලු අශ්වයන් එ දවස් මියුරුවූ හෙසාරව නාදයෙන් සොඟකිරීමය; (16) මහත්වූ සඞ්ඝරත්න නමැති භෙරි නාදය ඇස්වීමට පූජනිමිත්තවූ, එ දවස් කැම සිංහරාජයන් ගල් මුදුනට නැඟී බුඬාඞ්කුරහු මව්කුසින් බිහිවුනුසේකැයි ලොවට හඬ ගසා කියන්නාසේ කළාවූ සිංහ ගර්ජනාමය; (17) ආශ්‍රී අෂ්ටාඞ්ගික මාර්ග නමැති දෙරහැරීමට පූජනිමිත්තවූ, මිවුන්, ගවරුන්, සෙම රුන් ආදී සියලු සිවිපාවුන්ම එ දවස් තම තමන්ගේ නාදයෙන් සොඟකිරීමය; (18) සියලු ලොකයාට සඞ්ඝරත්න නමැති ආලොකය දක්වන බවට පූජනිමිත්තවූ, දසදහසක් සක්වළ දෙව් මිනිසුන් පැළඳි කනක කටකාදී සියලු ආභරණම එ දවස් බැබළීමය; (19) අවිද්‍යා නමැති අන්ධකාරය දුරුකොට විද්‍යා නමැති ආලොකය දක්වීමට පූජනිමිත්තවූ, දසදහසක් සක්වළ දශදිශාන්තරයන්හි එකහෙළා බුඬරශ්මිය පරිද්දෙන් රැස් විහිදීමය; (20) සියලුම වාත වලාහකයන් එ දවස් සැඬපවන් දුරුකොට වනාමල් සුවඳින් යෙදුන මදපවන් පැවැත්වීම වනාහි, දෙසැට දෘෂ්ටිගතිය බිඳ හෙළීමට පූජනිමිත්තය; (21) මහත්වූ සඞ්ඝරත්න නමැති වර්ෂාව වැස්වීමට පූජනිමිත්තවූ, එ දවස් වස්සවලාහකයන් අකාල මෙඝ නාශ දසදහසක් සක්වළ එකතීන් මහවැසි වැස්වීමය; (22) කායික චෛතසිකවූ ශාන්ත සැප ඉපදීමට පූජනිමිත්තවූ, මහපොළව

දෑදුරුකොව නාඹ තල්කඳන් සෘ ජලධාරාවන් රිදී කඳන්සේ ඒ ඒ දිශ දිවිමය,(23)මහජන සමූහයා අවවාද පිළිගෙණ ජීවිතාන්තය දක්වා සරණයන බවට පූජනිමිත්තවූ, සිඟලු පක්ෂීන් එ දවස් අහසින් නොගොස් තුරු අග නොහිඳ පොළොවට බැස තම තමන්ගේ ධවනියෙන් මධුර නාද කිරීමය; (24) චතුර්විධ වෛශාරද්‍ය ඥානයාගේ ලැබීමට පූජනිමිත්තවූ, නොයෙක් දහස්ගණන් ගඛයාවන් යටිගඟ බලා යන ගමන් නවතා, බුඛාඛකුරහු උපන්හයි සතුටුව බලාසිටිනාසේ නොගොස් රඳුපිමය; (25) නිර්වාණ රසයෙන් එකරසභාවය ලැබීමට පූජනිමිත්තවූ, දසදහසක් සක්වළ සියලු සමුද්‍රයන්ගේ රළ වෙගය සන්සිඳී ලවණ රසය පහකොව, එ දවස් මිහිරි ජලයෙන් පිරී පැහැදී සිටීමය; (26) බුඩත්වය පැමිණ උදානවාක්‍යය පවත්වන බවට පූජනිමිත්තවූ,එ දවස් සියලු සාගරයන්හි පස් පැහැ මල්පිපීමෙන් සජ්ජිතවීමය; (27) විමුක්ති සැප නමැති පූජාපයෙන් හා ශ්‍රාමණ්‍ය ඵලාභරණයෙන් හරිත වීමට පූජනිමිත්තවූ, දිය ගොඩ පිපෙන සියලු මල්සමූහයම එක විඹම ප්‍රබුඛව, එ දවස් දශදිග සුවඳ පැතිරීමය; (28) විමුක්ති සැපතින් සැපතට පැමිණෙන බවට පූජනිමිත්තවූ, දසදහසක් සක්වළ ගල්මුල්වල එ දවස් අඟ දක්වා මල් පිපීමය; (29) සතර සතිපට්ඨාන ධර්මයාගේ ලැබීමට පූජනිමිත්තවූ, එ දවස් දසදහසක් සක්වළ පොළෝ විවරව සත්බුමු දඹපියුම් පිපීමය; (30) සිව්පිළිසිඹියාවගේ අධිගමයට පූජනිමිත්තවූ, එ දවස් සියලු අහස්තල මුලුල්ලෙහිම පියුමෙන් අතුරු නැතිව උඩබලා නටුතිබීමය; (31) දසදහසක් සක්වළ දහම් නමැති මල්වැසි වැස්වීමට පූජනිමිත්තවූ එ දවස් දසදහසක් සක්වළ මුලුල්ලෙහි මල්වැසි වැසපියා මල් අස්නක්සේ වීමය; (32) අභිඩවජ මාලාවෙන් සියලුලොව ලීලා පෙතවන බවට පූජනිමිත්තවූ, එ දවස් ලොව පහළවූ ධවජ මාලාවෙන් බඹලොව වසාගැන්මය.

තවද සියලු කුසලයන්ට උත්පත්ති ස්ථානයවූ ඒ බෝධිසත්ව මහා පුරුෂතෙම පදම මස්සාකයෙහි වැඩසිට නැගෙණහිර දිශාව බැලූසේක. නොයෙක් දහස්ගණන් සක්වළ එකාකාරව පෙණී හිඳේය. ඒ දිශාවෙහි දිව්‍යබ්‍රහ්මයන් විසින් "සර්වාම්වූ මහාපුරුෂයාණෙනි! මේ දිශාවෙහි ඔබ හා සම්මාන කෙනෙකුත් නැත, වැඩිතරම් කෙනෙක් නම් කොයින්ද? ඔබම උත්තම වෙති, එ බැවින් මේ දිශා බැලීමෙන් ප්‍රයෝජනයක් නොමැතිය"යි සැලකළ කල්හි, සෙසු දිශාවනුත් බලා මෙසේම වූසේක. එකල උතුරුදිග බලා සත්පියවරක් පියුම් පිටින් වැඩ, මනොඥවූ මුඛ සුගන්ධයෙන් පොළෝතලය සුවඳකරමින් "සියලු ලොකයාට මම දැන් අග්‍රවූයේ වෙමි, ජ්‍යෙෂ්ඨවූයේ වෙමි, ශ්‍රෙෂ්ඨවූයේ වෙමි, මේ මා‍ගේ කෙළවර උත්පත්තිය වන්නේය, නැවත උත්පත්තියක් මට

නොමැත්තේය'' යන මේ අර්ථ ඇති **''අහෙතාහමස්මි ලොකස්ස-පජ්ජෙතාහමස්මි ලොකස්ස සෙට්ඨොහමස්මි ලොකස්ස-අයමන්තිමා ජාති-නත්ථිදානි පුනබ්භවෝ'** යනාදි සිංහලු සඳළුයන්ගේ චාරිත්‍ර ධර්මයවූ අතීත සිංහනාද **පැවැත්වූසේක.** යම්කලෙක අප මහ බෝසතාණෝ **ලුම්බිනි** නම් වනොද්‍යානයෙහි උපන්සේක්ද, ඒ දිනයෙහිම **රාහුල** මාතෘවූ **යසොධරා**දෙවිය, **ඡන්න**නම් අමාත්‍ය යෝය, **කන්ථක** නම් තුරඟ රාජයාය, **බොධිවෘක්ෂය, සතර මහා නිධානය** යන මේ සියල්ලම පහළවූවාහුය. මෙසේ ඒ දෙව බ්‍රහ්ම යන්ගෙන් ප්‍රමාණාතික්‍රාන්ත පූජාසත්කාර ලැබූ ඒ මහසත්වතාණන් වහන්සේ විසින් පවත්වනුලැබූ අතීත සිංහ නාදයෙන් **ඉක්ඛාකී, ශාක්‍ය, කොලිය** යන උභය නගරවාසී නැදෑ සමූහයා එක්ව අපමණ පූජා පෙළහර පවත්වමින් **සුඛොදන** මහ රජ හුගේ **කිඹුල්වත්** පුරයට වැඩමවාගෙණ ගියේය.

බොධිසත්වයන් කාලදෙවල ඍෂීන්ට දැක්වීම.

සුඛොදන රජහුගේ පියාණන් **සිහහනු** නම් රජහුගේ අග්‍ර පුරෝහිතවූ **කාලදෙවල** නම් අමාත්‍යතෙමේ, **සුඛොදන** රජ්ජුගේ බාල්‍යයෙහිදී ශිල්ප ඉගැන්වූසේක. පසුව පියරජහු ඇවැමෙන් සුඛොදනරජ සිංහාසනාරූඪවූකල, කාලදෙවල අමාත්‍යතෙමේ හිහිඟෙයින් නික්ම තපස්කිරීම පිණිස යාමට සුඛොදන රජ ගෙන් අවසර ඉල්වීය. එකල සුඛොදන රජතෙම කියනුයේ; එසේ වීනම් ආචාර්‍යයෙනි! මාගේ පියාණන්වහන්සේත් නැත, ගුරුවූ නුඹවහන්සේත් මා අත්හැර ගියහොත් මට වන්නේ මහත් අනතුරුයෙක; එබැවින් මාගේ මේ උයනේම වැඩහිඳ තපස් කරමින් නිරන්තරයෙන් මාගේ ගෙට වැඩ භොජන වැළඳුව මැනව''යි කිහ එකල හේතෙමේ එසේම කෙරෙමැයි රජහට ප්‍රතිඥා දී හොස් තාපස වෙශධාරීව එම උයනෙහිම වාසයකොට භාවනාකරන්නාහු, නොබෝ දිනකින් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ඉපදවූසේක.

මෙසේ ඒ තපස්විතෙමේ දිවාභාගයෙහි රජගෙට ගොස් භොජනානුභවකොට රාත්‍රිභාගයෙහි එම උයනේ වැස, ඇතැම් දවසෙක දිවාවිහාරය සඳහා ශක්‍රයාගේ **හාසඳනොද්‍යානයෙහි** වාසයකෙරෙයි. ලොකයෙහි බුඩ්ඛුරයෙකුගේ ප්‍රතිසන්ධි උත්පත්ති ආදිවූ දෙතිස් පූර්වනිමිත්ති පහළවන්නාවූ මහා මඞ්ගල්‍ය කාලයෙහි ලොව වසන සකල ඍෂීන්ම ධ්‍යාන සුවයෙන් විසීම එක්තරා අද්භූතවූ ධර්මයක් සෙයින්, ගෞතම බුඩ්ඛුරයානන් බිහිවූ එදින යළොකත කාලදෙවලනම් තාපසයාණෝ සුඛොදන

Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

රජමැදුරේදී ආහාර වළඳා ඉක්බිති දිවාවිහාරය සඳහා ශක්‍රභවන යට ඔහොස්, සක්දෙව්රජුගේ නන්දනොද්‍යානයෙහි දිව්‍යප්‍රාසාදයෙක දිවයහනක් මතුයෙහි දහන් සුවසෙන් උන්නාහ.

එදවස් තව්තිසා වැසි දෙවසමූහයා, කපිලවස්තු පුරයෙහි සුඩොදන මහරජහට පුත්රුවනෙක් උපන, ඒ උතුමාණෝ බෝමැඩ වජ්‍රාසනාරූඪව වැඩහිඳ පස්මරුන් දිනා ලොව්තුරා බුදුවන්නාහයි, තුටුපහටු සිත් ඇතිව, ඔවුනොවුන් අත්වැල්බැඳ නටමින් ගයමින්, නදුසුගන් ආදියෙහි ඇවිදිමින් මහත්වූ උත්සවයෙන් ක්‍රීඩාකරන්ට වන්හ එකල කාලදෙවල තාපස යානෝ, උත්සවකරන්නාවූ ඒ දේවසමූහයා දැක, මෙවැනි උත්සව ක්‍රීඩාවෙක් නොපව අනික් කලෙක නුදුටු විරිමි එම්බා දෙවතා වෙනි! නොපගේ ශක්‍රදෙවෙන්ද්‍රයා තවත් ශක්‍රසම්පතක් ලද්දේද? තවත් අඩුතුන්කෙළක් දෙවඟනන් ලැබපිද ? මෙසේ සතුටු සිත් ඇතිව කුමක් පිණිස කෙළෙද? මවත් මේ කරුණ නොවළහා කියවයි විවාළහ. එසද දෙවියෝ කියන්නාහු, පින්වත්වූ තාපසයෙනි ! සුඩොදන මහරජුහට පුත්රුවනෙක් උපන, ඒ කුමාරොත්තම තෙමේ පන්තිස් අවුරුද්දකින් ලොවුතුරා බුඩබව යට පැමිණ ධම්මචක්‍රය පවත්වයි, ඒ කාලය අපගේ මේ දිව්‍ය ගණනාවෙන් එක්විසි පැයෙකා, එසේ හෙයින් ඒ උතුමාන්ගේ අප්‍රමාණවූ බුඩශ්‍රිය දක්නවද ධම්මශ්‍රවණය කිරිමටද ලබම්හ, මේ කාරණයෙන් සතුටු උත්සව කරම්හයි කීවාහුය.

එසද කාලදෙවල තපස්වීතෙමේ, දිව්‍ය සමූහයා කී එපවත් අසා වහා වහා දෙව්ලොවින් බැස සුඩොදන මහරජානන්ගේ මාලිගාවට ප්‍රවිෂ්ටව, පණවනලද ආසනයෙහි වැඩඋන්නේය; එකල මහරජ අවුත් ඍෂිවරයන් නමස්කාරකොට එකත්පස්ව සිටි කල්හි, කාලදෙවල ඍෂිතෙමේ, "මහරජ තොපගේ අග්‍රමහෙෂි කාතොමෝ පුත්රුවනක් ලද්දීයයි ඇසිම්, ඒ කුමරුන් දක්නා කැමැත්තම්හ"යි කීය. එකල්හි පිය මහරජතෙමේ කුමරපළඳනා වෙන් සරහනලද පුත්කුමරුවන් වඩාගෙණ, "පුත! තාපස සවාමීන් වැඳ පින්රැස්කරගණුව"යි කියමින්, තාපසයන් දිශාවට පැලූහ. එකෙණෙහි බෝසතානන් දෙපතුල් දෙක පෙරළී ඍෂිහුගේ ජටා මතුයෙහි, මෙඝකූටයකින් නික්මුණු විදුලියසුන් දෙකක්සේ විරාජමානවී. බුදුවන මේ ආතමභාවයේදී බෝසතානන්හෙන් වැදුම් ගතයුතු කිසිවෙක් මුලු තුන්ලොවම නැත, ඉදින් නොදැන වත් බෝසතානන්ගේ හිස ඍෂිහුගේ පාමුල නැබුවා නම්, ඒ ඔහුගේ හිස සත්කඩක්ව පැළීයෙයි; එහෙයින් තපස්වීද "මා නොනැසුව මැනව" යි කියමින් හුනස්නෙන් බැස දෙහොත් මුදුන්දී බෝසතානන් වැන්දහ. එකල මහරජතෙම සිතනුයේ:-

'මේ කෙසේවූ විසමයෙක්ද? ශක්‍ර බ්‍රහ්මාදීහු නුමුත් මේ රුසිවරන් දැක නොවැඳ සිටිය නොහෙති. ඓබදු මහානුභාවසම්පන්නා සෘෂිහුගෙන්පවා මේ කුමරු වැඳුම් ගත්තේය" යි ආශ්චර්‍යීමත්ව ප්‍රේමය දරාගතනොහී තම පුතනුවන් සිරිපතුල් සුන් දෙක නලළත තබාගෙණ වැන්දේය. පසුව ඒ කාලදේවල තාපස තෙමේ බෝධිසත්ත්වයන්ගේ සිරුරෙහි පිහිටි මහපුරිස්ලකුණු දැක, මෙතුමාට බුඩබව සිඩවේදෝ නොවේදෝහෝයි දිවැසින් බලනුයේ, ඒකාන්තයෙන් බුදුවන බැව් දැක, සතුටුව සිතා පහළ කෙළේය. ඉක්බිති මේ උතුමානන් බුදුවූකල මා ඇස දක්නට ලැබේද නොලැබේදැ යි පරීක්ෂාකරන්නාහු බෝසතානන් බුඩබව ලැබීමට පළමු තමන් කා ලක්‍රියාකොට බුදුවරගන් සියක්දහසක් විසිනුදු නිවන් අවබොධකර, සසරින් මුදලිය නොහෙන අරූප භවයෙහි උපදනාබැව් දැක මෙබඳුවූ ආශ්චර්‍යීමත්වූ උතුමානන් බුදුවූකල දකිනු නොලබමියි බුන් පැන් කළයකින් වැගිරෙන දිය පරිද්දෙන් කදුලු ධාරා වහුරවමින් මහත්සේ හඬන්ට වන්හ මේබව දුටු ඇමතියෝ සහ එහි රැස්වූ අවශෙෂ මනුෂ්‍යයෝද, සෘෂිහුගේ සිනාසීම සහ එකෙණෙහි ඇඬීමත් දැක, මේ කිමෙක්ද? බෝසත්කුමරුවන්ට මතු උපද්‍රවයක් වන නියා දෝහෝයි සැක සිත් ඇතිව සෘෂිහුගෙන් විචාරන්නාහු, කිමෙක්ද සවාමීනී? ඔබ දැන් මහත්කොට සිනාසී කෙළවර වැළපෙන්ට වන්හුය, අපගේ මේ කුමාරෙත්තමයානන්ට කිසි යම් අනතුරුයෙක් ඇත්තේදැයි විචාළාහුය. මෙපවත් ඇසූ සෘෂිවරතෙමේ කියනුයේ:-"මේ කුමරුවාට වන අනතුරුයෙක් නැත, මොහුගේ ශරීරයෙහි පිහිටි තුන්සිය අවවිස්සක් මහල් ලකුණු දැක, එකාන්තයෙන් මේ මහොත්තමයානෝ මේ ආත්මභාවයේදීම බුදුවෙත්ය" යි සතුටින් සිටිමි, එසේම මේ උතුමානන්ගේ බුඩශ්‍රී දක්නට නොලැබ, අතරෙහි මාගේ කාලක්‍රියාව සිඩවන හෙයින් වැළපීමි යි කිය. මෙසේ කියා රජහෙන් නික්ම සිතන්නාහු, මම මේ කුමරුවාගේ බුඩ ශ්‍රී දක්ක නොහෙමි, මාගේ නැයන් අතුරෙහි බුදුසිරි දක්නට පොහොසත් කිසිවෙක් ඇද්දෝහෝයි පරීක්ෂාකරන්නාහු බැණ නුවන් වන නාලක නම් කුමරුවා දැක, එකෙණෙහිම එම නුවර වසන තමන් නැගණියන්ගේ ගෙට ගොස් පැණවූ අස්නක හිඳ, නැගණියෙනි, තොප පුතු වහා ගෙණවයි කියා, බැණ නුවන් කැඳවා කියන්නාහු, දරුවෙනි, සුදවුන් මහරජානන්ට පුත්‍රයෙක් උපන, ඔහු බුඩාඩකුරයෙකි, ඔහු පන්තිස් අවුරුද්දක් අතික්‍රාන්ත වූකල ලොව්තුරුබුදුවෙති. මුලුලෝ සතුන් දුකින් මුදවති, මාගේ ආයුකාලය මදහෙයින් එතුමාගේ බුදුසිරි දක්ක නොහෙමි. තොපට ඒ බුදුන් දක්නට ලැබෙන්නේය, එබැවින් වහාම ගිහිගෙන් නික්ම ඒ තුමා නමින් පැවිදිව ඒ තුමාගේ බුඩශ්‍රීය නරඹා සසරින් ගැලවී ගණුවයි කියා අනුශාසනාකොට ගියාහුය.

එබස් ඇසූ නාලක කුමරුතෙමේ, මසිල් තපසුන්ගේ බස් අසා "එකානතයෙන් මාගේ මසිලණුවෝ මා අනපේක්ෂා නොයෙදති, මාගේ අභිවෘඩියක් පිණිසම කියේවනා" යි සිතා වීථිසව යවා කාසාය වස්ත්‍ර සහ මැටි පාත්‍රයක් ගෙන්වා ගෙණ හිසකේ රැවුල් බහා, බෝසතානන් දිසාවට අභිමුඛකොට ඇදිලි බැඳ පසඟ පිහිටුවා වැඳ, "ලොකයෙහි යම් පුද්ගලයෙක් උත්තම විනම් මාගේ පැවිදිවීම ඒතුමා උදෙසාය" යි කියා සතාසූ කෙළක් ධන ඇති කුලෙහි බ්‍රාහ්මණ සාරසැපත් හැරපියා පැවිදිව කිමාල වනයට වැද තපස් කරන්ව වනි.

නාමකරණ මඞ්ගල්‍යය හා බ්‍රාහ්මණයන්ගෙන් පුණ්‍යලක්ෂණ පිළිවිසීම.

සුඛොදන මහරජතෙමේ බෝසතානන් උපන් පස් දවසින් නම් තබන මඟුල්දිනයෙහි කුමරුවන් සුවඳදියෙන් නහවා මලින් සරසා, රාජභවනයද සදුන්, කපුරු, කොකුම්, තුවරලා යන සිව්දෑ ගඳින් පිරිබඳගන්වා වතුවේදයෙහි නිපුණවූ බ්‍රාහ්මණයන් අටොරාසියක් ගෙන්වා පණවනලද අසුන්වල හිඳුවා පැන් නොවකා පිසූ කිරිබත් රන්තැලි සමග දන්දී මහත් සත්කාර කොට, බ්‍රාහ්මණයෙනි! මාගේ පුත්‍රවූ මේ කුමාරයන්ගේ පුණ්‍යලක්ෂණ බලා සුදුසු නමක් තබා මතු සිදුවනා දේද තක්වූපරිද්දේන් කියව් යයි නියොග කෙළේය. ඔවුන් අතුරෙන් රාමණ, ධජණ, ලක්ෂණණ, ඔනාතණ, කොණ්ඩඤ්ඤය, භෝජණ, සුයාමණ, සුදත්තණ යන මේ ප්‍රධාන බ්‍රාහ්මණයන් අටදෙනා කෙරෙන් වැඩිමහලු සත්දෙන ඇඟිලි දෙකක් ඔසවා කියන්නාහු, දෙවයන්වහන්ස, සතුටුවුව මැනව, යමෙකුගේ කුලයක මෙවැනි පුත්‍රරත්නයක් පහළ විනම් ඔවුන්වවූයේ මහත් ලාභයෙක, දෙවයන්වහන්ස, මේ ලදරුතෙම දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් සමන්විතය; එහෙයින් මේ කුමාරයන්ට දෙගතියක් වන්නේය, ඉදින් මේ කුමරු ගිහිගෙයි විසුයේනම් කොදෙව් දෙදහසක් පිරිවරකොට ඇති සතරමහා ද්වීපයට අධිපතිවූ චක්‍රවර්තිරජව අහසින් ඇවිද ලොකයාට අනුශාසනාකරමින් රජසිරි විඳිනේය; ඉදින් ගිහිගේ හැර පැවිදිවූයේනම් රාග, ද්වේෂ, මෝහ, මාන දෘෂ්ටි ආදි ආවරණයන් අනාවරණයකොට ලොවුතුරා බුබරාජ්‍යයට පැමිණ දිව්‍ය බ්‍රහ්මාදී සියල්ලන්ගෙන් වැඳුම්ගන්නා තරම් පින් ඇතිසේකැයි කිවාහුය.

මෙසේ ඔවුන් දෙගතියක් ප්‍රකාශකළ කල්හි, ඒ කැමදෙනාට වයසින් බාලවූ කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණවාර්‍යතෙම බොධිසත්වයන්ගේ පුණ්‍ය ලක්ෂණයන් යහපත් ශාස්ත්‍රඥතයෙන් බලනුයේ:-අරුණුවන්වූ ගගනතලයෙහි බබලන ඔෂධිතාරකාව

මේන් දක්ෂිණාවාහනව පිහිටියාවූ උණ්ණී රොම්ධාතුහුගේ ශ්වේත වර්ණනියාව දැක චක්‍රවර්ත්තීවේනම් මේ රොමය සවර්ණතිලක යක්සේ රත්නවර්ණ ඇතිවෙයි, බුදුවන මහතානන්ට වූකලී මකුල තිලකයක්සේ සුදුපැහැ ඇතිවේයයි දැන, මෙබදු උත්තම යන් හිඳිගෙයි විසීමෙක් නම් නැත, එකාන්තයෙන් මුන්වහන්සේ බුදුවන්නේමයයි සපිරකොට එක ඇඟිල්ලක් ඔසවා එකක්ම කීයේය. මෙසේද කියා උන්වහන්සේට නම් තබන්නාහු, මේ කුමරු මතු ලොවට අර්ථ සිද්ධකෙරෙයි, එහෙයින් සිද්ධාර්ථ කුමාර යයි නම් තැබුවාහුය.

තවද මේ කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණතෙම කප් ලක්ෂයක් මුලුල්ලෙහි කෘතාධිකාර ඇත්තාවූ පශ්චිමභවිකවූ සත්වයෙක, එහෙයින් ඉතිරිවුන් සත්දෙනා මැඩපවත්වා සැකනැතිවම බුදුවන්නේයයි එකඟිල්ලක් ඔසවා කීයේය. ඉක්බිති ඉතිරි සත්දෙනා වනාහි තම තමන්ගේ නිවාසස්ථානවලට පැමිණ තම පුත්‍රයන්ට කථාකොට,''දරුවෙනී! අපි ඉතාමහල්ලම්හ, සුද්ධෝදන මහරජානන්ගේ පුත්‍රවූ සිද්ධාර්ථ කුමාර තෙමේ මෙයින් පන්තිස් අවුරුද්දක් ගිය කල බෝමැඩ විජ්‍රාසනාරූඪව බුදුබවට පැමිණෙති. උන්වහන්සේකරා පැමිණෙන්ට ලබමෝද නොලබමෝ දැයි නොදනුම්හ; එහෙයින් තෙපි ඒ කුමාරයන් බුදුවූකල්හි උන්වහන්සේගේ ශාසනයෙහි පැවිදිව සසරදුකින් මිදෙව්යයි කියා ඒබ්‍රාහ්මණයෝ සත්දෙනම ආයුකෙළවර කම්වූ පරිද්දෙන් මිය පරලෝ ගියාහ. තරුණ වයස්වූ කොණ්ඩඤ්ඤ නම් මාණවකයෝ තමන් නිරොගිභෙයින් ගිහිගේ හැරපියා තාපස වෙශ ධාරිව දඹදිව ඇවිදිනාහු උරුවෙල් නම් දනව්වට පැමිණ මේ භූම්ප්‍රදෙශය තපස්වීන්ට රම්‍යයයි එහි මහත් වීර්‍ය්‍ය වඩමින් සිද්ධාර්ථ කුමාරශ්‍රාවන් මහාභිනිෂ්ක්‍රමණය කරණ කල් දක්වා මෙතන වෙසෙම්හි සිතා එහිම වාසඅකළාහුය.

ඉක්බිත්තෙන් මහා පුරුෂයානෝ පැවිදිවූහයි අසා කොණ්ඩඤ්ඤ නම් මාණවකතෙමේ යටොකන මහලු බමුණන් සත්දෙනාගේ පුත්‍රයන් කරා ගොස් ඒ සිද්ධාර්ථකුමාරයෝ පැවිදි වූහ. හේතෙම එකාන්තයෙන්ම බුදුවන්නේය; ඉදින් තොපගේ පියබමුණෝ ජීවත්ව සිටියාහු වීනම් බෝසතුන් හා සමඟ ගොස් අදම මහණවෙති. ඉදින් තොපිත් කැමැත්තාහුනම් මා හා කැටුව එව, මම් ඒ මහා පුරුෂයාන්ට අනුව පැවිදිවෙමි'' යි කීය. ඒ ඇසූ බමුණු දරුවෝ එක්සිත්වන්නට අසමර්ථවූහ. එහෙයින් තුන්දෙනෙක් පැවිදිනුවූහ. කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණතෙම ජ්‍යෙෂ්ඨකොට භද්දිය, වප්පය, මහානාම්ය, අස්සජිය, යන සතර දෙනම පැවිදිව උරුවෙල් දනව්වෙහි වසුවාහුය; ඒ පස්දෙන වනාහි පඤ්චවග්ගියය නියුතුහුනම් වෙති.



Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa, Press. Colombo.*

එදවස් වනාහි මහ බෝසතාණන්ව නමිතබන මහුල් පිණිස එතැන්හි රැස්වූ අසූ දහසක් ඤාති රජදරුවෝ මුන්වහන්සේව අප හැමගෙන් එක එක කුමරුවා බැගින් දෙම්හ, ඉදින් මේ සිඛාජී කුමාරයෝ මතු චක්‍රවර්ති රජවූහු නම් ක්ෂත්‍රිය කුමරුවන්ම පිරිවරා ඇවිද්ද මැනව, බුදුවූවහොත් ක්ෂත්‍රිය නිඝණ්ඨම පිරිවරා ඇවිද්ද මැනව, මේ දෙකාරණයෙන්ම අප දරුවන්ව අභිවාඩිවන්නේයයි කියා හැම රජුන්ගෙන්ම එක එක කුමරුවා බැගින් අසූදහසක් ශාක්‍ය කුමාරවරු පිරිවර පිණිස දුන්හ.

ඉක්බිති සුඛෝදන මහරජානෝ මපුතනුවන්ව කිරිමවුන් ගෙණෙවයි නියොගකොට ශාක්‍ය, කොලිය දෙනුවරින් රාජකුල සත්‍රීන් ගෙන්වා රූප සම්පන්නවූ විගතදෝෂවූ කිරිමවුන් තෝරන්නාහු:—ඉතා උස්වූ කිරිමවුන්ගෙන් කිරිබොන දරුවන් කර ඔසවා බොන හෙයින් ග්‍රීවා දික්වෙයි; ඉතා මිටිවූ සත්‍රීන්ගේ ඇකයෙහි හිඳ කිරිබොන දරුවන් කරතමා බොන හෙයින් ලුහුඬු කරවෙයි; ඉතා සථූලවූ සත්‍රීන්ගේ ඇකයෙහි වඩනා දරුවන් බකාල පාවෙයි; ඉතා දුර්බලවූ සත්‍රීන් වඩන දරුවන් කලවා සිහින්වෙයි; තනහුනු සත්‍රියගේ කිරිබොන දරුවන්ගේ නාසාපිට තනය වැදගන්නාහෙයින් අරමණ නාසාවෙයි; ඉතා ඵලලූ සත්‍රීන්ගේ කිරි හුණුහෙයින් හුණුකිරි බොන දරුවන් ඇඟ ලහුණ ඇතිවෙයි; ඉතා කැළිවූ (කළුපැහැ ඇති) සත්‍රීන්ගේ කිරි සිහිල්වන හෙයින් ඇල්කිරිබොන දරුවන්ගේ ඇඟ මස් පිපිහලුවෙයි, ක්‍රියා යථෝක්ත දෝෂයෙන් දුරුව ඉතා උසත් නොවන මිටිත් නොවන සථූලත් නොවන දුර්බලත් නොවන කැළිත් නොවන සිය ගණනක් කිරිමවුන් තෝරාගත්හ.

වප්මඟුල් දිනයෙහි දැක්වූ ප්‍රාතිහාර්‍යය.

මෙසේ ඒ සිඛාජීකුමාර තෙමේ මහත්වූ ශ්‍රී සෞභාග්‍යයෙන් තරු පිරිවැරූ සඳමඬලක්සේ දවසින් දවස වැඩෙන්නට වන්සේක. එක්දිනක සුඛෝදන මහ රජාණන්ගේ වප්මඟුල් කෙළියක් විය. එදවස් මූලුනුවර දෙවිනුවරක්සේ සරසා ඒරජ ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් සැරසී දිව්‍යසෙනාවක්බදු මහත් සෙනඟ පිරිවරා ප්‍රාසාදයෙන් නික්මෙන්නේ පුතනුවන් සිවිගෙයකින් වඩාගෙණ ගොස් සීසානා ක්ෂෙත්‍රාසන්නයෙහි ඉතාරමණීය වූ ඝණවූ ඡායාව ඇති අභිනව පත්‍රයෙන් ගැවසීගත් එක් දඹගසක් මූල සුදුවැලි අතුරවා ගහනක් පණවා වටතිර ජවනිකාදිය බන්දවා කුමාරයන් එහි සතප්වා කිරිමවුන් කුමාරයන්ව රැකවල්පිණිස සිටුවා සුදෙවුන් මහ රජානෝද ක්‍රීඩා පිණිස මඩයල්‍ය සම්මතවූ රන් නඟුලක්ද දහසක් ඇමතියන් විසින් රිදීනඟුල් දහසක්ද

කෙණ කෙෂත්‍රයව බැස සීසාන්ව පවන්ගත්හ. එදු වප්මහුලෙහි හැමදෙනම ශ්වෙත වස්ත්‍ර හැඳ සුවඳමලින් සැරසී කෙන්වත් පුරා සිටගත්හ. එසමයෙහි බෝසතුන් පිරිවරා හුන් ඝිරිමවිහුද රජහුගේ ශ්‍රී සම්පත් බලම්හඩි තිර තුලින් පිවත අවුත් බලමින් සිටියෝය. එකල ශ්‍රී මහා බෝධි සත්වයන්වහන්සේ ඔබමොබ බලා කිසිවෙක්හු නොදුක වහ වහා නැගිව ආනාපාන සමෘති කර්මස්ථානය භාවනාකොට ප්‍රථමධ්‍යාන උපදවා අහසට නැගී පලක්බැඳ දහන්සුවයෙන් වැඩහුන්සේක. එසමයෙහි සෙසු වෘක්ෂ ඡායාවෝද ඒ දඹරුක්ෂයෙහි ඡායාව පිරිවරා මණ්ඩලාකාරව සිටිගත්හ. නැවත කිරිමවිහුද ආයුෂ්මත්පුත්‍රයන් වහන්සේ හුදකලාව නොවේදැසි තිරවලින් ඇතුල්වූකල පලක්බැඳ ධ්‍යාන සුඛයෙන් වැඩහුන් බෝසතානන් දැක ඔවිහු වහ වහා පිය රජහු කරා දිවගොස් සැමිනිවහන්ස! මේ වප්මහුල තබා ඔබ පුතනුවන් සිඛාපිකුමාරයානන්ගේ ආශ්චර්‍යයක් [illegible] ඔනෑවහි කීය; එබස් ඇසූ රජතෙමේ වප්මහුල හැර [illegible] අවුත් ධර්මාසනයකහුන් මහ තෙරහොත්හුන් [illegible] ඔප්නැගූ සුවර්ණප්‍රතිමාවක් මෙන්ද පතුරුසම පත්තිබාබ [illegible] දසදික් නොබලා ඇසිපිය නොහෙලා [illegible] ධ්‍යානසුඛයෙන් වැඩහුන් පුත්‍රකුමාරයානන්ගේ ප්‍රාතිහාර්‍ය දැක ප්‍රේමය දරා නොහෙන්නේ සතුටු කදුලෙන් යුතුව "පුත සිඛාපිකුමාරයෙනි! මේ කෙසේවූ විස්මයෙක්ද? දැන්ම බුද්ධත්වයම් පැමිණියෙහිද? නුඹගේ මැනියෝ මහාමායාදේවී අද මේ සිටින්නාම් මේ පෙළහර දුටුවාවූ ඇ නුඹව ඇගේ පුත්‍රයය සුදුනොකරන්නී? මා එකලාවූ පියෙකුට මෙසේවූ සුරතල් [illegible] මේ මාගේ දෙවන වැදීමය" යනාදීන් කියා පිය මහරජානෝ පුතනුවන්ට නමස්කාර කළහ.

මෙසේ සත්හවුරුදු වයසේදී ඒ කුමරුතෙම ප්‍රාතිහාර්‍යය දැක්වීමෙන් පිය මහරජානන් ප්‍රමුඛකොට ඇති අනිකුදු සතුන් සමූහයාගේ සිත් පිණවා පෙරඹමස සඳසෙයින් දිනෙන් දින වැඩෙනසේක් සොළොස්හැවිරිදි වයසට පැමිණියේය. එකල්හි සුඛෝදන නරපතිතෙමේ නිමිත්තපාඨක බ්‍රාහ්මණාචාර්‍යයන් කැඳවා "මාගේ පුතනුවෝ කෙසේවූ පූර්වනිමිත්තක් දැක පැවිදි වෙද්දැ" යි විචාළේය. එකල බ්‍රාහ්මණයෝ කියන්නාහු මහරජාණන්වහන්ස! ප්‍රථම වාරයෙහි ජරාරූපයක්ද, දෙවන වාරයෙහි ගිලන් රූපයක්ද, තුන්වන වාරයෙහි මෘත රූපයක්ද, සතරවන වාරයෙහි ශ්‍රමණ රූපයක්ද දැක රාජ්‍යය හැර පැවිදිවෙතිසි කීහ,



Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo,*

මෙබස් ඇසූ සුදොවුන් මහරජ තෙමේ එසේනම් මෙතැන් පටන් ජරාවට පැමිණීයෙකු හෝ ව්‍යාධිගත නෙවත් ගිලන් අයෙකු හෝ මෘතශරීරයක් හෝ ශ්‍රමණ විලාසයක් හෝ මපුත නුවන් දක්නට අවකාශ නොදෙව; බුදුවීමෙන් කම්නැත, මම මපුතනුවන් දෙදහසක් නොදෙව් ලිරිවරසොරොවඇති සතර මහ වීපයට අධිපතිව චක්‍රවර්ත්තිරජ්ජව අහසින් ඇවිද අනුශාසනා කරණු දක්නා කැමැත්තම්හයි කියා ජරා ව්‍යාධි මෘත ප්‍රව්‍රජිත යන මොවුන්ගේ එනුවරට ඊම වළක්වනු පිණිස සිව් දිගින් ගව්වෙන් ගව්ව නුවර ආරක්ෂාකරවීය. තවද සිධාර්ත්තකුමාරයාණන්වහන්සේසොළොස්හැවිරිදි වයසට පැමිණිකල්හි සුධොදන රජ තෙමේ මපුතනුවන් කාමසම්පත්තියෙහි ගිජුකරවමැයි සිතා වස්සාන, හෙමන්ත, ගිම්හාන යන තුන් ඍතුවට සුදුසුවූ උස මහතින් එක සමවූ නවමහල් සත්මහල් පස්මහල් ඇති තුන් ප්‍රාසාදයක් කරවාදුන්හ.

ගිලන් දැක්වීම හා රාජ්‍යාභිෂෙක මඩගල්‍යය.

ඉක්බිති පියමහරජතෙමේ මෙසේ සිතුයේය:-"මපුතනුවන් රාජ්‍යාභිෂෙකයට පත්කොට රාජ්‍යශ්‍රී විඳිනා පරිදි දකිමි" යි පළමුව යසොධරා දෙවීන් පුතනුවන්ට අගමෙහෙසුන් කරණු කැමතිව උන්හේ පියවූ සුප්‍රබුධ මහීපාලයන්ට එපවත් කියා යැවූහ. එකල්හී සුප්‍රබුධ රජතෙමේ "ඔබගේ පුතනුවූ සිධාර්ත්ත කුමාරයෝ නොබෝකලකින් පැවිදිවෙන්ල, එකල්හි මා දියනිවූ යසොධරාදෙවිය වැන්දඹු වෙයි; පැවිදි නොවන රජෙකුටපාවා දෙමි" යි කියා යැවීය. බොධිසත්වයෝ එපවත් අසා, මහණත් වෙම්මය, යසොධරාවන් පාවානුදුනහොත් රාජ්‍යය මට නොකැ මැත්තම්හයි කියති. යසොධරා දෙවිද, සිධාර්ත්තකුමාරයෝ සෙට මහණවෙත් නුමුත් සරණෙක රැකෙම්නම් උන්කෙරේම රැකෙ මියි කියයි; සුධොදනරජ තෙමේ දෙදෙනාගේ එපවත් අසා තමන් ශාක්‍යවංශයට අධිපතිහෙයිනුත් නැහණියන්ගේ දියනි යන් හෙයිනුත් භිමිකම් බැණ ගිවිස්වා මහපෙරහරින් විවාහගුල් කොට, යසොධරාදෙවීන් හෙන්වා රුවන් රැසක් මතුයෙහි සිටුවා බොධිසත්වයන්ට අහමෙහෙසුන් කොට පාවාදී ත්‍රිසංඛ යෙන්ම අභිෂෙක ජලය වත්කොට දෙදෙනා එකවිටම ඔටුණු පළඳවා සියලු රාජ්‍යයම පාවාදුන්හ.

තවද ශාක්‍යයින්ට හසුන් යවන්නානු මාගේ පුත්‍රයා වයස් ප්‍රාප්තය. එහෙයින් මපුතනුවන්ට රාජ්‍යයදෙමි, සියල්ලෝම තම තමන්ගේ ගෘහයන්හි වයස් සම්පූර්ණ කුමාරිකාවරු අපගේ රජහෙව එවත්වයි හසුන් යැවූහ. එකල යථොක්ත හසුන් ලැබූ

ඤුති සමූහයා අතරෙහි මෙබඳු කථාවක් පහළවිය; හේකවරේද යත්? "සිඛාඊකුමාරයෝ සිව්මැලිවූවෝය, ලදරු වයසෙහි සිටියෝය, හේතෙමේ රූපම්දයෙන් මත්ව ක්‍රීඩාවෙන් කල්යවන්නේය, එකම ශිල්පයකුදු නොදන්නේය, එසේහෙයින් දරුභාරය කළනොහෙති; යුඩනක් පැමිණිකල්හි කෙසේ ජයගණිද්ද? අපගේ දරුවන් කෙසේ පොෂණය කෙරෙද්ද? එබැවින් නිඟශිලපි නැනැත්තන්ට අපගේ දියනිවරු පිරිවරකොට නොදෙම්හ" සි ගිවිසගත්හ. මෙපවත් ඇසූ සුබොදන මහිපාල තෙමේ, බොධිසත්වයන්ට ආමන්ත්‍රණයකොට පුත තොපගේ නැගෝ, සිඛාඊකුමාරයෝ කිසි ශිල්පයක් අභ්‍යාස නොකොට ක්‍රීඩාවෙන් දවස්යවන්නාහයි කියා උන්ගේ, දියනිවරු තොපට පිරිවරකොට නොදෙත්ල, එබැවින් මේ සඳහා කුමක් කටයුතු දැයි විචාළේය. එකල්හි සිඛාඊකුමාරයෝ කියන්නාහු, පියා ණන්වහන්ස? ගම්සේ වමපක සුමන මදුරුදිවූ සුගඛපුෂ්පයෝ අන්කිසි සුගඛ පුෂ්පයන් කරා ගොස් තමන්ට සුවඳ පිණිස අභ්‍යාස යෙක් නොකෙරෙද්ද? එසේම මේ ආතමභාවයේදී මාගේ ශිල්ප අභ්‍යාසයක් පිණිස අන්කිසිවක්හුකරා ගොස් අභ්‍යාසකරණ ශිල්පයෙක් නැත; එබැවින් මාගේ ශිල්ප බැලියැටියෝ මෙයින් සත්වන දවසෙහි රැස්වෙත්ව" සි නුවර බෙරහසුරුවා වදුලමැන වසි කිහ. ඉක්බිති රාජාඛහනයෙහි මණඩපයක් තනවා සත් වෙනි දින, සිඛාඊකුමාරයානෝ මහසෙනඟ පිරිවරා එක්ලක්ෂ සැටදහසක් නැ රජුන් මඛ්‍යයෙහි අක්ෂණවෙධි, වාලවෙධි, ශබ්ද වෙධි, ශරවෙධි, ධනුර්ධරයන් ඉදිරියේදී දහසක් පුරුෂයන් විසින් නගාලියයුතු සන්දහසකින් යුකතවූ, "සඟ්‍රහ්ණාම" නම් මැඩඟු දුන්න ගෙණ නුවර මැද පඨ්‍යිඛකයෙහි වැඩහිඳ ධනුශිල්පයන් දක්වන්නාහු, එම දුන්නෙහි ඝටපිලාව වම්පය මහපට ඇඟිල්ලෙහි නියපිව තබා තමන් උන්පලින් නොසෙල්වී දුන්න නඟා දුනුදිය පෙලූහ. එහි සොඟාව "දඹදිව" දෙර දෙර ඇසූ සෙන හඬක්සේ පැතිර ගියේය. ශිල්ප බලම්හයි රැස්වූ නැ සමූහයා මේ ආශ්චය්‍යීය දැක මහත්සේ සාධුකාරනාද පවත්වන්ට වනි. තවද අක්ෂණවෙධිය, වාලවෙධිය, ශබ්දවෙධිය, ශරවෙධිය ඇත ධනුර්ධරයෝ සතරදෙනෙක් සතරදිඟ හිඳුවා, එකෙකුට තිස්දහස බැගින් එක්ලක්ෂ විසිදහසක් ගිඟස් දෙවා මහබෝසතානෝ වීදුරු එබූ නාරුවයක් අතින්ගෙණ ඔවුන් මැද හිඳ ධනුර්ධර වරුනි! තෙපි ඇම මා එකවිටම විද්දමැනවයි කීසේක. එබසට දුනුවායෝ කියන්නාහු, "දෙවයෙනි! ඔබවහන්සේ වනාහි මතු ලොවට බොහෝ වැඩ ඇති උතුමෙක, ඉතා තරුණයෝය, එසේහෙයින් අපි නොවිදුම්හ" සි කිහ. සිඛාඊකුමාරයෝ එබස් අසා ධනුර්ධරවරුනි, තෙපි මාගේ ව්‍යක්තකම් නොදනිති, තෙපි



Printed & Published by **K. D. PERERA, & SON** *Vidyadarsa Press, Colombo.*

ණතාපගේ ඇතිතාක් සමඵකමින් මා එකවිටම විදහෙලුව මැනව, මම ගේ වැද්දනොදෙමියි කියා නාරුවය නියපිට ලෙල වමින් අසුරහවගෙකුසේ ඉඳ ධනුර්ධරයන් සතරදෙන විදි ශර සතර නාරුවගෙන් රැක පියා පගිලිඉගෙන් පගිලිය නොවරදවා සතරමූනත් ඔවුන් දිශාවට යොමුකොට බැලූසේක. මෙම ක්‍රමඉගෙන් ධනුර්ධරයන් ඝණඝණයෙහි විදි ශරයන් නාරුවඉගෙන් රැකහෙළීමෙන් එක්ලක්ෂවිසිදහසක් පමණ හැමතිගස්ම නිමාවට ගියහ; තවද නැවතත් ධනුර්ධරයින් සතරදෙනා සතරදිග සිටුවා ඊමැද හිඳ, "ධනුර්ධරවරුනි, තෙපි තිස්දහසක් තිස් දහසක් බැගින් තිගස්විද මා හෙළන්නට අසමර්ථවූහ; මම වනාහි එකම තිගසින් තෙපි සතරදෙනම විදහෙළුම්"යි කීසේක. එසඳ භයපත්වූ දුනුවායෝ කියන්නාහු, "සවාමීනි! අප නොවිදුව මැනව, සිටින්නව අසමර්ථයම්හ"යි කීහ. එවිට මහබෝසතාණෝ කෙනෙල්කඳ සතරක් සතරදිග හිඳුවා තිගසක් ඉණ පගිලියෙහි රත්තූගයක් බැඳපියා කෙහෙල්කඳකට විදපූහ; කෙහෙල්කඳ සතර විදගණ ආපසු හසතලයටම තිගස ආයේය; පිරිත්හුගයක් ඇද්දක්මෙන් නූල්හුග පෙණිගියේය. මෙසේ ශරපවුරුය, ශරතොරණය, ශරප්‍රාකාරණීය, ශරප්‍රාසාදය, ශරරූනය, අක්ෂණවෙධිය, ශබ්දවෙධිය, වාලවෙධිය, ශරවෙධිය, ගනාදි ආශ්චර්‍යමත් නොයෙක් ධනුශිල්ප දක්වා තද්ඉන්නාරව මහා පුරුෂයාණෝ, අද මාගේ බලපරාක්‍රම සහ ගුරුකෙනෙකුන් ගෙන් නොඉගෙණ නොයෙක් ආකාර ශාස්ත්‍ර මම දන්නාපරිදි නැගන්ට ප්‍රකාශකරමැයි සිතා, ශ්‍රැතිය, සමෘතිය, ව්‍යාකරණය, ඡන්දෝලක්ෂණය, ශබ්දඋච්ය, නක්ෂත්‍රය, ශික්ෂාය ගනාදි අෂ්ටාදශ ශිල්ප දක්වා, තමන් විශෙෂගෙන්ම ශිල්පී පරිදි භගවන්නාහු, අක්ෂරය, ලිඛිතය, ගණිතය, මිණිතය, ගාන්ධර්ය, තර්කය, ව්‍යාකරණය, නිඝණ්ඩුය, අලඞ්කාරය, මන්ත්‍රය, තන්ත්‍රය, ගන්ත්‍රය, ගනාදි කලා ශිල්පගන්ද දක්වූහ.

එකල මේ ආශ්චර්‍යමත්වූ ශිල්පදර්ශනයෙන් සතුටුවූ ඥති සමූහයා බොධිසත්වගන් හොරෙහි සැක දුරුකොට තමතමන්ගේ දියනිවරු සවිලඞ්කාරගෙන් සරහා සතළිස් දහසක් කුමරිගන් යසොධරා අග්‍රමහෙසිකාවට පිරිවර වශගෙන් පාවාදුන්හ.

කාමසුඛානුභවය හා සතර පුර්‍වනිමිති දැකීම.
නිබ්බුනපද ඇසීම.

නව ද සියලු කරුණාවට නිධානවූ අප මහබෝසතාණෝ, ශක්‍රදෙවේන්ද්‍රලීලාවෙන් යසොධරාදෙවීන් ප්‍රධානකොට ඇති සත ළිස්දහසක් නාට්‍යාඞ්ගනාවන් පිරිවරා ඒ ඒ ඍතුවට සැපවූ පරිද්දෙන් මාණික්‍යාභරණාලංකාරයෙන් දිලිසෙන්නාවූ සියලු දිව්‍ය මනුෂ්‍ය

භවනයන්හි ශ්‍රී ශොභා රැස්වූ තැන් බදුවූ පියරජහු කරවා දුන් රමණිය, සුරම්‍යය, සුභග යන නම් ඇති ප්‍රාසාදත්‍රයෙහි සුවඳතන්බදු වරඟතන්ගේ මදහස්ලස් බැල්මෙන් පිණ පිණා මහත්වූ රාජ්‍ය ශ්‍රී සම්පත් විඳිනාසේක. මෙසේ කාමභොගීව වසනා ඒ මහාපුරුෂයානෝ එක්දිනක උයන්කෙළියට යනු කැමතිව රථාචාර්‍යයා කැඳවා මඟුල්රථය සරසාලවයි විධානකළහ. ඔහු තුමූ මැනවයි පිළිගෙණ සියලු රථාලඞ්කාරයෙන් සරසාලද දිව්‍යරථාකාරවූ මඞ්ගල්‍යරථය ගෙණ, ඊට කුමුදපත්‍ර වණීණවූ මඟුලසුන් සිව් දෙනෙකු යොදා සිඛාමීකුමාරයානන්ට දුන්වූහ. එකල උන්වහන්සේද දිව්‍යරථයක් බඳුවූ යථොක්තරථයට නැඟී උද්‍යානභූමියට යන්නේ තුවර මහජනියට වන්කල, දෙවතාවෝ "සිද්ධත්ත කුමරුගේ බුදුවීමට කල් ආසන්නවිය, එහෙයින් තපසට කාරණාවූ පූර්ව නිමිති දක්වමිහ"යි එක් දිව්‍යපුත්‍රයෙක් ජරාවෙස් ගන්වා, කඩ දත් ඇතිව, පැසිගිය හිසකේ ඇතිව, රැලිවැටුනු වක්වූ ශරීර ඇතිව, ලැව්ගින්නෙන් විඳලනලද රුකක් වැනිවූ ජරායෙන් දුඳුරුවූ සිරුර ඇතිව, සැරයටියක් අතින්ගෙණ වෙවුල වෙවුලා යන ලීලා වක් දක්වූහ. මේ විරූප වේශය දුටු මහාපුරුෂයානෝ රථාචාර්‍යයාට කථාකොට, සඛද රථාචාරිය! මේ පුරුෂතෙම අවශේෂ අයමෙන් හිසකේද ඇත්තේ නොවෙයි, ශරීරයද අන්‍යයන්ගේ මෙන් පැහැපත් ඇත්තේද නොවෙයි, එබැවින් මේ කෙසේවූ රූපයක්දැයි විචාළේය. සවාමිනි! යෞවන අවස්ථාව ඉක්මී දිරිම් සඞ්ඛ්‍යාත ජරාවට පත්වූ වෘද්ධ මනුෂ්‍යයෙකැයි කී කල්හි, මෙවැන්නෝ තවත් ලොව ඇද්දැයි විචාළවිට, එසේය සවාමිනි! මෙවැන්නෝ ඉතා සුලභය, මෙය සියලු සතුන්ට පැමිණෙන සභාව ධර්මයකැයි, දෙවානුභාවයෙන් රථාචාර්‍යතෙම සැළකෙළේය. ඉක්බිති බෝසතානෝ, පින්වත් රථාචාරිනි! මේ මිනිස්කය වනාහි මෙසේ එකාන්තයෙන් විරූපව ජරාපත්වන සභාව ඇත්තේයයි අනිත්‍යලක්ෂණ සලකා, මෙවැනි ජරාවක් ඇති මට උයන් කෙළියෙන් කවර ප්‍රයෝජනයක්ද? එහෙයින් උත්පතනියට නිදුවේවයි යනාදීන් කියා තළකිරුණු හදයෙන් යුක්තාව ආපසු පෙරළා අවුත් සවකීය ප්‍රාසාදයටම වන්හ. ඉක්බිති පියමහ රජානෝ, "කුමක් නිසා මපුතනුවෝ උයන්කෙළි පිණිස නොගොස් ආපසු පෙරලා ආයේදැ"යි විචාරා, ජරාවක්දැක ආබැව් අසා, එබදු රූවක් දැක මහණවන බැව් ලක්ෂණ පාඨකයන්ගෙන් ඇසීම්, කොළු මා නොනසව්! වහා මපුතනුවන් ක්‍රීඩාවෙන් සතුටු කරවා පැවිදිවීමෙහි අධ්‍යාශය දුරීභූතකරවයි නියොගකොට නාවක සත්‍රින් යොදවා, මෙවැනි ජරා ජීර්ණ ශරීර ඇත්තෝ මෙනුවරට නො එළඹෙත්වයි කියා, නුවර සිව්දිගින් අඩයොදුන් පමණතැන රැකවල් ලැවූහ. අමරගණයා විසිනුදු ප්‍රාර්ථනීයවූ

අනඹයාගේ හස්තාභාර සවරූපවූ, ධෛර්‍යය, ප්‍රඥා, වීර්‍යාදීවූ ගුණ සමූහ ආමැති උත්තම රත්නසමූහයට උපද්‍රවකරවූ, මානය, මදය, ප්‍රමාදය ආදී අනන්තප්‍රකාර දෝෂ ශතසහස්‍රයන්ට සහායවූ, අඥානයන්ගේ මූලාවීමට ආසන්න කාරණාවූ ලොකයාහට මාර නමැති වැද්දු විසින් මනාකොට මානා තබනලද පාශබඳු පඤ්ච කාම ගුණයෙන් සන්තර්පිතවූයේ සාරමසක් අතික්‍රාන්තවූකල නැවතත් එක්දිනක පෙරසේම උද්‍යානභූමිභාග පිණිස යන්නාහු, එසේම දෙවියන් විසින් නිර්මිතකොට දක්වනලද පඤ්චකාම රතිය නැසීමට හෙතුවන කුෂ්ඨරෝගාතුරවූ මහසැලක් වැනි උදරයක් ඇති, බරවා පා ඇති, ව්‍යාධීන් පෙළෙන පුරුෂයක්හු සෙමෙන් සෙමෙන් එන්නාහු දැක, පෙර පරිද්දෙන්ම රථාවාහනීයා විචාරා, රොගීවූ පුරුෂයෙක් බැවී දැන කළකිරී ආරෝග්‍ය මදය පහකොට ආපසු පෙරළා අවුත් සියනුවරටම වන්හ.

එපවත් ඇසූ මහිපාලතෙමේ මහත්වූ සංවේගයට පැමිණ නුවර භාත්පස තුන්ගව්වක් පමණතැන් ආරක්ෂා තැබ්බවීය. නැවතත් එක්දිනක උයන්කෙළි පිණිස යන්නාහු, නුවර මහා වීථියෙහි පෙරසේම දෙවියන් විසින් මවාලූ, කට දල්වාගෙණ ඉදිමී නිල්වගිය ශරීර ඇති, ඇස්, කන්, නාසා, මුඛ ආදී නවද්වාරයකින් පණුකැලෙන් සහිතව වැහෙන ඔජස් ඇති මෘතශරීරයක් දැන පළමු පරිද්දෙන්ම රථාවාහනීයා කෙරෙන් කරුණු විචාරා, ජීවිත මදය හැර විදුරුපෙත්තයෙක්හි දක්නාලද සිදුරක් මෙන්ද, හිරු විමනෙක්හි දක්නාලද අඹිකාරයක් සෙයින්ද, දිව්‍යබ්‍රහ්ම විමාන යෙක්හි දක්නාලද මළමුත්‍රයක් මෙන්ද, තමන්ගේ ශ්‍රී සමෘද්ධියෙහි කළකිරී, උයන්කෙළි ගමන් හැර ප්‍රාසාදයට වන්හ. මෙපවත් ඇසූ පිය මහරජතෙමේ ඉතා දෙම්නස්ව නුවර භාත්පස යොදුනක් තැන් රැකවල් කරවීය. නැවතත් සාරමසක් අතික්‍රාන්තවූකල ඇසළ මැදිපොහොදවස සම්ප්‍රාප්තවිය. එදවස් බෝසතාණෝ උයන්කෙළි පිණිස වඩනාහු, දෙවනිම්මිතවූ පරිමඩලකොට හැදපෙරවියාවූ සිවුරු ඇති විශදඛු පමණ තැන් හෙලනලද ඇස් ඇත්තාවූ උපශාන්තවූ ගුණයෙන් සැදී සිටියාවූ ප්‍රව්‍රජ්‍යා සැපයෙන් සුඛිතවූ භික්ෂූන් දැක, රථාවාහනීයාට කථා කොට මේ පුරුෂයාගේ හිසද අන්‍යයන්ගේ හිස්වැනි නොවෙයි, හැදපෙරව සිටිනා වසුන්ද අන්‍යයන්ගේ වසුන් වැනි නොවෙයි මේ ඥාන්තගුණයකින් හොබනාහු කව්රැදුහි විචාළහ. රථාචාරී

---

* දීඝායුෂක බොධිසත්වයෝ මෙකී පූර්වනිමිති සියක් සියක් අවුරුද්ද කින් දකිති. සමලායුෂක කාලයෙහි උපන් බෝසත්වරු සාරමසින් සාරමසින් දකිති. එපරිද්දෙන් අප මහබෝසතාණන්ද සාරමසකින් සාරමස පූර්වනිමිති දක්නාලදබැව් දතයුතුයි.

කිසිසේත් බුඩොතපාදයක් නැතිසෙයින් ප්‍රව්‍රජිතරූපය හෝ ප්‍රව්‍රජ්‍යාගුණයෙන් හෝ නොදන්නේ වීනමුත් දෙවානුභාවයෙන්, දෙවයන්වහන්ස! මේ පැවිදි කෙනෙකැයි කීකල්හි, සඛඳ රථවාහකයෙ! ප්‍රව්‍රජ්‍යාව නම් කුමක්දැයි අසා, දැනැමින් සෙමින් දිවිපවත් නාවූ කුසලක්‍රියායෙන් හා අවිහිංසාවෙන්ද සත්වානුකම්පාවෙන්ද යුක්තවූයේ පැවිදිනමැයි කීකල්හි; යහළු රථවාහකය, ප්‍රව්‍රජ්‍යාව යහපත, ධම්මචරියාව යහපත, සමචරියාව යහපත, අවිහිංසාව යහපත, සත්වානුකම්පාව යහපත, මේ ඉතා ශාන්තවූ වෙශයන්ත, එකාන්තයෙන් මෙබඳු වෙශධාරී තැනැත්තාහට සසර කතරින් එතරවිය හැකිවේ යයි පැවිදිවීමෙහි ආලය උපදවා එදවස් උයන් කෙළි පිණිස නික්මුණුසේක. ඒ උද්‍යානයෙහි, දිව්‍යපෂ්ඨිද් හා සමග නානාදොද්‍යානයට වන් සක්දෙව්රජහුමෙන් එහි විත භවන සුඛය අනුභව කරණුයේ නෙවත් උද්‍යාන ක්‍රීඩා කරණුයේ හිරුනැගි තැන් පවන් දස පැයක් ඉකුත් කොට නිර්මල ජලයෙන් පිරුණු, පියුම් කුමුදු මහනෙල් ආදිවූ පුෂ්පාභරණයෙන් සැදුම් ලද්දාවූ, පියුම් මී බී මත්වූ හංසාඛ්‍යනාවන් විසින් කරණලද කොලාහල ඇති, හැළී දියකෙළිනා මද සහිතවූ ශාක්‍යාදූන්ගේ කුවකලසයෙන් අලලනලද මහුල් පොකුණට අවතීර්ණව මඛ්‍යාහ්න දසපැය ජල ක්‍රීඩා කොට දවසාවසාන යෙහි නෙවත් සවස දසපැයෙහි විල්තෙර පරම රමණීයවූ දර්ශන ඇති මහුල් ගල්තලාව පිට වැඩහිඳ, සර්ව ලඞ්කාරයෙන් සැරසෙම්සි සිතුසේක. එකල උන්වහන්සේගේ අදහස දත් ඇමති සමූහයා සිව්සැවක් රාජාභරණ හා මල් සුවඳ විලවුන්ද ගෙණ සරසනු පිණිස හාත්පසින් පිරිවරාගත. එසෙණෙහි මහා පුරුෂයානන්ගේ පශ්චිම භාගයෙහි ලබන අලඞ්කාරය හෙයින්, සක්දෙව්රජහුගේ පුඩුපුල්සලස්න හුණුවිය. එකල සක්දෙව්රජ ලොව බලන්නාහු මහබෝසතානන් පැවිදිවෙන ආකාරභාවයේදී ලබන පශ්චිම අලඞ්කාරයයි දැන, විශ්වකර්මදිව්‍ය පුත්‍රයාට ආමන්ත්‍රණය කොට, "එම්බා විශ්වකර්මය, ඔබා ජීවකුමාර යානෝ අද මධ්‍යම රාත්‍රියෙහි මහානිෂ්ක්‍රමණය කරණසේක. මේ උන්වහන්සේගේ අන්තිම අලඞ්කාරය තා විසින් කටයුතුය, එබැවින් තොපි වහා එම උයනට ගොස් ඒ මහාපුරුෂයා දිව්‍යාභරණයෙන් සරහාලව"යි නියොගකළහ.

ඒ අසා විශ්වකර්ම දිව්‍යපුත්‍ර තෙමේ මැනවයි පිළිගෙණ එ කෙණෙහිම දිව්‍යානුභාවයෙන් බෝසතාණන් වෙත එළඹ මහුල් කපු වෙසක් ගෙණ දිව්‍යාලඞ්කාරයෙන් සරහනුයේ අකුලාඟත් කල්හි තුඹමලක ප්‍රමාණවත විදුපිකල දෙළොස් ගොදුනක් ප්‍රමාණ වත, දහස්පවකින් යිරෙ වෙඡ්ඡනය සකස් කොට මිණි ඔටුනු සහිතව පළඳවා සක්දෙව්රජහු පරිද්දෙන් අලඞ්කෘත

කෙළේය. * බොධිසත්වයෝ විශ්වකර්ම දිව්‍යපුත්‍රයාගේ හසත සප්‍රතීයෙන් මේ මනුෂ්‍යයෙක් නොවෙයි, මේ එක් දිව්‍යපුත්‍ර ඉෙකැයි දත්තේය. මෙසේ විස්කම් දෙව්පුත් විසින් සකීාලඛකාර යෙන් සරසනු ලැබූ බෝසතානන් අභිමුඛයෙහි කරණු ලබන ආතතවිතතාදී පඤ්චාඛ්‍යික තූර්‍යනාදයෙන් හා බ්‍රාහ්මණයන් විසින් ජයනන්දාදි වචනයෙන් මඞ්ගල සම්මත සතුතිකථනයකරණ කල්හිද, හරුඩයන්ගේ ජවබලබදුවූ හමන් ඇති ශෙවත අශව රාජයන් සතරදෙනෙකු යොදනලද උතුම්වූ රන් රිදී මිණිරුව නින් සැදුම්ලද්දාවූ, එල්වනලද නොයෙක් මල්දම්. ඇති, සියලු රථාලඞ්කාරයෙන් හෙබියාවූ, මඞ්ගල්‍ය රථවාහනාරූඪවූසේක. එසමයෙහි යසොධරා නම් අගබිසෝ නොමෝ රාහුල නම් පුත් රුවන ප්‍රසූත කළාය. එකල සුඩොදන මහරජතෙමේ යෙහෙළ නියෝ පුතෙකු වැදූහයි අසා, එතෙකින්ම මා පුත් සිඛාවිකුමාර සින් දරුමලින් බැඳගනුම්හ, මහණවිය නොදෙමි, මවවූයේ මහත් අනුබලයෙකැයි ඉතා සතුටුව, මපුතනුවන්ට මේ සතුටු හස්න දන්වාලව්හි, අමාත්‍යයන් මඟුල්වෙස්ගන්වා මහබෝසතාණන් කරා යැවීය. ඒ හස්න බෝසතුන් වැඩමවන මාගීයේදීම අසා "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතංති" යන වචනයෙන් රාහුල යෙක් උපන, ගිහිබන්ධනයක් උපනැයි කීසේක.

සුදොවුන්මහරජතෙම, මපුතනුවෝ කුමක් කීහුදැයි අමාත්‍ය යන් අතින් විචාරා, එකි වචනය අසා, මෙවක් පටන් මාගේ මුනු බුරුතෙම "රාහුල කුමාර" යයි නම්කෙළේය. තවද බොධිසත්ව යන්වහන්සේ අති මනොරම්‍යවූ මහත් ශ්‍රී සෞභාග්‍යයෙන් කිඹුල්වත්පුරය අභිමුඛව වඩනාසේක. එවේලෙහි අනඛශයාගේ ආයුධයක්බදු රාග නමැති ආසවයෙන් දෙවත් සුරාවෙන් මත්වූ කිසාගොතමීනම් ක්ෂත්‍රිය රාජකන්‍යාතොමෝ ප්‍රාසාද මතුයෙහි උන්නී බෝසතුන් වීථිමාර්ගයෙහි වඩනා ලීලාව හා රූපශ්‍රී සෞභාග්‍යයද දැක ඉතා කුල්මත්ව, ඇතුළුහැයි හිඳගතනොහී මතු මහල්තලයේ සීහපඤ්ජරයෙහි දෙරහැර, නීලවණ්ණ වලාගහිය කින් නිකුත් පූර්ණචන්ද්‍ර මණ්ඩලානුසාරීව කවුළුදොරින් බෝසතා නන් දිසාවට මුහුණ පෑ:- "ඔඛාවී නම් උතුමානනි! මෙනුඹ වැනිවූ පුතෙකුලද ඒ මවද අවශ්‍යයෙන් නිවිතිය සිත් ඇත්තීය, එසේම නුඹගේ ශ්‍රී සෞභාග්‍යය දුටු ඒ පිය තෙමේද නිවිතිය සිත් ඇත්තේය, යම් සත්‍රියකව මෙනුඹ වැනි රූමුහුදු සැමිවුනම් ඒ ඛිසව් නොමෝත් නිවිතිය සිත් ඇත්තීය, නැවත අනික් සමණ කෙණෙකුන් නොපතන්නාහ" යි යන මේ අර්ථ ඇති:-

---

* බොධිසත්වයන් මහණවනතෙක විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් කරණලද්දාවූ ඒ අලඞ්කාරය පරිද්දෙන් මේ දක්වාත් සසුන්වැද පැවිද්දන්නවුන් අතරෙහි උපසම්පදා මඞ්ගල්‍ය දිනවලදී යථොක්ත සිරිත භාවිතා කරණ බැවි දක්නා ලැබේ.

"නිබ්බුතා නූන සා මාතා නිබ්බුතා නූන සොපිතා
නිබ්බුතා නූන සා නාරී යස්සායං ඊදිසෝ පති."

යන මේ ගාථාව කීය; නුමුත් සසර කළකිරී සිටින මහ බෝසතානන්ට මෙය අන්‍යාකාරයකින් වැටහිනා; රාහ වෙහෙ මොහාදි ගිනි නිවීම වනාහි නිවුනානම් වේයයි සිතා, මේ රාජ කන්‍යාතොමෝ මට යහපත්වූ සැනක් ඇස්වුව, මම වනාහි නිවන් සොයමින් ඇවිදිමි, අදම මව, ගෘහවාසය හැර ඉගාස් පැවිදිව නිවන් සෙවීමට යුතුවන්නේයයි සතුටුව, මව ප්‍රියතෙපුල් කීවාවූ ඇට, ප්‍රියවූ වසතුවකින් ගුරුපඬුරක් පුදකරමැයි සිතා, කර පැළඳි ලක්ෂයක් අගනා මුත්හරය ගළවා ඒ කෘශාගෝතමිය වෙත යැවූහ. කෘශාගෝතමී මුතුහර දැක, "සිඛාඊකුමාර තෙමේ එකාන්තයෙන්ම මා කෙරෙහි අනුරාග සිත්ඇත්තේය. යසොධරා දෙවියමෙන් මාත් අගමෙහෙසුන් කරත්ය" යි සිතුහ.

ගෘහාභිනිෂ්ක්‍රමණය.

ඉක්බිති මහ බෝසතානන් වහන්සේ මහත් ශ්‍රී සමෘද්ධියෙන් ඉතා රම්‍යවූ ප්‍රාසාදයෙහි මතුමහල්තලයට නැඟී ශ්‍රී යහන් මතු යෙහි සැතපුනුසේක. එතෙණෙහි සම්‍යාලඞ්කාරයෙන් විභූෂිතවූ නෘත්‍ය ගීත වාද්‍යයෙහි අතිශ්‍රමවීවූ සුර යුවතීන් බඳු රූපාග්‍ර ප්‍රාප්තවූ නාටක ස්ත්‍රීහු නොයෙක් තූර්‍යාභාණ්ඩගෙණ බෝසතා නන් පිරිවරාගත්හ. මෙසේ පිරිවරාගත් විශිෂ්ටවූ රූපශ්‍රී ඇති ඒ නාට්‍යාඞ්ගනාවන් අතුරෙහි, සමහරෙක් නටති, සමහරෙක් ගී කියති, සමහරෙක් වස්කුලල් පිඹිති, සමහරෙක් වීණා වයති, සමහරෙක් අත්තල ඵලති, තවත් සමහරෙක් නෘත්‍යාඞ්ග දක් වති, මේආදික්‍රමයෙන් අනඞ්ගයාගේ ජයඝොෂාවක් බඳු මිහිරිවූ ගීතිකාධ්වනියෙන් යුක්තව ක්‍රීඩාකරන්ට වන්හ; එවේලෙහි සසර කළකිරී සිටින ඒ මහාපුරුෂයානෝ කෙලෙශ රතියෙහි නොඇලුනු සිත් ඇති බැවින් ඒ ක්‍රීඩාවෙහි සිත් නොහෙළා අනික් ඇල යක්හි නැමී මොහොතක්කල් නිද්‍රොපගත වූසේක; ඒ බව දුටු නාටක ස්ත්‍රීහු, යම් කෙනෙකුන් උදෙසා අපි නැටීම් ගීයිම් ආදි ක්‍රීඩාවෙහි යෙදෙමුද, හේ නිද්‍රොපගතවූ පසු කුමක් පිණිස අපි වෙහෙසෙමුදැයි තම තමන් ගත් තූර්‍යාභාණ්ඩයන් බිම තබා, ඒ ඒ තැනම වැදහෙව නිදන්වවන්හ. එකල සුවඳ තෙලින් දල්වන ලද පහන් ඇති ප්‍රාසාද මිතුයෙහි ශයනය කල ඒ මහා පුරුෂ යානෝ මදක් නිදා පිබිද යහනින් නැගී බඩපයඞ්කයෙන් වැඩ උන්නාහු, තූර්‍යාභාණ්ඩයන් දමා නිදන ස්ත්‍රීන්ගේ විප්‍රකාර දුටු සේක:—හේ කවරේදයත්? සමහරෙක් කුණුසොළ ධාරා වැගිරී මෙන් තෙත්වූ සිරුරු වලින්ද, සමහරෙක් දත් සපමින්ද,



Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

සමහරෙක් කළුපහරමින්ද, ඇතැම්තෙනෙක් විවෘතමුඛයෙන්ද සමහරුන් වැළපිමෙන්ද, සමහරෙක් අපගත වස්ත්‍රව ගුහ්‍යස්ථාන දැක්වීමෙන්ද, තවත් සමහරු මිදී ආකුලවූ කෙශකලාප ඇතිව දැසි යනාදි විකාරයෙන් ශයනාය කරණ ඔවුන්ගේ විප්‍රකාර සෙය්‍යාව දුටුවාවූ මහබෝසතානෝ, 'මේ සත්‍රිනු පෙරයම්වේලෙහි දිව්‍යාඩ්ගනාවන්සේ සිටියාහුය, දැන් මෘතරූප වැනියහ, යි ශක්‍ර භවනයක්බදු ඒ මහා ප්‍රාසාදය නොයෙක් කුණපයෙන් පිරුණු අමූසොහොනක් මෙන් නිශ්‍රීකකොට සිතා නැවතත් බොහෝ සෙයින් කාමයෙහි උකටලී වූසේක.

ඒ එසේමය. අගුන නිමිත්ත වශයෙන් බලන්නාහුගේ කාමාශාව ප්‍රහීනවෙයි, මෙසේ ඒ නාවක සත්‍රින්ගේ අපගතවස්ත්‍රයෙන් යුක්තාව ශයනාය කිරීම් ආදිය දුටු මහාබෝසතානෝ මූළුතුන්ලොවම කලපාණතාවහ්නි ශිඛා කලාපයෙන් වළඳනාලද තණපැලක් මෙන් සිතා, මේ සසරෙහි උපන් සඛ්‍යාට උපද්‍රවයක් විය, ඉතා පරිහානියක්වීයයි නියමින් අනිශ්‍රීන්ම ප්‍රව්‍රජ්‍යාවෙහි සිත් ඇල වූහ; අදම මා විසින් ගෘහවාසයහැර පැවිදිවන්නට නියමැනවයි සිතා ශය්‍යාවෙන් නැගිට දෙරටු සමීපයට පැමිණ, "සවාම්දරු වානන් වහන්සේගෙන් බසක් කවර විටෙක අසන්නේහෝයි නොනිදු, වැදහොත්තාවූ ඡන්න නම් අමාත්‍යයාට කථාකොට, සහළු ඡන්නය, "දැන්ම මම ගෘහාභිනිෂ්ක්‍රමණය කරණු කැමැත්තෙමි, කිසිවෙකුවත් නොහඟවා ශීඝ්‍ර ගමන්ඇති ඣන්ඨඣතම් මඟුලසු සරසා වහා හෙණවයි කිහ; " එකල ඇමතිතෙමේ යහපත සවාමිනියි කියා දහස්ගණන් අසුන් සිටිනා අස්ථළවපැමිණ සමන්මල්විසන්යට රමණීය භූමිප්‍රදෙශයෙහි සිටි අස්රජහු දැක අශ්වාලඞ්කාරයෙන් සරසන්ට පඬන්ගත; එකල මහාභිණිෂ්ක්‍රමණයෙහි සහායව යෙදෙන පිණිස බොහෝකලක් මුලුල්ලෙහි කරණලද ප්‍රාර්ථනා ඇති අස්තෙමේ සිතනුයේ, මේ සැරසුම් ඉකා දැඩිවන්නේය, මෙතෙක්ද උගන් කෙළි ආදියව මාගේ සවාමීන් වඩනාකල යොදන යෙදීමක් නොවෙයි අද රාත්‍රියෙහි රහසෙන්ම මා සරසති, එකානතයෙන් මාගේ සවාම්දරුවාණන් වහන්සේ මහබිනික්මන් කෙරේ වෙයි, බොහෝ කාලයක් මුලුල්ලෙහි මා පුරා ආවාවූ ප්‍රාර්ථනාව අද මසතකප්‍රාප්තවේයයි සතුටුව, මහත්සේ හෙෂාරව නාද පැවැත්වීය; ඒ නාදය සියලු කපිලවඤ්ඣුර පැතිරයනතරම් උසස් හඬක් විනුමුත් දෙවතාවෝ ඒ හඬ කිසිවෙක්හවත් ඇසියනුදුන්හ. එසඳ බෝසතානෝ පුතනුවන් දැකපියා යෙමියි සිතා බිම්බාදෙවින් වසන ශ්‍රී යහන්ගබඩාව ප්‍රවිශටව සඬුපතින් දෙර හයා දකුණු ශ්‍රීපාදය එලිපත මත්තෙහි තබා සිට, දැසමන්මල් අතුරණලද ශ්‍රීයහන් මතුයෙහි හෙව නාරිලතාවෙන් නිකුත් රැවන්දළුවක්මෙන් නොහරණලද

ගම්භීරඥ ඇතිව මැනියන්ට තුරුලුව, මැනියන් විසින් පාඝඨයෙහි තබනලද අත් ඇතිව සතප්තාවූ තම්පුත් රහල්කුමරුවන් දැක ඉදින් මම දෙව්ගබේ අත ඉවත්කොට පුතනුවන් වඩාගෙණ සිඹ සනහාපියම් නම් යසොධරාතොමෝ පිබිදෙන්නීය, එකල ඇඟා කථා ඉපදවීමෙන් මාගේ ගමනට බාධාවන්නීය, එබැවින් බුදුව අවුත් මපුතනුවන් දකිම්යි සිතූහ; නැවතද සිතනුයේ, ඉදින් මේ එක දරුවෙකු කෙරෙහි කළාවූ ප්‍රේමයෙන් මහණනොවීම්නම් මතුඇම් ලොකවාසීන්ම කෙසේ දරුකොටගණිම්ද? සංසාරසාගරයෙහි ගොඩ නොදක්නාවූ මේ සත්වයෝ කවරෙකු මූහුණබලා ගැලවෙද්ද? යනාදීන් සමසත ලොකසත්වයන් කෙරෙහි උපන් මහාකරුණා ඇතිව, තම්පුත් රහල්කුමරුවන්කරා දිවූ ප්‍රේම නමැති මහවතුර, තම්න්වහන්සේගේ සාරාසඛ්‍ය කල්පලක්ෂයක් මූලුල්ලෙහි නොකඩව පුරණලද විශ්‍යී පාරමිතා නමැති මහමිය රින් රදවා, මහමේරක් ඔසවන පුරුෂයෙකුමෙන් එලිපත මත් තෙහි තැබූ පාදය ඔසවා ආපසුගෙණ, ප්‍රාසාදයෙන්බැස මගුලසුලඟට පැමිණ මෙසේ කීසේක; 'යහළු කන්ථකය! අද රෑ තෝ මා ගළවාලව, මම තාගේ සහායෙන් ගොස් බුදුව තා ඇතුළුවූ බොහෝ දිව්‍යමනුෂ්‍යයන් සසරින් ගලවාලන්නෙමැ''යි කියා සම්පන්න සීලක්ෂණ සමපන්නා කෙලාශ පර්වතය මෙසින් අභිඛවලවූ අස්රජ පිටට නැගිසේක; ඒ අශ්වරාජතෙම ත්‍රිවිධ පවන් වාලධිය දක්වා අවළොස්රියන් දිගඇත්තේය, ඊට සුදුසුවූ උසමහතද ඇත්තේය, ඉතා ජවබල සම්පන්නය, පිරිසිදු සතක්සේ නිම්මල සුදුපැහැ ඇත්තේය. ඔහුගේ හෙළාරව නාදය හෝ ඇක්මෙන හඬ හෝ මූලුනුවර පැතිරයෙයි යනබිමෙන්, දෙවතාවෝ තම තමන්ගේ ආනුභාවයෙන් කුල්නාහඬ පැතිරගිය නුදුන්හ; ඇක්මෙන පියවරින් පියවරට අතුල්නළු දුන්හ; ඉක්බිති මහබෝසතාණෝ අසුපිටහිඳ සන්බහාඅම්ණෝසමග එදරුවූපසලොස්පැහිය මධ්‍යම රාත්‍රී වේලෙහි මනවාසල් දොරඅඛ්‍යසට සම්ප්‍රාප්තවූහ; තවද සුඩොදන රජතෙමේ, ලක්ෂණ පාඨක බ්‍රාහ්මණයන් විසින් කියනලද මහබෝසතානන්ගේ මහාභිනිෂ්ක්‍රමණයගැණකාරණා දන්හෙයින් තම පුත් කුමරුවන්ගේ ගමන වළක්වන අටියෙන් දහසක් යොධයන් විසින් ගයාලන වසාලන සතවූ බිලි යදෙර දෙකක් දොරටුවෙහි සේදවිය; එසේම දහස්ගණන් රාජපුරුෂයෝද වාසලරුකවල්ගෙණ සිටින්නාහුය; බෝසතාණෝ වහාම ඇප්ගණනින් කෙළ දහසක් ඇතුන්ගේ බල ඇතිසේක; පුරුෂගණනායෙන් කෙළ ලක්ෂයක් පුරුෂයන්ගේ විශ්‍යීය ඇතිසේක; එබැවින් උන්වහන්සේ සිතනසේක්, ඉදින් දොරවිවෘතනොවීනම් අසු පිට හුන්නෙම්ම අසු දෙකලවයේ රදවාගෙණ ශ්‍රීන්නයාන් සමග අවළොස්රියන් උස මහා ප්‍රාකාරඅපෑනයෙම්යි සිතූසේක;



Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa, Press. Colombo.*

අමාත්‍යතෙම සිතනුයේ, ඉදින් දෙර නොහැරේනම්, මාගේ සවාමිදරුවානන් දකුණු උරෙහි හිඳුවාගෙණ අස්රජ කිසිල්ලෙන් ගෙණ පවුරපැන යෙමිසි සිතීය; එවිට ඛන්ධක නම් අස්රජ සිත නුයේ, ඉදින් දෙර විවෘත නොවී නම් මාහිමියානන් පිට හිඳුවා ගෙණ, ඇමතියා වාලධිය අල්වාගෙණ සිටිඅදීම මේ ප්‍රාකාරය පැනයෙමිසි, ඉදින් එසේ දෙර විවෘත නොවී නම් තුන්දෙනම තම තමන් සිතුසේම පැන පලායන බල ඇත්තාහුය; එකෙණෙහි වාසල්දෙර අරක්ගත් දෙවතාවෝ, "සාරඝඩ්ය කලාපලක්ෂයක් මුලුල්ලෙහි, අඛ, බධිර, මූක, පඬු, ගිලාන, දීනාදීවූ ඖඩඝවිධ යාචකඝන් දැක දෙරක් පියලා නුනවිරු සවාමිදරුවන්ට මේ දෙර නොහරමෝද, මතු අපට නිවන්දෙර හැරදීලුව මැනව" යි සතුටු පඬුරක් දුනඝ කරන්නාසේ වාසල්දෙර විවෘත කළාහුය.

එකෙණෙහිම වසවතීනි මාරතෙම, සිදුහත්කුමරු අද මේ දෙරින් පිවත්වී නම් එකාන්තයෙන් බුදුවෙසි, බුදුවී නම් නිරඝ සිස්වී දෙව්ලොව පිරෙසි. මව බොහෝ භානි පමුණවසි; එබැවින් මායමක් කියා අද ඔහුගේ ගමනට බාධාකරමැයි සිතා වහාම දෙව්ලොවින් බැස නුවර දෙර අහසෙහි සිට:—

"මානිකඛම මහාවීර ඉතෝ තෙ සත්තමෙ දිනෙ
දිබ්බානතු චකකරතනං අධාපාතු භවිස්සති"

ඝහළු සිඛාවිකුමාරයෙනි! නොනික්මෙව, මෙයින් සත්වන දවසෙහි නුඹවහන්සේට චක්‍රරතනඝ පහළවීමෙන් දෙඝහසක් කොදෙව් පිරිවරකොට ඇති මේ සක්වළ ඟැබ මුලුල්ලෙහි එකාන පත්‍රයෙන් චක්‍රවර්තිරාජ්‍යඝ කරව, ඝහළු මහණවීම පිණිස නොඝවයි කීය; එකල්හි බෝසතාණෝ තෝ කවරෙහිදැයි විචාළහ; මාරතෙම කියනුයේ, ඔම වනාහි සවන පරනිම්මිත දෙව්ලොවෙහි වසන මාරදිව්‍ය රජ යෙමියි කීය; එබස් අසා බොධිසත්වයෝ කියන්නාහු, එම්බල මාරඝ! තා වැනි මාරඝන් සියඝක්, දහසක්, ලක්ෂඝකිනුදු අද මා නවතාලිය නොහැක්ක; චක්‍රරතන ඝාගේ පහළවීම මම්ත් දනිමි; ඒ සක්විකිරුජ්‍යයෙන් මට කම් නැත, දස දහසක් ලොකධාතුව කම්පාකරවා උතුම්වූ සම්‍යක් සම්බුඩත්වඝට පැමිණෙම්, එබැවින් තා මෙතන නොරඳ, වහා පලාඝවයි කීසේක; එබස් ඇසූ වසවත් මරුතෙමේ ආකාශයෙහි සිට බෝසතුන් කෙරෙහි බඩවෙරීව දන්කකා 'මතු තා බුදුවන සැටි බලම්, මෙතැන් පටන් කාමවිතකකී, ව්‍යාපාද විතකකී, විහිංසා විතකකී, ඝක මොවුන් අතුරෙන් එකක් සිතුවිටක වඝ දනිමැ"යි කියා, එතැන්පටන් සතු අවුරුද්දක් මුලුල්ලෙහි උන්වහන්සේගේ පසුපස්සෙහි ඡායාවක්මෙන් සිදුරුබලා හැසිරෙමැයි සිතා අන්තර්ධානව ගියේඝ.

ඉක්ඛිත්තෙන් අනන්තගුණධාරී බුඩාඩඛුරවූ මහබෝසත නන්වහන්සේ, හසහප්‍රාප්තවූ රාජ්‍ය ශ්‍රීසම්පත්තද සතියකින් ලැබෙන චක්‍රවර්ත්තිසම්පත්තියද අලුයම දැමූ කෙළපිඬක්සේ තියරු කොට දෙවබ්‍රහ්මාදීන් විසින් කරණුලබන මහත්සත්කාර විදිමින් නුවරින් නික්මුණුසේක; මේසේ ඇසළ මස පුර පසළොස්වක් පොහොදින උතුරුසළඟනකතින් මධ්‍යම රාත්‍රියෙහි මහඛිනිෂ්මන් කරණසේක්, නුවර බලනුකැමැතිවූ හෙයින්, එතෙණෙහි පෑපි විය කුලාල චක්‍රාක්සෙයින් භ්‍රමණයව මහබෝසතානන්ට පෙණී හිඳුවය. ඒ සථානයෙහි "ඛණ්ඩඛ නිවර්ත්තන" නම් වෛත්‍ය සථානය මතුවන්නේයයි දක්වා, යාවුතු දිශාවට අශ්වරාජයා විහිදුවා, දිව්‍ය සමූහයා විසින් බෝසතානන් පෙරටුවද, පිටිපසද, වම් දකුණු පාර්ශ්වයන්හිද, නගනලද මිණිදඬු පහන්වැට ඇතිව, අසුර නාග ගරුඬ ගඛර්ව්‍යාදීන් විසින් ඉහිනලද පරසතු කඩුපුල් මල් ආදීන් පූජා ලබමින්ද, අවශෙෂ දෙවතාවන් විසින් පුදනු ලැබූ පඤ්චාඛ්‍යික තූර්‍ය්‍යතාද ඇතුවද මෙසේ මහත්වූ පුණ්‍ය ශ්‍රී ශොභාවෙන් පිරිවර සහිතව ගමන්ගත් ඒ මහා බොධිසත්ව තෙමේ පසළොස් පැය ඇතුළත කිඹුල්වත්, කොලිය, දෙවිදහ යන තුන් නුවර ඉක්මවා තිස්යොදුන් මාහිගයගෙවා අරු ණොදගමන වේලෙහි අනොමා නම් ගංතෙරට වැඩිසේක, ඒ අස් රජතෙම වනාහි, මොහොතකින් සක්වළවට ඇවිදින්වද නිසි ජව ඇතත්, එදා දෙවි බඹ ගුරුළු ආදීන් විසින් අහස සිට ඉහින ලද සුවඳමල් ආදියෙහි ගිලීගිය සිරුරු ඇතිව, දිවකුසුම් කඩ, යන්නාක්මෙන්, ඉක්මන් නොව තිස්යොදුනක් තැන්ම ගමන් කෙළේය.

මහණවීම, රජගහනුවර පිණ්ඩපාතය කරමින් හැසිරීම, බිම්බිසාර රජුන් හමුවීම.

ඉක්ඛිති මහබෝසතානෝ ගංතෙර සමීපයට එළඹ, මෝ කිනම් ගහක්දැයි ඡන්නාමාත්‍යයා අහින්විචාරා, සවාමිනි මේ ගඩගා නොමෝ අනොමා නම් වන්නීයයි කීවාල්හි, මාගේ පැවිදි වීමත් අනොමාය අලාමකයයි කියා සතුටුව, අශ්වයාට ගඟ පැන යතෙළස විලඹෙන් සංඥකොට, අවසියයක් රියන් පුළුල ඇති ගඟින් ඡන්නයා හා සමග අසූ පන්නවා, අසුපිටින් බැස මුතු රැසක්වන් සුදුවූ සියුමුවූ වැලිතලා මතුයෙහි වැඩසිට ඇමතියාට කථාකොට "යහළු ඡන්නය! නෝ මා පැළඳි ආභරණ හා අශ්වයාත් නුවරටගෙණයව, මම මහණවෙමි"යි කිහ; එබස් ඇසූ ඡන්නා තෙමේ, සවාමිනී! මමද මහණවෙමි"යි කියා; "තොපගේ පැවිදි වීම දැන්ම සුදුසු නොවෙයි, මපියාතන් හා, මැනියන් වහන්සේ

Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*



Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

හා ඝණ්ඨාඛරාදෙවිද මාගේ පැවිදිවීම නොදනිති, එහෙයින් දැනට තෝ යව, පසුව තා මහණකරවා ගණ්හිම්"යි තුන්යලක්ම ඇමතියාගේ වචනය වළක්වාලීය; මේ ශ්‍රමණ නම් අමාත්‍ය තෙමේ බුඩාඩකුරයෙකු කාමබන්ධනයෙන් ගැලවීමෙහි අනුබල දෙන්නෙක් වෙමියි කල්පලක්ෂයක් මුලුල්ලෙහි කරණලද ප්‍රාර්ථනා ඇත්තේය; එ බැවින් මේ අන්තිම ආත්මභාවයේදී, ඕඩාඵිකුමාරයාණන්ගේ ගෘහාභිනිෂ්ක්‍රමණයෙහි සහායවීමෙන්, ඔහුගේ අභිමතාර්ථය මුදුන් පැමිණි බැව් දතයුතුයි; මෙසේ පළඳනා හා අශ්වයාත් අමාත්‍යයාහට පාවාදී සිතනසේක්, මේ මාගේ හිසකේ තපසට නොහොබනේයයි, බොධිසත්වයන්වහන්සේගේ ශිෂ්‍ය අල්වා හිසකේ බාන්නට සුදුසු අන්කිසිවෙක් නැතිහෙයින්ද, සිය අතින් කෙශච්ඡේදනය කිරීම හැම බුදුවරයන්ගේම ධර්මතාවක් බැවින්ද, මම්ම ඡේදනය කරමැයි සිතා වළාකඩකින් හළ විදුලිපතක්සේ හයා දකුණතින් කොපුයෙහි තුබූ මිගුල් රන්කඩුව ගෙණ වාම හස්තයෙන් උතුම් සුගන්ධවාසිත මෞලිසහිතවූ කෙශකලාපය අල්වාගෙණ සිඳලූසේක; එතෙණෙහි සිරසෙහිවූ කෙශයෝ දැහැල් පමණව දක්ෂිණාවර්තව සිරස හා ඇලීගියහ, දැළිරැවුළුද තදනුරූපවිය; නැවත ජීවිතාන්තය දක්වා දැළි හිසකේ බැමෙන් කම් නැතිවිය; ඉක්බිති ඒ මහබෝසතාණන් වහන්සේ සිතන සේක්, ඉදින් මම එකාන්තයෙන් බුදුවෙම් නම් මේ කෙශකලාපය අහස රඳවයි, නැතහොත් බිම පතිතවේවායි අධිෂ්ඨානකොට අහසට දැමූසේක; ඒ ශික්ෂාමාණ්ඩල්‍ය සහිතවූ කෙශකලාපය යොදුනක් පමණ තැන් නැඟී අහසෙහි රැඳී සිටියේය; එතල සක්දෙව් රජ වහා අවුත්, යොදුනක් පමණ උස ඇති මිණිමුවා සුමුහකින් යටොතන කෙශකලාපය මස්තකයෙන් පිළිගෙණ හොස් මෙරමුදුනෙහි පිහිටි නවතිසා දිව්‍යලොකයෙහි "සිළුමිණි සෑය" නම් චෛත්‍යයක්කොට, අද දක්වාත් දෙව්ලෝ වාසීහු වන්දනමානාදිය කරණු ලබන්නාහුය.

එසේ හෙයින් කියනලදී:—

"ජෙට්ඨාන මොලිං වරගන්ධවාසිතං
වෙහාසගං උක්ඛිපි සක්‍ය සුඛතෝ,
සහස්සනෙත්තෙනා සිරසා පටිග්ගහි
සුවණ්ණා චඞ්ගොටෙ වරෙන වාසවෝ."

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ, මේ මා ඉන හැදි කසී සළු අතැති බැවින් ශ්‍රමණසාරූප්‍ය නොවෙයි සිතූහ, එකෙණෙහි ඒ සිත දුටු පූජිතයෙහි භාග්‍යපබුදුන් සමයෙහි බෝසතුන්ට විශ්වාසිවූ සුඛාවාස බ්‍රහ්මලෝකයෙහි වසන ඝටිකාර නම් මහාබ්‍රහ්මතෙම

බුඩාහතරයක් මුලුල්ලෙහි නොනැසී පැවැත්තාවූ මිත්‍ර ධර්මයෙන් යෙදුනේ, අද මාගේ යහළුවෝ මහණවෙති, එහෙයින් ඒ තුමා නන්ට ශ්‍රමණ පරිසකාර ගෙණයෙමි:—

"තිච්චරඤ්ඤ පතෙනාව වාසි සුච්ච බ්‍රහ්මණං,
පරියාසාව තෙන අට්ඨනෙ යුත්ත යොගස්ස භික්ඛුනෝ."

නෙයවන් දක්වනලද, කලෙපාතපත්තියෙහි පදම මසුනක යෙහි පහදවී තුබූ සතරවිත අවපිරිකර ගෙණවුන් හස්තයෙහි තැබීමෙන් පිළිගැන්විය; එකල මහසතානෝ බ්‍රහ්මයා විසින් පිළිගන්වනලද සිවුරු හැඳ පෙරව උතුම්වූ තවුස් වෙස් ගෙණ, හින තුබූ සළුසඟල අතින් ගෙණ පෙරසේම ඉවා ආකාශයව දැමූහ; එයද සතරගව්වක් අහසට නැගී ශ්වෙත හංස යුගමයක්සේ ලීලොපෙතව සිටිකල මහාබ්‍රහ්මයා විසින් දෙළොස් යොදුන් රැවින් කරඬුවකින් ඒ සාධක යුගමය පිළිගෙණ බ්‍රහ්මලොකයෙහි "සළුම්ණිසෑ" නම් චෛත්‍යයක් කරණලදින් අද දක්වාත් බඹලෝ වැස්සෝ අපමණ පූජාසත්කාර කෙරෙති; මෙසේ ශ්‍රමණ වෙශධාරිවූ ඉක්බිති මහබෝසතානෝ ජන්‍යාමාත්‍යයාට කථා කොට "යහළු ජන්‍යාය, තෝ ශොකනොකොට මපියානන්වහන්සේව හා මැනියන්වහන්සේවද ණසොධරාදෙවින්වද, මා මනණව නිරොගිව වසනබැව් දන්වාලව්, මා ලොවුතුරා බුඩත්වය පැමිණ මුත් ඔවුන් දක්නට නොඑනපරිදි කියව, එබැවින් පියානන් වහන්සේව, මා පුත් රහල්කුමරුවන් රක්ඛාකරගන්නාලෙස කියව"යි කීසේක. ජනෝ තෙමේ බෝසතානන් වැඳ සමුගෙණ නික්මුන; කන්ථකා නම් අස්රජතෙමේ වනාහි බෝසතානන් මහණවූ පරිදින් ජන්‍යායා හා පැවැති කථාත් දැන, නැවත මාගේ සවාමීන් දැක්මෙක් මට නොලැබෙයි සිතා, ශොක කරණුයේ නොපෙණෙන ප්‍රමාණය ඉකුත්වූ කල්හිම ශොකාගනියෙන් පැලී කාලක්‍රියාකොට, රිදීකඳක්වන් අස්කද බිමහෙළා, එතෙණෙහිම තව්තිසා භවනයෙහි කන්ථකනම් දිව්‍යපුත්‍රව උපන.

තවද ජනෝනම් අමාත්‍යයාට ප්‍රියවිප්‍රයොගය නිසා ප්‍රථම යෙන් එක් ශොකයෙක්විය; දෙවෙනිව කන්ථකා නම් අස්වරාජ යාගේ කාලක්‍රියාවෙන් හටගත් ශොකයෙන් වැළපෙමින් දුක් වෙමින් සවකීය පුරයවූ කපිලවස්තු නගරයට ගමන්කෙළේය. ඉක්බිති බොධිසත්වයන් වහන්සේ පැවිදිව අමාත්‍යයා ගියපසු, නුවරින් ආකෙනෙක් මා දැකපියනිසි සිතා එමඟතොර මලලව රජුන්ගේ අනුපිය නම් අඹවනයට වැඩ, ඒ වනයෙහි සිත්කලුවූ වෘක්ෂජායාමණ්ඩපයෙහි සත්දවසක් නිරාහාරව ප්‍රව්‍රජ්‍යාසුඛයෙන් කල්යවා සත්වෙනි දිනයෙහිම තිස්යොදුන් ඔගගෙවා, මහා මණ්ඩාතු මහාගොවින්දුන් විසින් ගෘහිතවූ (මොවුන්ට ගෘහවූ,

සෙයින් රාජගෘහ (රජගහ) නම්වූ නගරයට පැමිණ පූජාවාර යෙන් ඇතුල්ව ගෙපිළිවෙළින් පිඬුපිණිස වැඩිසේක; එහුවර පළමු සත්දවසෙක පටන් ඇඹුලඟෙළි නම්වූ නකත්කෙළියෙක් විය; මනුෂ්‍යයෝ තම තමන්ගේ කම්මානත හැර නුවරවි වැද උත්සව කෙළි කෙළනාහුය. එදා නගරවාසී මනුෂ්‍යයෝ, සියලු ලොවට අසහාය ප්‍රදීපයක් වැනිවූ අප මහ බෝසතානෝ, මෙසේ කාලයක්මෙන් සන්සිදුවනලද කෙලෙස් නමැති රජස් ඇතියේ සඤ්ඤාවලාභටලයකින් බබලන්නාවූ ශරත් කාලයෙහි චන්ද්‍රයා සෙයින් උතුම්වූ කාෂාය වස්ත්‍රධාරීවූ මහොතතමයානන් වහන්සේගේ රූපශ්‍රී දැකීමෙන් නාලාගිරිඳුවන් රජගහනුවරසේද, අසුරෙන්ද්‍රයා විසින් ප්‍රවිෂටවූ ශක්‍රපුරයසේද, (දහස් ගණන් මනුෂ්‍යයෝ) දිව දිව අවුත් බෝසතුන් වටකොටගත්හ; ඒ මේලෙසි මහබෝසතානෝ වියදඬු පමණ දුරබලා සන්සුන්ලීලා වෙන් ගෙපිළිවෙළින් වැඩ පිඬු පිණිස හැසිරෙනසේක. එහි රැස්වූ ජනයන් අතුරෙහි සමහර කෙනෙක්, කොල මේ රහුගේ නයින් මිනිස්ලොවට පැමිණ ඇවිදිනේ පූණ්ණචන්ද්‍රයා දෙහෝයි කියති; එකල්හි ඇතැම් මනුෂ්‍යයෝ ඒ වාග්විශෙෂ අසා කොල කුමක් කියවිද? ඒ පූණ්ණචන්ද්‍රයා කවරකලෙක මනුෂ්‍යලොක යෙහි සඤ්චාරණය කෙළේද? ඒ චන්ද්‍රතෙම සසලෙඛා ඇත් තෙක, මොහුවනාහි අලඞ්කාරය, එබැවින් පූණ්ණචන්ද්‍රයාතොව අප රජුගේ සහ නුවරවාසීන්ගේත් ක්‍රීඩාදර්‍ශනය සඳහා අන්‍ය වෙශයෙන් ආ මොහු කාමදෙවයා දෙහෝයි කියත්; සමහර කෙනෙක් එබසට සිනාසී, කොල තොපි නන් දෙබවිද? ඒ අනඞ්ගයා නම් ජාවරයා විසින් දවා පියනලද අඞ්ගිය ඇත් තෙක, මේ පුරුෂයා වනාහි සම්පූණ්ණවූ ගාත්‍රා ඇතිකෙසින් කාමදෙවයා නොව, තමාගේ දිව්‍යපුරයයි යන සංඥාවෙන් ඇවිදිනා මොහු ශක්‍රදෙවෙන්ද්‍රයා දෙහෝයි කියත්; සමහරු එබසට සිනා පහළකොට, තොප කියනබස් පූර්‍වාපර විරොධය. ඒ තොප කී ශක්‍රයාගේ දහසක් නෙත් කොයිද? වජ්‍රාඞ්කුශය කොයිද? ඓරාවන නම් හස්තිරාජයා කොයිද? ඒ හෙයින් මේ ශක්‍රයා නොව, මෙනුවර බ්‍රහ්මබන්ධු (බ්‍රාහ්මණතපස්වීන්) වෙද හැදෑරීමෙහි ප්‍රමාදවූවාහුදැයි වැඩ පිණිස ආ මොහු මහාබ්‍රහ්මයා දෙහෝයි කියත්; ඇතැම් දනෝ ඒ අසා, භවත්නි, උමතුවූවාහුද? මහබඹතෙම චතුර්මුඛයක් ඇත්තේය, මේ තෙමේ සෞම්‍ය මුහුණක් ඇත්තේය; ඒ මහාබ්‍රහ්මතෙම වෙදපුස්තක ධාරීය, මේ තෙම පාත්‍රයක් ගත් අත් ඇත්තේය; මේ වනාහි ශ්‍රී විෂ්ණු තෙම මෙහි පැමිණ ලක්ෂ්මිය සොයමින් අප්‍රසිඩ වෙශයකින් ආයේයයි කිහු; ඇතැම් මනුෂ්‍යයෝ එබසටද හසාසෙඨාවනය කොට සිනාසී තොපි මේ කුමක් කියන නියාද? ඒ විෂ්ණුතෙම

වාමනාවතාර ඇත්තෙක, හෙවත් ලකුණටකය, සාෂඨිවර්ෂික ශරීර ඇත්තෙක, මේ වනාහි ඊශ්වර තෙම මනොඥවූ රූපයකින් මේ අප නගරයට පැමිණියේයයි කියත්; ඇතම් අය ඊට්ක් නිසා කොට, කොල මේ වසුදිව්‍යරාජයාත් නොවෙයි, සක්දෙවිරජත් නොවෙයි, බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරාදී කෙනෙකුත් නොවෙයි, එකාන්තයෙන් ලොවට ඉෂ්ටාර්ථ ප්‍රසවය කරන්නාවූ මහාද්‍යුතිමත් තපස්වී කෙනෙක්මයයි කීහු; මෙසේ මෙරුමථනයකොට අල ළනලද මුහුදක්සෙයින්ලොකවාසීහු බෝසතානන් වහන්සේගේ රූප නමැති සාගරයෙහි සිත් නමැති නෞකාවන් නුවන්නමැති පලූපතින් පදින්නාහු පරතෙරක් කොම දුටුවාහුය. එකල්හිරාජ පුරුෂයන් ගොස්, දෙවයන්වහන්ස, ඉතා විශිෂ්ටවූ රූපශ්‍රීන් අනඹයා හා සමානවූ පුරුෂොත්තමයෙක් මෙනුවර දොරින් දෙර පිඩු සිඟන්නේය, ඔහු දෙවියෙකු බවත් නොදනුම්හ, බඹෙකු ගුරුලෙකු මිනිසෙකු බවත් නොදනුම්හයි බිම්බිසාර මහ රජහට සැළකළාහුය. එපවත් ඇසූ රජතෙමේ ප්‍රාසාදයේ මතු මහල් තලයෙහි දොරහැර බලනුයේ, බෝසතානන්ගේ අපමණවූ රූප ශ්‍රී දැක විස්මිතව, මම් මොහු දෙව්යෙකු බැවුත් නොදනිමි, බඹ, යක්, නා, ගුරුළු, මිනිස් බවත් නොදනිමි, කොල තොපට එක් උපායෙක් කියම්, මොහු පසුපස්සෙ යව, ඉදින් දෙවියෙක් බඹෙක්වීනම් දෙව්ලෝ බඹලෝ බලා අහසින්යෙයි; නාගයෙක් වීනම් පොළව කිමිදයෙයි, ගුරුලෙක් වීනම් අහස පියා පැහැර යෙයි, යක්ෂයෙක්වීනම් නුවරින් නික්ම අනතඹානවෙයි; ඉදින් මිනිස් තවුසෙක් වීනම් ලත් අහර හැරහෙණ සුදුසු තැනෙක හිඳ අනුභව කෙරෙතියි කියා රාජ පුරුෂයන් පිටත්කර යැවිය, ඉක්බිති මහබෝසතානෝ සවකිය රූපශ්‍රී සෞභාග්‍යයෙන් සකල ජනයාගේම මනනුවන් තමන්කෙරෙහි ආකර්ෂණයකොටගෙණ, යාපෙනපමණ ආහාර සිඟාගත්පසු ප්‍රවිෂ්ටවූ වාසල් දොරින්ම නුව රින් නික්ම සුපිපි වන ලියන්ගේ මනොඥවූ මලින් සුවඳවූ, පාණ්ඩව නම් පර්වතච්ඡායාවෙහි පූර්වදිග බලා වැඩහිඳ ආහාර වළඳන්ව ආරම්භකළහ; පෙර දිවබොජුන්වැනි සුවඳ හැල්සාලේ අග්‍ර භොජනානුභවකොටම වැඩහෙයිනුත්, උපන්දුපවින් මෙබඳු බැහැපත් ආහාරයක් ඇසිනුත් නුදුටු විරැහෙයිනුත්, පාත්‍රයෙහිවූ ඒ සිඟනලද මිශ්‍රකාහාරය බැලූ කෙණෙහිම අතුනු පෙරළී කවින් නික්මයන තරම් මහත් පිළිකුල් උපන.

එවේලෙහි අපමහබෝසතානෝ ආහාරයෙහි ප්‍රතිකූලසංඥ උපදවා තමන්වහන්සේ විසින්ම තමහට අවවාදකරණුවෝ මෙසේ සිතූහ:-එම්බා සිඛාණ්ඩිය! පෙර තොප සුවඳ කවා තුබූ හැල්සාලේ අග්‍රභොජනය අනුභවකොටම එන රජ කුලයෙහි ඉපිද අනෙකවිධ රාජ්‍යශ්‍රීසම්පත් විඳිනා සමයෙහි, කවර දවසෙක

සිවුරක් පොරවාගෙණ ශරීරයෙන් බහදිය වගුරුව් වගුරුවා දෙර දෙර පිඬු සිඟා ලැබූ මිශ්‍රකාහාරයක් එකලාව වැඩහිඳ අනුභව කරම්දෝහෝ කවර දවසෙක එය ලබම්දෝහෝයි සිත සිතා ඇවිද්දෙහිය, දැන් තෝ ඒ ආහාරය ලදින් පිළිකුල් සිතයිද? සුභොජනයම වළඳ බුදුවෙතොත් කැමැත්තේද? තාසේවූ අලජ්ජියෙක් තවත් ඇද්ද? තාගේ ශරීරයට සුව කැමැත්තෙහි වීනම්, මුලුලෝ වැසියන්ට කෙසේනම් හිවන්සුව දීලිය හැකිද? තොපව ලජ්ජා ඇතිවීනම්, මෙතැන්පටන් බුදුවන දවස් දක්වා ලද යම් භොජනයක් අමාකොට සිතා, ලදදෙයකින් යැපී ඉන්ද්‍රියසංවර ශීලය නොභඩකොට රක්ෂා කරවයි; මෙසේ ඉන්ද්‍රියසංවරශීලය ඉටාගෙන හැවතද සිතනුවෝ:-එම්බල සිඩාඊ කුමාරය! තාගේ මේ ශරීරය ඝන රනින් නිමවා ඔප්නගතලදුයේ නොවෙයි, දෙතිස්කුණප කොට්ඨාශයකින් සමන්විතවූ අශුචි පුරවනලද භාජනයක් හා සමවන්නේය; හේ කෙසේදයත්? * "ගලවලුයෙහි පවන් නළලහිම්කොට දෙකන්සිළුවෙන් උඩ හිස්කබල මත්තෙහි පිහිටියාවූ සමපිට වැඩුනාවූ දෙකෙළ පණස්ලක්ෂයක් හිසකේ යෙන්ද, අතුල් පතුල් හැර සකල ශරීරයෙහි පැතිරී සිටියාවූ නවානූදහසක් රොමයන්ගෙන්ද, ඇඟිලිඅග පිහිටියාවූ විසි නිය පොත්තන්ගෙන්ද, දෙනිකවෙහි හෙවත් මුඛයතුළ දෙඇන්දෙහි පිහිටියාවූ සතලිස් දක්අටයන්ගෙන්ද, සකලශරීරයෙහි ඇත්තාවූ මාංසය වඟා සිටි සමින්ද, නවසියයක් මස්පිඬුවලින්ද, ඇටසම් වැළඳ සිටින්නාවූ නවසියයක් නහරවැලින්ද, තුන්සියයක් ඇට වලින්ද, ඒ ඇටතුළ පුරා තිබෙනා ඇටමිදුලු වලින්ද, එකතුවූවේ හවගත් ආත්මය ඵල වයක්වැනිවූ දෙතන මැද පිහිටියාවූ වකුගඩු වෙන්ද, හදවත වැනිර සිටින්නාවූ හෘදයමාංස යෙන්ද, හෘදය මාංස යට දකුණුපසින් පිහිටියාවූ අක්මා වෙන්ද, ඒ අක්මාව වඟාසිටි නාවූ දලබුගෙන්ද, ඒ හෘදය මාංසයට වම්පසින් හදවත වැනිර සිටින්නාවූ, බඩදිවින්ද, එසේම පපුකැනින්ද, ගලවළඳයෙහි පවන් අධොමාගීය දක්වා එක්වීසි තැනකින් නැමී පිහිටියාවූ දෙතිස් රියන් දික්වූ බඩවැලින් ද, එසේම දික්වූ අනුණුබහනින්ද, අනු භවකරණුලබන සියලුම ආහාරයන්මිවිදෙ සිටින්නාවූ, උදරයෙන්ද, අධොමාගීයෙන් අවගුලක් උඩ පිහිටියාවූ ආහාරමලයෙන් හෙවත් අශුචියෙන්ද, අක්මාපපුව අතුරෙහි මිදිගිය ගිතෙල්වැනිවූ පිත්කොළයෙන්ද, උදරපටලය පවන් උගුර දක්වා පිරිසිටියාවූ ශෙලෂ්මයෙන්ද, කණුකටු ආදියෙහි ගැටීමෙන් හදිහන්නා සැර වෙන්ද, කෙස්ලොමනියදත් ආදියහැර සකලශරීරාභ්‍යන්තරයෙහි හැසිරසිටින්නාවූ ඉසිර සිටින්නාවූ පැතිර සිටින්නාවූ කැටිව සිටින්නාවූ ලෙහෙයෙන්ද, නවානූ දහසක් රොමකූපයෙන් වැහෙන්නාවූ

---

* පිළිකුල් භාවනාවයි.

ඩිභදියෙන්ද, ඔම් මස් දෙකව අතුරෙහි පිහිටියාවූ මේදඝන
ලින්ද, ඇස්දෙක පුරාසිටියා කඳුලෙන්ද, අව්හිනි ආදියෙන් ශරී
රය උණුසුම්වූ කල්හි අතුල්පතුල් කන් නාසා ආදියෙන් නිකුත්
වන්නාවූ වුරුණු තෙලින්ද, ආහාරයක් දුටු කල්හිද ආහාරයක්
ඇණ අසන කල්හිද සුගන්ධාඝ්‍රාණයෙන්ද, දෙකපොළයෙන්
පෙණයේ නික්මෙන්නාවූ කෙළවලින්ද, දෙම්නස් කල්හිද බල
වත්සේ කව දවන උෂ්ණාධික ආහාරයක් අනුභවකල කල්හිද
නහ සිදුරුවලින් වැහිරෙන්නාවූ ඝොටුවලින්ද, සකල සත්ත්වා
නයන්හි පිහිටියාවූ ඝදම්දුලුවලින්ද, එසේම පිරුණු මුත්‍රවලින්ද,
හිස්කබල පුරා සිටියා හිස්මුලින්ද, යන මේ දෙතිස් කුණප
කොට්ඨාශයෙන් යුක්තවන්නේය"; තවද මේ පවිත්‍රවූ ආහාරය
තාගේ ශරීරය නමැති ගෘහයෙහි මූඛ නමැති වහල බහා දත්
නමැති මොහොලින් කොටා දිව නමැති කුල්ලෙන් පොළා කෙළ
නමැති දියෙන් ගරා උදර නමැති සැළියෙහි ලා පක්ති නමැති
උදුන නහා ආපොනමැති දියවරඝණ ඝෙජෝනමැති ගිනි උද්ද
වාඝොධාතු නමැති පවන්සලා, මෙසේ මහකුසගින්නෙන් දිවා
රාත්‍රියක් කකියා සැළිපැ හිඝකල මල මූ වඝයෙන් උහතොමාඝීඝ
යෙන් ඉතිර පිළිකුල් බවව පැමිණෙයි; තාගේ මේ ශරීරය බැලූ
කල මේ ආහාරයම ඉතා පිරිසිදුය, ඉතා උතුමැයි, සිතත් සිතත්
බෝසතුන්ව ඒ ආහාරයම සුභොජනවිය නැවතද සිතන්නේ:–
එම්බල සිඛාඊ කුමාරය! තාගේ මේශරීරයද එක්ධාතු සමූහයෙක,
මේ ආහාරයද එක්ධාතු සමූහයක් වන්නේය, එසේනෙමින් ධාතු
සමූහයක් ධාතු සමූහයක් වළඳයි; ඝනාදීන් මෙසේ මූඛ නමැති
තුඹස් කටින් නික්මුනාවූ අතුණු නමැති සඤ්ජරඝා ප්‍රත්‍යවෙක්ෂා
නමැති මනඃබලයෙන් වළකා පිළිකුල්නැතිව ඒ ආහාරය වැළදු
සේක. එකල පසුපස්සෙහි ගිය රජහුගේ දූත පුරුෂයෝ එපවත්
රජහට සැළකළාහුය; එබස් ඇසූ බිම්බිසාර නරපතිතෙමේ මහා
නුවරින්ගොස් මහබෝසතානන්කරා එළඹ වැඳහුන් ලීලාව දැක
අතිශයින් ප්‍රසන්නව, නම්ගොත් විචාරා මාගේ යහලුවූ ශාක්‍ය
වංශ නමැති ඔටුන්නට සිඑම්ණි තැන්පත් සිඛාඊකුමාරයයි
පහන් සිත් ඇතිව මෙසේ කීසේක; කිමේක්ද යහලු සිඛාඊකුමාර
යෙනි! ඔබගේ වංශයෙහි මහත්වූ රාජ්‍යශ්‍රී සම්පත් විදිනවා විනා
සිහා කෑ එකද් රජෙකුත් නැත, එබැවින් මෙසේ කිරීම ඔබගේ
රජකුලයට පරිභව කරන්නාක් වැනියැ; යහලු, මාගේ මේ රජගහ
නුවර නම් අසූදහසක් නියම්ගම්හි හා අවලොස්කෙළක් මනුෂ්‍ය
යන්ගෙන්ද ගැවසීගත්තේය; තුන්සියයක් ඔදුන් අඟ මගධ
දෙරටින් යුක්තය; ඉසිගිලිය, වෙභාරය, මෙඝුල්ලය, පාණ්ඩවය,
ගිජ්ඣකූටය, යන මේ පඤ්චමහා පර්වතයන්ගෙන් පරික්ෂිප්තය;
සූලීයෙහි චක්‍රවර්ති රජුන්ගේම වාසස්ථානයවිය; අමිතභොගීවූ

මහධන සිටුවරුන්හෙන් ශොභමානය; එබැවින් යහළු, මෙතුවර මහා එක්ව රජකරවයි කියා සියලු තමාගේ රජඉසුරුද ප්‍රදානය කෙළේය. එකල බොධිසත්වයෝ කියන්නාහු, මහරජ, සත්දවස කින් ලැබෙන චක්‍රවර්ති රාජ්‍යය හැරපියා අවුදින් දැන්තොපගේ අඛිරාජ්‍යය ගතිමිනම් චිත්තාමණික්‍යය හැරපියා කදුමැටිකැවක් ඉන්නාවැන්න, මහරජ, වසතුකාම කෙලෙසකාම යන කාරණා දෙක්හි මාගේ සිත් ඇලීම නොවනසෙයින් තොපවිසින් ප්‍රදානය කරණලද්දාවූ රජසැපතින් මව කම්නැත; මම වනාහි සම්‍යක් සම්බෝධියපතා මහණවීමියි කීසේක. මෙසේ බිම්බිසාර මහරජ තෙමේ මහබෝසතානන්ව නොයෙක් ප්‍රකාරයෙන් රාජ්‍යය පිළිගන්නාපිණිස යාචඤ්ඤාකොවත් නොගිවිස්නාසෙයින්, එසේවී නම් ඔබවහන්සේ යම් දවසෙක බුදුවූසේක් නම්, පළමුකොට මාගේ විජිතයට වැඩිය මැනවයි ආරාධනාකොව ආපසු සවකීය රජගහනුවරටම ප්‍රවිෂටවිය. ඉක්බිති මහබෝසත්තෙම රජහව ප්‍රතිඥදී මාණික්‍යගුහාවුකින් නිකුත් සිංහරාජයෙකුසේ ඒ පාණ්ඩව නම් පර්වතගුහාවෙන් නික්ම අනුක්‍රමයෙන් දනවිසැරිසරා ඇවිදිනාසේක් ආලාරඤ්ඤාලාමය උදඤ්ඤරාමය යන තාපසවරු දෙදෙන කරා එළඹ කිපදිනක් එහි වැස අෂ්ටසමාපත්තීන් උපදවා මේ ධ්‍යාන මාත්‍රයකින් බුදුබව ලැබිසනොහැක්කැයි ඒ තාපස වරුන්ගේ සමයෙහින් නිවන් නැතිසේ දැක, සිඟලු දිව්‍යමනුෂ්‍ය යන්ට තමන්වහන්සේගේ වීර්‍යබල දක්වා මහත්වූ දුෂ්කරක්‍රියා කෙරෙමිනි සිතා උරුවෙලා නම් දනව්වට වැඩ එහි රමණීයවූ වැලිතලාව දැක මේ භූමිප්‍රදේශය රම්‍යයයි සිතා එහිම වාසයට පවන්ගත්සේක. ඒ උරුවෙලායෙහි වැලිතලාව කෙසේවිදයක්? පෙර ධ්‍යානලාභී දසදහසක් තාපසවරුන් බොහෝකලක් විසූ පන්සලය; එකල ඔහු හැමදෙනාම අප හැමදෙනාඅතුරෙන් යම් සේ කෙනෙක් තමතමන් රහසත් කාමවිතර්කාදි පාපයන් සිතුනම් හිරුඋදයේ ගොස් මේ ගඩොවේ කව පමණක් දියට බැස ගංපල් ලෙන් වැලිගෙණවුත් මේ මළු මධ්‍යයෙහි ලාලා ආරෝචනයකළ මැනව, ඕහට මේ දඬුවම්නමැයි කතිකාකළහ. එකල තාපසවරු අකුශල විතර්කාදියක් සිතුකල එම ක්‍රමයෙන් වැලිගොටුවක් ලා ඇවැත් දෙසන්නාහ. දීර්ඝකාලයක් ගියකල යොදුන් පමණ වැලි තලාවක්විය. පසුව තාපසවරුන්ගේ අයාමෙහි උපන් රජ දරුවෝ මේ පෙරඋතුමයන් විසූතැනයයි සිල්වතුන්ඇදි වැලි යයි සිසාරා පවුරු බඳවා උපවාරකළහ; මෙසේ ඒ උරුවෙලා නම් වැලිතලාව රම්‍යසේ දැක දුෂ්කරක්‍රියාවෙන් එහි වාසයට පවන්ගත්සේක. ඉක්බිත්තෙන් පෙර කියනලද කොණ්ඩඤ්ඤය, භද්දිය, වප්පය, මහානාමය, අස්සජිය, යන මේ පඤ්චවර්ගීකභික්ෂූන් ගම් නියම්ගම් රාජධානීයෙහි සැරිසරා ඇවිදිනාහු

ඒ උරුවෙලාවට වැද මහබෝසතානන් දුටහ; එතැන් පටන් එක්ව වාසයකොට සාවුරුද්දක් මුලුල්ලෙහි බොධිසත්වයන් දුෂ්කරක්‍රියා පුරණකල මේ සිද්ධාර්තකුමාරයෝ අද බුදුවෙති සෙව බුදුවෙතිහි, මළු ඇමද නහන බොනපැන්දී වත්පිළිවෙත් කොට දුක්ගෙණ සමීපයෙහි වාසයකළාහුය. ඉක්බිතිමහබෝසතානෝ මේ ශරීරයට පහසුවක්කොට බුදුවියනොහැක්ක, ඉතා මහත්වූ දුක්දී දුෂ්කරක්‍රියාවෙන් මුදුන් පැමිණෙමියි දවසෙක තලඇටක් පමණ හොජනගෙණ මේසේ ක්‍රමයෙන් ආහාර අඩුකොට ගණිමින් කෙළවරදී සම්පූර්ණයෙන් ආහාර වර්ජිතකරමැයි භාවනාවැඩූහ්ක, දෙවතාවෝ ආහාරවර්ජිතබවයෙන් නොත සිත්වයි සිතා, මුඛයෙන් අනුභව නොකරණහෙයින් නවාතූ දහසක් රොමකූපයෙන් දිවඔජස් බහා ජීවිතය රක්ෂාකරමැයි සිතූහ; ඉක්බිත්තෙන් මෙසේ ආහාර වතර්ජී කිරීමෙන් දුර්ල ඛවට පැමිණීකල්හි, රන්කදක්වන් උන්වහන්සේගේ ශ්‍රී ශරීරය කාලවණිණවගියේය; දෙතිස්මහාපුරුෂලක්ෂණ හා අසූ අනූ ව්‍යඤ්ජනයෝද අතුරුදන්ව ශරීරයෙහි නිමගනාව සැඟවීගියහ; සකලශරීරයෙහි ඔස්, ලේ, ක්ෂයව ඇවි සම් නහර පමණක් ශෙෂ විය. මෙසේ මහත් දුෂ්කරක්‍රියාවෙන් දවස්යවන්නාහු, එක් දවසක් තුන්යම් රාත්‍රියෙහි භාවනාකරමින් සිටිකල, කෙළ දහසක් පුරුෂයන්ගේ බල ඇති මහබෝසතානෝ ආහාරවර්ජිතභවයෙන් පැමිණී දුර්ලභීය හෙතුකොටගෙණ රූපසකැඩිය; දරාගත නොහී සක්මන්කෙළවර, ගසකින් හුන්නු ඉදිනිය පත්‍රයක්සේ බිමවැටී විසඳ වූසේක; එවේලෙහි සමහර දෙවතා කෙනෙක්, අහෝ බෙදය! ලොවට හානිවිය, භවක් ගෞතමයෝ බුදුවෙමියි උත්සාහකොට බුදුවියනොහි, බලව දැන් මියගියාහු යයි සිසාරා සිව හඬනි; සමහර දෙවතාකෙනෙක් තව නොමළා හුය, ඇසිල්ලකින් උපදිති, බුදුනොව ඔහට අන්‍යතරයෙක් නොවෙත්යයි කියති, ඉක්බිත්තෙන් එක්දෙවතා කෙනෙක් බෝසතුන් විසංඥිව බිමහුණුක්ෂණයෙහිම කිඹුල්වත්පුරයටවැද සුදොවුන් මහරජාතන්ගේ ශ්‍රී යහන් ගබඩාවෙහි ආකාශයෙහි සිට ආලොක පතුරුවා, "මහරජ! නොපමේ පුත්‍රවූසිද්ධාර්ථ කුමරු තෙමේ මළේය" යි කියය; එබස්අසා මහරජ කියන්නාහු, කිමෙක්ද මපුතනුවෝ බුදුනොව මළාහුදැයි විචාළහ; එසේය මහරජ බුදුවිය නොහී දුෂ්කරක්‍රියාවෙන් භූමියෙහි වැටී මළාහුයයි කිහ; එකල මහරජතෙම කියනුයේ, දෙවතාවෙනී ඉවත යව! නොප කී බස් නොගිවිසිමි, මාගේ පුතනුවන් ලොවුතුරුබුදුනොව මියයාමෙක් නම් අහසට පොළවසේ දුරවන්නේයයි කියා නොගිවිස්සේය. එවිට දෙවතාවා එතනින් අන්තර්ධානව බෝසතුන් කරා එලඹ කුල්හි, ඒ උතුමන් සංඥ ලැබ නැගිසිටගත් බැව් දැක සතුටුව

Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

නැවතත් දිවඟොස් මහරජ, තොප පුනකුවෝ නොමිළානුයේ. ශොක නොකරවයි කියා අතුරුදන්විය. ඉක්බිති මහාපුරුෂ යානන් විසින් කරන්නාවූ ඒ වීර්‍යය අහස හා පොළව ගැට ලන්නාසේද, මහමුහුද පැන් ඉස්නාසේද, මහමේර කම්පාකර වන්නාසේද, ඉතා උගහටවිය. මෙසේ නොයෙක් දුෂ්කර ක්‍රියා කොව නැවත සිතනුයේ, මේ දුෂ්කර ක්‍රියාව වනාහි බුඩත්වය ලැබීමට මාර්ගය නොවෙයි, දුක්කැර පියා ආහාර සෙවනය කොට, කායබල උපදවාගෙණ ඒසමාධිභාවනාව වඩන්නෙමැයි සිතා, පාත්‍රය අතින්ගෙණ අතෙක සථානයන්හි ඇවිද භික්ෂා වනයකොට මධුරවූ ආහාර වළඳන්ට පමන්ගත්සේක; මේසේ කීප දිනකින් ශරීර ශකතිය හා සැඟවීතුබූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයද නැවතත් පහළවූයේය; එකල පස්වග භික්ෂූහු මේ සිඛාර්‍ථකුමාරයෝ සාවුරුද්දක් මුලුල්ලෙහි දුෂ්කර ක්‍රියා පුරා බුදුවියනොහී දැන් ගම් නියම්ගම් ආදියෙහි භික්ෂාවනයකොට මධුරාහාරයන් සිරුර සතපා ගන්නාහ; මෙසේ ක්‍රියාකොට කවුරකලක නම් සම්‍යක් සම්බොධියට පැමිණෙද්ද? ඉස් සෝදා නහවනුකැමතිව පිනිබිඳුඅව්ලා එක්කොට නහමියි සිතන්නාක් වැන්න; මෙහුට උපසථානාදිය කිරීමෙන් දුක්ගෙණ කවර ප්‍රයොජනදැයි, පාසිවුරුගෙණ බෝසතානන් හැර අවලොස් යොදුන් මඟගෙවා ගොස් බරණැස ඉසිපතනයට වැඩ වාසය කරන්වී වන්හ.

මහබෝසතානන් දුටු සිතිය හා කිරිපායාසය පිළිගැණීම.

තවද ත්‍රෛලෝක්‍යෛක දීවාකරවූ මහබෝසතානන් වහන්සේ, දෙවඟනන් විසින් පිරිවරණලදුව දිව්‍යරාජශ්‍රී සමපත් අනුභව කරන්නාවූ සක්දෙවි රජහු පරිද්දෙන් සතළිස්දහසක් වරඟනන් විසින් පිරිවරණලදුව යසෝධරා නම් අග්‍රමහෙෂිකාවන් සමඟ කාම සුඛානුභවයෙන් බොහෝ කලක් රාජ්‍යශ්‍රී සම්පත් විඳ *"කාමසුඛල්ලිකානුයොගය" යි කියනලද රූප, ශබ්ද, ගන්ධ, රස සපර්‍ශ, යන මේ පස්ආකාරවූ කාමසැපෙහි සිතින් ඇලීමෙන් කයින් යෙදීමෙන් නිවන් නැති බව් ලොකයාට ප්‍රකාශකොට, උරුවෙල් දනව්වෙහිදී සාවුරුද්දක් මුලුල්ලෙහි අහස පොළව ගැවලන්නාක්හුමෙන්, බුබාඛ්කුරයෙකු හැර අන් කිසිවෙකු විසින් නොකොටපියා හැකිවූ නොපැමිණිය හැකිවූ දුෂ්කරක්‍රියා

---

* "කාමසුඛල්ලිකානුයොගය" යන තැන්හි කාම, නම් රූපාදි විෂය, සුඛ, නම් ඒ විෂය ආශ්වාදය, අල්ලිකා, නම් සිතින් ආසකතය, අනුයොග නම් එහි කයින් යේදුන්හු බවය.

කරමින්, *"අනන්තකිලමථානුයොගය" යි කියනලද ශරීර පීඩා කිරීමෙහි යෙදී, එම කායවත සම්මදනයෙනුදු මොක්ෂයාගේ අභාවය ලොකයාට ප්‍රකාශකොට මඩ්‍යමප්‍රතිපදාවශයි කියනලද ආයස්‍යඅඤ්ඤාඔහිත මාගීයෙහි පළිපැද ඔළාරිකවූ ආහාර පාන වීර්‍යාදිය අනුභව කරමින් ශරීර සන්තර්පනයකොටගෙණ වස්‍ස කල්හි වෙසඟ මස පුර තුදුස්වක් දින රාත්‍රි පශ්චිම යාමයෙහි මෙබදු මහාමඩ්ගල්‍ය සුප්න පසක් දුටහ.

හේ කවරේදයත්? පළමුවන සුපන්නයනම්:-මේ මහා පෘථිවිය ශ්‍රී යහනක්කොට හිමාලය පර්වතය බිම්බොහනයක්කොට හිසට තබාගෙණ, පෙරදිග සමුද්‍රයෙහි වම් ශ්‍රී හස්තයද, බටහිර සමුද්‍රයෙහි දකුණු ශ්‍රී හස්තයද, දකුණු සාගරයෙහි ශ්‍රී පාද යුග්මයද ලා ශයනය කරන්නාක්මෙන් පෙණීගියහ, මේ සුප්නය වනාහි මහබෝසතාණන්ගේ බුඩඥතාඥාණයෙන් චක්‍රවාලය මුලුල්ලෙහි එම ධර්ම පැතිරපවත්නා බවට පූර්වනිමිත්තය; දෙවෙනි සුපන්නය නම් මහබෝසතාණන්ගේ නානිමණ්ඩලයෙන් සුරක්තවූ නිතණ ගසෙක් පැණනැගී අහස පැහැර සිටගත්තාක්මෙන් දුටහ, මේ සුප්නය වනාහි අවබෝධ කරණ්ලබන ආයස්‍ය අෂ්ටාඩගික මාගීඥය දෙවි මිනිසුන් අතරෙහි සුප්‍රකාශවන බවට පූර්වනිමිත්තය; තුන්වෙනි සුප්නය නම්, මහබෝසතාණන්වහන්සේගේ පාමුලින් කළුහිස සහ ධවලවූ ශරීර ඇති ක්‍රිමිහු පැණනැගී දතමඩල දක්වා වසාගත සිටින්නාක්මෙන් දුටහ, මේ වනාහි බොහෝ ගිහිජනයා සරණගතවන බවට පූර්වනිමිත්තය; සතරවන සුප්නයනම්, අනෙක ප්‍රකාර පැහැ ඇති මනහර රූ ඇති ලිහිණි පක්ෂීන් සතරදෙනෙක් සතර දිශාවෙන් පියාඹා අවුත් මහබෝසතාණන්ගේ ශ්‍රී පාදමූලයෙහි වැටී ක්ෂණයකින් සුදුපැහැ ඇතිවූවාසේ දුටහ; මේ සුප්නය වනාහි ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශූද්‍ර යන සතරකුලයෙහි ජාතයන්ම සස්නෙහි පැවිදිව පරිශුබ්ධීමෙන් එක්වැනිවූ නිර්වාණරසාස්වාදනය කරණ බවට පූර්වනිමිත්තය; පස්වෙනි සුප්නයනම් මහත් අශුචිපර්වත යක් මත්තෙහි, එම අශුචි ශරීරයෙහි නොඇති බවමොබ සක්මන් කරන්නාසේදුටහ; ඒ වනාහි ලොකවාසීන්විසින් පුදනු ලබන මහත් ප්‍රත්‍යයදායකයාවූ, එම්ලාභසත්කාරාදියෙහි ලොභ නොකොට පරිභොග කරණ බවට පූර්වනිමිත්තය; මෙසේ ඒ මහ බෝසතාණන්වහන්සේ මේ පඤ්ච මහාමඩ්ගල්‍ය සුපන්නයන් දැක එකානනයෙන් අදම මට බුඩරාජ්‍යය අත්වේයයි නිශ්චයකොට් ගෙණ වෙසඟ මැදි පොහොදින අලුයම් වේලෙහි දැවටිදඬු කා

* "අනන්තකිලමථානුයොගය" යන තැන්හි අනන්ත,නම් ශරීරය, කිලමථ නම්පීඩාවය, අනුයෝග නම් එහි නියුක්තය.

මූබශොධනඅකොට සිවුරු මනාසේ හැඳ පෙරව අජපාල නාග්‍රොධ නම් නුගරුක්මූලටවැඩ නිසණාවනවේලාව පැමිණෙන තෙක් නැගෙණහිර ලොකධාතුව බලා, උදයගිරි මස්තක ප්‍රාප්තවූ බාලඃකී මණ්ඩලඃයමෙන් සවකීය ශරීරාලොකයෙන් සියලු නාග්‍රොධ වෘක්ෂඃය සවණීණ වණීණකරමින් වැඩහුන්සේක.

එසමයෙහි එම උරුවෙල්දනව්වෙහි සෙනානි නම් නියම්ගම සෙනානිනම් කෙළෙඹිහුගේ දූවූ කලපලක්ෂඃයක් පිරූ පාරමිතා ඇති සුජාතා නම් සිවුදූ තොමෝ, තමා වැනිවිය පැමිණි කල්හි, ඉදින් "මම් සමවූ ජාති භා ධන රූ ඇති සිටෙකු කෙරේ සරණ රැක කුලුදුල් පුතෙකු ලදුඃඛේනම්," එතැන් පටන් අවුරුදුපතා ලක්ෂඃයක් අඟනා ක්ෂීරපායඃසඃකින් පූජා කෙරෙමැ" යි අජපාල නාග්‍රොධ වෘක්ෂයෙහි අධිගෘහිත දෙවතාවාට අයැද සිටියාය. මෑත භාගයෙහි ඕතොමෝ බරණැස සිටාතන් කෙරේ වැස කුලුදුල් වාරයෙහිම යස නම් පුතෙකු ලත්කල්හි, එවක් පටන් අවුරුදු පතා ඒ නුගගස දෙවතාවාට බිලියම් දෙයි; මේසේ පිරුණාවූ මනදෙල ඇති ඒ සුජාතා නම් සිටු දූ වෛශාඛ මාස යෙහිවූ පසළොස්වක් පොහෝ දවස ඒ වෘක්ෂයෙහි අධිගෘහිත දෙවතාවාට තමන් විසින් පෙර කරණු ලැබූ ප්‍රතිඥ නියාවට බලි පූජා කරණු පිණිස එදින අලුයම් නැගිසිට දෙවපූජා කරමැයි සිතා, ඉස්සෝදු නහා දහසක් දෙනුන් වැලීම් වෙනෙහි කවා, ඔවුන්ගේ කිරිදෙව පන්සියයක් දෙනුන් පොවා, මේසේ ක්‍රම යෙන් අවදෙණකු දක්වා පොවා ඉක්බිති ඔවුන්ගේ කිරි දෙණා සඳහා මුදුලූ වස්සන් දෙනුන් තනමූලට ලංනොවන කල්හි පැලූ බදුන්වලට ක්ෂීරධාරාවෝ තුමූම් වැගිර භාජනපුරා ඉතිරසිටියාහ. ඒ ආශ්චය්‍යීය් දුටු සුජාතාවෝ තමන්ගේ සවඃසත්‍යයෙන්ම කිරි ගෙණ නැවුම් මහසැලෙකබහා අගරු දෙව්දුරු කපුරු කලුවැල් සඳුන් ගනාදිවූ සුවඳ දර උදු කිරිබත් පිසන්නට පවන්ඃත; ඒ බත් පැසෙන කල්හි මහත් මහත් බුබුලු නැගී දක්ෂිණාවෘත්තව සැළුවට දිවෙත්, එහෙත් එක බුබුලෙකුදු පිටත නොයෙයි; උදුනෙන් පහත් සිළුවක දූළි පමණකුදු දුම් නොනැගෙයි, එකල්හි වරම් රජදරුවෝ සතරදෙන අවුත් උදුන සතරදිග රැකවල්ඃත්ත; සක්දෙව්රජ අවුත් දඬුවම් පෙණහෙලි උදු ගිනි දල්වා අරක්කැමිකම් කෙරෙයි; මහබඹු තෙමේ උදුන් මුදුනෙහි සේසත්හෙණ සිවඃත; දසදහසක් සක්වළ දෙවියෝ, දෙව්ලොව හා මනුෂ්‍ය ලොකඃයහිද ඇතිතාක් රස ඕජස් තම තමන්ගේ ආනුභාවයෙන් දඹුවැල්බෑයක් පෙලා මධුරස ගන්නවුන්සේ හැරගෙණ ඒ බදුනෙහි බහාලූහ; එතල සුජාතාතොමෝ මේ ආශ්චය්‍යීමත් කාරණඃදැක, තමන්ගේ පූණීණා නම් දාසිය කැඳවා

බුහුනතියනි, මෙතෙක් කල් බත් පිසතකල මෙසේවූ ප්‍රාතිහාර්‍යයි යක් නුදුටුවිරිමි, අපගේ ඒ වෘක්ෂ දෙවතාවා අද අප කෙරෙහි පැහැදගියේවත, තෙපි පළමුව දිව ඒ දෙවාලය හැමද පියවයි පිවත්කර හැවීය; එකල පූර්ණා නම් දැසිතොමෝ අජපාලනම් න්‍යග්‍රොධ වෘක්ෂයකරා පැමිණිකල, රුක්මුල්හි පූජිදිහාව බලා ශරත්කාලයෙහි චන්ද්‍රමාමෙන්වැඩහුන් මහසතානන්ගේ ශ්‍රී ශරීර සෞභාග්‍යය දැක අද අපගේ වෘක්ෂ දෙවතාවා විමතීන් බැස සවහස්තායෙන්ම කිරිපිඬු පිළිගන්නට හුන්නේවනැයි බියපත්ව ආපසු දිවගොස්, "සවාමි දියනියනි! ඔබගේ අභිවාඩිය පිණිස වෘක්ෂදෙවතාතෙමේ අද සියතින්ම දුනය පිළිගැණීමට රුක් මුල්හි වැඩහිදිනේය; එබැවින් වහා ගොස් කිරිබත් පුදව" යි සුජාතාවහට සැළකළා; සුජාතා තොමෝ ඇ කී තෙපුල් අසා ඉතා සතුටුව මෙබඳු සතුටු හසුන් දන්වූ නිවනැති අද පවන් මාගේ වැඩුමහල් දූයයි කියා දූ තනතුරෙහි තබා සිරිත් ප්‍රකාර දුහිතාවක්හට දෙන්නාවූ ආභරණ හා දාසාද සම්පත්ද දුන. ඉක්බිති සුජාතාතොමෝ ලක්ෂයක් අගනා රන්තලියක් ගෙන්වා එහි පරම මධුරවූ ක්ෂීරපායාසය බහා අනික් රන්තළියකින් වසා, ඊමත්තෙහි සුදු වස්ත්‍රයකින් වසා, තොමෝද ඉස් සෝදා නහා දෙවඟනක් සෙයින් සම්භාරණයෙන් සැරසී රන්තලිය හිස මතුයෙහි තිබාගෙණ න්‍යග්‍රොධ වෘක්ෂයට අභිමුඛව යන්නී, ඒ සියලු නුඹරුක රන්වන් කෙරෙමින් නිඝමවූ දෙවතාලීලා ඇතිව පුණ්‍ය ශ්‍රී ශොභාවෙන් වැඩහුන් මහපුරුෂයාකන් දැක ඉතා සතුටු සිත් ඇත්තී වෘක්ෂදෙවතාවාය යන සංඥාවෙන් දුටුතැන් පටන්සිට නැමිනැමීගොස් හිසින් කසුන්තළියබාගෙණ පධාන්‍යය කැරපියා ඕඝබෝසතානන්ගේ මෘදු කොමල හස්තයෙහි තබා බැස හෙවවැද, "මාගේමනදෙල යම්සේ සමාඛ්විද, එපරිද්දෙන්ම ඔබවහන්සේගේ මනොරථයත් මුදුන් පැමිණේව" යි කියා ක්ෂීර පායාසයෙන්පිරූ ලක්ෂයක් අගනා ඒ රන්තලිය මහසත්හට පුදා ගියාය. මේසේ සුජාතාවන්විසින් පිළිගන්වනලද ක්ෂීරපායාසය, මහා බ්‍රහ්මයා විසින් පැවිදිවනදා පිළිගැන්වූ පාත්‍රය සාවුරුද්දක් තිබි ඳදවස් අනතඛානවූහෙයින්ද, බෝමැඩව එළඹෙනදිනයෙහි ඉතරන්තළියක ක්ෂීරපායාසය වැළදීම සියළු බුදුවරයන්ගේම ධර්මතාවක් හෙයින්ද, සුජාතාවන් විසින් පුදනලද රන්තලිය සමඟ ක්ෂීරපායාසය පිළිගෙණ, හුන් තැනින් නැගී ඒ වෘක්ෂය සිසාරා ප්‍රදක්ෂිණාකොට තළියගෙණ නෙරඤ්ජරානම් ගංතෙරට එලඹී, බුදුවන සියලු බොධිසත්වරයන්ම බුදුවන දිනයෙහි බැස නහන සුප්‍රතිෂ්ඨිත නම් තොට සමීපයේ සිහිල් සෙවනෙහි රන් තළිය තබා, ගඟවබැස සනානඝකොට ගොඩනැගී අහිත්ධවජය හැදපෙරව පූජිදිගබලා වැඩහිඳ එකුන්පණස් දිවක් කෙරෙමින්

ඒ පරම මධුරවූ නිරුදක ක්ෂීරපායාසය නිරවශෙෂකොටම වැළඳු සේක; එදු වැළඳු කිරිබතම බුදුව බෝමැඩ වැඩහුන් සත්සතිය පිළිබඳ එක එක දවසට එක එක පිඬක් බැගින් ආහාරවූයේය.

මෙපමණකල් මුලුල්ලෙහි අන් කිසි ආහාර පරිභොගයක් හෝ නහන මුඛධොවනාදි ක්‍රියාවක් හෝ නොකෙළේය. ධ්‍යාන සැපයෙන් මාඝිහ සැපයෙන්, ඵල සැපයෙන්ම දවස් යැවූසේක; ඒ ක්ෂීරපායාසය වැළඳු ඉක්බිති, මේ රන්තළියෙන් මට කම්නැත, බුදුවීමට කාරණයක් පරීක්ෂා කෙරෙමි යි සිතා, ඒ තළිය හැර ගෙණ, "ඉදින් මට අද බුඩත්වය ලැබේනම් මේරන්තළිය උඩුගං බලා යේවා, ඉදින් බුදුවිය නොහේනම් යටිගංබලා යේවා" යි අධිෂ්ඨානකොට, ඒ ගත රන්තළිය ගඟට දැමූසේක; එකෙණෙහි ඒ තළිය, දිය දෙබෑකොට ධාවනය කරන්නාවූ නෞකාවක් මෙන් ගඟ මැදට දිව, නැවත ශීඝ්‍රගමන් ඇති සෙනවයෙකුසේ අසූරියනක් තැන් උඩුගංබලා ගොස්, එක් දියසලාවක හැසී මහාකාලනම් නාරජුගේ නාගභවනයට වැදී කකුසඳ, කොනා ගම, කාශ්‍යප යන තුන්බුදුවරයන්ගේ පාරිභොගික රන්තළි තුනෙහී වැදී රාවය කෙරෙමින්, ඒ තුන්තළි මතුකොට එයට යටවපිහිටියේය, ඉක්බිති මහාකාලනම් නාරජතෙම තළියතුනු හඬ අසා, තමන් කපක් මුලුල්ලෙහි හිඳිනා ආයු ඇති හෙයින්, ආදි තුන්තළියක් නුනුහඬ අසානිඛෙන හෙයින් මේ තළියෙත් හඬ අසා, "කොල මින් පෙරවිදුන් * එක් බුදුකෙනෙක් බුදුවිය; ඊයෙත් එක් බුදුකෙනෙක් බුදුවිය; අදත් එක් බුදුකෙනෙක් බුදුවේයයි" යි බුදුමඟුලට යම්හයි නාගාඩහනාවන් රැස්කොට පූජාසරහා සිටගති.

ඉක්බිත්තෙන් මහබෝසතානන් වහන්සේ නෙරඤ්ජරා නදී තීරයෙහි සුගන්ධ පුෂ්පයෙන් සැදුම්ලද්දාවූ නීලවර්ණ ප්‍රභාවෙන් සිත්කළුවූ සල්වනයෙහි දිවාවිහරණයකොට පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා, සායනහෘසමයෙහි හෙවත් දිවසාවසානයෙහි සවර්ණ වර්ණවූ මනොඥ සුගන්ධපුෂ්පයන් තුවටුවෙන් ගිළිගි සිවුර මත්තෙහි වැටෙන්ව වන්කල්හි දිව්‍යසුරයන් විසින් වස්වනලද පුෂ්පවර්ෂාධාරාවෙන්ද, දිව්‍යාඔහනාවන් විසින් පවත්වන ලද සාධු නාදයෙන්ද, එසේම දෙවතාවන්විසින් අලඞ්කාරකොට සරසනලද මාගීයෙන් බොධිවෘක්ෂාභිමුඛව වඩනාසේක; එකල කප් ලක්ෂයක් මුලුල්ලෙහි ප්‍රාර්ථනාකොට ආවාවූ සොඪියනම්

* දහසක් අවුරුද්දෙන් අඟලක් වඩන්නා මේ මහා පෘථිවිය සත් ගම්වක් උස්ව වැඩුනුකල බුඩාතතරයෙක් නම්වෙයි; මෙසේ දිගි කාලයක් විසිමට ඉතාකාලනම් නාරජව ආයු ඇති බැවින් ඊයේ පෙරවිදුයයි සිතිහ.

බ්‍රාහ්මණයෙක් තණකොළ කදක් ගෙණ බොධිසත්වයන් පෙර මහට එනුයේ මහසත්තානන්ගේ දෙහෙත්විලාසය නරඹා පැහැදුනු සිත්ඇත්තේ, භවත්හට මෙයින් යම්කිසි ප්‍රයෝජනයක්ලැබේවා යයි; අදිටන්කොට, එයින් තණ අවමිටක් ගෙණ ශ්‍රීමත්සනයට පිළිඟැන්වීය. මෙසේ ඒ කුසතණ *අවමිට ගෙණ මිටසිඑවූ කඳින් හා ඝාබාමණ්ඩලයෙන්ද බබලන්නාවූ තමන්වහන්සේ උපදනා දවස්ම උපන්නාවූ සියලු බුදුවරයන් බුදුවන ජයභූමි යෙහි පිහිටියාවූ තමන්වහන්සේගේ කරුණාවටබදු ශීතලවූ ඇති අශෝකවෘක්ෂ බොධිද්‍රැම රාජයාකාර පැමිණ දකුණු දිශාභාග යෙහි වැඩසිටිසේක; එතෙණෙහි දකුණු සක්වළ පාතාලයෙහි ගැසී උතුරු සක්වළ බඹලෝ ගැසී පැතහැංගාසේ කම්පාවිය; එසමයෙහි මහබෝසතානෝ පශ්චිම දිශාභාගයටගොස් වැඩසිටි සේක, ඒ භූමිභාගයද එසේම කම්පාවිය; නැවත උත්තරදිශා භාගයට ගොස් වැඩසිටිසේක; හෙද එසේම කම්පාවිය. ඉක්බිති නැඟෙණහිර දිශාභාගයට ගොස් වැඩසිටිසේක; ඒ සථානය පශ්චිමයට ප්‍රමාණවූ අවලසථානය හෙයින් නිශ්චලවූයේය. මේ කාරණය දුටු මහාපුරුෂයාණෝ, පෙර සියලු බුදුවරයින්ම මාර විජයකොට කෙලෙස විධ්වංසනයකළාවූ උත්තමසථානයයිසලකා, තණ්හාමිටි අගින් අල්වාගෙණ සැලූසේක; එකෙණෙහිම තීක්ෂ්ණ නමැති ඥානසමූහයා මඩ්‍යයට දමාලූ අංකුශයක්සේ, ඒ කුසතණ පොළවට දමාලීම හා සමගම මහාපුරුෂයානන්ගේ පාරමිතාභූ භාවයෙන් මහාපෘථිවිය විවෘතව තුදුස්රියන් වප්‍රාසනයක් පැන නැගී අතුරණලද ඒ හැම කුසතණ චිත්‍රකර්මානතයක්සේ මුල් සැඟවී අක්පිටිතව නික්ම ශ්‍රෝහාමත්ව සිටගත්හ, මහාබෝධි සත්ව තෙමේ යථොක්ත වප්‍රාසනාරූඪව වැඩහිඳ සිතතුයේ:– 'මේ මහාපෘථිවිය පරිවර්තීනිතව සියදහස්ඉණන් සෙනහඬ වන් කල්හිදු ආකාශගඞ්ගාය ශුෂ්කනදීජලතාවෙන් පැලෙණකල්හිදු, ගිනිගෙණ දිළිහෙන සිහිරහුරු වස්තව වන්කල්හිදු මාගේ මේ ශරීරයෙහි මස්, ලේ, ඇට, නහර, විසලි සුණුවිසුණුවනකල්හිදු, සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි අධික වීර්‍යකොට මා විසින් ලබාගත්තාවූ මේ වප්‍රාසනය හැරපියා, සම්‍යක්සම්බෝධි යට පැමිණෙම්ය නොනැගිවිමැ" යි වීර්‍යාධිෂ්ඨානයෙන් බඳනාලද බඳපශ්චිමකඇතිව වටමවසිඑවූ බෝකඳටපිටලා නැඟෙණහිරට මුහුණලා වැඩහුන්සේක.

---

* ජම්බුවිපවාසීන් විසින් කුසතණ කීදගැනීමට හා බිම අතුට නිදුගැණීම් පිණිසත් හාවිතා කරණ බැවින්, සොවිජනම් බ්‍රාහ්මණයා යථොක්ත කුසතණ අවමිට මහසත්තානන්ම සූණාතෙළේශයි දනයුතු.

Printed & Published by **K. D. PERERA SON,** *Vidyadarsa Press, Colombo.*

මාර සඞ්‍රාමය.

මෙසේ බොධිද්‍රැමමූලයෙහි වජ්‍රාසනාරූඪව වැඩහුන් මහා පුරුෂයාණන්වහන්සේව අමරපුරෙශ්වරවූ දහසක් නෙත් ඇති ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ එක්සියවිසිරියන් පමණදිග ඇති විජයුත්තර නම් ශඛ්‍යය පෙරටුවසිට පිඹිමින් සිටියේය; පඤ්චසිඛ්‍යනම් ගන්ධර්ව දිව්‍යපුත්‍රතෙම බෙලුවපාණ්ඩු නම් වීණාවහෙණ වයමින් සිටියේය. සූණාම නම් දිව්‍යරාජතෙම ශරත්කාලයෙහි සඳරැස් සමූහයක්සේ ශොභමානවූ දිව්‍යචාමරයහෙණ මදින්මද සලමින් සිටියේය. සන්තුසිතනම් දිව්‍යරාජතෙම මැණික් තල්වැටහෙණ පවන්සලමින් සිටියේය; එසේම චතුර්මූඛොපලක්ෂිත සහම්පති නම් මහාබ්‍රහ්මතෙම දෙවනපුන්සඳමඩලක් බඳුවූ ශ්වේතච්ඡත්‍රය බෝසතාණන් මස්තකයෙහි ධරමින් සිටියේය; මහාකාලනම් නාරජතෙමේ අසූදහසක් පමණ නාගාඛ්‍යතාවන් විසින් පිරිවරණලදුව සතුතිගීතිකාශතකයන් ගායනාකරමින් සිටියේය; ප්‍රජාපත්‍යාදි දෙතිස් දිව්‍යපුත්‍රයන්ගේ දෙතිස් දෙවි කුමරියෝ දිව්‍යමලින් පිරුණාවූ අනෙකවිධ රන්කරඬුහෙණ පුදමින් සිටියාහ; දසදහසක් සක්වල සිහලු දෙවසමූහයා මඞ්ගල්‍ය වෙහධාරිව ධජජ්තාකාදි මඞ්ගල්‍ය භාණ්ඩයන් හත් අත් ඇතිව සාධුකාර සහස්‍රයන් පවත්වමින් බෝමැඩ වැඩහුන් ඕහිපුරුෂයා නන් පිරිවරා සිටියාහුය.

එසමයෙහි සුයාමදිව්‍යරාජතෙම වසවර්තිමාරයා දැක්ක බිය පත්ව සැඟවුනාසේ පළමුකොට අසනපර්වතයව වනී; එකෙණෙහිම පුණ්ණවල්ලතෙමේ මහබෝසතාණන්ගේ අභිමුඛයව පුදුළු රිදීකැවපතුක්සේ උදයපර්වත මස්තකයෙහි කිඹිමල ප්‍රභාවෙන් ලීලොපෙතව බබලන්ව වන. එසමයෙහි වශවර්තිමාරතෙමේ සහවුරුද්දක් මුලුල්ලෙහි දිවෙය්‍යශව්‍යයක් කැරපියා මහබෝසතාණන්ගේ සිතෙහි අකුශල විතර්කයක් උපදනා අවකාශයක් බලමින් හුන්නේ, ඊවකිසි අවකාශයක් නොලදින් පසුව සිතනුයේ, පැවිදිවීමට යනදුන් මාගේ වචනය නොතකා පලාගියාහ, මේ සහවුරුද්ද මුලුල්ලෙහිත් ඔහුගේ චිත්තයෙහි අකුශල විතර්කයක් නවතැන්වීමෙන් මව අවකාශයක් නොපැයේය, දැන් බුදුවෙමිසි වජ්‍රාසනාරූඪව හිඳින්නේය, එකානතායෙන් සංසාරයට වූයේ ඉතා පිරිහීමක, වහනියෙන් දවනලද වනලැහැබක්මෙන් අසිහසින් නිශ්‍රීකවේ; එබැවින් මේ සුඛොදන මහා රාජපුත්‍රවූ සිඛාඊ කුමාරයා නොසිදුහත් කෙරෙමි හෙවත් සිඛ නොවූ අඊ ඇත්තක්හු කෙරෙමි; ඔහු මාගේ විෂය ඉක්මවන්නවද නොදෙමැයි සිතා චක්‍රවර්ති දෙව්ලොව්ව ගොස් මරසෙනඟහව මෙපවත් කියා දිව්‍යබ්‍රහ්මයන් කුමපාකාරව්මව පොහොසත්වූ

"මාරසොඟා" නම්වූ භෙරි සොඟාවක් කරවිය; ඒ භෙරිසොඟාව බ්‍රහ්මාණ්ඩය දක්වා ඇසිනා, දිව්‍යබ්‍රහ්මයෝ වෙවුලා ගියහ, සියළු සතුන් සිත් ඉපිලගියහ, ඒ ශබ්දය ඇසූ මහබෝසතානෝ තමන් වහන්සේගේ බුදුමගුලට ගැසූ තිබිරිබෙරක් පමණවත් සරු නොකොට, අද වසවත්මරු මාකරා එන්නේ, මාගේ වික්‍රමය මූලු ලොකාවාසීන්ට දක්වම්හයි ප්‍රීතීන් පිණාගිය සිත් ඇතිව නිශ්චලවම වැඩහුන්සේක.

ඉක්බිති ඒ භෙරිසොඟාව ඇසූ ඔහුගේ මාරසමූහයා අද අපගේ මාර දිව්‍යපුත්‍රතෙම මහත්වූ සඞ්ග්‍රාමයක් කරන්නේ වනැයි නන් අවිගෙණ දිව අවුදින් ඔහු පිරිවරා සිටගත්හ. එකල වසවත්තීමාර දිව්‍යපුත්‍ර තෙමේ නිර්මිත කරණලද යෙළ සියයක් යොදුන් උස ඇති ගිරිමෙඛලා නම් ගජ රජ පිටට පැනනැඟී පන්සියයක් හිස්මවා ගිනිවිලක්සේ දහසක් රතැස් මවා, දෙක පොලින් නික්ම තිබෙන අතිශයින් භයඞ්කරවූ දහසක් තියුණු දළමවා, දහසක් අත්මවාගෙණ චක්‍ර තොමර හෙණඩිවාල කර වාලාඞ්වඳු චක්‍රාදි දහසක් ආයුධගෙණ රතැස් බමව බමවා පිටි තොල්කකා, "මටහිමි සෙනාව මාගේ සතුරා අල්වාදෙව"යි කිය කියා මහබෝසතානන් දිශාවට නික්මුනේ; එසෙණෙහි යළොකතා සෙනාව මරහුට ඉදිරියෙන් අටසාලිස් හවිවක් දිවෙයි, වම් ඇලයෙන් අවසාලිස් හවිවක් දිවෙයි; දකුණැලයෙන් අව සාළිස් හවිවක් දිවෙයි; පසුභාගයෙන් මුහුදසේ චක්‍රාවපමිතය දක්වා දිවෙයි; උඩින් සතිස්ගවිවක් පමණතැන් ගැවසී දිවෙයි; ඒ සෙනාවගේ සොඟාව ප්‍රලය කාලයෙහි මෙඝමාලාවන්ගේ සඞ්ඝට්ටනයෙන් උපන් ප්‍රචණ්ඩ සෙනදහසුන්ගේ හෙනහඬක් සෙයින් දරුණුවූ භොරබ්රම් හඬ ගව් සාරදහසක් පමණ තැන පොළව පැළියන හඬක්සේ ඇසෙයි; මෙසේ ඒ මරසෙනඟ ඇත් අස්, ගව, මහිෂ, සුනඛ, නා, පොළොන්, දුරපිඹුරු යනාදිවූ එකෙක් ගත්වෙස් අනිකෙක් නොගෙණ බිහිසුහුහඬින් එකනින් නාදකරමින්, සිදුහත්කුමරු ගණුව! අනුව! විදුව! මරව! පාදය ගෙණ පරසක්වළ ඉසව! සි යනාදී මැතදෙඩමින් ගුරුළුරජක්හු අල්ලන්ට නික්මෙන දියබරණුන්සේ තෙළොකෙක දිවාකර ප්‍රතිභාග මහාපුරුෂයානන් මැඩපවත්වන අදහසින් දිව ආවා හුය. මෙසේ ඒ මරසෙනඟ බෝමැඩව පැමිණෙන්ට වන්කල්හි බොධිසත්වයන් පිරිවරා සිටි දෙවියන් අතුරෙහි එක දෙවතා වෙකුදු සිටිනට අසමර්ථවිය; දිව්‍ය සමූහයා සෙනා සහිතව එන් නාවූ වසවත්තීමාරයා දුරින් දැක හයින් පෙළුනාහු කප නස්නා පවනින් ගැසූ පුලුන්පෙද සමූහයක්මෙන් අහිමුඛ අහිමුඛ දිශා වෙන් පලාගියාහුය; මහාඛාලනම් නාරජතෙම තමන්ගේ සැට දහසක් නා මෙනෙවියන් සමඟ සතුතිගීතිකා කථනය කරමින්

සිටියේ, එතෙණෙහිම පොළවකිම්දගෙණ තමාගේ පන්සියයක් යොදුන් මාළුජාතිකතම් නාගභවනයට ගොස් දෙඅතින් මුහුණ වසාගෙණ "අහෝ සිඛාඊකුමාරයානන්ගේ රූසිරි අද නිෂ්ප්‍රභා වන්නේය"යි කියකියා කම්පිතවූ ලය ඇත්තේ යහන් මතුයෙහි මුනින්වැදහොත්තේය; සුජම්පතිනම් ශක්‍රදිව්‍යරාජතෙමේ තමන් මහපින් බලැති හෙයිනුත් මහා ධෛර්‍යී ඇති හෙයිනුත් තමන්ගේ විජයුත්තර නම් ජයසඛ බිමහෙලා පිට වතුරුවා ගෙණ දිවන්නේ තමාගේ ශක්‍රපුරය බලා නොගොස් සක්වළ ශලමුදුනට නැගී කරුණා බෝමැඩ දිශාව බලබලා සිටියේය; සුශාම සනාතුම්නාදී දෙවියෝ තමතමන් අතතුබූ තල්වැව චාමර ආදිවූ පූජාභාණ්ඩයන් දමදමා සිටි සිටි දිගින් පලාගියාහ; සහම්පති නම් මහාබ්‍රහ්මතෙමේ තමා අත තුබූ ශ්වෙතච්ඡත්‍රය (ධවලාත පත්‍රය) හකුලා සක්වළමුදුනට දමා තමාගේ බඹපිරිස් ගියඅත් නොදැන බ්‍රහ්මලොකයටම දිවීය. මෙසේ හැම දෙව් බඹුන් පලාගියකල්හි, මහාපුරුෂොත්තමයා හුදකලාව වැඩහිඳ පිටපසින් තමන්හරා දිව එන මරසෙනඟ දැක, තෙජස්නම්වූ ගිනිකඳ වැගිරෙණ පලඟැටි සමූහයක්කොටත් නොසලකා මෙතෙක්දෙන හුදකලාවූ මා එක්කෙනෙකුන් සමඟ යුදකිරීම පිණිස මහත්වූ වෙහෙසකින් හා ව්‍යායාමයකින්ද දිවඑන්නෝය; මෙතැන්හි මාගේ දෙමව්පිය නෑ සහොදර පුත්‍ර මිත්‍රාදී කිසි වෙකුත් නැත්තාහ; එහෙත් මේ සාරාසඛ්‍ය කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි අත්නොහැර ආවාවූ මාගේ සත්‍යපාරමිතාව වනාහි මෑනියෝ වන්නීය; ඇඹුරුවූ ප්‍රඥාපාරමිතාව පියානෝ වන්නේය; මවිසින් අවබෝධකරණලද ධර්මය සොහොවුරු වන්නේය, මාගේ මෛත්‍රී පාරමිතාව කල්‍යාණමිත්‍රවන්නේය; මාගේ අවලවූ ශ්‍රද්ධාතාමෝ ප්‍රියකාන්තා වන්නීය; ක්ෂාන්තිපාරමිතාව වනාහි ඔව අනුබල ප්‍රියපුත්‍රවන්නේය; එසේහෙයින් මේමාගේ නැයන් සදෙනාට මේතෙක්කල් මුලුල්ලෙහි එක්දවසෙක් හෝ එක් පැයකුදුකිසි හානියක් නොකොට රක්ෂාකෙළෙමි; එබැවින් මෙහි මාගේ ජීවිතය සමාන නැයොත් ඇත; තවද මෙතෙක් කල්මුලුල්ලෙහි මා අත්නොහැර විසුවාවූ මා විසින් පොෂ්‍ය කරණලද්දාවූ, මාගේසමත්‍රිංශත් පාරමිතානමැති මහායෝධයෝ තිස්දෙන අද මේ මාඟට විරුඬව එන්නාවූ මාරපිරිස ලුහුබදවා මා රක්ෂාකෙරෙත්මය; එසේහෙයින් බලයෝධයෝත් මට ඇත් තාහ; තවද මාගේ සත්තිස්බෝධිපාක්ෂික ධර්මයෝ අද මාගේ මහාමන්ත්‍රීවන්නේය; තවද මාගේ නවදහස් අසූඅසඟකොළපණස් ලක්ෂසතිස්මහා සංවරශීල සමූහය මාගේ මහාබල සෙනඟ වන්නේය; එසේහෙයින් මාගේ ශීලතමැති හවසෙනාවද අදමා අත්හැර නොයෙත්මය; තවද මාගේ ගම්භීරවූ ගුණසමූහය

ගැඹුරුවූ මහා අඟල වන්නේය; මෛත්‍රිය එහි පුරුකිබෙන්නාවූ ජලය වන්නේය; එබැවින් මේ මහා අඟල මා කරු අද සතුරන් වැද්ද නොදේමය; තවද මාගේ පාරමිතා නමැති තුලින් බැඳ නගනලද සෙජෝමයවූ මහපවුර බ්‍රහ්මාණ්ඩය දක්වා උස්ව සිටියේමය; එසේ හෙයින් ඒ මහා ප්‍රාකාරය පැනඒමට මාරසතු රුට අවසර නොදෙත්මය; මා විසින් විශෙෂයෙන් රක්ෂාකරණ ලද චතුපාරිශුද්ධි ශීලයෝ වන්හි සතර මහ වාඝල්වන්නාහුය; මාගේ ඉන්ද්‍රියසංවරශීලය පක්ෂපාතවූ වාරපාලයෙක් සමාන වන්නේය; එසේහෙයින් ඒ මාගේ වාරපාලයා අද සතුරන්ට වාඝල් නොහැර මා රක්ෂාකෙරේමය; මාගේ මේ විජ්‍රාඝනය මා හට ඝණිවාහනය වන්නේය, මේ ජය ශ්‍රී මහාබොධිඥානය සතුරන් පරදවන්නා ජයඝේෂය වන්නේය; එබැවින් මා නිසා උපන් මොහු දෙදෙනත් අද මාහැර නොයෙක්මය. යනාදි වශයෙන් අපගේ මහාපුරුෂයානන්වහන්සේ තමන් වහන් සේගේ පාරමිතා නමැති සේමවූ මහානගරය මවා ශීල නමැති සෙනඟින් කදයුරුබැඳ, සුදශීන මහත්තුවර මහපිරිස් පිරිවරාගුන් සුදශීන නම් චක්‍රවර්ති රජහුමෙන්ද, දෙවියන් විසින් පිරිවරණ ලදුව අසුර සෙනඟට බියනොවන සක්දෙවිරජහු පරිද්දෙන්ද සිංහයන් විසින් පිරිවරණලදුව සිවිල් සෙනඟට බියනොවන කෙසරසිංහරාජයෙකුසේද, දානාදි දශපාරමිධර්මයන් ආවර්ජනා කෙරෙමින් තමන්වහන්සේගේ ගුණසමූහ නමැති ශ්‍රී ශරීර සඤ්ඣයෙන් වීහිදෙන්නාවූ තෙජස් නමැති වහනියෙන් මර සෙන් නමැති පලඟැටිහු වැදීමෙන්දවා හසමව වැවෙතැයි සිතා නිර්භීතවම් විදුරුසුන්පිට සන්ත්‍රාස රහිතව වැඩහුන්සේක.

ඉක්බිති ධර්මේශ්වරවූ මහා බොධිසත්වයන්ගේ ඉදිරියෙහි දුර්නිමිත්තයෝ පහළවූහ; මහා පෘථිවි තොමෝ සෙමෙන් සෙමෙන් වෙව්ලන්ට පවන්ගත, සතර දිශාවෝ අදුරුවූහ, දරුණුවූ උල්කා දහස් හඬන් අහසින් හින, සූර්‍යදිව්‍යරාජතෙම මාරසෙනා බා සැඟවෙන්නාක්මෙන් විනෂට රශ්මි ඇතිව හසඤ්ඣතවිය, අපඟත මෙඝ ඇති ගගනතලයෙහි ඉඳුවාප යෝද විදුලිද ඇතිවූහ, මහවන කවුඹුඹුමූහුඟයෝද මහවුහුනෝද අමනොඥ නාද කළාහුය. මේසේවූ අවලක්ෂණ පෙණෙමින් සිටියදී පළිත සමූහයක් දැකත් පුලුන් පෙදක්සේ ආකාශයට ඔසවා සුණුවිසුණු කරණ තරම් ඒ වශවර්තිමාරතෙම බෝමැඩ කරු දිව අවුත්, දිළිසෙන ගවයක්වෙතට ලංවිය නොහෙන මැස්සෙක් පරිද්දෙන් මහබෝසතානන්ගේ පුණ්‍යතෙජානුභාව යෙන් ඔලුවට වැද්දනොගී පිටතින්සිට, ප්‍රචණ්ඩවූ වාතයක්මවා මොහු පවන් පහරින් පරඝක්වල හෙළමිසි සිතා, කල්පාන්ත වාතයක්වැනි ප්‍රචණ්ඩ වාතයක් මවාලීය; ඒමවනුලද මහසුලඟ

සතරදෙසින් නැඟී අඛයොදුන් සමයොදුන් දෙයොදුන් තුන් යොදුන් පමණ ඇති පළිතයන් පෙරළමින්ද, වනගතවූ මහා වෘක්ෂයන් මුලිනුපුටමින්ද, මහාවහනියක් පැමිණිකලමෙන් ධූමා කාරව ප්‍රාවිත්තලයෙන් පැතිරෙන්නාවූ අපමණවූ ධූලි නගමින්ද අවුත්, කරුණානිධානවූ මහාබොධිසත්වයන්ගේ මෛත්‍රී පුණ්‍ය ප්‍රභාව හෙතුකොටගෙණ බොධිදුමයෙන් පත්‍ර ශාඛා පමණකුදු මහබෝසතානන්ගේ සිවුරුකොනකින් හුයකුදු සොලවාලිය නොහී, විඛාහැරීමට වැඩූ මිහිරිවූ සුවද මදපවන්හැල්ලක්වැනිවී ගියේය. ඉක්බිති ඒ මාරදිව්‍යපුත්‍රතෙම සිදුහත්කුමරු සුලන් පහරින් ගොස් කවර සක්වළක වැටිගියේදෝයි බලනුයේ උදයගිරිපළිතාග්‍රයෙන් පැතෑනැංගාවූ ලහිරුමඩලක්සේ, බබල මින් බොධිපර්‍යඞ්කයෙහි වැඩහුන් මහබෝසතානන් දැක දණ්ඩන්පහරලත්සර්පියෙකුසේ කිපී, මේ තවුසා මහාජලෞඝය කින් උල්පවා හරිමිසි සිතා කල්පාන්ත වර්ෂාවක්සේ මහත් වැසි මෙඝ නාංවා මහාවර්ෂාවක් වස්වාලිය; එකෙණෙහි ඔහුගේ දිව්‍යානු භාවයෙන් ඒ මෙඝය මතුමත්තෙහි ශතපවල සහස්‍ර පවලාදීන් ගුණිත ප්‍රභෙද ඇති වලාගහ නැඟී දිශානුදිශාවන්හි මෙඝ ගර්ජනාපතුරුවා අකුණුසෙන විදුලිගසඝසා තල්කද පොල්කද පමණ වැසිපොද ඇතිවෙමින්, මහත්වූ දැඟලි පමණ බුබුලු ඇතුව යොදුන්ගණන් උස පෙණපිඬු විහිදෙමින් ඒසා මහත් ජලධාරා වෙඝයෙන් මහපොළොව විදාරණය කරගණ දිවනුයේ මහත්වූ වෘක්ෂයන් මූලොත්පාටනය කරමින් ගලාගෙණ මහා පුරුෂයානන්කරා දිව, සම්බුඛයන්වහන්සේගේ චීවරයෙහි පිණිබිඳක් පමණ ස්ථානයකුදු තෙමන්ට අසමර්ථව, බුදුමහුලව වස්වනලද පොකුරුවර්ෂාවක්මෙන් ශරීර ස්පර්ශනොවම අතුරුදන්වගියේය; ඉක්බිති වසවර්ත්තිමාරතෙම සිතනුයේ ඒ මහා ශ්‍රමණයා සැඩවතුරෙන් ගෙණගොස් කවර මුහුදකා වැටිගියේදෝයි, අද බුදුවීමට ගියරිසි පළාගියේදෝයි බලනුයේ, නීලවර්ණිණ වලාඝඩ්‍යයකින් නිකුත් නිර්මලවූ පූර්ණචන්ද්‍රයාසේ බබලන්නාවූ මහාපුරුෂයානන්ගේ ශ්‍රීමුඛමණ්ඩලය දැක, නියපිට ප්‍රහාරලත් මතැතෙකුසේ කිපී අද මොනු මිරිකා සුණුවිසුණු කොට හරිමිසි සිතා ගිනිගෙණ දිලිහෙන මහත්වූ පළිතවර්ෂාවක් වස්වාලිය; එකෙණෙහි අහසින් පැමිණියාවූ ඒ ගිනිගෙන දිලිහෙන යොදුන්ගණන් උස ඇති පළිතයෝ ගලින්ගල ඝට්ටනයවීමෙන් උපන් හඬින් අහස් පොළෝදෙක දැදුරු කෙරෙමින්, ත්‍රිවිධාග්නි නිර්වාපණයට සමර්ථවූ මහසක්කරා පැමිණ ශීලතෙජානුභාවයෙන් සුවද මල්දම් පෙළක්සේ සැදී සිවගත්හ; ඉක්බිති මාර දිව්‍යපුත්‍රතෙමේ, ගොයුම් මහණ පළිතයන් කරණකොටගෙණ සුණුවිසුණුව ගියේදෝයි

බලනුයේ, මහ බෝසතාණන්ගේ රන් කැපපතක්සේ බබලන වකුත්‍රමණ්ඩලය දැක, ගින්නව දැමූ ලුණුසෙයින් "තවතව" යන අනුකරණයෙන් දත්කතා ක්‍රෝධාග්නියෙන් දිලිහී, තෙල විද්‍යුල්ලතා ආකාරයෙන් දිලිසෙන රන්වන්වූ ශරීරය හා කණ් නාසා කපාහරවමිසි සිතා මහත්වූ ආයුධවර්ෂාවක් වස්වාලිය; එකෙණෙහි එක අත මුවහත් දැත මුවහත් ඇති කඩු සිරි අඛයටි තෝමර හෙණඩිවාල ගදාශුධාදි අති සූක්ෂ්මවූ ඒ ආයුධ වර්ෂාවෝ අහසින් දිව අවුත් අප මහබෝසතාණන්ගේ තියුණුවූ ප්‍රඥා පාරමිතානුභාවයෙන් නාලඝනිත මල්පූජාවක්මෙන් දෘශ්‍යමාන වූහ; ඉක්බිත්තෙන් වශවර්ත්‍ති මාරතෙමේ ශ්‍රමණ ගෞතමයාගේ මාංස අවිපහරින් කැපී වැගිර ගියේදෝහෝයි බලනුයේ, මාගේ සවාම්දරුවානන්වහන්සේගේ රන්පියුමක්සේ බබලනාමුඛපදමය දැක ගින්නව පිදුරුදැමුවාසේකිපි මේ මුඛමඛණහු දවා හසමකොට හරිමිසි සිතා හාත්පසින් අග්නිජ්වාලයෙන් ගැවසිගත්තාවූ ගිනි අහුරුවර්ෂාවක්වස්වාලිය; ඒඅඛාරවෘෂ්ටිහු නරකාභ්‍යන්තරයෙන් උද්ගතවූ වස්කිරුයින්මෙන් අහසින් ධූමජාලා පතුරුවමින් අවුත් මහබෝසතාණන්ගේ පාරමිතෙජසින් පෙරළී පද්මරාගමාණික්‍ය පූජාවක්සේ ශ්‍රීපාද මූලයෙහිවගුළහ: ඉක්බිති මරදෙවිපිත්තෙමේ සිදුහත්කුමරු ගින්නෙන්දු අළුව ගියේදෝහෝයි සතුටින් බලනුයේ, ඝනවූ අන්ධකාර විධ්වංසනය කරමින් උදයගිරි ශිඛරාග්‍රයෙන් උදාවූ නිර්මල සූර්‍ය දිව්‍යරාජයාසේ බබලනා බෝසතාණන්ගේ පුණ්‍යවන්ත ශරීරශොභාව දැක මහත්සේ කිපී අද බොධිපර්‍යඞ්කාරූඪව හුන්නාර්සි හරිමැසිසිතා ගිනිගෙණ දිලිසෙන උණුඅළුවර්ෂාවක්මැවීය; ඒ හසමවර්ෂාව මහබෝසතාණන් කරා පැමිණ බුදුමගුලට පිදූ ශ්වෙතවන්දන කපුපූරුදිය සම්බන්ධවූ සුවඳසුණු පූජාවක් වැනිවගියේය; ඉක්බිත්තෙන් මාරදිව්‍ය පුත්‍රතෙම හුණුඅලු උණුයෙන් සිදුහත්කුමරුහෙළුව දැ මළේදෝහෝයි බලනුයේ සොම්ගුණයෙන් යුත් පුන්සඳ මඬලක්සේ නිශ්චලව වැඩහුන් ජිනෙන්ද්‍රඥානන්ගේ ශ්‍රී ශරීරය දැක නැවතත් ගිනිදුටු ඉවිසේ කිපී ගිනිගෙණ දිලිසෙන කලල්වැස්සක් වස්වා ලීය; ඒ කර්දමයතෙම මහබෝසතාණන්කරා පැමිණ වන්දනාකල්ක යක්සේ සැදීගියේය; නැවතත් මාරතෙම, සිදුහත්කුමරු කලල් ගින්නෙන් ඉදිගියේදෝහෝයි බලනුයේ, දැරහම්ණිරුවන්සේ බබලන ශරීරශොභාව දැක සුලන් දුටුගිනිකදක්සේ කිපී ගිනි ගෙණ දිලිසෙන හුණුවැලි වර්ෂාවක් වස්වාලිය. ඒ ගිනිගෙණ දිලිසෙන වාලුකා වර්ෂාව අහසින් අවුත් දශබලධාරිවූ සර්ව්ඥ රාජෝත්තමයාණන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි පිදූ දිමුතු මුතු මාලාවක්සේ සැදීගියේය; නැවතත් මාරතෙමේ ශ්‍රමණයාගට කුමක්වී දෝහෝයි බලනුයේ හාත්පසින් මල් පිපිගිය ශාලවෘක්ෂ රාජයක්හුසේ ශොභාමත්ව වැඩහුන් මහ බෝසතාණන් දැක,

ක්‍රෝධාග්නියෙන් දිලිසෙමින් ඇස් බම්වමින් අද මේ ශ්‍රමණයා අදුරෙහි බහා භයගන්වා මුළාකොට පලවාපියමියි සිතා චතුරාඛයකින් යුකතවූ අතිභයඛකරවූ ගතදුරක් මවාලිය; ඒ චතුරාඛයකින් යුකතවූ ඝනාන්ධකාරය මහාබොධිසත්වදිවාකරයා කරා එළඹ, ඒ මහොතතමයානන්ගේ පුණ්‍යරශ්මිකදම්බයෙන් විධවසනව අතුරුදන්වගියේය; ඉක්බිත්තෙන් පාපිවූ මාරතෙම නිමෙක්ඛෝහෝ සිඛාඵිකුමාරයා ඝනාන්ධකාරයෙන් මූර්ජිතව ගියේදෝහෝයි බලනුයේ, නහොමඛ්‍යයෙහි සනස්‍රශමින් විරාජමානවූ දින රාජඝඛ්‍යාත සූයීදිව්‍යරාජයාව අපභාඝකරන්නාක් මෙන් විදුරසුන් මතුයෙහි දෙහශ්‍රියෙන් බබලමින් වැඩහුන් මහබෝසතානන්ගේ පුණ්‍යශ්‍රී විලාසය දැක නොඉසතුටුව සිත නුයේ, අහෝ මම ප්‍රවණඛවූ වාතයක්ද, භයානකවූ මේඝයක්ද, ප්‍රබලවූ පාෂාණවර්ෂාවක්ද, තියුණුවූ ආයුධවර්ෂාවක්ද, දීපනිමත්වූ අඞ්ගාරවර්ෂාවක්ද, ක්‍රූරවූ අළුවර්ෂාවක්ද, ගිනිසිළුවැනි වාලුකාවර්ෂාවක්ද, එසේම බිය ඵලවන්නාවූ කලල් වර්ෂාවක්ද, ඝෝරවූ ඝනාන්ධකාරයක්ද, ගතමේ නවවිධ මහා වර්ෂාවන් වස්වා මහා සඞ්ග්‍රාමයක් කොවිත් මේ ශ්‍රමණයා නුන්නැනින් සොල්වාලිය නුහුනුගෙම්මය, මා කෙතෙක් යුඛ කලත් ඔහුව පුජා පිණිසම වන්නේයයි ක්‍රෝධාග්නිය නිවාගතනොහී තමාගේ ආත්මරක්ෂණයපිණිසතුබූ චක්‍රායුධය* ගෙණ ප්‍රඥායුධයවූ මහබෝසතානන්ව දිමාගැසීය; ඒ චක්‍රායුධය වනාහි මෙබදු ආනුභාව ඇත්තේවේ; ඉදින් මාරතෙම අන්කරුණක් උදෙසා කිපි මේ චක්‍රායුධය මෙරමුදුනෙහි හැසීනම්, මහමෙර පවා නුණකිළිල් සෙයින් කඩ කඩව කැපී යට ගිලාබස්නේය; අහසට දැමීනම් දෙලොස්හවු රුද්දක් එක් දියඹිදකුදු වැසි නොවස්නේය; ඉදින් පොළවට හැසීනම් සියලුම වෘක්ෂලතාදිය වියලි සුණුවිසුණුව හොස් දෙලොස් හවුරුද්දක් මුලුල්ලෙහි තණපැළයකුදු නොනැහෙන් නේය; ඉදින් මහාසමුද්‍රයට දමාහැසීනම් සියලුම සමුද්‍රජලය රත්වූ යකඩලෙස ඉසි දියඹිදක්සේ වියලී මස් කැබුබු ආදී ජලචරහුද නැසී යන්නාහ.

ඉක්බිති ඒ චක්‍රායුධය සෙන දහස්සුවහස් එකවිට හැසුවාසේ බ්‍රහ්මාණ්ඩය දක්වා ගුගුරුවාගෙණහොස් සියලු ආකාශතලය දුම්කඳ හා ගිනිකඳවිහිදුවමින් සියලුලොකය ඝෝරනාදයෙන් එකකොලාහල කෙරෙමින් දිලිහි දිලිහී අවුත් මාරයාගේ

---

* මාරයාගේ මේ චක්‍රායුධය ඇතුළුව මහත් බලසම්පන්නවූ ආයුධ පසෙක් ලොකයෙහි ප්‍රකටව ඇත්තාහුය; එනම් 'කවරේදයක්? ශක්‍රයාගේ වජ්‍රායුධයද, වෛශ්‍රවණයාගේ ගදායුධයද, යමයාගේ දණ්ඩායුධය සහ ආලවකයාගේ චක්‍රායුධයක්ය.

මෑන මිර්දනයකෙරිමේන් දශපාරමී ධර්මයන් ආවර්ජනය කරමින් හුන්නාවූ නරසාරථින්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි පාපිස්නා කිස්සක්ව හුනුයේය. මේබැව් දුටු පාපිවූ වසවත්තීමාරතෙම මහත්සේ ක්‍රොධාග්නියෙන් දිලිහිදිලිනි හිස සල සලා තව තව යන අනුකරණයෙන් දත්කකා රතැස් බමවබමවා ගිනිගෙණ දිලිසෙන ලොහොකදකව ලංවියනොහෙන මැස්සන්සෙයින්දා උඩුගංබලා පිහිනන්නන් සැඩවතුරෙන් යටිගසව ගෙණයන්නා සේද, මහබෝසතාණන්ගේ අනන්ත ගුණසම්පන්නවූ මෛත්‍රී පාරමිතානමැති සැඩවතුරෙන් පරාබ්මුඛව සිටිනේ, එසේම සිටිනා තමාගේ මාරපිරිස දෙස රතැස් කරකවා බලා එම්බල මාගේ කිකරු මාරහවයෙනි! තෙපි කුමක් කරව්ද? තෙපි හැම මාගේ සමර්ථකම් බලාසිටිනා නියාවද? තෙල සිඛාර්ථයා වහා ගණුව! සිදුව! බදුව! වීදුව! සුණුවිසුණුකරව! යානොදෙව! දෙකකුල්ගෙණ පරසක්වල ගසව! සි යනාදීන් මැතදෙඛමින් නිමිලවූ සඳඹලෙහි අඟුවි තැවරීමට තැත්කරන්නාහුසේ මාරපිරිසව විධානකොට තෙමේද දහසක් අත් මවා දහසක් අවිවලින් සැරසීගිදිමෙබලා තම් තමන් විසින් නිම්මිතකරණලද ඇත්රජක්හුපිව නැගී ඒ මහාවීරපුරුෂොත්තමයානන් ප්‍රබුඛයව එලඹ "සිඛාර්ථය! මේ බෝධිපර්‍යාඞ්කය තොපසතු නොවෙයි, මාසතුය, ඒ හෙයින් මාගේ පර්‍යාඞ්කයෙහි නොහිඳ වහා නැගී සිටුව" සි කියා සක්විතිරජෙක් විසින් ලබනලද චක්‍රරත්නය දැක සැඩොලෙක් අවුත් ක්ෂත්‍රියකුලයෙහි උපන් තොපවැන්න වුන්ව මේ චක්‍රරත්නය අයිකි නොවන්නේය. අපවැනි සැඩොලුන්ට මේ චක්‍රරත්නය අයිතියයි කියන්නාසේ කිසි භයක් චකිතයක්නොමැතිව "මාඝතු පර්‍යාඞ්කයෙන් වහානැගුටුව" සි කියේය.

ඉක්බිත්තෙන් මිහිරි තෙපුල් ඇත්තාවූ බොධිසත්වතෙම ඔහුගේ වචනය අසා මුඛපද්මය විවෘතකොට කුරවිකනාදයසේ ලීලොපෙතවූ ශබ්දයෙන් මෙසේ වදාළේය. එම්බල පාපිවූ වශවර්තීමාරය! මේ වජ්‍රාසනය නිසා සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි දශපාරමීධර්මයන් පුරන්නාවූ මම මහපොළොවපරයා ඇඟමස් දුනිමි, මූහුද පරයා ලේ දුනිමි, මහමෙර පරයා ඉස් දුනිමි, තරු පරයා ඇස් දුනිමි, මෙම වජ්‍රාසනයෙහි පතපතා ජීවිතය සමානවූ අඹුදරුවන් බැඳ දුන් වැල් හොඳ පමණක් මෙසේවූ මෙරගල් දසයකටත් උස්මය; සමහිස් පෙරුම් පිරිමි, රාජ්‍යය දුනිමි, සපනඝතක මහදන්දුනිමි, එබැවින් මේපර්‍යාඞ්කය මවම හිමිය; තා විසින් කවරකලෙක්හි මේ බොධිපර්‍යාඞ්කය පිණිස දශපාරමීධර්මයෝ පුරණලද්දාහුද? කවර කලක ඒ පිණිස යම්කිසිදිවූ දානයක් දුන්නෙහිද? තාගේ ශීලය කෙසේද? ඊට තාගේ සාක්ෂිකාරයෝ කවරහුදැයි කියව" සි වදාළේය,

එපවත් ඇසූ සොරවූ මාරතෙම මරසෙනඟ දිසාවෙ අත දිගුකොට මෙතෙක් මේ පිරිස්තොමෝ ඊට ප්‍රත්‍යක්ෂකරවන්නා සේ කිහ; එකෙණෙහිම ඒ මාරසේනාතොමෝ "මම සාක්ෂියෙමි මම සාක්ෂියෙමි"යි එකිනෙකා වෙනවෙනම උද්ඝොෂාකලාවූ ශබ්දය ප්‍රලය සාගරයෙහි නිඝ්‍රොෂාවක් බඳුවි බඹලොව දක්වා පැතිරයාමෙන් දෙවිබඹුන් භයපත්කරවිය; ඉක්බිත්තෙන් මාරදිව්‍යපුත්‍රතෙම "මම වනාහි සාක්ෂි කියවූයෙමි, එබැවින් සිබාඹියෙනි, තාගේ දැනයෙහි කවරක් සාක්ෂිද? ඇත්නම් වහා මට කියව"යි කිය; ඉක්බිති එපවත් ඇසූ මහාබොධිසත්වතෙම මිහිරිවූ කටහඬින් මයුරයාගේ ගතපත් නාදය සදිසෙකුට යම්සේද එමෙන් ඕහට වදාරණසේක් "පාපිවූ මාරය! තාගේ දැනයෙහි සාක්ෂිවූයේ තාගේ සවෙතනිකවූ පිරිසමය, මට මේ ස්ථානයෙහි එබන්දේ නැත්තාහ, වෙනකාරහිතවුම සාක්ෂි කියන්නෝ ඇත්තාහ"යි කියා සවණිණප්‍රභා ඇති සඤ්ඡා වලා ගණයකින් නිෂක්‍රාන්තවූ සිහරැලි විදුලියක්සේ සුතුමාලවූ ශ්‍රී හස්තය සුරක්තවූ විවරගර්භයෙන් නිකුත්කොට "මාගේ මේ පඤ්චඞ්ගය උදෙසා සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි දුන් දන් හැර එකම වෙස්සන්තරාත්මභාවයෙහි සිට දුන්නාවූ සපත ශතක මහාදානයෙහි තී සාක්ෂි ඇද්ද නැද්දැයි විචාරා මහා පෘථිවියට අත දිගුකළසේක.

එකල උන්වහන්සේගේ දක්ෂිණ ශ්‍රී හස්තය පෘථිවිතලයට දිගුකළ කෙණෙහිම මහාපෘථිවිතොමෝ "මම එකල්හි ඔබවහන්සේට සාක්ෂියෙමි"යි කියා මාරයාගේ මාන මර්දනයකරන්නීයක්හු මෙන් සයුරුරැලමෙන් පෘථිවි තරඹගඟන් නංවන්නී කුලාල චක්‍රයක්සේ * අතිශයින් කරකැවීන; මේසේ උන්වහන්සේගේ දශපාරමී බලයෙන් පෘථිවිය දෙස්කිකල්හි ගෙළ සිටයක් යොදුන් උස ඇති ගිරිමෙඛලා නම් හස්තිරාජ තෙම මහබෝසතානන් දිශාවට දනබිම ඇන වැටිගියේය; මේ ආශ්චර්‍යය දුටු මාරසෙනා තොමෝ භයින් ත්‍රස්තව බුන්වෙරළ ඇති සමුද්‍රය මෙන්ද මහ සුලහින් දුවන පරණලා පත්සේද කල්පාන්තවාතය වැදගත් හිඹුල් පුළුන්සේද දෙදෙනෙක් එකමඟ නොගොස් ශීඝ්‍රහරණ ශ්‍රීඝ්‍රහරණ උතුරු සළු සහ හස්තයෙන් ගන්නාලද නොයෙක් ආයුධයන්ද ඒ ඒ තැන හැරදමා හැදිවත පමණකුදු නොතකා පලාගියාය; ඉක්බිති බුන්දලඇති සතිරාජයන්හුමෙන් නටුවාවූ දසිඇති විශෙෂයෙන් දුර්මුඛවූ ඒ පාපිවූ වශවර්ත්තිමාරතෙමේද පෘථිවි ආකාශ දෙකට මධ්‍යගතවූ තමහට සහායවන්නාවූ එකම ස්ථානයකුදු නොලැබ අසරණව මහබියට පැමුණුනේ දහසක්

* කුඹලුන් මිහින් වලන් ඉදිකරණ චක්‍රය

අත්හිතුබු අවි දහසම් එතැන්හිම හෙලා පැන පලාගියේය. මෙසේ පැරද දිවන්නාවූ පිරිස් සහිත මාරයාදුටු පළමුවාරයෙහි මරණභයින් තැතිගෙණ පැනගියාවූ ඒ දෙව්බඹ සමූහයා "වසවත් මරහට පරාජයවිය. මහාබොධිසත්වොතතමවූ සිද්ධාර්ථ කුමාරයානන්ට ජය අත්විය. එබැවින් ජයපූජා හා බුඩ මඩගල්‍යොත්සවයක් එකවිටම කරම්හ"යි කියා නාග සුපණ්ණ දෙව බ්‍රහ්මාදිහු ගඩ මාලාදීන් ගත් අත් ඇතිව සුරනරමුනිමනුජ වන්දනීයවූ වාත්‍රිංශත්වර මහාපුරුෂ ලක්ෂණයෙන් සමන්විතවූ ඒ මුනීන්ද්‍රයන්වහන්සේ සමීපයට නෙවත් බෝමැඩට එළඹ නොයෙක් පූජාවිධි පවත්වමින් ජයමගුල් කෙළේයි.

මාරසන්‍යමර්ථනය නිමි.

සම්බුදපදප්‍රාප්තිය.

ඉක්බිති පූර්වාකාශයෙහිලග්නවූ වන්ද්‍රමණ්ඩලනමැති මාණික්‍ය කුණ්ඩලාභරණය කණිණිකාභරණ කොට ඇති ඒ නිසාකාන්තා තොමෝ මාර විජය කළාවූ මුනීන්ද්‍රයන්වහන්සේ පුදන්ට මෙන් පැමිණියාය, අතිශයින් නීලවර්ණවූ ආකාශ නමැති කෙශ කලාපයෙහි පළඳකාලද තාරකා නමැති මල්දම් ඇත්තාවූ ඒ රාත්‍රි නමැති අඩහනාතොමෝ පූර්වදිශා නමැති සුකුමාලවූ හසත යෙන් සුපුෂ්පිතවූ මධුරාම්බු මල්කැන් නමැති චාමර සලන්නියක් වැනිවිය; එකල්හි මල්රොන් ගැණීමෙන් මත්වූ භෘඩග සමූහයා ඒ බුදු මගුලට සක්පිබින්නාක්ෂුමෙන් මිහිරිනාදයෙන් හඩන්ට වනි. සුගන්ධ මකරන්දයෙන් යුක්තව හැමුවාවූ මන්දමාරුතයෝ වකාහි බෝසත්හුගේ සිරුරෙහි ශීතල සෘතුගුණය ගැන්වූහ. මෙසේ සපරිවාර මාර ප්‍රතිජයකොට හිරු අස්තාඩගතවීමට පූර්ව භාගයෙහිම අවිද්‍යා නමැති මහමුල් ඇති කම් කෙලෙස් ආදීන් සම්බන්ධවූ මහකඳක් ඇති සංසාර නමැති විෂවෘක්ෂය මූලෝතපාටනය කරන්ට පවන්ගත්සේක; ප්‍රථම යාමයෙහි තමාගේද අතුන් ගේද පෙරවිසූ ආත්මභාවයන්හි කඳපිළිවෙල දක්නට සමර්ථවූ පූර්වේනිවාසානුස්මෘතිඥානය ලදින් මධ්‍යම යාමයෙහි චුතූපපාත ඥානය හා පශ්චිම යාමයෙහි ආශ්‍රවක්ෂයකර ඥානයද ලදින් ප්‍රතීත්‍යසමුත්පාදයෙහි ප්‍රඥවබහා අනුලොම ප්‍රතිලොමවශයෙන් සංමර්ශණය කරත් කරත් දසදහසක් සක්වල අනන්තවාරයක් කම්පාකරවා, සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මග සතරඵලයට පැමිණ අරූපාවචරධ්‍යාන වේලෙහි ලොවුතුරා බුඩත්වයට පැමිණියේක; සම්බුදපදප්‍රාප්තිය හා සූර්යෝදයනමයද ඉදිරිපසුනොව එකවිටම වූවාහුය.

මේතෙකින් මේ "ජිනරාජවංශ" නම්වූ ගෞතම බුඩචරිතයෙහි අභිසම්බොධි වර්ණනා කථාව නිමිණියේය.

පළමුවන සතිය.

කවද එවේලෙහි සියලු දසදහසක් සක්වළ එකම මඟුල් ගෙයක්සේ සියලු අලඞ්කාරයෙන් ශොභාමත්ව සිටගත; දස දහසක් සක්වළ සියලු වෘක්ෂලතාදියෙහි මල්පල හටගෙණ එකම මල්පිඬක් මෙන් විය; අවදහසක් ලොකාන්තරික නරක සප්ත සූර්යෝද්ගමනයෙක්හිමෙන් ආලොක ඇතිවූහ; අසුසාර දහසක් යොදුන් ගැඹුරැති මහාසමුද්‍රයෙහි ලවණ ජලය මිහිරි දියවිය; සියලු ගංගාජලය උඩුහංබලාගියේය; ජාත්‍යන්ධයෝ ඇස්ලද්දාහුය; ජාතිමූකයෝ (ගොළුවෝ) සැපසේ කථාකළාහුය; ජාතිබධිරයෝ මිහිරි ගීතිකා ශබ්ද ඇසුවාහුය; ජාතිපංගුලයෝ (කොරවූවෝ) සෘද්ධිගමන් ගියාහුය; කුරුකුදු අය ආරොහපරිණාහ ලද්දාහුය; බන්ධනගත සියලු සත්වයෝ ඒ ඒ බන්ධනවලින් මිදුනාහුය; සියලු නරකයන්හි ගිනි නිවීනියේය; ප්‍රෙතයින්ගේ සා පිපාසා සන්සිදී ගියහ, තිරශ්චීන සත්වයන්ගේ භයභක්තිනැතිවිය; සියලුසත්වයන්ගේ රොග සංසිදුනේය; මේ ආදී දෙනිස් මහා පූජාවිශේෂ පහළ වීමෙන් දසදහසක් සක්වළ උතුම්වූ ශ්‍රී සෞන්දර්‍යයෙන් අග්‍රප්‍රාප්ත කිරීමෙන් ලොවුතුරා බුබත්වයට පැමිණ සියලු ධර්ම්සකාඞ්ගයන් මෙනෙහිකොට මියෙන් පිරිනිය භාජනයක් ගට අවකාශ නොමැත්තෙන් ඉතිර වැගිරෙන්නාසේ දහම් අමායෙන් පිරුණාවූ ශ්‍රී ශරීර නමැති භාජනයෙන් සබුම්මාතඵ උතුරුවා සුවාසුදහසක් ධර්ම්සකාඞ්ගයන්ට පළමුවන්වූ සියලු බුදුවරයන්ගේ චාරිත්‍රධර්ම්යක්වූ:—

අනෙකා ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසනෙනා දුක්ඛා ජාති පුනප්පුනං,
ගහකාරක දිට්ඨොසි පුනගෙහං නකාහසි
සබ්බානෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං
විසංඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා ති.

යන මේ උදාන ගාථාවෙන් කියා දෙවැනිදෙවවූ නඝනලද කෙලෙශාවකාශ ඇති පැරැණි පස්මරැන්ඇති ඒ ශාස්තෘවූ සම්බුදුයන් වහන්සේ සූර්‍යරශ්මි සප්තයක් පදමයක්සේ අතිශයින් සතුටුවූ චිත්තඝනතාන ඇතිසේක්, කල්පකොටි සතසහසුයක් මුලුල්ලෙහි මේ බොධිපක්ෂීයකය උදෙසා සසර දිව ඇවිද්දෙමි, එසේම මේ පළඟ සඳහා හිස් කඩා දුනිමි, ඇස් උපුටා දුනිමි, හදමස් උපුටා දුනිමි, රන්ලිය සෙයින් වොරජනා දරුවන් නවයොවුනෙන් හොබනා අඹුවනුත් අන්හට දසකොට දුනිමි, මේ පර්‍යඞ්කයෙහි හුන්නාවූ මම මාරවිජය කෙළෙමි, මෙහි හුන්නාවූ මාගේ මන දෙළ පිරිණ, ඒ හෙයින් මේ පළඟින් දැන්ම නොනැගෙමියි සිතා ඒ නීශ්චලාසනයෙහි නොයෙක් ලක්ෂගණන් සමාපත්තියව සම වදිමින් සතියක් මුලුල්ලෙහි වැඩහුන්සේක.

දෙවෙනි තුන්වෙනි සිව්වෙනි සති ගහකිරීම.

මෙසේ බුබසිඟයට පැමිණි දෙවන සතියෙහි බොධිද්‍රැමය බලා වැඩහිදිනකල ඇතම් දෙවිකෙනෙක් සිදුහත්කුමරු තවම පළඟ නොපියසි බුදුකොවුසේක්දෝහෝයි සිතූහ; එකල්හි සම්‍යක්සම්බුදුන් වහන්සේ දෙවියන්ගේ ශඞ්කාවිනොදනය කරණු පිණිස වජ්‍රාසනයෙන් නැගිසිට ආකාශයට පැණනැගී ඇඟින් යුවල යුවල සෙකට ගිනිකඳ දියකඳ විහිදුවමින් මෙසේ යමා මහ පෙළහර දක්වා දෙවියන්ගේ ඒ විමති දුරුකොට තදනන්තරව ආකාශයෙන් බැස මහා බොධිපය්‍යඞ්කයට ඊශාණකොන සිව, එකාන්තයෙන් මා විසින් මේ බොධිපය්‍යඞ්කයෙහි හිඳ සම්‍යක්සම්බුදුඥානය ප්‍රතිවෙධනය කරණලදැයි සිතා ප්‍රමාණාතික්‍රාන්ත කාලයක් මුලුල්ලෙහි රැස්කරණලද පාරමිතාවන්ගේ ඵලයට පැමිණි ස්ථානයද වජ්‍රාසනයද බොධිද්‍රැමයද, පස්වනක් පැයෙන් බබලන්නාවූ ප්‍රීතියෙන් විකසිතවූ, නිල්වූ, දික්වූ නෙත්‍රයන්ගේ නිම්මලවූ කාන්ති නමැති දිගැදහර වැහිමෙන් බොධිද්‍රැමේන්ද්‍රාභිමුඛයන් තෙමේම අනිමිසලොචනයයි කියනලද නොහෙලනලද ඇස්පිය ඇතිව ප්‍රේමයෙන් හරිතවූ නෙත්‍ර යුගලයෙන් පූජාකෙරෙමින් එතැන්හි සතියක් මුලුල්ලෙහි ධ්‍යාන සුවයෙන් වැඩහුන්සේක; ඒ ස්ථානය වනාහි "අනිමිසලොචන චෛත්‍යය" යන නමින් ප්‍රකට විය.

ඉක්බිත්තෙන් දෙවතාවෝ, බෝධිපය්‍යඞ්කයවද සම්‍යක්සම්බුදුන් වහන්සේ අනිමිසලොචනය කරමින් වැඩසිටි ස්ථානයටද යන මේ දෙඅතුරෙහි නන්වැදෑරුම්වූ මාණික්‍යයන්ගෙන් ශොභනවූ රුවන් සක්මනක් මවාලූහ; එකල නර නාග සුරෙන්ද්‍රාදීන් විසින් අනවරතයෙන් පුදනුලැබූ ඒ දෙවැනි දෙවවූ සම්‍යක්සම්බුදුන් වහන්සේ නීලාකාශයෙහි තාරකාවන් පිරිවරා ගම්න්කරන්නාවූ චන්ද්‍රදිව්‍යරාජයාමෙන් ඒ වඞ්ක්‍රමණයෙහි සක්මන්කරමින් සතියක් කල් ගතකළසේක; ඒ පෘථිවි ප්‍රදේශයෙහි කරණලද චෛත්‍යය වනාහි "රතනචඞ්ක්‍රමණය" යන නාමයෙන් ප්‍රසිඞ්ධ විය; මේ ත්‍රිවිධ සතියෙහි එක දවසෙකවත් සම්‍යක්සම්බුදුන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් බුදුරැස් නොනික්මිනා.

ඉක්බිති දෙවතාවන් විසින් බොධිද්‍රැමෙන්ද්‍රයන්ට වයඹ දිග් භාගයෙන් පෘථිවිතලයෙහි අග්‍රවූ අනෙකප්‍රකාර රත්නමය ප්‍රාසාදයක් මවනලදී; එකල සම්‍යක්සම්බුදුන් වහන්සේ ඒ රතනගෘහයෙහි පණවනලද උතුම් පළඟෙහි වැඩහිඳ මහා රාජ්‍යයක් ලද්දාවූ සක්විති රජෙකු නොයෙක් රුවනින් පිරූ භාණ්ඩාගාරවල චාරිත්‍ර කරවා සිත්සේ වෙන වෙනම නන්විසිතුරු රුවන් බලා එහි අගනා මිළඟණන් ලේකම් කොටබලා සතුටු වන්නාසේ,

(ඒ සඩම්මවර චක්‍රවර්තීන් වහන්සේද) බුඩ මහා රාජ්‍යය ලදීන් ඉතා දුකසේ අවබොධ කළහැක්කාවූ අති ගම්භීරවූ අවශෙෂයන් විසින් නොවැකිණියහැකි පරතෙරක් ඇත්තාවූ, **පඨානප්‍රකරණ** නමැති දැඩවූ රළපහර ඇති **සඩම්ම** නමැති මහා සමුද්‍රය තුවණ නමැති මහමෙර මතින් ආලොළිතය කරමින් ඒ සඩම්ම නමැති රතනාකරයන් සාදිනක් මුලුල්ලෙහි වෙන වෙනම බලා වදාළ සේක; මෙසේ සමන්තපට්ඨානය මෙනෙහි කරන්ව වන්කල, **කිමිරපිඩගල** නම් මහා මත්ස්‍ය රාජයාහට අසුසාරදහසක් යොදුන් ඝාඹුරුති මහා සමුද්‍රයමෙන්, සම්බුදාසුදානය අවකාශ ලැබ ඉතා සියුම්වූ පරම ගම්භීරවූ **සඩම්මයන්** සංමිශ්‍රණයකරන්නාවූ සම්බුදයන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් නීල පීත ලොහිත අවදාත මාංජෙෂ්ඨ ප්‍රභාසවර, යන ෂඩ්වර්ණ්‍ය ඝන බුඩරශ්මී මාලාවෝ නික්මුණාහුය; මේ පරම්විචිත්‍රවූ ශ්‍රී සඩම්මය මෙනෙහි කළාවූ ස්ථානය වනාහි දැන් **"රතනඝර චෛත්‍ය"**යි නම් විය.

පස්වන සතිය ගතකිරීම.

මෙසේ කරුණාගුණාඩභයන්ගෙන් අගතැන් පැමිණියාවූ ඒ සම්බුදයන්වහන්සේ, ශ්‍රී මහා බොධීන් වහන්සේගේ සම්පඥහිම සඩම්මසංමිශ්‍රණයකරමින් සතරසතියක් අතික්‍රාන්තකොට පස්වන සතියෙහි බොධිවෘක්ෂමූලය කෙරෙන් යම්තැනෙක්හි අජපාල න්‍යග්‍රොධ වෘක්ෂය වීද, එතැන්හි එළඹ පූර්වදිශාභිමුඛව වැඩහිඳ භාග්‍යවතී සුව විදිමින් දවස් ගැවූසේක. එසමයෙහි යුඩයෙහි බුදුන් විසින් පරදවනලද ඒ වශවර්තීමාරතෙම යහන් මතුයෙහි මුහුණින් වැද්ඳොත්තේ දෙවතාවන් විසින් කරණුලැබූ **අපඹණ** නිසූ අපභාසාදිය ඉවසාගත නොහෙන්නේ තමාගේ ඒ දිව්‍ය භවනයෙන් සැඟවී ගොස් **දඩදිව** මාවතෙක් මැද මගී වෙසක් ගෙණ වියරුහුනුවාක්හුසේ හිසෙක් තුනා පිටමැද හෙලාගෙණ දෙපා දිගුකොට එක් අතක් නිකටට දී යළබැලූ මුහුණ ඇතිව නිශශබ්දව සිතනුයේ:-සිඩාර්‍ථ කුමාරතෙම මා නොකාමැති කරවා මහානිනිෂ්ක්‍රමණය නෙලේය; සාවුරාද්දක් මුලුල්ලෙහි කාමවිතර්කාදිය ඉපදවීමෙන් මට අවකාශයකුදු නොපෑයේය; දැන් මට **මේසා** පරිභවයක් කොට බුඩත්වයට පැමිණියේය; ඉතිස්න් **ඒ** සතුරා මාගේ විෂය ඉක්මවීමෙන් බුදුව දැනට සතියක් අතික්‍රාන්තවිය; එසේ හෙයින් ඒ සතුරා කෙසේ පිටිදකිම්දෝ කෝයි සිතා පවනින් වලිත රුකක් සෙයින් වැනි වැනී ශොක කරණුයේ, සොළොස් කාරණයක් සිත සිතා පොළවෙහි නියෙන් ඉරි අදිමින් හුන්නේය; හේ කවරේදයත්? මම ඒ සිඩාර්‍ථයාට වඩා දානපාරමිතා වෙනුත් අඩුය, ශීල පාරමිතාවෙනුත් අඩුය, නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෙනුත් අඩුය, ප්‍රඥාපාරමිතා වෙනුත් අඩුය, වීර්‍ය්‍ය පාරමිතාවෙනුත් අඩුය, ක්ෂාන්ති පාරමිතා

වෙනුත් අඩුය, සත්‍ය පාරමිතාවෙනුත් අඩුය, අධිෂ්ඨාන පාරමිතා වෙනුත් අඩුය, මෛත්‍රී පාරමිතාවෙනුත් අඩුය, උපෙක්ෂා පාරමිතාවෙනුත් අඩුය, තව ද ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානයෙනුත් අඩුය, ආශ්‍රවක්ෂයකර ඥානයෙනුත් අඩුය, මහාකරුණා සමාපත්ති ඥානයෙනුත් අඩුය, යමකප්‍රාතිහාර්‍ය ඥානයෙනුත් අඩුය, අනාවරණ ඥානයෙනුත් අඩුය, සර්ව්ඥතාඥානයෙනුත් අඩුවූයේමය, යන මේ සොළොස් කාරණයකින් මම ඔහුට වඩා ශත සහස්‍ර ගුණයකින් හීනය; මෙසේ ඔහු නොයෙක් කාරණා මෙනෙහි කිරීමෙන් සුසුම් ලලා හුන්නේය.

ඉක්බිති මරහුගේ නාණහාය, අරතිය, රගාය යන දුහිතෘන් තුන්දෙන එම දිව්‍යප්‍රාසාදයේ යකනකාවැදහොත් තම පියානන්වූ වසවත් මරදෙව්පිත් නොදැක "අපගේ පියානන්වහන්සේ කොයි ගියේදෝහෝයි බලනුවෝ, මාවතක බිම ඉරි අදිමින් හිඳිනා හියාව දැක ක්ෂණයකින් එතනට එළඹ, "අහෝ පියා නෙනී! අහෝ පියානෙනි! නුඹට මේ කුමක්වීද? ඔබතුමා කුමක් පතන්නෙහිද? කවර සතුරෙක් විසින් පරදවනලද්දෙහිද? අපි කුමක් හෙණෙන්නෙමුද? කුමක් නිසා ශොකාතුරණුද යන බව කිවමැනවැ"යි විචාළහ; එකල වසවත් මරතෙම කියනුයේ, පින්වත්වූ දුහිතෘවරුනි, කුමක් කියවිද? පතළාවූ කීර්තිසෞඛ්‍ය ඇති මාගේ මුවෙහි දැලි තැවරුවාවූ මා සතු විජිතය බලාත්කාරයෙන් මැඩ ඉක්ම ගියාවූ ඒ ශුඩෝදන පුත්‍රයා නොදැක්කෙහිද? මට පැමිණවූ ලජ්ජා තොපි නොදනිව්ද? ආතමරක්ෂණය පිණිස තුබූ චක්‍රායුධය පවා, දරුවෙනි උදුරාගත්තේවේදැ"යි කිය; එවිට ඒ මාරකන්‍යාවෝ කියනුවෝ, "පියානෙනි, අපට නොකියා ඒසා පිරිසක් හෙණගොස් කුමට විඩාවූසේක්ද? අප වැනි දරුවන් තුන්දෙනෙකු ඇත්තේ මෙවෙනි දුඃඛකටවේද, අපට කිවහොත් එක බලපිරිසකුත් නැතුව අපි තුන්දෙනා ගොස්, ඔහු මදයෙන් මත්වූ හස්තියෙකුමෙන් කාමරාගය නමැති මලපතින් දැඩි බන්ධනයෙන් බැඳ ගෙණෙන්නමෝ නොවේදැයි කීවාහු; එකල මරදෙව්පිත් කියනුවෝ, "සෞභාග්‍ය ඇති දූවරුනි! කුමන බස් කියව්ද? ඒ සිඛාවියා දැන් පහවූ රාග ඇත්තෙක, මහත්වූ ආනුභාව හා මහත්වූ තෙජස් ඇතියේය; කාවිසිනුත් ජයගත නොහැක්ක; සොලවාලිය නොහැකි ධෛර්‍ය සම්පන්න මහා පුරුෂයෙකැ"යි කිය; එබසට ඒ මාරාඔන්නාවෝ කියනුවෝ:— "පියානෙනි! අපගේ වශවර්ත්තී දිව්‍යලොකයට වඩා කාමභූමියක් නැති බව නොදන්නාසේක්ද? ජීවිතයක් ඇති පුරුෂයෙකු ඉදිරියෙහි ඇසිල්ලක පෙණිගියමෝනම්, ඔහු කාමයෙන් පොළඹා ගැන්මෙහි අපට වඩා දක්ෂවූ කාමාඔන්නාවෝ ලොකයෙහි නැත්තාහුමය; අපගේ ආශ්වර්‍යය බැලුව මැනව; ඉතා මනොඥවූ

රූපය කරණකොටගෙණ නෙත්‍රයද, මනොඥවූ ගන්ධය කරණ කොටගෙණ නාසයද, මනොඥවූ සවරය කරණකොටගෙණ කණද, මනොඥවූ ස්පර්ශය කරණකොටගෙණ ශරීරයද, මනොඥවූ රසය කරණකොටගෙණ දිවද, කාමජවූ මලපතින් සිතද, යහපත් බාහු නමැති මලපුඩුවෙන් ඔහුගේ ග්‍රීවයද, අප සිරුරෙහි දරණ මල්දමින් හස්තාවයද, දැඩිසේ බැඳගෙණ ඔබ පාමුලව හෙණෙන්නෙමුය"යි කියා වාසිබස් බැණ පියාගේ පාද වය නමස්කාරකොට සමුගෙණ නීක්ම, ලැසිගත් ගමනින් දුවුදුවුවන් සිත් තමන් කෙරෙහි ලැසිගන්වමින් පිරුණු තන සඟලින් දුවුදුවුවන් ලොබකරවමින් නුවන් කෙළවර නවන නුරා බැල්මෙන් දුවුදුවුවන් සිත් තමන් කෙරෙහි නවවමින් සැරහී මාර ශත්‍රුවූ සම්බුදුන්වහන්සේ යම් තැනෙක්හි වැඩඋන්සේක්ද එතැනට වහා එළඹ නොපෙණී සිටියාහ.

ඉක්බිති මාරවධූන් තුන්දෙන ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු, "නැගනියෙනි, පුරුෂයන්ගේ සිත් නම් නොයෙක් ආකාර වන්නේය; සමහර කෙණෙක් බාලස්ත්‍රීන් කැමැතිවෙති, සමහර කෙණෙක් යෞවන ස්ත්‍රීන් කැමැතිවෙති; සමහර කෙණෙක් මධ්‍යම ස්ත්‍රීන් කැමැතිවෙති, ඇතම් කෙණෙක් වෘද්ධ ස්ත්‍රීන් කැමැතිවෙති; එබැවින් සිද්ධාර්ථකුමාරයාණේ අදහස් නොවරදවා දැනගණුම්හ"යි මන්ත්‍රණයකොටගෙණ, දෙලොස් හැවිරිදි කුඩා කෙලිරූපයෙක; සොළොස් හැවිරිදි යෞවන ස්ත්‍රී රූපයෙක, එක් දරුවෙකු ලද ස්ත්‍රී රූපයෙක; දෙදරු කෙණෙකුන් ලද ස්ත්‍රී රූපයෙකැයි මෙසේ සසියක් නොයෙක් වෙස් නිර්මිතකොටගෙණ, සිද්ධාර්ථයා අප පියානන් මුහුණ ගැ දැලි අද පිස හරිම්හ; ඔහුගේ සිල් බිඳලම්හයි කියා කියා, නන්විසිතුරු මලින් සරසනලද නිල්වරලසින් හා කන් නමැති මධු ගුහාවට ගමන්ගත් නීල භෘඞ්ග යුගමයක්සේ ඉදුම්ණිවන් දිගුපුළුල්වූ ඇසින් හා ගතනිල්වරල් නමැති මහමේකුළින් පැහැනැඟී දෙව් දූනුවන් දිලිසෙන බැමසඟලින් හා සල්ලාල ජන නමැති මත්ත හසතීන් දමනයකරණ සවණිණාඩ්කුශයක් වැනිවූ සෘජුවූ නාසිකා වෙන් හා දුවුදුවුවන්ගේ චිත්තාකර්ෂණය කරණ සුලුවූ සේසත් පතින් දිලිහෙන කණින් හා සුරත්තවූ බිඹු ඵල වැනි අධර යුගම යෙන් හා ඝොෂාද කැකුළුවන් දන්න පඞ්කජින්ගෙන් ධාවනය කරන්නාවූ ශ්වේතරශ්මීන් හෙතුකොටගෙණ ප්‍රබුද්ධවූ මුඛ නමැති පද්මය නිරීක්ෂණය කරමින් කර ඔසවා සිටින්නාවූ රන්වන් හංස පැටවුන්සේ ලීලොපෙතව පිරිසිටින්නා පයොධර යුගමයෙන් හා නෑඹපියුම්ව මුවරද ලොලින් බස්නා භෘඞ්ගාවලින්සේ දුවු දුවුවන්ගේ චිත්තොත්පාදය කරවන්නාවූ නීලවර්ණ වස්ත්‍රාජිනයෙන් හා මිටින් ගතහැකි සිඟුවලඟින් හා කාමුක පුරුෂයන්ගේ

මනදෙළ පුරවන්නාවූ රන්වන්වූ පුළුලුකුලෙන් හා එසේම කාමුක පුරුෂයන්ගේ ධෛර්‍යය මැඩපැවැත්වීමට හැකිවූ මට සිළුවූ කලවා සඟලින් හා නිවන්පුරයට වදනාවුන් බදුහෙලනා මල පුඩුවක්සේ කරපුරා කොකුම් කලලින් මනොඥවූ දළමුතුහර පැළඳ 'පින්වත් කාමුක පුරුෂයෙනි! නිවන්පුර නොඟොස් අප කරා එව''යි හඬහා කියන්නාසේ සවණිණලතාවන් හසුනවයෙහි පිරූ මිණිවළුළු රැව්දෙවම්න් සියලු සතුන් ඇසවලූ ඉඳුජාලා වක්සේ පැහැයෙන් විසිතුරු උතුරුසළුලා සිතවලූ උනමාද ඖෂධයක් බඳුවූ, ධෛර්‍යයට සතුරුවූ, නිවණට අකුල්වූ, සසරට වහල්වූ, සුවයට නිධානවූ, දෙම්නසට විෂයවූ, රතියට ආකරවූ, ලීලාවට කුලඟේවූ, යෞවනයට මගුල්ගේවූ, ඒ මාරවධූන් තිදෙක මද මද සිනායෙන් යුතතාව පිරුණාවූ මුවපියුමෙන් දිවනා අනනතරගමියෙන් සල්ලාල ජන නමැති කෞමදවනය හිරු පෑ කලක්මෙන් සනතුෂ්ටකරවම්න් මෙසේ දුවුදුටුවන් ඇසු ඇසුවන් සිතු සිතුවන් චිතත වික්ෂෙපයට හෙතුවන සසියක් වෙස් නිම්මිත කොවඟෙණ ඔවුනොවුන්ගේ රුසිරි බල බලා, නඟනියනි, අද අපට එක් පුරුෂයෙක් නම් සරුකිම්දැයි වහසිබස් බෙණෙම්න් නසනලද අනඩ්ගානිමාන ඇති මාත්‍රිංශත්තර මහාපුරුෂ ලක්ෂණ ඉෙන් විරාජමානවූ සම්බුදයන්වහන්සේගේ අනිමුඛයට අහසින් වහළ සපුමල්දම් පෙළක්සේද, බුදුමගුලට දක්වනලද විදුලිසරඹ සමූහයක්සේද, දෙදෙනෙක් එසාලෙස නොව වෙන වෙන නොයෙක් සත්‍රීලීලායෙන් බුදුන් පෙරටුව සිට, විලිඉෙන් හනා මියෙන්ගලා බොලඳින් මූසුකොට රසයෙන් ආර්ද්‍රකොට සෙනහ ඉෙන් සිනිදුකොට මෙසේ කියන්ට වන්හුඃ-**හේ භාග්‍යවතුන්වහන්සේ:-**

සවාමිවූ සිඛාඊකුමාරයෙනි! නුඹවහන්සේ වනාහි පන්තිස් හැවිරිදි වයස්වූ බැවින් අභිනව ඉෞවනයෙන් ශොභමානවන් නේය; තවද සවණිණ වණිණවූ චීවරයකින් තෙල උතුම්වූ ශරීරය වසාඟෙණ කාමාඩ්ගනාවන්ගේ ශොක නමැති ලැව්වනය ගිනිලන්නාසේ හුදකළාව මේ නුගරුක්මූල වැඩහිදිනේ නුඹ වහන්සේගේ කානනාතොමෝ ඩොසිද? නොහොත් ප්‍රියාඩ්ගනා වක් සමඟ කල්යවා නොඑන හෙයින් ඇ එන පෙර දිශා බලා හිදිනෙහිද? අහෝ! සිඛ ඊකුමාරයෙනි, ඒ බැව් අපට නොවළහා කියවයි විවාළහ; එකල සකල සත්ත්වයන් කෙරෙහි පතළාවූ මහා කරුණාවක් ඇති සම්බුදයන්වහන්සේ චෙසසනතරාතම භාවයෙහි **''ක්‍රිෂ්ණාජිණ''** නම් දියතියන් කියනලද්දාවූ ලදබොලද මිහිරි තෙපුල්සේ සිතා මුවෙන් නොබැණ හුදු කරුණාවෙන් හඬාලූ රුවක්සේද, හුදු මුදිතාවෙන් මවාලූ රුවක්සේද, හුදු උපෙක්ෂා වෙන් තනාලූ රුවක්සේද, මහාපෘථිවියසේ නිශ්චලව වැඩහුන් සේක; ඉක්බිති මහලූ වෙස්ගත් තණ්හාතොමෝ සිතන්නී, මේ

පුරුෂයා වනාහි එසේ මෙසේ සොළොස්වැලියහැකි කෙනෙක් නොවෙයි; වෙන අය නම් අපවැනි කාමාඛ්‍යනාවන්ගේ රූපශ්‍රී වර්ණනාකළ කල මදනැගි හැන්දිරිජයක්හුණස් උපතත්තවෙයි; එබැවින් මමද මොහු ඉදිරියෙහි සිට මොහුගේ සිත කාමබන්ධන යෙන් බැඳගැණීමට තැත්කරමැයි සිතා "සිඛාවී සවාමිනි! මා කියන්නක් ඇසුවමැනව. රළින් හිනවූ සමුද්‍රය තෙමේද, චඳ්‍රයා හෙන් හිනවූ රාත්‍රිතොමෝද, හංසයන්හෙන් හා හෘඛයන්හෙන් හිනවූ සුතපුල්ලවූ විලද, රජුන්හෙන් හිනවූ රටද, ලදරුවන්හෙන් හිනවූ ගෘහයද, කාන්තාවිරහිතවූ වල්ලහතෙමේද, නොබබලන් නාක්මෙන් සවකීය භාර්‍යාව කෙරෙන් වියොව හුදකලාවූ ඔබ මෙහි සිටීම කිසිසේත් යොග්‍ය නොවන්නේය.

"තරඛගිනෝ'පි තරඛගමාලි
සඝාඛක ගිතා රජ නීව සාම්,
හංසාලිහීනා සරසී සුපුල්ලා
නාභාති කාන්තා විරතොධවෝ"පි".

තවද සිඛාවීකුමාරයෙනි, ඔබගේ "සිඛාවී" යන නාමය වනාහි සියලු සත්‍රීන්ගේ කාමාවියන් සිඛකරණ අවියෙන් තැබූ හයි හඟිම්; ඔබගේ සවණ්ණිණවණ්ණිණවූ ශ්‍රී ශරීරය, ලොකවාසීහු කරුණා මෛත්‍රියෙන් සම්පූණ්ණිණවියයි කියති, මම වනාහි එසේ නොව පඤ්චකාමයෙන්ම පිරුනේයි සිතමි, ඔබගේ තෙල ධන් කඳන්වන් රූපසඤ්ඤය රන්මුහුදින් පැනනැගි ඉදුනිල්මිණි පර්‍වතයක්හුගේ ශ්‍රී විභූතියක් වැන්නැයි නොකියමි, කාමසත්‍රීන් නමැති බලාකාඛ්‍යනාවන්ට සවණ්ණිණඛ්‍යුර පසක් වැන්නැයි නොකියමි, කාමසත්‍රීන් ඔබගේ තුනුවිලව බැස කෙළනා විසල් මහතොවකැයි කියමි; තවද ඔබගේ රන්මෙරක්වන් ශ්‍රී ශරීර යෙහි දිලිසෙන ඉදුනිල්මිණිවන් සිරස රන්මුහුදින් පැන නැයි ඉදුනිල්මිණි පර්‍වතයක්හුගේ ශ්‍රී විභූතියක් වැන්නැයි නොකියමි; කාමසත්‍රීන් නමැති බලාකාඛ්‍යනාවන්ට ඝණ්ඨාධානය කරන්නාවූ මහමේකුළක්දෙහෝයි සිතමි; තවද ඔබගේ තෙල රන්ලතාවක් වන් නළල්තලමැද දිලිසෙන ඌණ්ණරෝමය රන්බිතෙක්හිවූ මකුල් තිලකයක් වැන්නැයි කියාත් නොකියමි; සවණ්ණිණසාගර යෙන් පැනනැගී දක්ෂිණාවර්ත ශඛ්ඛයක් වැන්නැයි කියාත් නොකියමි; නොහොත් එම රන්මුහුදින් පැනනැගි දරණලා ගොත් හැලි නාරජක්හු වැන්නැයි කියාත් නොකියමි; නොහොත් ඔබගේ රූපශ්‍රී සාගරයෙන් පැනනැගි අමා දධියක් වැන්නැයි කියාත් නොකියමි; නොහොත් ඔබගේ යශොලතා වෙහි ප්‍රබුඛවූ යස මල්කැනක් වැන්නැයි කියාත් නොකියමි; නොහොත් නාසිකා නමැති පුඩු ඇති බැම නමැති ඉනිල්මිණිදු

සතෙහි මුදුන්දුන් රිදීකොතක් වැන්නැයි කියාත් නොකියමි; නොහොත් ඔබගේ මුඛනමැති මහ පියුමට බැස මුවපුරා රෙන් ගෙණ නළල් නමැති රන්පෙතෙහි හිඳ රැව්නගා මත්ව ගුවන් බලාහුන් සවණිණ හංසපොතකයෙකු වැන්නැයි කියාත් නොකියමි; එකානතයෙන් කාමාඛනාවන් නමැති කෙඟමුදයන් ප්‍රබොධකරන්නාවූ පුන්සඳ මඩලක් වැන්නැයි සිතමි, හෙවත් ඔබකරා පැමිණි යෙඟවන සත්‍රීන්ගේ කාමපරිළාභ නිමිත්තපණය පිණිස මවාළූ රිදීතල්වැටක්දෝහෝයි සිතමි; තවද ඔබගේ තෙල වෙන වෙන පස්වණක් ප්‍රභායෙන් දිලිසෙන්නාවූ ඇස් සඟළ මුඛපද්මයට බට නීල භෘඞ්ගරාජයුගලයක් වැන්නැයි කියාද, නීලොත්පල වැන්නැයි කියාද, ඉන්ද්‍රනීලමාණික්‍ය යුගල යක් වැන්නැයි කියාද නොකියමි; පඤ්චකාමයෙන් ජයගැන්මට විශෙෂයෙන් වෙන්වෙන්කොට මවාළූ පඤ්චවණිණයක්දෝ හෝයි සිතමි; තවද ඔබගේ තෙල තුඩුවූ නාසිකාව මුවපියුම බලා කරනඟහුන් රන්වන් හංසරාජයෙකු වැන්නැයි නොකියමි; ඔබකරා පැමිණි පෙමකාන්තා නමැති කෙණෙරඟනන් අනුන්කරා නොයාදී භයාඟන්නාවූ සවණිණාඩකුනයක් දෝහෝයි සිතමි; තවද ඔබගේ තෙල සුපක්ව බිම්බඵල සමාන වණිණවූ අධර යුගමය, මුඛ නමැති පද්මයෙහි හටගත්තාවූ රත් පියුම් පෙති සඟලක් වැන්නැයි නොකියමි, ඔබගේ රූප නමැති ක්‍රීඩා ශාලාවෙහි කාමාඛනාවන්ට මවාළූ ප්‍රවාලමයවූ රාඞ්ඩම් සඟ ළක් වැන්නැයි සිතමි; තවද ඔබගේ තෙල අධර යුගමාභ්‍යන්තර රයෙන් අඞ්රූපව දක්වන්නාවූ දන්තපඞ්ක්තිහු මුඛපදමයෙහි කෙශරපඞ්ක්තියක් වැන්නැයි කියාත් නොකියමි; දුටු දුටු කාමුක සත්‍රීන්ගේ කාමාර්ථයන් සිදුකරමැයි සඞ්ඛ්‍යා වලාඟබකින් පෙණෙන්නාවූ දෙවෙනි චන්ද්‍රයාදෝහෝයි සිතමි; තවද යහළු සිඛාවී නම් රූ සයුරුතෙනි! ඔබගේ තෙල රන්කුළු සඟලක්වන් උරසඟලෙහි පැහැර සිටිනා කන්පව සඟළ, රන්ගල් මුදුනෙක නවන සවණිණ මයුරරාජ යුගමයක් වැන්නැයි නොකියමි; ඔබ කරා පැමිණි යෙඟවන සත්‍රීන් අනුන්කරානොයාදී දෙපා බැඳ රඳවන රන්දම්වැල් සඟලකැයි සිතමි; ඔබගේ තෙල රන්වන්වූ ශ්‍රීවය රන් මිනිහුබෙරක් වැනියයි නොකියමි; කාමාඛනාවන් උමතුකරවන ඖෂධ සටිකාවක්මයයි සිතමි; ඔබගේ තෙල රන් වන් සිව්රැඟැඹින් නිකුත්බාහු යුගමය, රන්වලාඟබකින් නිකුත් විදුලුලතා යුගමයක් වැන්නැහි නොකියමි; ඔබගේ රූප නමැති අමාඟඟට වැද කාමුක සත්‍රීන් සික්සේ ක්‍රීඩා කරන්නාවූ රන්පළු පත් සඟලක් වැන්නැයි සිතමි; මෙසේවූ රූපසෙඛ්‍යයකින් හොබනාවූ ඔබට කාමසත්‍රීන් නැතුව හුදකලාවම මෙහි වසනු ඉතා නොයෙදෙයි; කුඹවහන්සේ සුණු ගල් උළු දැව ලොහ යනු

වගීවලින් නිම්මිතනුවූයෙහිමය, සෞම්‍යවූ රූපයක් දරන්නෙහිය, එතකුදුවුවත් කිම කාමිංගාව සිහින් දුරුකෙරෙහිද? එබැවින් එව හිමිය, එකලාව මේ වෙනෙහි නොවැස, අද දක්වාත් පුරුෂයන්ගේ පහස් නොලත් මාගේ මේ දෙලොස්හැවිරිදි කුඩා නැගනිය රක්‍ෂාකරව; මේ තරුණිතොමෝද කාමරතියෙහි දක්‍ෂියෙක, බාලයයි සිත්හි සැකහළ මැනව, කිම මනාව පිපියාවූ මල්කැණමත්වූ භෘඩගරුජයා පිරිසුඹුනාකල්හිබිඳේද? නොබිඳේමය. තව යෞවනයෙහි පිහිටි සොළොස් හැවිරිදි මේ නැගනිය හෝ රක්‍ෂාකරව; ඝනාදි වශයෙන් කියා නැවතද කියන්නී; හිමි ඔබසිතැත්තෙක් නොවළහා කියව; අපමුත් මෙතත අන්කිසිවෙකු නැති බැවින් කිසි විළියක් නොවේවයි ඝනාදීන් මෙසේ ලදබොළදවූ නොයෙක් විරහ තෙපුල්කියය. මෙසේ තුන්ඝම්රාත්‍රිය මුලුල්ලෙහි හැවසූ ඉසතෙස් උනාහෙළමින් අක්කොළින් සිනාසෙමින් නුරා බැල්මෙන් බලමින් ඇඟින් මැඩසන්කෙරෙමින් හන්පිළී හිපිල කරමින් නොයෙක් ප්‍රකාර අකටවිකට පා පොළඹන්නාහු, හරණලද කෙලඟාභිමාන ඇති සඕඥයන්වහන්සේගෙන් නුවන් කෙළවරකින් බැල්මක් පමණකුදු නොලද්දාහුය.

මෙසේ අනෙකප්‍රකාර උත්සාහකොවත් අවකාශයක් නොලදින් වෙහෙසෙමින්, සවාමිවූ සිඛාඊකුමාරයෙනි! මේලොකයෙහි ඔබ මහා ශ්‍රඛාවන්තයෙකැයි කියති; කාමපරිළාහයෙන් ඔබකරා ආ අපගේ එම විඛාව සන්හිදුවා නුලුයේනම් අද අපගේ දිවි නිබේයයි නොසිතුව මැනව; එසේත් ලොභිවූනම් ඔබගේ තෙල ශ්‍රීපාදනමැති පියුම් දෙකින් අපගේ නළල්මැද තිලකාභරණ දෙව; එසේත් ලොභිවූනම් ඔබගේ මුඛ නමැති රන්කරඬුව විවෘතකොව,එහි ඇත්තාවූ සවණිණෙහාණඩනමැති මධුරවචනයක් දන්දී අපගේ මනදෙළ පුරාළව මැනව; මේ ආදි වශයෙන් ශ්‍රඛාබල බලම්හයි නොයෙක්ලෙස යාචඤ්ඤාකළකාලද මාගේ සවාමිදරුවෝ ඒ දිව්‍යසත්‍රීන්ගේ සවභාව ලීලා විලාසය ජරපත් වැදිරි මුළක් පානා උසුලුවිසුලුසේ සලකාද, අසුචිවලෙක්හි ගුගුල්දෙන පණුකැලන්සේද අශුභ ලකුණු උපදවා මෛත්‍රීන් පිණ පිණා මහමෙරසේ නිශ්චලවම වැඩහුන්සේක; එකල ඒ මාරාඛ්‍යනාවෝ, මොහුගේ පූර්‍වචරිතයෙන් මොහුවම නිදුෂ්කොව පොළඹාඅණුම් හයි සිතා කියන්නාහු:—සිඛාඊකුමාරයෙනි! ඔබ පෙර කුඤරජව උපන්කල ප්‍රභාවතීන් ඔබ හැර පලාගියද, ඔබ ඒසා රාජ්‍යයක් හැරපියා ඇපසුපස්සෙහි එකලාව එකද, සියක්යොදුන් දිවුදවස් සිහිනැද්ද? තවද එම සත්‍රියකිසා සන්මසක් මුලුල්ලෙහි දරපැන් ඇද බත්මාළු පිස අරක්කෑමිකම්කොට ගත්දුක් මතකනැද්ද? තවද එක්කලෙක චුල්ලපදුම ජාතකයෙහි ප්‍රියවූ කාන්තාවක් නිසා රාජ්‍ය හැරහොස්, ඈ පස බිම්ගාපියා නොදෙමැයි කර

භිදුවාගෙණ දුරුකතර යනකල, ඇ පිපාසයෙමියි කීවේලෙහි, ඒ ගමනය කරන්නාවූ මාගීයෙහි පැන් නොදැක සියවෙර ඉරු උරිරුපොවා ඇගේ පිපාසය සන්සිඳුවාලූ නියාව සිහිනැඳිද? තවද **සංඛපාලජාතක**යෙහි **බරණැස්රජු**ගේ අගමෙහෙසුන් බිසව දැක ලොභකිරීමෙන් පියාපත් සිඳලූ පක්ෂියෙකුසේ ආකාශයෙන් බිමගි එබදුවූ ධ්‍යානසුව හැරගොස් කිපදිනක්ම නොකා නොබී හිදීමෙන් එයමයෙහි ඔබකළ සත්‍රීශොකය දැන් සිහියෙන් තුරන් වීද? තවද පෙර ඔබ **උම්මදන්තීජාතක**යෙහි රජව නුවර පැද කුණුකොට යනතල **උම්මදන්තී** නම් කාන්තාව දැක ඇ කෙරෙහි පිළිබඳ සිතක් ඉපදී කාමොන්මාදව ආපසු පෙරළා රජගෙට ගොස් ඇ සිහිකොට විලාපබස් කියමින් හැඬුලිලාව දැන් සිහි නැද්ද? පෙර මෙසේ ඒ ඒ සත්‍රීන් නිසා දුක්ඝත්තාවූ ඔබ, දැන් අප සසීයක් ප්‍රියකාන්තාවන් දැකත් දැඩිව සිටීම සුදුසුතොවෙයි; අපගේ මේ කාම විඛාව සන්සිඳුවාලවයි නොයෙක් ලෙසින් යාචිසුනළාහුය.

එවේලෙහි **සම්බුදයන්වහන්සේ කරුණාපිඩක්සේ** නියවලව වැඩහිඳ සිතාවදුරණසේක්,මා රහාදී කෙලනයන්නසා ලොව්තුරා බුදුව තුන්ලෝ මුදුන්වූ පරිදි මේ සත්‍රීන් නොදන්නනියාය, මෝවුන්ට මා අරුගී, අවෙෂි, අමොහී පරිදි **හඟමාලම්යි** සිතා **තමන්වහන්සේගේ** මුවපියුමෙන් සුවඳ විහිදවා අඡාඩඝඝමූ පෙතවූ සුමිහිරි නාදයෙන් වදුරණසේක්:—නහිනි, කුමක්නිසා වෙහෙසෙව්ද, තොපගේ මේ සත්‍රීලීලාව අවිතරුගිවූ පුරුෂයන්ට සුදුසුබවමුත් මාසේ අරුගීවූ, අවෙෂිවූ, අමොහීවූවන්ට සුදුසු නොවේයයි වදළසේක; ඒ ධම්මය ඇසූ **මාරකන්‍යාවෝ**, සදෙව් ලොව දෙවඟනහු අවුදිනුත් මොහු කාමපාශයෙන් බැඳගත නොහෙන්නාහුමයයි කලකිරී, බුදුන් දිහාවට ඔවුන්ගේ අත් දිගුකරමින් කයන්නාහු:—කොල සිඹාවිය! එකාන්තයෙන් තොප මනුෂ්‍යයෙක් නොව ලෙහි ගුණ ලවයත් නැති රකුසෙක්හිද? නොහොත් උනමඤ්ඤ පුරුෂයෙක්හිද? නොහොත් තාගේ රුව මතුපිට රන්පොත්තකින් වසා ඇතුළත ඉලකින් නිම්යේද? නොහොත් තාගේ මේ ශරීරය යකඩින් නිමවා රන්වන්කරණ ලද්දේද? එකාන්තයෙන් මේ ශරීරය රූපසකඛය මුත් සිතෙක් එහි දුරින්දුරුමය; තාසේවූ සිත ගුණනැති **පුරුෂයෙකුනරු** අපි ආමෝ නොයෙදෙයි; තාසේවූ ගුණනැතියන් කෙරේ ඉදින් නොකැමැත්තෙනුත් හිදිනෝ කවුරුදැයි, යනාදී **වශයෙන්** නිම්ල චන්ද්‍රයාකෙරේ ඊර්ෂ්‍යාවෙන් භූඛාකාරකරණ සුනඛවුලක්සේ නිතු බැණ පැරද **එතකින්** අන්තාඛීනව පලාගියහ.

මෙසේ නසනලද කෙලසානිමාන ඇති ඒනාසන්නාන්වහන්සේ **අජපාලනම් න්‍යග්‍රොධවෘක්ෂමූලයෙහි** ධ්‍යානසුඛයෙන් **සත්දිනක්** අතික්‍රාන්ත කළසේක.

සමන සතිය.

තාවද ඒ අජපාලකම් නුගඝසඵල පස්වෙනිසතිය අතික්‍රාන්ත කොට එතනින්නැගී මුවලිඳ නම් විලසමීපයෙහිවූ මහ මිදෙල් රුකක්මුල, යුගදුරු පළුත මධ්‍යාකයෙහි බබලන්නාවූ සඝස රශ්මීන් විරාජිත සූයර්දිව්‍යරාජයාමෙන් ශ්‍රීවණී ඝණ බුඩරශ්මී මාලාවන් විහිදුවමින් වැඩඋන්සේක; ඉක්බිත්තෙන් සියගණන් වලාපටලින් යුක්තව, විදුලි සහිතව ගජ්ජාකරන්නාවූ, ශීතල වාතසහිතවූ සත්දිනක් මුලුල්ලෙහිම නොකඩව වර්ෂාරාපතනය කරණසුලුවූ වාතුද්දිපිකානම් මහාමේඝයක් නැගී අහසපුරා පැතිර සිවගැණීමෙන් ඝනාන්ධකාර සහිතවූ දවසෙක්විය; එකල එහි වසන මුවලිඳුනම් නාරජතෙම විලෙන්නැගී බලනුයේ, දඟදිග ගැවසීසිටි මහත්වූ වැසිඅදුරුදැක, සම්බුදුන්වහන්සේගේ ශ්‍රී ශරීරයට සීත වැසි සුලං මැසිමදුරු ආදීන්ගෙන් වන උවදුරු වලකා, මේ සත්දිනම කායවෙය්‍යාවතෙකින් පින් රැස්කරමැයි සිතා බුදුන්සමීපයටගොස් මහත්වූ සත්දරණවැලකින් වටකොට ගෙණ, මුදුනේ පෙණපත විදහාගැණීමෙන් සෙවෙනිකරගෙණ සිටියේය; මෙසේපිළිමිණීකරඬුවෙක තබනලද සවණ්ප්‍රතිමාවක් මෙන් ඒ නාගාසන මස්සාකයෙහි දහන් සුවයෙන් සවන සතිය ගතකළසේක.

සත්වන සතිය.

ඉක්බිති කරුණාගුණාඛගයෙන් අගතැන් පැමිණියාවූ ඒ සම්බුදුන්වහන්සේ මුවලිඳුනම් නාරජහුගේ දරණ ගහීයෙහි ශ්‍රී සඛම්මය මෙනෙහිකිරීමෙන් සතියක් කල්ගතකොට, එයින් නික්ම සත්වන සතියෙහි මුචකිඳිපළුවනෂට වැඩ එහි කිරිපළ රුකක්මුල ගලස්නක්පිට, නිල්වලාගැබකින් නිකුත් නිමීල පුණ්ණචන්ද්‍රමණ්ඩලානුකාරීව විමුක්ති ප්‍රීති සැපවිඳිමින් සත් දවසක් අතික්‍රාන්ත කළසේක; මෙසේ සම්බුදුන්වහන්සේ වෙසඟ මස පුණුපොහොදිනයෙහි උදැසන සුජාතානම් සිටුදියණියන්විසින් පිළිගන්වනුලැබූ කිරිබුබු වැළඳුනැන් පටන් මේ සත්සතියයි කියනලද එකුන් පණස්දවසක්මුලුල්ලෙහි නිරාහාරව සමාපත්‍යානුභාවයෙන්ම කාලාතික්‍රමණය කළසේක; එබැවින් මූඛ ඩොවන ශරීරකෘත්‍යය ආහාර කෘත්‍යාදියක් මේ සත්සතියතුළම නොවීය; ඉක්බිති බුදුවූ පණස්වනදා උදය අරුණුනැගී වේලෙහි ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ අමාඅරළු සුණුකඩක් සහ නාලියදෑවිටුද ගෙණවිත් බුදුන්ගේ ශ්‍රී හස්තයට පිළිගන්වාලීය; ඒ දිව්‍යවූ අරළු වැළඳුකල තථාගතයන්වහන්සේ සිරුරුපිළිදුගුම්විය, ඉක්බිතිව ශක්‍රදෙවිරජහු දුන් සිහිදුවූ ඒ නාලියදෑවිටුදවළඳා එකොණෙහිම

හිමාලයෙහි සම්පණස් යොදුන් අනවතප්ත මහවිලව් වැඩ, අනන්තාපරියන්තවූ බුදුවරයන්වම නියතව තුබූ "සුගත" නම් තොටට බැස මුඛධොවනය කොට නැවත වැඩ එම කිරිපළ රුක්මුල්හිම වැඩහුන්සේක.

මධු පිණ්ඩික දානය.

එකල බුදුසෙනෙකුන්ට අග්‍රභොජ්‍යයක් පිළිගන්වමැයි කල්පලක්ෂයක්මුලුල්ලෙහි ප්‍රාර්ථනාකොට ආවාවූ **නාපසසුහල්ලුක*** නම් වෙළඳදෙබෑනෙක් උත්තරාපථයෙහි (උතුරු දනව් වෙහි) සිට ගැලින් බඩු පුරාගෙණ මධ්‍යමණ්ඩලයට යන්නාහු ඒ කිරිපළුවනයට පැමිණියාහ; ඉක්බිති පුවිජන්මයෙහි ඔවුන්ට සහලේනැවූ එක්තරා දෙවිදුවක් ඒ වෙනෙහි වසන්නී, යන්නාවූ ඒ වෙළඳ දෙබෑයන් දැක ඔවුන්ලවා අද බුදුන්ට දානක් දෙවා ඔවුන්ට වැඩක් සිදුකරමැයි සිතා, ඔවුන්ගේ පන්සියයක් ගැල්සක් නානි දක්වා පොළොවෙහි ගල්වාපිය; අදනා හොන් දන බිම ඇන රදුගියහ; ඒ වේලෙහි වෙළඳදෙබෑයෝ බියපත්ව මේ වවනෙහි දෙවිනෙනෙකුන් කළදෙයක්ව නැයි සිතා ගඳදුම් මල් පහන් පුදා දෙවියන් ආරාධනා කළහ; එකල දෙවිදූ තොමෝ ආකාශයෙහි සිට ඔවුන්ගේ භය හරවා කියන්නී— "අපගේ බුදුහු සම්‍යක්සම්බුද්ධත්වයට පැමිණියදවත් එකුන්පනස් දවසක් මූලුල්ලෙහි මේදක්වාත් නිරාහාරයෙන් කල්යවා, දැනම මාගේ මේ වෙනෙහි පුණ්‍යක්ෂේත්‍රව වැඩවාසය කරණසේක; එබැවින් නොපවත් මටත් පින්පුරා මතු වැඩ පිණිස බුදුන්ට අග්‍රභොජනයක් දෙවාලනු කැමැත්තෙමි" යි මෙසේ බුදුගුණ කථනයකොට බුදුන්ට දනක් දෙනසේ ඔවුන් සමාදන්කරවා ගෙණ ඒ පන්සියයක් ගැල්ම හැරපිය; එවිට ඔව්හු මිපිඩුගෙණ බුදුන් කරා එළඹ පෙරටුව සිට "ධිරඝන්වහන්ස! අපට අනුග්‍රහ පිණිසත් මතු අනල්ප කල්පයෙක්හි හිතවැඩ පිණිසත් මෙම දානය පිළිගෙණ වැළඳුවමැනව" යි ආරාධනා කළහ.

"ඉදං හිනොධිර අනුගහාය, පටිගහෙහා පතිහකප්පදානං
හිතාය තං හොති සුඛාය චෙව, අනාපකඛපපසු අනාගතෙසු"

මහාබ්‍රහ්මයා විසින් පිළිගැන්වූ පාත්‍රය බුදුහු කිරිපිඩු පිළිගන්නා දවස් අතුරුදන්වූ හෙයින්ද, කිරිපිඩු පිළිගත් පාත්‍රය නාලෝ වැසියන්ට සෙත් පිණිස නාගභවනයට ගිය බැවින්ද, බුදුහු කිමෙකින් මිපිඩු පිළිගනිම්දෝහෝයි සිතූහ; එකෙණෙහි උන්වහන්සේවිසින් ජාතිශතසහශ්‍රයෙහි වතුමධුර පූර්ණ පාත්‍රයන්

---

*රාජේන්ද්‍රලාල්මිත්‍ර නම් පණ්ඩිතයා විසින් සකස්කරණලද "බුද්ධගයා" නම් ඉංග්‍රීසි ප්‍රකාශයෙහි "තපුසුසා" සහ "භල්ලිකා" යයිද වෙළඳ දෙබෑයන්ගේ නම් දක්වා තිබේ.

දන් දුන් කුශලානුභාවයෙන් (එසඳ) ධාතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන සතරවරම් මහරජහු ඉදුනිල්මිණිමුවා පාත්‍ර සතරක් එළවූහ; බුදුහු පෙර බුදුවරයන්ගේ චාරිත්‍ර බලා ඒ පාත්‍රයන් නොපිළිගත්හ; නැවත මුංවන් පැහැ ඇති ශෛල මය පාත්‍ර සතරක් ගෙණවුත් මාගේ පාත්‍රය ගතමැනව, මාගේ පාත්‍රය ගතමැනවයි කියකියා බුදුන්ගේ ශ්‍රී හස්ත නමැති පියුමට බස්නා නීල භාඛරරාජයන් සතරදෙනෙකුසේ මතුමත්තෙහි තබාපූහ; බුදුහු සතර දෙව්පුතුන් කෙරෙහි අනුකම්පාවෙන් සතරම් එකම පාත්‍රයක් වේවයි අධිෂ්ඨාන කළහ; එකෙණෙහි සතර පාත්‍රයම එක්ව ඇලී මුවවිට පෙණෙන රෙඛා සතරක් ඇති එක පාත්‍රයක් විය; එකල බුදුහු ඒ පාත්‍රයෙන් මීපිඬු පිළිගෙණ වළඳ අනතයෙහි භුක්තානුමොදනා පිණිස බණ වදාරා බුත්සරණ දම් සරණෙහි පිහිටුවා වෙවාචික උපාසක කළෝය.

මේ තපුසසු භල්ලුක නම් දෙබෑ වෙළෙන්දෝ මේ ලොකයෙහි බුධරතනය, ධම්මරතනය, යන රතනවයෙහි පළමුකොට සරණ ගොස් උපාසකවූ අය බැව් දතයුතුයි; නැවත ඔව්හු, "ස්වාමීනි අපව නිති වැඳපුදගන්නාසියාගෙන් පූජනීය වස්තුවක් දුන මැනව" යි ඉල්වූහ; එකල සම්බුදුන්වහන්සේ ශ්‍රී හස්තයෙන් මස්තකය පරාමර්ශනය කොට කෙශධාතු මිටක් දින; ඉක්බිති එයින් සන්තුෂ්ටවූ ඒ වෙළඳ දෙබෑයෝ රුවන්කරඬුවකින් ඒ ධාතු පිළිගෙණ රථයෙහි වඩා තබා පුදකෙරෙමින් සිය නුවරට හැරගෙණ ගොස් දගැබක් කොට එහි ද නිදන්කර සම්පත්වූ පරිද්දෙන් පිදූහ.

ධම්ම ශාමණේරිය මෙනෙහිකිරීම හා බ්‍රහ්මාරාධනාව.

තවද ශාස්තෘන්වහන්සේ විසින් තපුසසු භල්ලුකනම් වෙළඳ දෙබෑයන්ට අණුමෙවෙනි බණ වදාරා ඔවුන් සරණගතකොට, ඉක්බිති නැවතත් අජපාල න්‍යග්‍රෝධ වෘක්ෂමූලයෙහි වැඩහිඳ උන්වහන්සේ විසින් අවබෝධකරණලද ධර්මයෙහි ගම්භීරත්වය මෙනෙහිකරන්ට පටන්ගත්සේක. ගේ කෙසේද යත්? මා විසින් අවබෝධකරණලද මේ නිර්වාණ ධර්මය සාවෙකු විසින් මහා සමුද්‍රය තරණය කිරීමට තැත්කරන්නාක්මෙන් බුබඳුනය නොලැබුවන් විසින් අති ගාම්භීරයියෙන් හා විශාලත්වයෙනුත් නොයාහැකි පරතෙරක් ඇත්තෙහිය; පණිතයකින් වසා තුබූ දෙයක් මෙන් නිසි කෙනෙකුත් විසින් නොදක්නා හැක්කේය; නිවියාවූ සියලු සෙලඹ පරිදහ ඇතිබැවින් ශාන්තවත්තේය; මධුර රස ඇති භෝජනයක්සේ තෘප්තියකට නොපැමිණෙන

කාරණයෙන් ප්‍රණීතය; සියක්වර පළනලද අස්ලොම් අඟක් මෙන් ඉතා සූක්ෂමවූවන්නේය; මහා පණ්ඩිතජනයන් විසින් දැනගතයුතු බැවින් පණ්ඩිතවේදනීය වන්නේය. එසේවූ මේ ධර්මය අවබෝධකරණු පිණිස උත්සාහකරන්නාවූ මා විසින් වනාහී පැමිණි පැමිණි යාචකයන්ට මිණිඔවුනු ආදීන් සරහා පිළිගෙළකරණලද්දාවූ හිස් කපා දන්දීමෙන්ද, ශරීර ලොහිතය දන්දීමෙන්ද, මහාකොව අදුන්ගා සරහනලද ඇස් උපුටාදන්දී මෙන්ද, කුලවංශයට ප්‍රදීපයක් වැනිවූ පුත්‍රයන් හා මහාවඩන්නාවූ භාර්‍යාවන් දන්දීමෙන්ද, නුදුන්නාවූ දෙයෙක් නම් නැත්තේය; ඝණ්ඨපාල ජාතකාදීවූ ආත්මභාවයන්හි තෘණලවයක් මෙන් නොසලකන්නාවූජීවිත පරිත්‍යාගය හා පොළෝ පෙරළීමක් මෙන් සිතන්නාවූ ශීලව්‍යතික්‍රමණයද ඇති මා විසින් නොරක්නාලද ශීලයක් නම් නැත්තේමය; චුල්ලසුතසොමාදිවූ ආත්මභාවයන්හි මනොඥවූ සම්පත්ති පරිත්‍යාගකරන්නාවූ මා විසින්ද, ක්ෂාන්තිවාදීදී ආත්මභාවයන්හි ශ්‍රේෂ්ඨ හෙද්‍යදියට පැමිණෙන්නාවූ මා විසින්ද නුපුරණලද කිසියම් පාරමිතාවෙක්නම් නැත්තේය; මෙබඳුවූ මා සවස්වේලෙහි මාරසෙනාව විධ්වංස නයකරන්නාහටත් මහිකම්පානොවීය; ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසානුස්මෘතිඥානය උපදවන්නාහටද, මධ්‍යම යාමයෙහි දිව්‍ය චක්ෂුර්ඥානය උපදවන්නාහටද පෘථිවිතොමෝ කම්පා නොවීය; පශ්චිම යාමයෙහි වනාහී ද්වාදශාඞ්ග ප්‍රතීත්‍යසමුත්පාදය අනුලොම ප්‍රතිලොම වශයෙන් ප්‍රතිවේධකරන්නාවූ මාහට දසදහස් සක්වල ගදණ්ඩකින් ප්‍රහාරලත් ලොහ කළියක් මෙන් දස දහස්ගණන් හර්ෂනා පවත්වමින් පවනින් වසඳුලවූ පියුම් පෙතක්හි බඹත රලබින්දුවක් මෙන් සාම්ප්‍රතාවිය, මෙසේ නිස්සණ ප්‍රඥ ඇත්තාවූ මා විසිනුදු මේධර්මය දුකසේ ප්‍රතිවේධ කරණලද්දේය; මේලෞකික මහාජනයා කාසි පිරුණු ලැබූ ඵල යක්මෙන්ද පූතිතක්‍රයෙන් හරිතවූ (කුණු මෝරු පිරුණු) සැලක් මෙන්ද, කෙලසමලයෙන් හරිතය, ඉතා සංකලිෂ්ටය, රාගයෙන් රක්තය, වෙෂයෙන් දුෂ්ටය, මොහයෙන් මූඪය, චතුස්සත්‍යය නොදක්නා අවිද්‍යාදියෙන් මඬනාලද එසේවූ සත්වයෝ මෙබඳුවූ ගම්භීර ධර්මයක් කෙසේ නම් අවබෝධකෙරෙද්දැයි යනාදීන් සිතා දනම් දෙසීමෙහි මනුතසාහ ඇතිවූහ.

එකෙණෙහි සහම්පති නම් මහා බ්‍රහ්මතෙම බුදුන්ගේ අදහස් දැන, "නස්සති වතාහොලොකො-විනස්සති වතාහොලොකො" යනාදිවශයෙන් මුළුලෝ නැසීනැසී දසදහසක් ලොකධාතුව උපුල්වා මහඟඬින් හඬා, සියලු දෙව්බඹ සමූහයාද පිරිවරා දික් කළ අතක් වක්කරණ ඇසිල්ලෙන් බුදුන් අබිමුවව එළඹ උතුරු සළුව එකාංශකොට පෙරව අඳුනිව හිඳ මුදුනෙහි ඇදිලිබැඳ

කියන්නේ "දෙවාතිදෙවවූ ශ්‍රීමත් සම්බුදුරජාණන් වහන්ස! ඔබ වහන්සේ සුමේධ තාපස කාලයෙහි සංසාර සාගරයෙහි දුක් විඳිනා සත්ත්වප්‍රජාව කෙරෙහි මහා කරුණා සමාපත්තියෙන් යෙදී දිවකුරු බුදුන් පාමුලදී ලබනලද නිර්වාණරසය හැරපියා විශේෂයෙන් දුගීමවූ සංසාර නමැති මහ වනයට ප්‍රවිෂ්ටව, ඇස් ඉස් මස් ලේ ආදීන් පුදකෙරෙමින් දස පාරමිතාවන් පරිපූරණය කළහ; නොඉවසිය හැකිවූ අප්‍රමාණවූ දුක් විත්දෙනිය; ඔබ වහන්සේ සාරාසඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි මෙසේ අනෙක ප්‍රකාර දුෂ්කර ක්‍රියා පුරමින් දුක් ගත්තේ සර්වඥ ප්‍රයෝජනය නකාගෙණ නොව පරහට දයාවෙන් දහම්සක් පවත්වා සියලු සතුන් සංසාරසාගරයෙන් එතරකරමැයි සිතාවේද, එසේමවූ ඔබවහන්සේ දැන් සබම්මවර චක්‍රවර්තිව ධර්මචක්‍රය නොපවත්වමැයි සිතුයේ නොදෙදෙයි; මේ ලොකයෙහි ඔබවහන්සේගේ ධර්මය අවබෝධ කරගැනීමට සමර්ථවූ අල්පරජස්ක සත්ත්වයෝ එකාන්නයෙන් ඇත්තාහුය; යම්සේ ජලජ ඵලජවූ අනෙක පුෂ්පයෝ සූර්‍යරශ්මි ස්පර්ශයෙන් සුදුසු කාලයෙහි විකසිතවෙද්ද, එපරිදිදෙන්ම ඔබවහන්සේගේ දේශනා නමැති රවි රැසින් විනෙයජන නමැති කුසුම්යන් ප්‍රබෝධකර වදුළමැනවැයි කියා ආරාධනා කෙළේය; එසඳ සම්බුදුරජාණන්වහන්සේ දිවැසින් ලොව බලා වදුරණසේක්, මෙපමණ සත්ත්වයෝ අල්පවූ රාගාදි රජස් ඇත්තාහුය, මෙපමණ සත්ත්වයෝ මහත්වූ රාගාදිරජස් ඇත්තාහුයයි දැක, එයින් අනුශාසනාවට යෝග්‍ය පුද්ගලයන් දැක ධර්ම දේශනා කෙරෙමියි මහ බඹුනට ප්‍රතිඥ දුන්සේක; එකල ඔදවැඹියාවූ සිත් ඇති මහා බ්‍රහ්මතෙම මුලුලොවට ඇසෙනසේ තුන් වළක් සාධුනාද පවත්වා එතනින් අන්තර්ධානවිය.

දහම් දෙසීමට සොඟැසින් පරීක්ෂාකිරීම.

මෙසේ මහාබ්‍රහ්මයා විසින් ගන්නාලද අකුඬු ඇත්තාවූ ඒ සම්බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මාරාධනාව පිළිගෙණ මම කවරක්හට ධර්මදේශනා කෙරෙම්ද, කවරෙක් මාගේ ධර්මය වහා අවබෝධ කිරීමට තරම් ව්‍යක්තඥයි සිතා ආළාරකාලාම උදකාරාම නම් දෙමහතවුසන් ප්‍රඥසම්පන්නයා අල්පරජස්කයන් බැව්දැන ඔව්හු කොයි වෙසෙද්දෝහෝ දිවැසින් බලනුයේ, ඔවුන් එයට පූර්‍වයෙහි මියගොස් බුදුවරයන් දසදහසක් ලොව පහළවූවත් ගැලවී ගත නොහෙන අරූපාලයෙහි ඉපිද සිටිනා බැව් දැන, කප් ලක්ෂයක් මුළුල්ලෙහි අග්‍ර දහම් පිළිගන්නට කරණලද ප්‍රාර්ථනා ඇති පළමු සහවුරුද්දක් මුලුල්ලෙහි තමන්වහන්සේ සමීපයෙහි හිඳ උපස්ථාන කෘත්‍යයන්හි යෙදී සිටියාවූ කොණ්ඩඤ්ඤයාදි පස්වග

මහණුන් දැක ඔව්හු කොයිවෙසේද? හෝයි බලනුයේ, බරණැස ඉසිපතනයෙහි වසනාබැව් දැක උපන් මහා කරුණා ඇතිව ඔවුන්ට දහමසක් පැවැත්වුව මැනවයි කිපදිනක්ම මෝඬැඩ අබියසෙහි වැස ඇසළමස පුණු පොහෝ දිනයෙහි පාසිවුරු හැර ගෙණ බාරාණසි නම් නගරයෙහිවූ මිගදය ඉසිපතනාරාමයට වඩනේ අතරමගට පිළිපන්සේක.

උපකනම් ආජීවකයා හමුවීම.

මෙසේ එකවාරි හැතිපොතකයෙකුසේ සම්බුදුරජාණන් වහන්සේ ඉසිපතනාරාමයට වඩනාසේක් අතරමගදී උපකනම් ආජීවකයා සම්මුඛවිය; එකල උපකාජීවකතෙම බුදුන්ගේ ශ්‍රී ශරීරයෙන් නික්මෙන ෂඩ්වර්ණ ඝනරශ්මිමාලාවන් දැක, සඳරැස්දුටු කුමුදු විලක්සේ ඉතා ප්‍රසන්නව "සවාමිනි! තෙපි සඳුට වඩා සෞම්‍ය කෙනෙකුව, හිරුට වඩා තෙජස් ඇති කෙනෙකුව, සමුද්‍රයට වඩා ගැඹුරු කෙනෙකුව, මහමෙරට වඩා අවල කෙනෙකුවව" ඔබවහන්සේගේ ශරීරය වන්හි ඉතා දීප්තිමත් භාවයකින් හොබනේය; සන්හුන් ඉඳුරන් ඇතිසේ පෙණෙන්නේය; ඔබ වහන්සේ කවරෙක්හිද? දැන් ඔබවහන්සේ කිනම් සථානයකට වඩනාසේක්දැ"යි විචාලේය; එකල බුදුහු තමන් කෙරෙහි ඔහු පැහැදීමෙන් ඕහට මතු බොහෝ වැඩවන නියාව දැක තමන් වහන්සේද මදසිනා පහළකොට වදාරණසේක්:-"එම්බා ආජීවකය! මහමෙරට වඩා උස්වූ ගඟලක් නැත, මහා සාගරයට වඩා ගැඹුරුවූ ලිදෙක් නැත, මහපොළවට වඩා මහත්වූ ගොඩෙක් නැත, අහසට වඩා මහත් සිස්තැනක් නැත, සිංහයන්ට වැඩිසිටි කැනගිල්ලු නැත, ගඛ්ඛහත්තීන් හා සමකරණ ගම්හූරෝ නැත, සඳ හිරුමඬුලු පරයන කඳෙපැණීයෝ නැත, එබැවින් මේ මූලු ලෙව්හි මා හා සමාන එකද සත්වයෙක් නැත, මම වන්හි සියලු ධම්මයන් නිමවා දත්තෙමි; දුරුකළමනා රාග වෙෂ මොහාදී කෙලෙස් සහිතවූ ධම්මයන් අහසට පොළවසේ දුරහළෙමි; භාවිත කළමනා උත්කෘෂ්ටවූ ධම්මයන් හැම අළලා අමාපිඩක්සේ හැරගතිමි; දෙව බ්‍රහ්මාදීන්ගෙන් මෙහෙගෙණපීම්; ශක්‍රාතිශක්‍ර වීම්; බ්‍රහ්මාතිබ්‍රහ්මවීම්, වඳනියාහි වඳනීයවීම්, පූජනීයාහි පූජනීයවීම්, සබ්බම්මවර චක්‍රවර්තිවීම්; එහෙයින් ආජීවකය මට අනුත්තරජිනයයි නියත්; මම වන්හි මොහාන්ධකාරයෙහි නිමග්න වීමෙන් නිගවලව සිටින ලොකයා අතරෙහි දම්සක් නමැති අමෘතභෙරිය හසුරුවීමෙන් ලොකය බුබුලුවාහැරීම පිණිස බාරාණසියෙහිවූ ඉසිපතනයට යෙමි"යි වදාළසේක; එකල්හි ආජීවකතෙමේ බුදුන්කෙරෙහි අතිප්‍රසන්නව "යහළු අනුත්තරජිනයෙනි, එසේවීනම් අද පටන් ඔබ මාගේ යහළුවූයේය; ඔබ මෙසේ

පොහොසත් බැවින් මතු ඔබකරු ආ දවසෙක මා රක්ෂාකරවී දැ"සි විචාළේය; එකල තුන්ලොවට තිලකයක් වැනිවූ සර්ව්ඥ යන් වහන්සේ නිසා මතු බිහව වන වැඩ දැක මදක් සිනා පහළ කොට "යහපත දරුව පලාඑව, එදවස් නොප රක්ෂාකරම්හ"සි වදාරා ඉසිපතනාරාමයට වැඩිසේක.

උපකාජීවකයා නැවත බුදුන්කරා පැමිණි පරිදි.

එදවස් ඒ ආජීවකතෙම බරණැසින් ගොස් මහා ප්‍රත්‍යනත යෙහිවූ "වඩ්ඪහාර"නම් දනව්වෙහි එක්තරා වැදිගමකට පැමිණ අඩක් වැසූ ශරීර ඇති පරිබ්‍රාජකවෙසින් නිශ්චලව සිටියේය. එකල ඒ ගම නොයෙක් ජනයෝ ඔහු දැක, කොල මොහු කව්රු දැයි ඒ ඒ දිගින් දිව අවුදින් ඔහු සිසාරා විස්මයපත්ව සිට තොපි කවරෙක්දැයි විචාළෝය. එකල ආජීවකතෙම කියනුයේ නිති මිනිසුන්සේ ලජ්ජාවී සම්පූර්ණාඩගවසා පිළිනොඳුම්හ; අපිතපස් කරම්හ, ලජ්ජාවෙන් අඩක් පාලනයනරණ හෙයින් අඩිපාලක නම් රහතුම්හයි කීය, එකල ඒ ග්‍රාමවාසි මුග්ධ මනුෂ්‍යයෝ සිතන්නාහු මොහු වනාහි මහා බලසම්පන්න තෙනෙක ලජ්ජ පමණකුදු නැති ඇහ; සෙසු තාපසයෝ වූකලී මොහුමෙන් තාපස ශීලයෙන් යුක්ත නොවන්නාහයි සිතා පැහැද රහතුන් වදුම්හයි කියා වඳිති පුදති සත්කාරකෙරෙති; එකල ඒ ගම වැදිනායකතෙම මොහුකෙරේ පැහැද උපස්ථාන කෙරෙයි; එදනව්වෙහි නලඝහිතවූ මක්ඛිකාජාතියක් බෙහෙවින් මිනිසුන් ඇඟවිද ලේ උරාබීමෙන් පුවක් පත්කඩක්සේ මරා හෙලා පියති; එසේහෙයින් ඒදනව්වැසියෝ එමැසිකැලෙන් බොහෝවූසමයෙහි මහසැලවල් ගුහාසේ නිමවා එහි වසන්නාහුය; එසේහෙයින් අඩිපාලක නමින් ප්‍රකටවූ ඒ ආජීවකයාහට එවැනිමැසිකැලෙන් ගෙන් පැමිණෙන උපද්‍රව වලකනු පිණිස වල ගෙයක් ගොඩ නඟා ඒ ගෙයි මහත්වූ සැලක් නිමවා ඒ සැලෙහි ඔහු බස්වා ආශ්වාස ප්‍රශ්වාස කිරීම් පිණිස පමණක් ඉඩතබා පිධානයකින් වසා දවසින් දවස දන්දෙයි; එකල ඒ වැදිනායකයාගේ "ජාවී" නම් දුවක් ඇත; මේ තෙමේ දවසක් ඈ දැක ඈ කෙරෙහි පිළිබඳ සිත්ඇතිවීමෙන් නොකා නොබී කීප දවසක් නිරාහාරයෙන් හුන්නේය; එකල ඒ වැදිතෙම යම්කිසි කරුණක් අරබයා පිටත ගොස් සිට නැවත ගෙට ආකාල අපගේරහතුන්වහන්සේ කුමක් කොට හුන්සේක්දැයි විචාරා අඹුව හා දුව ඔහු නොකා නොබී හිඳිනා නියාව දැන්වූකල වැදිතෙම කම්පිතවූ සිත් ඇතිව ඔහුකරා වහවහා දිවගොස් වැඳ, සවාමීනි ඔබට කුමන ව්‍යාධියක් වැළඳගත්තේද? මෙතෙක් දින කුමක්නිසා නිරාහාරයෙන්

සිටිසේක්ද? දැන් බොහෝසේ වැහැරගියේ නො වේ දැ සි විචාළේය; එබසට ආජීවකතෙම කියනුයේ, මවනම් අන්කිසි ව්‍යාධියක් නොමැත්තේය; බොහෝ කලක් තපස්කොට ශරීරය විඛාව ගියෙමි; එබැවින් එහා දවස් තපස්කොටගත නොහෙමි; තොපගේ "ජාණී" නම් දුව මට පාවාදෙවුනම් නොපකෙරේම වෙසෙමි; එසේනොකලේ නම් මහුමා රැකෙනියි නොසිතවයි කීය; එවේලෙහි වැදි නායකා තෙම කියනුයේ, "තපස්කිරීමනම් පළිබොධ නැත්තේය; ගිහිගෙයි වාසයනම් බොහෝ සම්පත් උපදවා පළිබොධ කවයුතුය; එකම ශාස්තෘයකුදු දැන මිස ගිහිගෙයි වාසය නම් බැරිය; එබැවින් නුඹ දන්නා ශාස්තෘ කිම්ද"යි විචාළේය; එවිට ආජීවකතෙම කියනුයේ-"මා දන්නා ශාස්තෘයක් නම් නැත්තේය; තොප පස්සේ දැල්නත් ආදිය ඇදගෙණගෙමි, සතුන් මැරුකළ මස්කත් ගෙණයෙමි; එබැවින් මෙතෙක් ශාස්තෘ ප්‍රමාණදැ"යි කීය; එකල වැදිපුත්තෙම සිතනුයේ මම දැන් රහත්කෙනෙකැයි සිතා සිටි මු වනාහී මහා මුග්ධයෙක; මා දුව නොලැබුනම් මියන බවත් සබැවිය හැක්කේය; මූගේ මියයාමෙන් අපිව කවර ප්‍රයෝජනද? මට මෙහෙකෙරේනම් හේද එක් ප්‍රයෝජනයෙක්වනැයි සිතා යහපතැයි ගිවිස ඒ වේලෙහි තමාගේ උත්තරසාධකය බිහවදී පරිබ්‍රාජක වෙස් හරවා වැදිවෙස් ගන්මා තමාගේ ගෙට කැඳවාගෙණ හොස් "ජාවී" නම් තම දුව සරණකරදුනි.

එතැන්පවත් හේතෙම එක්වේලක මසිලනුවන් සිත්ගනිමැයි දැල්නත් මස්කත් අදිසි; එක්වේලක නැන්දනියන් සිත් ගනිමැයි දරම්ටි බටු පලා ආදිය හැරගෙණ දෙයි; එක්වේලක අඹුවන් සිත්ගණිමැයි වී සහල් පැහැදී පැන්කත් ඇදදී නොගෙක් කම්නන්න නෙරෙයි; වෙසේ නොයෙක් මෙහෙකිරීමෙන් නොබෝ දිනකින් හේතෙම ජරූපත්වීය; "ජාවී" අඹු ඔහට දුකොට පුතෙකු වැදූය; එතැන් පවත් ඕතොමෝ පුතුවඩා ගෙණ නළවනකල මොහු ඇසිඇදී "මස් අදිනා කස්කරුගේ පුත නොහඬවයි" යනාදීන් කිය කියා මොහුව නිග්‍රහවනසේ පරුෂ වදනින් බැණ පුතු නළවයි, එකල හේතෙම ලජ්ජාවට පැමිණ කියනුයේ කොළු තී මා තිරුශ්‍රයවූ හුදකලා එකෙකැයි "සිතසිද? අනාකනාථිනා"යයි නම්ලත් ඉතාබලසම්පන්න ගහළු කෙනෙක් මට ඇත්තේය; මට මෙසේ තී බෙණෙයි නම් මම ඔහුකරා පලාගෙමැයි කීය; එකලජාවී නොමෝ සිතන්නී මෝහට මා කියන බස් ප්‍රිය නොවෙත්ල, මොහු දැන් ජරපත් මහල් ලෙක් බැවින් මට කම් නැත, මොහු මෙහි සිටිනකළ යෞවන පුරුෂයෝ මා කරා නොඑළඹෙන්නෝය; මොහුව ඉක්මකළුවූ

රළු වදනින් බැණ මෙතනින් පලවාපියා සික්සේ වෙසෙමැයි එහැන් පවන් දිනෙන් දින පුහු හඬව හඬවා පුත් නලවනාකාර යෙන් "කොල මස්වැද්දහුගේ දරුව නොඛඩා සිටුව; කත් අදනාහුගේ පුත, කොලතොළුගේ පුත, කඩදක්හුගේ පුත, ජර පත්හුගේ පුත, නොඛඩයි යනාදිවශයෙන් නිබඳම නොසරුප් තෙපුල් කියමින් දරුවා නළවන්නීය; එකල හේතෙම සඛකිය භාඇත්‍රීවගේ නිදුබස් ඇසීමෙන් මඛත්ව ලජ්ජාවට පැමිණ අඹුව හා පුතු හැර ගිහිගෙයි විසීමෙහි කළකිරී නැදීමයිලන් වත් නොකියා ඒ දනව්ව හැර පෙර ගිය සලකුණෙන් ගොස් බරණැසට වැද අනනතජිනයෝ කොසිදැයි දුටුදුටුවන්ගෙන් විචාරන්ට වනි; එකල කුවණැනි ඇතම්හු මොහු කියන සලකුණෙන් බුදුන් විචාරණබැව් දැන, එවකට බුදුහු දෙව්රම්වෙහෙර වැඩවසන හෙයින්, කොසොල් රජ්හුගේ මහ සැවැන් නුවර දෙව්රම් වෙහෙරට ගොස් දැනගනුවයි කිවාහුය. එකල බුදුහු ආජීවකයා තමන්වහන්සේ කරා එන නියාව දැන "මහණෙනි අනනතජිනයෝ කොසිදැයි විචාළ කෙනෙක් ඇත්නම් මා කරා ගෙණෙව" යි වදාළසේක. එසමයෙහි ආජීවකතෙමේ දෙව්රම් වෙහෙර දෙරටුවට ගොස් සිට අනනතජිනයෝ තම්වූ මාගේ රූපත් යාළුවෝ කොසිදැයි ඇසීය; එවිට පෙර බුදුන් අතින් නියොග ලත් භික්ෂූන්වහන්සේ කැඳවාගෙණ ගොස් බුදුන්ට දැක්වීය; හේතෙම බුදුන් දැන සම්කාලයෙක්හි අමාවිලක ගැලෙන්නක්හුසේ මඛත් සතුටට පත්ව "අනනතජිනයෙනි! මා හඳුනාදදැයි" යි පිළිවිසීය; එවේලෙහි සවාම්දරුවෝ ඔහුකෙරේ උපන් මහා සාරුණා ඇතිව "එසේය උපාසකයෙනි, තොප හඳුනම්හ; එදවස් බෝමැඩ ඉඤිපතනඝට යන්නාහු අතරමඟදී තොප දුටුවමෝ නොවේද? මෙතෙක් දවස් තොපි කොයි විසූදැ" යි වදාළසේක; එකල හේතෙම තමන් ඔඛකභාර තම් දනව් වෙහි විසූ නියාවත් ජාවී නම් භාඇත්‍රීව රක්ෂාකොට භදදඛා නම් පුතෙකු ලද නියාවත්, ඇගේ අවශූවෙන් ගිහිගෙයි වාසයෙහි කළකිරී බුදුහු දක්නා පිණිස දෙව්රම්වෙහෙරට තමා පැමිණි බවත් බුදුන්ට දැන්වීය. මෙසේ සියලු තොරතුරු දන්වා තද නනතරව කියනුයේ, සවාම්වූ අනනතජිනයෙනි! මාත් ඔබ සෙරේ මහණකරවා වදාළමැනව, මම්ත් ඔබතුමාගේ ශාසන යෙහි මනාකොට මහණදම් පුරම්" යි කීය. එවේලෙහි බුදුහු ඔහු මහණභාරවා උපසම්පදාශීලය දී ඔහට තරම්වූ කමටහන් උගන්වා වදාළසේක. එකල ඒ මහණතෙම නොබෝකලකින් විදර්ශනා වඩා අනාගාමී ඵලයට පැමිණ උපඛ නම් මහතෙරව බුදුසසුන් බොබවා බුදුන්ට සම්‍යක්ප්‍රතිපත්තින් පූජාකොට ආයු කෙළවර දහසක් කපට ආයු ඇති අවිහ නම් ශුඛාවාස බ්‍රහ්ම ලොකයෙහි උපන්සේක; මෙසේ උපකාජීවඛායන්ගේ පිළිවෙළ කථාව දතයුතුයි.

පඤ්චවර්ගීය භික්ෂූන්හට වැඩීම.

දෙවෙනිදෙවවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ ඉසිපතනාරාමයට වඩනා බැව් දුටු පස්වග භික්ෂූහු ශ්‍රමණ භවද්දී ගෞතමයෝ දුෂ්කරක්‍රියා හැර තමන් ඉසුරුමත් රජකුලයෙහි උපන් බැවින් සුඛිතයන් විසින් දෙනලද රසමසවුලෙන් යුක්තවූ මධුරාහාර වළඳා ශරීර වර්ණලදින් පහන්වූ ඉදුරන්ඇතිව රත්කදක්සේ ප්‍රභාසම්පන්නව බුදුවියනොගී දැන් අපහරුවෙහි; ඔහු රජකුලයෙහි උපන්හෙයින් හිඳිනා අසුන් පමණක් දෙන බව මුත් වන්දනමානනාදියක් නොකරම්හ; පෙරගමන් නොකරම්හයි අස්නක් පණවා, තුමූහු කතිකාකොටගෙණ සිටියානුය. එකල සම්මාසම්බුදුරජාණන්වහන්සේ සියලු ලෝකයාගේ සකලාඛ්‍යාශය දක්නාවූ බුඛඥාන නමැති කැඩපතින් බලාවදාරණසේක්, ඒ පස්වග භික්ෂූන්ගේ අදහස් දැන, අනන්තාපරිමාණවූ සත්ත්වලෝකයෙහි පැහිර පවත්නා මෛත්‍රී නමැති ජලප්‍රවාහයෙ ඒ පස්වග මහණුන් කරා මෙහෙයාලූසේක. එකල්හි සැඩවතුරෙන් ඉපිලෙන පරඛලාපත්සේ බුඛ තෙජානුභාවයෙන් තමන්ගේ කතිකායෙහි පිහිටා සිටිනට අසමර්ථව හුනස්නෙහි හිඳගත නොහී සම්මාසම්බුදුරජාණන්වහන්සේ කෙරෙහි මහත් ගෞරවයක් ඔවුන් ලෙහි ඉපිද ඒ පස්වග භික්ෂූන් අතුරෙන් කෙනෙක් පෙරගමන් කොට පාඹිවුරු පිළිගත්තේය, එක් කෙනෙක් ආසනයක් සකසා තැබීය, එක්කෙනෙක් පා දෝනා ජලය හා පාපුටුවද, තවත් කෙනෙක් පා දෝනා පුවරුවද ගෙණ ගොස් ලහ තැබුවාහුය; මෙසේ ඔව්හු සියලු ආගතානුක වතාවත් කොට සාධු සාමීචිකථා කරන්නාහු බුදුවූබැව් නොදැන සමසම යන්සේ නම් කියකියා ආවුසො * වාදයෙන් කථාකරන්ටවන්හ; එකල භාග්‍යවතුන්වහන්සේ, "මා භික්ඛවෙ තථාගතං නාමෙන ච ආවුසො වාදෙනච සමුදාචරථ අරහං භික්ඛවෙ තථාගතො සම්මා සම්බුඩ්ඩො" යනුවෙන් "මහණෙනි, මව නම්ගුත් "ආවුසො" වාදයෙනුත් ව්‍යවහාර නොකරව්; මම වනාහි තථාගතයෙමි, සම්බුදුවෙමි" සි වදාළසේක; එබස්ඇසූ පස්වග මහණහු බුඛ තෙජසින් වෙවුලා කෙසරසිංහරාජයන්හු දුටු ඇත්පොව් වන්සේ මුවෙන් නොබැණ තූෂ්ණීම්භාවයෙන් වැඩඋන්හ. එකල පූර්වයෙහි අනන්තාපරිමාණවූ බුදුවරයන් දහම්සක් පවත්වනදා වැඩහිඳිනාවූ සඛර්මභූමියෙහි පැහැනැගී බුඛාඝාතයක් විය; මහ මුහුදු රළපෙළ වැඩ අදුරු විදහා උදයගිරි ශිඛරාග්‍රයෙන් පැහැනැංගාවූ සහස්‍රරශ්මීන් විරාජිත සූර්‍යදිව්‍යරාජයාසේ සම්මාසම්බුදුරජාණන්වහන්සේ යථොක්ත බුඛාඝාතයට පැහැනැගිකල්හි සියලහින්

* "ආවුසො" යන වචනය සිංහලභාෂාවේ "ඕයි" යන වචනයට සම්පවූ ඇවැත්නි යන අර්ථයෙහි වචනයක්වේ.

පඤ්ච වර්ගීය තාපස පිරිවරින් වැඩ සිටින
බුදුරජාණන් වහන්සේ.

Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

බුඩරශ්මිමාලා විහිදෙන්ට පටන්ගත්තේය; එතකණෙහි රාත්‍රි නමැති අඹුනාතොමෝ තරුපෙළ නමැති මුතුදම් ගෙලපැළඳ නීලාකාශ නමැති කෙස්වැටිය පිටමැද විදහා දිශානමැති කඳුන වයෙන් සඳරැස් නමැති දිවසළුඇඳ බඹලොව නමැති ඔවුනු දරා තුන්ලෝ නමැති ඇඟ සොලවා මනෝමූදු නමැති ඇස් දල්වා භෘඞ්ගනාද නමැති ගායනා පතුරුවා අප සම්බුදුරජාණන්වහන්සේගේ පළමුවන මඞ්ගල්‍ය ධර්ම්ම සූජාවට මෙසේ ලීලාපෙතව සැරසී සිටගත; එතකණෙහිම ඇට අලංකාර පිණිස රුවන් තෝඩු දෙකක් තැබුවාසේ සූර්‍යදිව්‍යරාජතෙම පශ්චිම චක්‍රවාට කඳුමුදුන සරහා සිටගත; පූර්‍වචක්‍රවාට කඳුමුදුන සරහා සිටි චන්ද්‍රදිව්‍යරාජතෙම ප්‍රභා විහිදුවමින් සිටගත. එකල සම්බුදුරජාණන්වහන්සේගේ ධර්ම්ම දෙසනාකාලය සම්ප්‍රාප්තවිය. සත් කුලපවිවෝ බුදුන් කෙරෙහි ගෞරව කරන්නාහුසේ ශතසහස්‍රවාරයක් ප්‍රාර්‍ථනාවූහ; මහා පෘථිවීතොමෝද කම්පාවූවාය; මේසේ ඇසළ මස පුණු පෝහොදිනයෙහි උතුරුසළ නකතින් දෙතිස් මහා පුරිසනිමිති පහළ වෙමින් සිටියදී හැම බුදුවරයන්ගේ චරිත්‍රධර්ම්මයක්වූ මඞ්ගල ධර්ම්දෙසනාව පිණිස වැඩහුන්කල්හි දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයෝ "අපගේ සවාමිවූ බුදුරජාණන්වහන්සේ අද අපහැම දහම් අමාවතුරෙහි ගල්වා සංසාරදුක් නමැති මහ ගිම් නිවසි; එබැවින් උන්වහන්සේනේ දහම් අමාරස පානය පිණිස අපි සියල්ලෝම යම්හ"යි කතිකාකොටගෙණ දිවමල්ගත් අත් ඇතිව දිව අවුත් සක්වළගල පර්‍යන්තව අහසිටා බඹලොව දක්වා ඉතා සියුම් වෙස්මවාගෙණ අවකාශනැතිව සිටගත්හ. එකල බුදුහු වැඩඋන් බුබ්ඝනායෙහි පවන් බ්‍රහ්මාණ්ඩය දක්වා බුදුන්ගේ සිරසින් පැනනැගි බුදුරැස් කදවම අවකාශවිය; දෙවි ම්මතෙක් වේවයි දෙවි බඹ කෙනෙක්වේවයි එදා බුදුරජාණන්ගේ සිරසින් නැගි බුදුරැස්කදෙහි ස්පර්‍ශවූහ. ඉක්බිත්තෙන් බුදුන් සිරසට පිදූ සඳමඬුලුසේ දසදහසක් ශක්‍රයෝද බුදුන්ගේ යසරැස් උරාබොන්නවුන්සේ දසදහසක් ජයසක් තුඩතුඩ තබාගෙණ එකවිටම පිඹින්ට පටන්ගත්හ; දසදහසක් සුශාම්දෙවියෝ දහදහසක් චාමර සලන්ට වන්හ; සෙසු දෙවියෝ අනෙක දිව්‍යපූජා භාණ්ඩගෙණ පූජාකරන්ට පටන්ගත්හ; එකල දෙවියන්ගේ පූජා කොලාහලයෙන් බ්‍රහ්මාණ්ඩය දක්වා වැදහත් මුහුදු ගිගුම්සේ එකතින් නාදවිය; එකල බුදුන්ගේ හාත්පස සිටි දසදහසක් ශක්‍රයෝ තමන්ගේ කලමනා ධුරය කෙසින් දසදහසක් දකුණුසක් පිටවතුරුවාගෙණ විසිදහසක් අත් ඔසවා එකවිට අත්පොල සන්දී "අහෝ! අහෝ! බණපිරිස සත්සිදෙව"යි කියා මහත්වූ සොඟාවක් කලහ; එවේලෙහි ඒ ශක්‍රසොඟාව ඇසූ සියලු දෙව් බඹපිරිසද රැළනැති මුහුදසේ නිසසබදවිය; එවිට මේ මහා පෘථිවී තොමෝද අනෙකවාරයක් රුවප්‍රතිරූව දෙමින් සාධුකාරදුන,

දම්සක් පැවැත්වීම.

ඉක්බිති නමන්වහන්සේගේ බුඩඳුන නමැති සූර්‍යරශ්මි යෙන් ප්‍රබෝධවූ සුරකතාවූ ජිහ්වාධාතු නමැති කෙම් ඇති දන්න ධාතූන් නමැති තෙශරපඩිකාසිඇති මනහරවූ අධරයුගම නමැති පෙති ඇති සඩම්ම නමැති මධු ඇති ත්‍රිමක්වූ මුඛපදමය විවෘත කොට බැණනැගිඩසින් සියලු බණ පිරිස දිවසුවඳ පිඩක්සේ කර වමින් "මෙමේ භික්ඛවෙ අනනා පඩිබ්‍රහ්මචරියවාසා යොවාසං ඛාමෙසු කාමේසු සුවලල්ලිකානුයොගෝ හීනෝ ගම්මෝ පොථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ නොවාසං අත්තකිලමනානුයෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථසංහිතෝ" එතෙහි භික්ඛවෙ උභෝ අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුඩා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති" යනාදීන් මහ ණෙනි, ලාමකවූ හෙවත් නීවනඩ මෙහෙයන්නලද සිත් තැත්කාවූ සසරෙහි කරණ ඇලුම් ඇත්තාවූ නීවයන්ට සිදුසුහෙයින් නීවවූ, ග්‍රාම්‍යවූ හෙවත් පඤ්චසථාකයනින් ලඟවූවෙහි ඇලීයිය වදු රෙකු සෙයින් නීවන් සැපයෙහි අනාලයව පස්කම් සැපයෙහි ලොභකළ ගිහිගෙයි වැස්සන්ගේම සඩභාව ධම්මයක්වූ අඩබාල පෘථග්ජනයන් විසින් පුරුදුකරණලද හෙවත් දුගීඩාශුචි පූති මාංසාදියෙහි හැසිරෙන්නාවූ නිලමැසි ආදීන් සෙයින් සඤ්ච කාමයෙහි ලොභිවූ මොහයෙන් මූලාවූ බාල ජනයන් විසින් සෙවනය කරණලද්දුවූ අනාය්‍යවූ හෙවත් බුඩ ප්‍රත්‍යෙකබුඩ අග්‍ර ශ්‍රාවක මහාශ්‍රාවකාදී ආය්‍යයන් විසින් ආසීර්විෂයක්සේ නිතැ කොට හරණලද බැවින්ද අඳුන ජනයන් විසින් රූපයෙහි ආශා වෙන් හින්නෙහි වැදෙන පළඟැටියන්සේද ශබ්දයෙන් හෙවත් මිණි පන්දමෙන් මෘගයන්සේද සුඝඩයෙහි ආශාවෙන් ඇතුන්ගේ කණවැද නස්නා ඝෘඩගයන්සේද රසයෙහි ආශාවෙන් මනා හොදුරුසි සිතා බිලියෙහි ඇමිනී නස්නා මත්ස්‍යයන්සේද සපශී යෙහි ආශාවෙන් වනයෙහිනොසිව ඇතින්නකෙරෙහි බැඳී ගම්ට අවුත් මිනිසුන් කෙරෙන් අනෙක වදබඩනයව පැමිණෙන හස්තීන්මෙන්ද, ස්ත්‍රීබාවට සුදුසු වසතුවකැයිසිතා දිලිසෙන අඟුරු අල්ලා නස්නා ලදරුවන් සෙයින්ද වණිණයෙන් හා ගඩයෙනුත් අඹවැනිවූ "කිම්පකක" නම් විෂ ඵල අනුභවකොට නස්නා සත්ව යන් සෙයින්ද, එබදු අඳුන ජනයන් විසින් සෙවනය භජනය පරිභුඤ්ජනය කරණලද බැවිනුත් උතුම් නොවන්නාවූ බුබාදි මනොකතමයන්ට සෙයින් හික සැප ඵලවන ලොකොත්තර සැප තින් පිරිහුනු හෙයින් හික සැප ඵලවන කාරණය ආශ්‍රය නොක ළාවූ හෙවත් අවැඩඹආශ්‍රයකළාවූ වසතුකාමයෙහි යම් මේ කෙලස කාමසැපයාගේ යෙදීමක් ඇද්ද හෙද දුකඩඹවූ කාරණයවූ දුක්

එලවන්නාවූ අනර්ථ මිශ්‍රවූ යම් මේ ආත්මභාවයෙහි යෙදීමක් ඇද්ද, මේ දෙකාරණය වනාහි ගෘහස්ථබන්ධනය සිඳපියා ප්‍රව්‍රජිත භාවයට එළඹියාවූ තොප විසින් සෙවනය නොකටයුත්තාහ; යනාදී වශයෙන් දම්සක් පැවතුම් සූත්‍රය පස්වග මහතුන්හට දෙසනාකරවදාලේය. මෙසේ මේ දම්සක්පැවතුම් සූත්‍රය දෙසනා කරණ කල්හි පූර්වක්‍රාවාටයෙහි සිටි දෙවියෝ බුදුහු අප මුහුණ බලාහිඳ දහම් දෙසතියි සිතති; දක්ෂිණ වක්‍රවාටයෙහි සිටි දෙවියෝද බුදුහු දකුණුදෙස බලාම වැඩහුන්සේකැයි සිතති; පශ්චිම චක්‍රවාටයෙහි සිටි දෙවියෝද පශ්චිමදික් බලාම වැඩහිඳිනාසේ කැයි සිතති; උත්තර චක්‍ර වාටයෙහි සිටි දෙවියෝද බුදුහු උතුරු දෙස බලාම වැඩහුන්සේකැයි සිතති; මේ ආදී වශයෙන් සියලු දීක්ෂාගයන්හිම වසන දෙව බ්‍රහ්මාදීහු තමතමන් දිශාවට මුහුණ ලා බුදුහු දහම් දෙසත්යයි සිතා පිණපිණාම ධර්ම්ශ්‍රවනය කරති; බුදුහු තම් චන්ද්‍රමණ්ඩලයට බදු උපමා ඇත්තාහ; යම්සේ නහෝ මධ්‍යයෙහි බබලන්නාවූ චන්ද්‍රමණ්ඩලය බැලු බැලු සත්වයන් අභිමුඛයට පෙණේද, ඉවත්ව නොපෙණේද, එමෙන් සර්ව්ඥයන් වහන්සේද සකල සත්වයන් කෙරෙහි සමව පවත්නාවූ මහා කරුණා ඇති හෙයින් සියලු සතුන් අභිමුඛයට පෙණී පෙණී සියලු සත්වයන්ගේ සිත් තමන්වහන්සේ කෙරෙහි ආකර්ෂණය කොටගෙණ සියලු සතුන්ගේ ප්‍රේම නමැති ගඞ්ගාවන් තමන් වහන්සේගේ රූප නමැති මහා සමුද්‍රය කරා ගලාබස්වම්න් පෙම් වඩව වඩවා ධර්ම්දෙශනා කරණසේක.

එකෙණෙහිම පස්වග මහතුන් කෙරෙහි වැඩිමහළුවූ ඤාණඩඤ්ඤ නම් ස්ථවිරයන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් මාර්ගඵලට පැමිණිසේක; මෙසේ දම්සක් පවත්වා දෙව බ්‍රහ්මාදීන්ට සමුදීයවා, එමද රෑ තාරකාවන් විසින් පිරිවරණලද පූර්ණචන්ද්‍රයාසේ ඒ පස්වග මහණුන් පිරිවරකොට එම ඍෂිපතනයෙහි පළමුවන වස්වසා දෙවනදා උදය සතරදෙනා වහන්සේ සිඟාගැනීමේ වැඩදැජී ස්ථවිරයන් වහන්සේට බණවදාළ සෝවාන්කොට තුන්වෙනිදා උදැසන ඔබ ඇතුළුවූ අනික් සතර දෙනාවහන්සේ සිඟායවා වප්පනම් මහතෙරුන්වහන්සේට බණවදාරා සෝවාන්කොට සතරවෙනිදා උදැසන ඔබ ඇතුළුවූ සතර දෙනා වහන්සේ සිඟායවා මහානාමතම් තෙරුන්වහන්සේට බණවදාරා සෝවාන්කොට පස්වෙනිදා උදැසන ඔබ ඇතුළුවූ සතර දෙනා වහන්සේ සිඟායවා අස්සජි නම් මහතෙරුන්වහන්සේට බණවදාරා සෝවාන් මාර්ගඵලට පමුණුවාලූසේක; ඉක්බිති සවෙනිදා උදැසන පස්දෙනා වහන්සේව කථාකොට "මහණෙනි, මේ රූපය වනාහි ආත්මයක් නොවන්නේය, තමන්ට අයිතිද නොවන්නේය, මේය තමා සතු දෙයක් නම් තමන් නොසතුටුවූ

නොයෙකුත් ව්‍යාධි හා සිදුම් බිඳුම් ආදියෙන් වන්නාවූ ශරීරපීඩාද නොපැමිණෙන්නාහ; මෙය තමන් අයත් නොවන නිසා මේ රූපය සම්බන්ධව තමතමන්ගේ අභිප්‍රායානුකූලව යමක් සිදුකළ නොහැකිවන්නේය"යි මේ ආදී වශයෙන් වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන සතරෙහි අනිත්‍යාදි සභාවද දෙශනා කර වදාරණසේක්; "මහණෙනි, නොයෙක් පිළිකුලම භාජනව සිටිනා මේ ශරීරය නිසා පවත්නා සිතමුත් ආත්මයක් එහි නොමැත්තේය; එබැවින් මේ ශරීරයත් සිතත් ඇසිව නැතිවන හෙයින් අනිත්‍යය, නොයෙක් දුකට හෙතුවන බැවින් දුකය, තමා කැමතිසේ නොපවත්නා බැවින් අනාත්මය; යමක් අනිත්‍ය නම් විපරිණාමසභාවයන් එය මමය මාගේය මාගේ ආත්ම යයි සලකන්නට නුසුදුසුය" මෙසේ මේ පඤ්චස්කන්ධය සම්බන්ධව අනිත්‍යය, දුකය, අනාත්මය යනාදීන් දෙශනාකළ කෙනෙහිම පස්දෙනාවහන්සේම රහත්වූසේක; එතැන් පටන් පඤ්චවර්ගීය ශ්‍රාවකයන්ගෙන් ශොභනවූ කල්පවෘක්ෂයක්කෙට පස්මහරහතුන් සමඟ එම වෙහෙර වාසඅකරන්ට වන්සේක.

අඤ්ඤාසිකොණ්ඩඤ්ඤ පුවත්ම කථාව.

තවද කොණ්ඩඤ්ඤ නම් මහ තෙරුන් වහන්සේ කොබදුවූ පිණක්කොට, මෙබදුවූ බුදුරජානෙකුන්ගේ සිඟලු මහ සව්වන්ට පළමු උතුම්වූ නිර්වාණ රසාස්වාදනය කළසේක්දයත්? විපස්සි නම් බුදුන් සමයෙහි බන්ධුමතීනම් නුවර උශභාලනම් සිටුව හැල් කුඹුරු කිරි බඩතලවා සහල්ගෙණ එයින් පැන්කුමුසු කිරිබත්පිසවා බුදුපාමොක් මහසඟපිරිස් වළඳවා, මෙසේ ඒ කෙත ගොයම්න්ම නවවාරයක් අග්‍ර ඵලයදී, "මතු බුදුකෙනෙකුන්ගේ සස්නෙහි මමද පළමුවන ධම්මචක්‍රය ශ්‍රවණයකොට නිවන්රස ලද්දවුන් කෙරෙහි අග්‍රවෙම්ව"යි කරණලද ප්‍රාර්ථනා හෙතුවෙන්, ඊට පසු එකවාරයකුදු සතර අපායෙහි නොඉපිද අන්තයෙහි උතුම්වූ ධම්මචක්‍රය ශ්‍රවණයකොට පළමුව අමාමහ නිවන් දුටුසේකැයි දතයුතුයි; මුන්වහන්සේ පළමුකොට අග්‍රඵලඥාන දත්හෙයින් "අඤ්ඤාසි වතභො කොණ්ඩඤ්ඤ" යි බුදුන් විසින් කළ උදාන වාක්‍යය නිමිත්තකොට ශෙෂ එතැන් පටන් * "අඤ්ඤා කොණ්ඩඤ්ඤ" යයි ප්‍රසිද්ධවිය.

---

* "ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤත්වෙව නාමං අහොසි."

යස නම් කුලපුත්‍රයාගේ ප්‍රව්‍රජ්‍යාව.

තවද සම්මැදයන්වහන්සේ ඉසිපතනාරාමයෙහි වස් එළඹ වැඩවසනකල බරණැස්නුවර සුජාතා නම් සිටුදුවගේ පුත්‍රවූ යස නම් කුලපුත්‍රතෙම මහත් ධන සමපත්තියෙන් යුක්තවූයේ හෙමන්ත ගිම්හාන වස්සාන යන තුන්ඍතුවට යොග්‍යව කරණ ලද ප්‍රාසාදත්‍රයෙහි දෙවනාඩහනාවන් පිරිවරා උවුමාලින් යටි මාලව නොබැස අතිශයින් කාමභොගීව වසනුයේ, එක් දිනක් රැ ගීරාගුම් අසමින් බලමින්ම හෙව නිදනුයේ පිබිද තමතමන් ගත් පසඟතුරුයෙහිවැතිරහෙව නිද්‍රාවවපෑමිණි තළඟනන්ගේ විකාර දැක මහත් පිළිකුලක් සඟ අනිත්‍යලක්ෂණද උපදවා සසර කළකිරීමෙන් උපන් සංවේග ඇතිව හොත් යහනින් නැගී රන් මිරිවැඩිසඟල පයින් හෙණ ප්‍රාසාදයෙන් බැස නුවරින් නික්ම හොස් බුදුන් වසනා ඉසිපතනාරාමය සමීපයෙන් යෙහි, එවේ ලෙහි භාග්‍යවතුන්වහන්සේ අලුයම්හි විහාරයෙන් නික්ම අභ්‍යව කාශයෙහි දිලිසෙන පහන්රුකක් සෙයින් සක්මන්කරන්නාහු, යන්නාවූ ඔහුගේ හෙතුසම්පත් දැක, කතර හොස් ආපසු එන පුතෙකු පෙරමගට දිවන මවෙකුසේ, ඔහු පෙරමගට මහත්වූ කරුණාවෙන් වැඩ අදුරට දීපතිමත්වූ පහනක් නඟා පැවාසේ බුදුරැස්කඳක් ඔහුකරා හැර මාගීය ආලොකකොට "මොබ එව යස" යයි වදාළසේක; ඒ සිටුපුත් බුදුන්ගේ ශබ්දය අසා අරුණු වේලෙහි බුදුන්දිහාව බලා සිහරැසින් දිලිසෙන හිරුමඬලක්සේ බුබරශ්මියෙන් දිලිසෙන බුදුහු දැක පිපාසිතයක්හු දුටු ආකාශ ගඩහාවක්සේද; දුහියෙකුවිසින් දක්නාලද මහනිධානයක්සේද, හස්තියෙකු විසින් දක්නාලද මහ පියුම්විලක්සේද, සූර්‍යරශ්මි සපහීය ලද මහා පද්මයක් සෙයින්ද, සිටුපුත්‍රතෙම ඉතා සතුටුව පස්වණක් ප්‍රීතියෙන් පිණා දෙනකුකරා දිවන වසුපැටවකු සෙයින් බුදුහුකරා දිව් පසඟ පිහිටුවා වැඳ එකත්පසෙක හිඳ බුදුන්හෙන් බණ අසා සෝවාන්විය. ඉක්බිත්තෙන් දේවතා උදෑසන යස නම් කුලපුත්‍රයාගේ මව්වූ සුජාතානම් සුටුදුකොමෝ තම පුතනුවන් මතුමහල්ප්‍රාසාදයේ නොදැක මහත්වූ සොවගින් හඬා වැලප, ඒබැව් යසකුලපුත්‍රයාගේ පියවූ බරණැස සිටානන්ට දැන්විය. එපවත් ඇසූ පියතෙමේ මහත් හොතයෙන් හඬ හඬා පුත්‍රයා රැ පලාහියේවනැසි සිතා සතරදිහාවන්හිම දූත යන් යවා තමාද බරණැස ඉසිපතනාරාමයට ගියේය; භාග්‍ය වතුන්වහන්සේ දුරින්ම එන සිටානන් දැක යස නම් කුලපුත්‍රයා ඔහුට නොපෙණෙනසේ අධිෂ්ඨාන කෙළේය. සිටානෝද එහි පැමිණිවිව තම පුතනුවන්ගේ වහන්සඟල බිම හිබෙනු දැක පුතනුවන්කෙරෙහි හොකයෙන් හඬමින්, "මාගේ යස නම් කුලපුත්‍රයා කොහිදැ" යි සම්මැදයන්වහන්සේගෙන් විවාළේය;

එකල සම්මැදයන්වහන්සේ "තොපගේ පුතනුවූ යස නම් කුල පුත්‍රයා මේ සථානයේදීම දැක්කහැකිවේ, එබැවින් මෙහි හිඳහණුව" යි වදළසේක. සිටුතෙමේද බුඬාඳු පරිද්දෙන් හිඳහත්කල සම්මැදයන්වහන්සේ ඔහුට දැනගිලාදිය සම්බන්ධවූ ධම්දෙශනාව පවත්හත්කල ඒ ධම්දෙශනාවසානයෙහි යස නම් කුලපුත්‍ර තෙම රහත්බවට පැමිණියේය; ඔහු පිත් බරණැස සිටුද පැහැදී බුඬ ධම් සංඝ යන ත්‍රිවිධරතනයෙහි සරණගෙණ උපාසකවිය.*

ඉක්බිති සම්මැදයන්වහන්සේ රහත්භාවයට පැමිණි යස නම් කුලපුත්‍රයා තම පියවූ බරණැස සිටානන්ව අපණෙනසේ අධිෂ්ඨාන කළසේක; එවිට සිටුතෙමේ ලඟම හුන් තම පුත්‍රයා දැක මහත් සොම්නසට පැමිණ ආපසු ගෘහයට යනලෙස කැඳවීය; එකල සම්මැදයන්වහන්සේ යස නම් කුලපුත්‍රයා කෙලෙසුන් කැසූ කෙනෙක් බැවින් ගිහිගෙයි වාසය සුදුසු නොවනබැව් වදළ කල සිටුතෙමේ සම්මැදයන්වහන්සේට දුවල් දනව ආරාධනා කොට නික්මගියේය; ඉක්බිති සම්මැදයන්වහන්සේ යසනම් කුල පුත්‍රයා එහිහිකබුහාවයෙන් පැවිදිකරවාලූසේක, එවිට ලොකයෙහි රහතුන් සත්නමක් ඇතිවූහ.

නවද සම්මැදයන්වහන්සේ බරණැස සිටානන්ගේ ආරාධනා පරිද්දෙන් එහිහිකබුහාවයෙන් පැවිදිවූ යස සථවිරයන් කැටුව සිටානන්ගේ ගෘහයට වැඩ දන් වළඳ අනතයෙහි ඔවුන්ව ධම් දෙශනා කළසේක; ධම්දෙශනාවසානයෙහි යස සථවිරයන්ගේ මෑනියන් හා භාය්‍යාවද ධම්යෙහි පැහැද තිසරණයෙහි පිහිටා උපාසිකාවූහ. †

ඉක්බිති යස සථවිරයන්ගේ මිත්‍රවූ විමලය, සුබාහුය, පුණ්ණජිය, ගවංපතිය යන සිටුසහරදෙන, තම්මිත්‍රවූ යසනම් කුලපුත්‍රයානන් මහණවූබැව් අසා අප යහළුතෙමේ අප කීවක්කෙරෙයි, ඔහු සිවුරු හරවාගෙණ කෙළියට ගෙණයම්හයි වහසිබස් කියා සුදුපිළිගෙණගොස් සත්හුන්ගුණෙන් සිටි තෙරුන්වහන්සේගේ උපශමය හා බුදුන්ගේ රූපශ්‍රීයද දැකයකොට, අප යහළුවා ගිහිව සිටිනකලවබා දැන් ඔහුගේ මහණවෙස ඉතාහොබනේය; සඳට අනුව ගුරුකරුවේ උත්තමෙකුකෙරේ මහණවීම ඉතා සුදු සුය; අප යහළුවා ලද සිරි අපවත් වීනම් යෙහෙකැයි සිතසිනා

---

* මේ සිටුතෙමේ ලොකයෙහි පළමුවෙන්ම බුදුන් දහම් සඟුන් යන තුන්සරණ ගත් උපාසකයා බැව් දතයුතුයි.

† මේ දෙදෙනා වනාහි සම්බුඬශාසනයෙහි පළමුවෙස් තිසරණගතවූ උපාසිකාවන් බැව් දතයුතුයි.

බුදුන්වැඳ එකන්පස්ව සිටියාහ; බුදුහු ඔවුන්ගේ චරිතය දැන බණ විදරා පහදවා එහි භික්ෂුභාවයෙන් මහණකරවා රහත් බවට පැමිණවූසේක. ඉක්බිති යසඇථවිරයන්ගේ අවසෙස මිත්‍රයන් පණසක්ද යසකුලපුත්‍රයා පැවිදිවීයයි අසා ඔහු දැකීමට ගියාහුය; ඔවුන්ටද පළමුකී ආකාරයෙන් භාග්‍යවතුන්වහන්සේ බණවදරා එහි භික්ෂුභාවයෙන්ම පැවිදි උපසම්පදා කරවා රහත් ඵලයට පැමිණවූසේක.

මෙසේ ලොකයෙහි බුදුන් අතුළුව එක්සැවක් මහරහතන් ඇතිවූකල්හි, බුදුහු වප්මස මැදිපොහෝදා වස්පවාරණකොට සැට මහරහතුන්ට ආමන්ත්‍රණයකොට ලඟට කැඳවා:-"අනේ කරොතෙහා පඨවී ඉමං බ්‍යාකරන්නා මනුස්සානං ධම්මං වරථ භික්ඛවොා"යි යනාදීන් 'මහණෙනි, මේ ලොකයෙහි සත්වයෝ බුඩරතනය ලොව පහළවියයි නොදනිති, එබැවින් දනව් සැරි සරන්නට එළඹෙව්, නෙපි හැම දෙදෙනෙක් එක් මඟකින් නොයව්, සැමදෙනම වෙන වෙන සැට මාඝීයකින් හොස් ගිය ගිය දෙස දුටු දුටු සත්වයන්ව මා උපන් පරිදි කියා ලොකාමී වරියාව කරව්, සත්වයෙනි, සම්‍යක් නමැති මහ පියුමෙක් නැඟී සදහම් නමැති රොන්සලා දෙමින් සිටියේය; සම්‍යක් නමැති ආකාශයෙහි සඩ්ඪි නමැති ආකාශ ගඩ්ගාව ධාරානිපාතයෙන් වස්වමින් සිටිනීය; සම්‍යක් නමැති මහානිධානයෙක් පෙණී සදහම් නමැති නවරුවන් දිලිසෙමින් සිටිනේය; සම්‍යක් නමැති කප්රුකක් පැණකැඟී සදහම් නමැති මහසැපත් දෙවමින් සිටිනේය; සම්‍යක් නමැති දිවාකරයා කෙලෙස් නමැති ඝනාන්ධකාරය විධ්වංසනයකොට සඩ්ඝ නමැති මහරැස්කද විහිදුවමින් සිටිනේය; යනාදීන් අවවාදකොට සත්වයන් බුඩදර්ශනයෙහි ලොල් වඩවා"යයි වදළසේක.

භද්‍රවර්ගීය රජකුමරුවන් පැවිදිකරවීම.

මෙසේ සම්‍යක්සම්බුදුන්වහන්සේ දනව් සැරිසරණ පිණිස ඒ සැට මහරහතුන් වහන්සේලා සැට මාඝීයකින් යවා, තමන්වහන්සේද එකලාවනික්මුණු අමාඝඩාවක්සේ උරුවෙලා නම් දනව්වට වඩනාහු, අතරමඟ ඛාපසාඝඩ නම් වනයෙහි ඝනවූ අතුපතරින් හා ගහපත් ඡාඳාවකින්ද යුකතවූ එක්තරා වෘක්ෂමූලයෙක්හි සවණක් රැසින් දිලිහි දිලිහී ජම්බුනදියෙහි ජාත සුවණ්ණවඩකුර යක්සේ ලීලොපෙනව වැඩහුන්සේක. එකල මනාවූ රූපශ්‍රීයෙන් හා උතුම්වූ ගුණයෙන්ද යුකතාව සම්වූ සිත් ඇති හෙයිනුත් භද්‍රවර්ගීයයි යන නමින් ප්‍රසිඩවූ රජකුමරුවන් තිස් දෙනෙක් කොසොල්රට විසූවෝය; ඔව්හු කොසොල්රජතු විසින්

ගෙණදුන් දෑවිමෙක සමඟව රජතරන්නාහු, ඔවුනොවුන් මිතු ධර්මයෙන් යුක්තව යන තැනක සියල්ලන්ම සමූහව යන සිරිතක් පැවැත්වූවාහ. එක්දිනක් මෙම කුමරුවන් තිස්දෙන තමතමන් භාර්‍යාවන්ගත් සමඟ කපපාසික නම වනෂ ශරත්කාලයෙහි ඉතා රම්‍යයයි අසා, එහි වනක්‍රීඩාව පිණිස යන්නාහු. ඉන්එක කුමරු මෙකුව බිරින්දක් නැති බැවින් ඒ වෙනුවට වෙඤඤනක් කැඳවා ගෙණගියහ; ඔහොමෝ රජකුමරුවන් ස්ත්‍රීවෙන් ඇවිදිනා කල්හි ඔවුන්ගේ යම්කිසි ප්‍රමාදයක් දැක එහි කුබු සියලු රජා හරණද සහවාගෙණ වල්වැද යියාය. ඉක්බිති රජ කුමරුවෝ ඔබමොබ බලා ආභරණ හා වෙශ්‍යාස්ත්‍රීන් නොදැක, තිස්දෙනම එක්වගෙණ ඇතිය පාසලකුණෙන් වල්සොයා ඇවිදිනාහු වෘක්ෂ මූලයෙහි සවණක් රැසන් දිලිහි දිලිහි වැඩහුන් බුදුහු දැක, වැඳ එනත්පස්ව සිට "මෙහි ආ වෙශ්‍යා දුව දුටුසේක්දැ"යි සම්ඵයන් වහන්සේගෙන් විවාළහුය; බුදුහු "කුමක්නිසා ඒ ගණිකාව සොයවිදැ"සි විවාළසේක; ඔව්හු තමතමන් උයන්පොළි පිණිස ආ නියාවත්, ඇ ආභරණ සොරුගෙණගිය නියාවත් කිවහුය; එකල සම්ඵයන්වහන්සේ "කමා හැණ සෙවීම උතුම්ද ඒ වෙශ්‍යාඛනාව සෙවීම උතුම්දැයි" විවාළසේක; ඔව්හු හෙතු සම්පන්නා ප්‍රඥාවන්නාව සිටිබැවින් බුදුන් විවාළ නියායෙහි අර්‍ථ දැන, ඒ ගණිකාව සෙවීමට වඩා තමාගැණ සොයා ගතහොත් ඒ සෙවීම උතුම්වේදැයි කිහු; එවේලෙහි භාග්‍යවතුන්වහන්සේ "එසේනම් කුමරුවෙනි, නෙපි නොප යොගකු කැමැත්තාහුනම් හිඳගත මැනව"යි වදාරා, ඔවුන් එනත්පසෙක හුන්කල්හි, ඔවුන්ට අනුරූපවූ දානදී කථා සහ ගෘහ වාසය හැර පැවිදිවීමේ ආනිසංසතාව සම්බන්ධව දහම්දෙසා සතරමඟ සතරඵල යෙහි පිහිටුවා එහි නිසැකුනාවයෙන් මහණකොට උපසම්පදා කළසේක.

සහොදර තපසුන් තිදෙන දමනය කිරීම.

සම්ඵයන්වහන්සේ භද්‍රවගීනීය රජකුමරුවන් තිස්දෙන ප්‍රව්‍රජ්‍යෝපසම්පදා කළ ඉක්බිති ඒ නිසැකුන්වහන්සේලාට ආමන්ත්‍රණයකොට මහණෙනි, නෙපි තිස්දෙන තිස්මඟකින් හොස් දුටුදුටු ජනයන්ම, සඤ්ඤෙනි, බුදුරුවන් දඹුරුවන් සඟුරුවන් ලොව පහළවිය, සම්ඵ නාමැති මහාමේඝය පැණනැඟී සදහම් නමැති අමාවැසි වස්වා ඛිනය ජන නමැති මහ හැල්කෙත සතුටුකරව මින් වැඩසිටින්නේය; අපායමාර්ගයට අකුල්හෙළීමෙන් හා නිවන් මඟ හෙළිකරමින්ද වැඩඉඳින්නේය; යනාදීන් බුදුගුණ කියා ලෝවැඩකරවයි වදාරා ඒ තිස්දෙනාවහන්සේ තිස්මඟකින් යැවූසේක; මෙසේ ලොකයෙහි එකානූවක් මහරහතුන් වහන්සේලා ඇතිවූහ.

ඉක්බිති සම්බුදුරජාණන්වහන්සේ හුදකලාව උරුවෙලාතම් දනව් වට වැඩිසේක; එහි නිල්ගලාතම් නදීතීරයෙහි උරුවෙලකාශ්‍යප ජටිල, නදීකාශ්‍යප ජටිල, ගයාකාශ්‍යප ජටිල යි සොහොවුරු ජටිලයන් තුන් දෙනෙක් වෙසෙත්; ඔවුහු රහතුම්හගි කියමින් මිථ්‍යාදෘෂ්ටිගෙණ ලෝවැස්සන් ප්‍රයොගගෙන් ඔවුන්හොරෙහි සහදවාගෙණ ලාභ යෙහි සහ යසසයෙහිද අග්‍රව වසන්නාහුය. මෙයින් උරුවෙල කාශ්‍යපයාගේ ශිෂ්‍යතාපස පිරිස පන්සියයක්ද; නදීකාශ්‍යප යාගේ තුන්සියයක්ද; ගයාකාශ්‍යපයාගේ දෙසියයක්ද වෙති; මෙසේ ඒ තුන්බෑ ජටිලයෝ තාපසයන් දහසකට ප්‍රධානවූහ. තථාගතයන්වහන්සේ ඒ තුන්බෑ ජටිලයන් ප්‍රමුඛකොට ඇති දස දහසක්දෙනාගේ නෙතුඇම්පත් දැක, අපායගාමිවූවන් නිවන්පුර ලවමිසි උපන්මහාකරුණා ඇතිව එදා ඒ උරුවෙලකාශ්‍යපයාගේ අසපුවටවැඩ; කාශ්‍යපයෙනි, අවසර ලදුමෝනම් තොපගේ ගිනි හල්ගෙයි අද එක්රැයක් සැතපෙනු කැමැත්තම්හ"යි වදාළසේක; එකල්හි උරුවෙලකාශ්‍යපතෙමේ "මහණහවත් ගෞතමයෙනි, තපස්වීවරුන්ට අවසරදීම අපසේවූ තපස්වීන්ට සුදුසුමය; එසේ වීතුමූත් මේ ගිනිහල් ගෙයි සොරවූ විෂ ඇති නාගරාජයෙක් වෙසෙයි, ඒ අප රහත්හෙයින් අපට කිසිවක් නොකෙරෙයි; තොරහත්වූ තොපවැනි මනා රුවක් ඇති මහණකෙණකුන්ට උපද්‍රවයක් කෙළේනම් ඉතා හානියක් වේද"යි කිය; බුදුහු ඒ බස් නො ඇසුනාසේ, "තොපගෙන් අවසරලදුමෝනම් මේ ගිනිහල් ගෙයිම සැතපෙනු කැමැත්තම්හ"යි දෙවනුවත් වදාළසේක; තවද උරුවෙලකාශ්‍යපතෙමේ, ඒ ගිනිහල්ගෙයි ලැගීමෙන් අපව නම්නැත; එහෙත් එහි දරුණුවූ විෂ ඇති නාරජෙක් වසනා බැව් කිය; එවිට භාග්‍යවතුන්වහන්සේ තුන්වෙනුත් වදාරණ සේක්, "නාරජුගේ දෙම නොකියා තොපට පිළිවන්විනම් අද එකරැයකට ගිනිහල්ගෙය අපට අවකාශකරව"යි වදාළසේක; බුදුන් තුන්වනාවරයක වැළකූ කෙනෙකුට හිස සත්කඩක්ව පැලීයන හෙයින් කාශ්‍යපයන්ට අනිකක් කියාභතනොහී නායාගේ දැඩිකම්ම කිය; ඉක්බිත්තෙන් බුදුහු, "නසින්ගේ බල නොකියා, තොපගේ ගිනිහල්ගෙය අපට හිදීමට අවසරදෙව"යි වදාරා උන්හෙන් අනුදන්වාගෙණ, නාවිමනට වදනා ගරුඩ රාජයකුසේ නිර්භීතව ගිනිහල්ගෙවැද නාගාසන මසාකයෙහි පළක්බැඳ වැඩහුන්සේක. ඉක්බිත්තෙන් උග්‍රවූතේජස්ඇති නාරජ තෙම, ගිනිහල්ගෙයි වැඩහිදිනා බුදුන් දැක මේ මහාශ්‍රමණතෙම ඇතෙකුකරා පැමිණි උනමත්තයෙකුසේ මාගේ භවනයට වැද නමාගේ ගෙයක්සේ කිසි විළිබියක් නොමැතිව වැඩහිදිනේ මොහු කවරෙක්දැයි කිපි බුදුන්කරා විෂධූම යවන්ටවනි; එකල සම්බුදුරජාණන්වහන්සේ සිතනසේක් මම්ද විෂධූමයක් හළෙම් නම්

එක නයෙකුනබා මුලුලොව මකුලුනුගක්සේ ද, හසමවෙයි; එසේද වුවත් මොනුගේ අනිමාන මැඩදැමුවම්නාවේදැයි සිතා, මාගේ ශරීරයෙන් නික්මෙන්නාවූ ධූමය කරණකොටගෙණ මුලුලොව වසන කිසිවෙක්හටවත්, මේ ගෙයි වසන මැසි මදුරු කුනුඹු ආදී ක්ෂුද්‍රප්‍රාණියෙකුවවත් කිසි උවදුරක් නොවේවයි අධිෂ්ඨානකොට තෙජොකසිණයට සමවැද පිදුරුගොඩකට හිනි ඇවිලූ කලක්සේ ශ්‍රී ශරීරයෙන් දුම්කද හරින්වවන්හ; ඒ ධූමසඤ්ඣය නාරජ විසින් නිකුත්කරණලද දුම්කද මැඩපවත්වා ඔහුගේ ඡවි මාංස යට කිසි හානියක් නොකොට පෙළන්නට පටන්ගත. එවිට නාරජතෙම මහත් කොපයට පැමිණ මේ මූඩමහණහු හින්නෙන් දවාපියම්යි සිතා, බුදුන්කරා මහත්වූ අග්නිජ්වාලයක් මවාහැරියේය, එකල බුදුහු තෙජොකසිණ සමාපත්තියට සමවැද ඔහුට ශතසහස්‍රගුණයකින් අධිකවූ හිනිදැල් ශ්‍රී ශරීරයෙන් විහිදුවන්ව පවන්ගත්සේක; එවේලෙහි සියලු හිනිහල්ගෙය හිනිගෙණ දිලී සෙන හේතක් පෙණෙන්නාසේ ඒ සියලු ආශ්‍රමය එකාලොක විය. තවද උරුවෙලකාශ්‍යපාදී ජටිලයෝ මේ මහා ශ්‍රමණයාව නාරජගෙන් කුමණ උවදුරක් පැමිණේදැයි නිදි නොලබා බලා සිටියෝය. එකල ඔවිහු මේ මහාවඤ්ඣසකඛය දැක අහෝ මේ නාරජහළ වඤ්ඣසකඛයවන්නේය; තෙල රන්කදක්සේ ශොභමානවූ ශ්‍රමණභවත්ගෞතමයන්ගේ ශ්‍රී ශරීරය අද ද, හසමවේය; අප කියමන් නොඇත් බැවින් ඕඛව මේසා විපතක් පැමිණියයි සිතා මහත්වූ සංවේගයෙන් උන්නාහ. සර්ව්ඥයන්වහන්සේ මෙසේ තෙජොකසිණසමාපත්තියට සමවැදීමෙන් සොරවූ විෂ සහිත උග්‍රවූතෙජස් ඇති ඒ නාරජ මැඩපවත්වා ඔහුගේ අභිමාන ශූන්‍යකර, ශ්‍රී හස්තය දිගුකොට දළ මුතුහරක් හයාගන්නාසේද සමන්මල්දමක් හයාගන්නාසේද, ඒ නාරජ හස්තගෙණ, ඉදුනිල් මිණිකරඹුවෙක රිදී සවඩියක් ලන්නාසේ පාත්‍රාධාතුව ඇතුලෙයි ඒ සොරවූ සපීයා දරණලා හොව, උදෑසන උරුවෙලකාශ්‍යප යන්කැඳවා ඊයේ තොප මහානුභාවයි නාගරාජයා වැඳහොත් ලීලාව බලවයි දක්වා වදාළසේක. එකල නාරජතෙම බුදුන්ගේ ශ්‍රීමුඛය බලබලා ඇකිළිඇකිළී වැඳහොත්තේය; ඒ බැව් දුටු උරුවෙලකාශ්‍යපතෙමේ මේ ශ්‍රමණභවත් ගෞතමයෝ අපසේ සවඤඤාතෘත්ව දමනකොට රහත්වනසේ නොදන්නා බවමුත්, මහත්වූ සෘඬිසම්පන්න කෙනෙකැයි සිතීය. තවද බුදුහු ඔහුගේ ලය මොලොක්නොවූසේ දැන තව ප්‍රාතිහාර්‍යයක් දක්වනු කැමැතිව, ඔහුගේ ආශ්‍රමයෙහිසිටි අනික් නයෙකුදු එසේම පාත්‍රාධාතු යෙනිලා පැසේක; එදවසුදු ඒ ප්‍රාතිහාර්‍යයිදුටු උරුවෙල කාශ්‍යපයෝ මේ මහාශ්‍රමණතෙමේ නායින් දමනයකරණ සෘඬිමත් කෙනෙකි, එහෙත් මාසේවූ රහත් ගුණයෙකින් සම්පන්න

ගොවියයි කීය. තවද එක් දවසෙක අගුම්ගඩ දෙරට වාසීහු බොහෝ පූජාසත්කාරගෙණ උරුවෙල කාශ්‍යපයන්කරා අවුත් වන්හ; එකල උරුවෙල කාශ්‍යපතෙමේ සිතන්නේ ශ්‍රමණභවත් ගෞතමයෝ මහත්වූ ආනුභාව ඇතියහ; මනොහරවූ රූපශ්‍රීන් හොබනාහ; මේ ඉන්‍ද්‍රියයන් මධ්‍යයෙහි ආනුභාවයක් දක්වාලූ යේනම් අපහැම කවුස්වෙස්ගත් වානරයන්කොටත් නොතකති; භවත් ගෞතමයෝ අදමෙතනට නොඅවුනම් යෙහෙකැයි සිතීය. සම්බුදුරජාණන්වහන්සේ තමන් වහන්සේගේ නොයිමෙහිවූ ඉච්ඡාචරය දැන, උරුවෙලකාශ්‍යපයා මාන සහිත පුද්ගලයෙක, ඔහු කැමැතිදෙයක්ම කෙරෙමිසි සිතා එදවස් උදැසන උතුරුකුරු ද්වීපයට වැඩ අහර පිළිගෙණ අනොතත්ත නම් විලටවැඩ එහිදී වළඳා තුන්දවසක් ඔහුගේ පූජානිමිකල නැවත ඒ ආශ්‍රමයට වැඩිසේක. ඉක්බිති උරුවෙල කාශ්‍යපතෙමේ උදැසන බුදුන්කරා හොස් "භවත් ගෞතමයෙනි, අද වළඳන්නට අවමැනව; ඊයේ පෙරෙසිදු අගුම්ගඩ දෙරටවාසීහු අපට මහපූජාවක්කොට මහා දානයක් දුන්නාහුය; අපි එකල තොපද සඳහන් කෙළෙම්හ; එබැවින් ඊයේ පෙරෙසිදු කොසිගියසේක්දැ"යි විචාළේසි. එකල සම්බුදුරජාණන්වහන්සේ එබසට සිනාපහළකොට, "උරුවෙලකාශ්‍යප යෙනි, සෙසුලෝවැස්සන්ට පවසන්නාවූ රැවටිලිවදන් මෙන් මවද නොකියව; මම තොප තබා සියලු සත්වලොකයෙහි කුහුඹුවා පවන් මහාබ්‍රහ්මයා දක්වා සකල සත්වයන්ගේ අදහස් දැනගැන්මෙහි පොහොසතෙක්මි; තොපගේම අධ්‍යාශයවූ පරිද්දෙන් මම නොආවෙමැ"යි වදාළසේක. ඒ ප්‍රාතිහාර්‍යය දැක උරුවෙල කාශ්‍යපතෙමේ, ශ්‍රමණභවත් ගෞතමයෝ පර සිත් දන්නා බව මුත් අපසේ රහත්මගක් නොදනිතියි කීය. තවද එක් දිනක් අකාල මේඝයක් නැගී වර්ෂාධාරා පතනයවීමෙන් හැම වල් ඔලාගෙණ හොස් උරුවෙල්පියසද ජලප්‍රවාහයෙන් ගසාගියේය; බුදුහු වැඩහුන් වනලැහැබත් ගලා දිවෙයි; එකල සම්බුදුරජාණන් වහන්සේ, ඒ ජලප්‍රවාහය මීර ලඟට නොවැද සිසාරා පවුරක්සේ සිටුවයි අධිෂ්ඨානකළසේක; එකල බුදුන්ගේ අධිෂ්ඨානයවූ පරිද්දෙන් දිය කඳු හානොවී සිටිකල, බුදුහු පූර්ණාගරපත්ලට අවතීර්ණව රුවන් වැලි මතුයෙහි සිටි චක්‍රවර්ති රජහුසේ දියෙහි නොගැවී දසදික් නොබලා සක්මන්කරන්ට වන්සේක; එවේලෙහි උරුවෙල කාශ්‍යප තෙමේ බුදුහු වැඩහුන් ප්‍රදේශයත් ජලසකුණියෙන් නිමග්නවීයයි සිතා ඔරුවක්ගෙණ වහවහා පැදගොස්, රිදීලෙනක සිටි සිංහපොවිවෙකුසේ ජලමධ්‍යයෙහි සුදුවැලිතලා මතුපිට සව ණක් රැසින් දිළිහි දිළිහි සක්මන්කරමින් හුන් බුදුන් දැක, මේ මහා ශ්‍රමණතෙම අපසේ රහත්ව තෘෂ්ණා ප්‍රවාහය රඳවන්සේ අපොහොසත් නුමුත් මහාඍද්ධි සම්පන්න කෙනෙකැයි කීය.

එකල සම්‍යක්සම්බුදුන්වහන්සේ උරුවෙල කාශ්‍යපයාගේ ඔරුවට වැඩ කිමෙක්ද මේ කාශ්‍යපජටිලයා මා මෙතෙක්දා මුලුල්ලෙහි පානා ලද නොයෙක් ප්‍රාතිහාර්‍යයන් දැනත්, තමා රහත්කෙනෙක යන මිථ්‍යාදෘෂ්ටිය නො හරින්නේමය: මොහුගේ මිසදිටු නමැති ව්‍යාධිය ඉතා අසාධ්‍යය, එබැවින් සෙසු ඉන්ද්‍රියයන් සංසිඳුවා; මාගේ සඩම්ම නමැති දිව්‍යෞෂධය පානයකාරවා මොහු හොඳහැඟිමැයි සිතා ශ්‍රීමුඛ නමැති රුවන් කරඬුවෙන් නික්මුනාවූ සුගන්ධයෙන් ඒ සියලු වනලැහැබ සුවඳපිඬක්සේ කරවමින්, මධුරස්වර විහිදුවා ධර්ම දෙසුනාවට පටන්ගත්සේක; එතෙණහිම සම්‍යක්සම්බුදුන් වහන්සේ මහානිධාන වසකුවක් ශෛණ නැරපානාක්ෂුසේ සවාසිය චරිතානුකූලවූ ධර්මය දෙසනාකරන්ට වන්කල්හි, ඒ උරුවෙල කාශ්‍යපතෙමේ කෙලෙසුන් නසා දහසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටා අන්ධකාර සමයෙහි දල්වාලූ ප්‍රදීපයක්මෙන් මෙලොව නම් මේය, පරලොව නම් මේය, බුදුහු නම් මේය, සඩම්මය නම් මේයයි යනාදි වශයෙන් දැන බුදුන්ගේ ශ්‍රීපාදවය නමස්කාරකොට, "සවාමීනි, සම්‍යක්සම්බුදුන්වහන්ස, ඔබ වහන්සේ වනාහි මාගේ මෑණියනෙනක, පියානකෙනෙක, යහපත් අනවද්‍ය මාතෘභාව දක්වන්නාවූ ගුරුවරයෙක, කල්‍යාණමිත්‍රයෙක්ද වන්නේය; මෙතෙක් දවස් ඔබවහන්සේ බුදුකෙනෙකුන් බැව් නොදන්නෙමි; එබැවින් ඔබ්තනුව ප්‍රව්‍රජ්‍යාඋපසම්පදා දෙවා වදාළමැනව"යි ඉල්වීය. එසමය බුදුහු කාශ්‍යපයෙනි, තොපගේ අවශෙෂ ජටිලසමූහයාගේත් අදහස් දනුවයි වදාළසේක; එවිට උරුවෙල කාශ්‍යපතෙමේ පන්සියක් ජටිලයන්කරා වහාගොස් දරුවෙනි, අසපුවෙහි මෙතුමක්කල් වැඩහුන්නේ ලොවිතුරා බුබොහතමයාය; එබැවින් මම උන්වහන්සේ කෙරෙහි පැවිදි වන්නෙමි; තොපිත් මාසේම පැවිදිවීමට කැමැත්තාහුනාම් මා කැටුව එවයි කීය; එසමය ජටිලයෝ යුෂ්මතුන්වහන්සේ පැවිදි වනසේක්නම් අපිද එසේ කරම්හයි කියා තම තමන්ගේ ජටා මඩුලු හා තවුස් පිරිකරද ගහදියට බහා බුදුන්කරා දිවගොස් පිරිවරා සිටියාහුය; එවේලෙහි භාග්‍යවතුන් වහන්සේ උරුවෙල කාශ්‍යපයන් ප්‍රධානකොට ඇති අනිකුත් ජටිලයන්ගේද, චරිත බලා ධර්මදෙසනාකොට හැමදෙනාම එහි භික්ෂුභාවයෙන් මහණ උපසම්පදා කළසේක.

තවද ගහදියෙහි පාවී යන ජටාමඩුලු සහිත තවුස්පිරිකරද දුටු නදීකාශ්‍යපතෙමේ, අහෝ අපසොහොවුරුව යම්කිසි උපද්‍රවයක් පැමිණියේවනැයි සිතා, තමන්ගේ තුන්සියක් තාපස පිරිසත් කැටුව උරුවෙල කාශ්‍යපාරාමයට පැමිණියේය; එකල ඔවුන් පැවිදිවී සිටිනු දුටු නදීකාශ්‍යපතෙමේ, තුමූද පිරිසත් සමඟ බුදුන්

කෙරෙන් දහම් අසා පැහැදීමෙන් සෝවාන් ඵලයෙහි පිහිටා එහි නිස්සූහාවයෙන් පැවිදිවිය; කයාකාශ්‍යපතෙමේද ගහදියෙහි පාවඅහන තාපස පරිස්කාර සහිත ජටාමඬුලුද දැක අප සොහොයුරන්ට යම්කිසි උවදුරක් පැමිණෙන්ට ඇතැයි සිතා, තමන්ගේ දෙසියයක් පමණ ජටිලපිරිසත් කැටුව එම ආශ්‍රමයට ප්‍රවිෂ්ටව පළමු අය මෙන්ම එහි නිස්සූහාවයෙන් පැවිදිවිය.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ උරුවෙල් දනව්වෙහි තෙමසක් වැඩසිට තුන්දහස් පන්සිය සොළසක් ප්‍රාතිහාර්‍යයි දක්වා තාපසයන් දහසක් විසින් පිරිවරණලද උරුවෙලකාශ්‍යප නදීකාශ්‍යප, ගයාකාශ්‍යපයයි යන නම් ඇති තුන් මහ තවුසන්ගේ, මානමර්දනයකොට එහි නිස්සූහාවයෙන් පැවිදිකරවා ඒ ප්‍රව්‍රජිත පිරිස කැටුව ගයාශීර්ෂයට එළඹ, එහිදී ඔවුන්ට ආදිත්තපරියාය සූත්‍රය දෙශනාකොට අග්‍රඵලාධිගමයට පමුණුවාලූසේක.

බුදුහු රජගහනුවරට වැඩිම, සක්දෙව්රජ බුදුගුණ කථනය කිරීම, බිම්සර නරපතින් වේළුවනාරාමය පිළිගැන්වීම.

ඉක්බිත්තෙන් බුදුහු ඒ උරුවෙලකාශ්‍යපාදි දහසක් මහරහතුන් පිරිවරා බිම්සර මහරජ හට දුන් ප්‍රතිඥාවෙන් මිදෙනු සඳහා දුරුතුමස මැදි පොහෝදින ප්‍රදීප සහස්‍රයෙන් දිලිහෙන ඇගැයක්සේ රජගහ නුවර ශෂ්පවන නම්වූ නල් උයනට වැඩ එක් රුකක්මූල සවණක්රැසින් දිළිඹි දිළිනි සහස්‍රරශ්මීන් විරාජිත සූර්‍යමණ්ඩලයසේ දහසක් පමණ මහරහතුන් පිරිවරා වැඩහුන් සේක; එකල බිම්සර රජතෙමේ බුදුහු තමන්ගේ උයනට ප්‍රවිෂ්ටව වැඩහිඳිනාබව උද්‍යානපාලයාගෙන් අසා එක්ලක්ෂ විසිදහසක් බ්‍රාහ්මණ ගෘහපතීන් විසින් පිරිවරණලදුව තරුපිරිවරණලද සුපුන්සඳක් සෙයින් සඟපිරිස් පිරිවරා, සවණක් සහ බුදුරැසින් දිළිහෙමින් වැඩහුන් බුදුහුදැක පස්වණක් ප්‍රීතියෙන් පිණා පියුම් ගැබකට බස්නා රාජහංසයෙකුසේ සක්ලකුණෙන් විසිතුරු ශ්‍රීපාද පදුමයට නැමී පසඟපිහිටුවා වැඳ සඟපිරිවරින් එකත්පස්ව උන්හ. උරුවෙලකාශ්‍යප තෙමේ එනුවර නැගූ මහාඛ්‍යඝක්සේ ඒ කාලයෙහි ඉතා ප්‍රසිද්ධය; එබැවින් ඒ පිරිස අතුරෙන් ඇතැම් කෙනෙක් කිමෙක්ද, ශ්‍රමණභවත් ගෞතමයෝ උරුවෙල කාශ්‍යපයන් නිසා වෙසෙත්ද, නොහොත් උරුවෙලකාශ්‍යපයෝ ශ්‍රමණභවත් ගෞතමයන් නිසා වෙසෙන්දැයි සැක සිතුවාහුය; එකල සර්ව්‍වඥයන්වහන්සේ ඔවුන් සිතූ සිත් දැන මහතෙරුන් මුලුනුන බලා:—

"කිමේව දිස්වා උරුවෙලම්හි
මහාසි අග්ගිං කිණ තොටදූතෝ,
පුච්ඡාමි තං භාසස්ස එතමත්ථං
කථං භගිතං තවඅග්ගිහුතක"

යන මේ ගාථාවෙන් උරුවෙලකාශ්‍යපයන්, ජනයන්සිත කුකුස් හරවයි වදාළහ. එකල්හි උරුවෙල්කස්සප්මහතෙරහු හුනස්නෙන් නැගී බුදුන්කරා එළඹ දෙපතුල්වැඳ අවසරගෙණ චතුර්ධ්‍යාන යට සමවැද ආකාශයට පැණනැගී නොයෙක් ප්‍රාතිහාර්‍යයක්වා අහසින් බැස නැවතත් දෙතලෙක තුන්තලෙක යනාදි වශයෙන් සත්තලෙක පමණ පෙරසේම අවකාශයට පැණනැගී එසින් බැස බුදුන් වැඳ සිංහරාජයෙකු පෙරටුව සිටි ඇත්පැවවෙකුසේ ආදර යෙන් නැබුරුවසිට, "සත්‍යයෙනි, මාගේ සව්මිදරුවන්නන් මා හා සමකොට නොසිතව්, බුදුහුතම් මහමෙරසේ ඉතා උස්වූ නුවණැතිසේක, මම වනාහි ලිග්ගලක්සේ මිටිවූ නුවණැතිවෙමි; බුදුහු මහා සමුද්‍රයසේ ඉතා ගැඹුරුවූ නුවණැතිසේක; මම වනාහි එසේ නොව ගවකුරෙක රැඳි දියත්තක්සේ ඉතා අල්පවූ නුවණැති වෙමි; මම සව්මිදරුවන්නන් නිසා සසරකතරින් එතරවූයෙමි, බුදුහු මට මව්සේක, පියසේක, ගුරුසේක, සව්මිදරුසේක, මම බුදුන්ගේ ශ්‍රාවකයෙමි; යනාදි වශයෙන් රැස්ව සිටි සෙනඟට ඇසෙනසේ අප්‍රමාණවූ බුදුගුණ කියා බුදුන්ගේ පා වැඳ එකත් පස්ව උන්හ. එවේලෙහි ඒ පිරිස්තොමෝ මහතෙරුන්කළ සෘද්ධි ප්‍රාතිහාර්‍යය දැක කුල්මත්ව මහත්වූ සාධුනාද පවත්වා බුදුහුතම් මහානුභාවසම්පන්න උතුමෙන; අපි රහතුම්හසි කියමින් මිථ්‍යා දෘෂ්ටිගෙණ බොහෝකලක් ඇවිද්දුවු උරුවෙල කාශ්‍යපයන්ගේ දෘෂ්ටි බිඳ විශෙෂයෙන්ම දමනය කරණලදැයි බොහෝ සතුති කළාය. එකල සම්බුදුයන්වහන්සේ ඒ රැස්වසිටි සමූහයාගේ කථා අසා අද මේ මහපිරිසට මෙය අර්‍ථොත්පත්තිකොට ගෙණ මහා නාරද කාශ්‍යප ජාතකයෙන් දහම්දෙසා මොවුන් සසරින් එතර කරවමැයි සිතා, "උපාසකවරුනි! මොහු දැන්මතු දැමූයෙම් නොවෙමි, පෙරත් මොහු දමනයකොට අපායමුඛයෙන් ගලවා ලූයෙම්වේදැ"යි වදාරා නිමඟර්හයක් පලා පුන්සඳ මඬල නිකුත් කොට පාන්නාක්හුමෙන් භවාන්තරයෙන් සැඟවුනාවූ අතීතකථාව ගෙණහැර දක්වන්නාහු මෙසේ වදාළසේක:—

මහා නාරද කාශ්‍යප ජාතකය.

යටගිය දවස මියුලුනුවර අඞ්කුර නම් රජෙක්විය. ඕහට රැජා නම් දියනියක්වී, ඕතොමෝ මනොඥවූ රූපයෙන්ද සුඝෂවූ නුවණින්ද අවලවූ ශ්‍රද්ධාවෙන්ද යුකතය, තුදුස්ජාතියක්

දක්නා ජාතිසමරණ ඥානයක්ද ඇත්තිය. පියරජ තෙම ඇව දිනපතා පස්වේසි කරඹුවෙක බහනලද සුවඳමල් හා සුවඳ පළඳනාද දෙයි, මැදිපොහොයෙන් පොහොයට දුන ධම්ය පිණිස දහසින් බැඳි පියලිද දෙයි, ඒ රජතෙම දශරාජධම්මයෙන් * අකොප්පව රජකෙරෙයි; මෙසේ දවස් යවන සමයෙහි එක් පොහොදිනක ධම්මකථිකයෙකු සොයා උයනට ගොස් මෙලෝ පරලෝ නැතැයි මිසදිටුගෙණ වසන්නාවූ ගුණ නම් ආජීවකයෙකු කරා එළඹ චක්‍රවර්ති රජෙකු අතින් ඉල්වියයුතු ව්‍යාපාරාමණ්ඩ්‍ය යක් දුයියෙකු අතින් ඉල්වන්නාහුමෙන් බුදුකෙනෙකුගෙන්ම විවාල යුතුවූ ඒ ප්‍රශ්නය ඒ නිවටා කෙරෙන් විචාරණ්ඩයේ:— "සවාමීනි, පරලොව ඉන්ද යුතුවූ පව් පින් විපාක ඕහාගය වෙසෙසින් මට විස්තරකර වදාළමැනැවැ" යි අයැදීය. එකල රජහුගේ එබස් ඇසූ ඒ ආජීවකයා කන බත වැලි උකාලන්නාක්හු සේද, දකුණු අත කපා හෙලන්නාක්හුමෙන්ද කියනුයේ:—"මහරජ කුමක් කියව්ද? පරලොවෙක් නම් කොයින්ද? කළපින් විපාක යක් නම් කොයින්ද? සුගති දුගතිය යි යන දෙයක් නොමැත් තේය. සත්වයා මියගියහල එම සිරුරෙන් කොටසක් ආපෝ ධාතුවවද, කොටසක් තෙජෝධාතුවවද, කොටසක් වායෝ ධාතුවවද, කොටසක් පඨවිධාතුවවද, එක්වගෙ" යි, යනාදි වශයෙන් දුල්බිධික වදනින් රජහු පහදවා මිසදිටු නැමැති මහ වනලැහැබෙහි හෙළීය. එකෙණෙහිම මිසදිටුගත් රජතෙමේ උයනින් ගොස් ඇතුළුනුවරට වැද තමා විසින්ම පිහිටුවනලද දන්හල් බිඳහෙළුවා දශරාජධම්මයන් හැරපියා, පරලොවක් නැතී නම් මෙලොවත් සුවවිඳිමැයි සිතා තමාගේ චන්ද්‍ර නම් මහපාසාද නැඟී පරස්ත්‍රීන් හා පුරස්ත්‍රීන්ද රැස්කොට පඤ්චකාමානුභවයට පටන්ගත. මෙසේ කාමයෙන් ප්‍රමාදව තුදුස්දිනක් අතික්‍රාන්තවූ ඉක්බිත්, ඔහුගේ රාජානම් දියනිතොමෝ අද මපියාණන්ගේ මිථ්‍යාදෘෂ්ටිය බිඳහෙළමැයි සිතා, පන්සියයක් කුමරියන් හා කිදම්වුන් විසින්ද පිරිවරණලදුව තමාගේ ප්‍රාසාදයෙන් බැස, චන්ද්‍රවිමානයට වදනා සඳ දෙව්දුවෙකුසේ පියරජහුගේ චන්ද්‍රනම් මහපාසාදට ප්‍රවිෂ්ටව පියරජහු වැඳ පණවනලද උතුම්වූ සවණීණ පීඨයෙහි හිඳගත; රජතෙමේ රූපාග්‍රප්‍රාප්තවූ තම දියනියන් දැක මහත්වූ ප්‍රේම ඇතිව, කිමෙක්ද මාගේ ප්‍රියවූ දියනියනි, තිට සළුපලඳනා පුජාප සුගන්ධභාණ්ඩ හා කෙළිවලන් ආදිය දිනපතා ලැබේද? තිගේ සුවදුක් කෙසේදැයි විචාළේය; එබසට රජ දූ

* "දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං...අවිහිංසාව ඛන්තිච අවිරොධිතා" දානය, සීලය, පරිත්‍යාගය, සෘජුභාවය, මෘදුභාවය, තපස, ක්‍රොධනොකිරීම, හිංසා නොකිරීම, ක්ෂමාව, අවිරුද්ධ භාවය යනමේ දශරාජ ධම්මයෙහි අඩංගවේ.

තොමෝ කියන්නී:-"පියාණන්වහන්ස, මවනම් කිසිසැපතකින් ඌනකමයක් නැත; නුමුත් සෙට මැදිපොහොදින පැමිණෙන බැවින් සිරිත් වශයෙන් කරන්නාවූ දානධර්මය උදෙසා මසුදහසක් දුනමැනව" යි ඉල්වීය; එබසට පියරජතෙම සිනාසී කියනුයේ, "පෙම්බර දියනියෙනි, පෙර නී දන් පින් කෙරෙමැයි බොහෝ වසතු අපතේ දැමීය; පෙහෙවස් රැකීමෙහි වෙහෙසීමෙන් මලානික භාවයට පැමිණි මල්දමක්සේ තිගේ රූපත් සිරුර බොහෝ කෘශ භාවයට පැමිණියේය; පුණ්‍යකර්මයෙහි හා පාප කර්මයෙහිද ඵල නැත්ල; එබැවින් නී අද පමන් පින් කිරීමෙහි වෙහෙසනොවව, එබැවින් මස්සකුදු වියදම්නොකොට මෙලොව සැපයම සොයව"යි කීය. මේ රූපා නම් රාජදුහිතා වනාහි අල්ප සවලපවූ කෙනෙක් නොවෙයි, ඕතොමෝ පූර්වයෙහි කරණලද අකුසල් බලයෙන් සත්‍රී ජන්මයෙහි උපන් බවමුත්, බුදුකෙනෙකුන්ව අත්පා මෙහෙවර කොට සුවාසූදහසක් ධර්මසඤ්ඤයන් ජීවග්‍රයෙහි ලෙලවනාතරම් ප්‍රඥාසම්පන්නාවූ පඤ්චස්ථානයකින් අග්‍රවෙම්වයි ප්‍රාර්ථනාකොට කප්ලක්ෂයක් මුලුල්ලෙහි පෙරුම් පුරා ආවාවූ ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් වහන්සේය; තවද ඒ රූපානම් රාජකන්‍යා තොමෝ කියන්නී, "පියාණෙනි, මෙලෝ නැතැයි නොවදුල මැනව, ඒ ගුණ නම් දුර්ගුණයාගේ මිථ්‍යා දෘෂ්ටිය හැරපියා මෙලෝ පරලෝ ඇතිබැව් විශ්වාසකළ මැනව; මා බාල කෙල්ලෙකැයි නොසිතුව මැනව; මම වනාහි පෙරවිසූ කඳපිළිවෙළ දනිමි; එබැවින් මා කියන්නාවූ කුශලාකුශල කර්මඵලයන්ගේ විපාක ඇසුව මැනව; මම්පුළුයෙහි පුරුෂාත්මයක් ලැබුකෙනෙහ; එතකුදුවුවත් මිට පුදුස්වන ජාතියෙහි සවණ්ණ කාරව ඉපිද අසත්පුරුෂවූ පාපමිත්‍ර සෙවනය හෙතුකොටගෙණ පවකැයි නොදැනීමෙන් එක්වාරයෙක්හි පරසත්‍රී සේවනය කෙළෙමි; ඒ අකුශලකර්මය අළුයම සැඟවිතුබු ගිනි පුපුරක්සේ තිබී ඒ ජාතියෙන් මිය පෙරකරණලද අන් කුශලකර්මයක් හෙතුකොටගෙණ, ඩොඞ්ඩුභවර මහදනසිටුව ඉපිද දන්දී මෙන්ද පෙහෙවස් රැකීමෙන්ද බොහෝවූ පින්රැස් කෙළෙමි; ඒ පින් සමූහය ආධානයකින් වැසූ පිධානයක්සේ තිබියදී ඒ සිටු කුලයෙන් සැව පෙර කරණලද පරදුරකර්මය හෙතුකොට ගෙණ රෞරව නම් නරකයෙහි ඉපිද දීර්ඝකාලයක් මුලුල්ලෙහි නොයෙකුත් දුක්විඳ, කර්ම විශෙෂයෙන් අවුත් සෙණඟුණ නම් රව බලසම්පන්නාවූ බැවිළි පොතකයෙක්ව ඉපිද ගියෙමි; එකල එළු ගොවියෝ මොහු මතු පුත්‍රවීමත් බලැනියෙකු වුවමැනවැයි සිතා මාගේ සතර පා බැඳ, පෙර සත්‍රීභූතකාම් කළාවූ අකුශලයෙන් මා හඬව හඬවා කිනිරිපොළුලා මැඩ බීජෝඩරණය කළහ; තවද ඒ ජාතියෙන් මිය, සඤ්ඤීනම්රට ගවයෝනියක උපන්මි,

ඒ ජාතියෙහිද පළමුකී අකුශලයාගේ දරුණු විපාකවශයෙන් තීක්ෂ්ණිරිපොලු ලා මැඩ බිජොඩරණයකළහ; තවද ඒ ජාතියෙන් මිය වැදිරවක නපුංසක පණ්ඩකව උපන්මි; තවද ඒ ජාතියෙන් මිය සක්දෙවිරජහට තුන්වාරයක්ම අගමෙහෙසුන්ව ඉපිද, පෙර සිටු ආත්මයෙහි කරණලද මහත්වූ කුශලානුභාවයෙන් දිවසැපත් ලදිමි; තවද ඒ ජාතියෙන් මිය ජීවක නම් දිව්‍යපුත්‍රයෙක්හට අග්‍රමහෙෂිකාව ඉපිද දිව්‍යශ්‍රීලදිමි; එතින්සැව දැනට ඔබවහන්සේව දූව රජකුලෙහි උපන්මි; මෙසේ මා විසින් එකම ජාතියෙක්හි කරණුලැබූ පරදර කම්මය හෙතුකොටගෙණ මේ ජාතිය දක්වා පුරුෂ අඟයක් නොලදිමි. මතු මෙසින් චුතව ශක්‍රපුරයෙහි මහෙෂාක්‍ය දිව්‍යරාජව ඉපිද ඒ පරදර පාපයෙන් මිදෙන්නෙමි, එබැවින් පියමහරජානෙනි, පව් පින් දෙක්හි විපාක ඇත්මය; දැන් නුඹවහන්සේ මෙසේ පරදරසෙවනාදි බලවත් පව්කොට නරකදුකින් කවරකලක මිදෙන්නෙහිදැ"යි මේ ආදි වශයෙන් ඒ රුජානම් රාජ දුහිතෘන්නොමෝ තම පියරජ හට නිර්මලවූ ධර්මයෙන් අවවාදකලා, රජවනාහි දියණියන්ගේ ලදබොලඳ ප්‍රේමනීයවූ තෙපුල් අසා මහත් සතුටට පැමිණියා, එතකුදුවුවත් දරුවන් කියනබස් මව්පියන්ට ලඝුවන හෙයින්, රජ තමාගේ මිසදිටු සවභාව නොහළයේමය. ඉක්බිත්තෙන් ඒ රජ දූ තොමෝ මෙසේත් කියා පියරජහු නිව්ස්වාගතනොහී මපියාණන් නරකයට යානොදී ගලවා ගණිමැයි පසුබවනොවී වීර්‍ය්‍ය වඩා මහත්වූ කරුණාවෙන් හුනස්නෙන් නැගී සඳල්ලට බැස, "ලොකපාලදෙවියනි! මෙලොවක් පරලොවක් ඇත්නම් ශ්‍රද්ධාගුණයක් මාකෙරෙහි පිහිටියේනම්, උපන්තැන් පවන් මේ දක්වාත් සිනෙන්වත් බොරු නොකියෙම් නම්, නිත්‍ය පඤ්චශීලය හා පොහොයෙන් පෝහොයට පෙහෙවස් අඛණ්ඩව රක්ෂා කෙළෙම් නම්, කෙළි පිණිසත් පස්පව් නොකෙළෙම් නම්, මෙලොවක් පරලොවක් දෙවි බඹකෙනෙක් ඇතුවාහුනම්, මේ මා විසින් කරණලද්දුවූ සත්‍යක්‍රියා බලයෙන් මා ඉදිරියෙහි පෙණී මව සහාය‍ව මපියාණන්ගේ මේ මිථ්‍යාදෘෂ්ටි නමැති කටු වන ලැහැබින් මැත්කොට එලියෙහි ලා පියත්වයි" අයැද සිටියාය.

එකල අප මහබෝසතානෝ නාරදඝාශ්‍රය නම්වූ බ්‍රහ්මරාජව ඉපිද ලොකාවචර්‍යාවෙහි යෙදී මිනිස්ලොව බලා මේ රුජා නම් රුජ කන්‍යාවගේ ආයාචනා හා සත්‍යක්‍රියාවද දැක, ඇගේ ගුණ මහිමතාව දක්වා ඒ රජහු ගත් මිථ්‍යාදෘෂ්ටිය බිඳහැර ලෝවැඩ කෙරෙමැයි සිතා බ්‍රහ්මානුභාවය අන්තර්ධානකොට සත රන් කඳක්සේ ප්‍රභාවිහිදුවමින් පුරුෂ තාපසවේශයක් මවාගෙණ, මෙසේ මනොඥවූ තාපසවෙශධාරීව චක්‍රවර්ත්ති රජක්හුගේ දොරට එන සක්රුවනක්සේ සියලු සතුන්ට පෙනිපෙනී අවුදින්,

ඒ චන්ද්‍ර නම් පභය මුදුනෙහි ආකාශයේ සක්මන්කරමින් සිටියා කුයඃ; එතෙණෙහිම ඒ රුජා නම් කුමාරිකාතොමෝ තාපසයන් දැක, එකානතයෙන් මේ තෙමේ තපස්කෙනෙක් නොවේමය; සියලු සතුන් තවුස් වෙසෙහි පහදනා කෙයින් තවුස්වෙස්ගෙණ මේ ලොවට බටුවාවු එක්තරා ආකුහාව සම්‍යනා දිව්‍යරාජයෙක් වනැයි සිතා සතුටුව තාපසයන් වැන්දුය; ඒසොණෙහිම මුලු මිසුලුනුවර මේ ප්‍රවෘත්තියෙන් ඇළලී ගොස් බොහෝ ජනයෝ දිව අවුත් රැස්ව සිදිගත්හ. රජතෙමේද බ්‍රහ්මතෙජසින් වේවුලා සිංහාසනයෙන් බැස එකත්පස්ව සිට කියනුයේ:—"තාපසයෙනි, ඔබගේ මේ ශරීරාලොකයෙන් මේ නුවර හිරු උදයත්සේ එකාලොකවිය; ඔබගේ තාපසලීලාව මා දුටුවිරූ ලීලාවක් නොවෙයි; බඹ කොයි සිට මෙහි පැමිණියාහුදැ"යි විවාළේය. එවිට බ්‍රහ්මරාජතෙම, මේ රජ වනාහි පරලෝ නැතැයි දෘෂ්ටි ගෙණ සිටින්නේය; එබැවින් මෝහට පරලෝ ඇතිබැව් කියා වාදයක් උපදවමැයි සිතා මහරජ මම පරලෝ සිට ආයෙමැයි කියා; රජතෙම පරලොවයයි කී බසට සිනාසී තපස්වීහු තම් එකානතයෙන් බොරු නොකියන්කාහුය; එබැවින් තාපසයෙනි, පරලොවකුත් ඇද්ද? පින් පව් විපාකයකුත් ඇද්දැයි මට නොව ළහා කියවයි විවාළේය. බ්‍රහ්මතාපසයෝ එබසට කියන්නාහු බොලඳවූ මහරජ, පරලෝ සහ පින් පව් විපාකද ඇත්තාහුය. තාගේ මේ ලදුරිවූ දුව දන්නා කටයුතු පමණක්වත් තා නොදන්නේ හිරිඝනෙක්හිදැයි කීහ; තවද රජතෙමේ තමාගේ ඒ මිසදිටු සුභාව නොහැර තාපසයන්ගේ ඒ බසටත් සිනාසී, මේ තාපසයා අද මම වෙහෙසකරමැයි සිතා, තාපසයෙනි, පරලෝ ඇතිබැවින්ද, බඹ පරලෝසිට මෙහි පැමිණි හෙයින්ද, මට දැන් මසු පන්සියයක් නය පිණිස දීපියව, මම වනාහි මතු තොපගේ ලොවට ගියකල පොලින් සමඟ මසු දහසක් දෙමැයි කියා තාපසයන් දිගාවට අත දිගුකෙළේය; එබසට බ්‍රහ්ම තාපස තෙමේ, මහරජ මම තාසේ නොවෙමි; මේ ලොව නය දියයුත් තන් හා නය නොදිය යුත්තන්ද දනිමි; සුඛිතයන්ට නය දුන්කල ඔය දිවුණු දක්වා නැවත ලබාගත හැකිවන්නේය; දුක්ඛිතයන්ට නය දුන්කල උන්ගේ බැහැපත්කම නිසා නය ලබනවා තබා තමා අතින් දී උන් රකිනු රිසි කෙරෙයි; එබැවින් තාසේවූ දුක්ඛිත යෙකුට දැන් මසු පන්සියයක් දී මතු මසුදහසක් කෙසේ ලැබගනිම් දැයි කීහ; බ්‍රහ්මතාපසයා විසින් රජ දුක්ඛිතයෙකුට සමානකළ බැවින් හේතෙම බොහෝසේ කිපී, මාගේ මේ සත් යොදුන් මිසුලුනුවර මහත්වූ චතුර්විධ සම්පත් බලව, මාගේ සිවිරඟ සෙනඟ බලව, සොළොස්දහසක් පුරඟනන් ගේ දෙනශ්‍රීසෞභාග්‍යය බලව, මාගේ මේ භාණ්ඩාගාරවල කිසි කලෙකත් ඌන නොවන්නාවූ

ධනය බලමිසි, මේ ආදි තමාගේ රජසිරි සැපත් දක්වා තපස්වීව සිටිනා ඔබ විසින් මේසා බොරුවක් ඉතා කිවා නොයෙදෙයි, අප වැනියෝත් දුකඛිතයෝදැයි විචාලෝය; එබසට තපස්වීතෙමේ, මහරජ, තාසේ වූ දුකඛිතයන් මේ ලෝකයෙහි නැතිසේ හැගෙන්නේය; මේ සා රජසිරිසැපත් තාගේ නොවෙයි; තා පින් නොකොට තබායන හෙයින් මේ හැම අන්සතු වන්නාහ; රුවන්ඝෙතකට වැද අහුරු උකාගෙණ යන්නාසේ, මෙසේවූ මනුෂ්‍යලොක නමැති පින් රුවන් ඝෙතකට වැද තෝ අකුසල් නමැති අහුරුගෙණ යන්නෙහිය; දැන් තොප විසින් කරන්නාවූ මේ පාපකර්ම හෙතුකොටගෙණ සඤ්ජීව, කාලසූත්‍රාදි මහ නරකවල වැටී දැඩි පැසි පැසී බොහෝ කාලයක් ගොඩ නොදැක දුක් ගන්නා කල, ඒ දුක් ඉවසාගත නොහී මහත්වූ බැගැපත් හඬින් හඬ හඬා ඇවිදින්නෙහිය; එදු ඒ නරක මැදට ගොස් මාගේ පොලින් සමග මසුදහස ඉල්වන්නව ගොදුන් සියයෙක දුරසිටියවුන් ඇස් පිපිරෙණ තරම් රළු කිනි ගෙසින් එය ඉල්වනවා තබා, තාගේ බැගැපත් හඬ ඇසූකල අතින් මිළ දීවත් තා ගලවාගන්නා සිතක් උපදින්නේමය; එබැවින් තාසේවූ දුකඛිතයෙකු නැති බැව් මනාසේ දැනගණුවයි කියය. මෙබස් ඇසූ ක්ෂණයෙහිම රජගේ මිථ්‍යාදෘෂ්ටිය, කිනි දුටු ලැවූ වනයක්සේද, සුලං දුටු වලාකඹක් සේද, දියදුටු කුණපයක් සේද, රජහු කෙරෙන් අතුරුදන්විය; එකල රජ, තාපසයන් වැද සවාමීනි, ඔබවහන්සේ වනාහි මාගේ මව්පියවන්නේය, සත්‍ය මාර්ග දක්වීමෙන් ගුරුවරයෙක්ද වන්නේය, මෙවක් පටන් පරලෝ ඇතිබැව් ඝා පින් පව් විපාක ඇති බව්ද දනිමි; එබැවින් මා විසින් මෙතැන් පටන් පින්කොත් වපුළ මැනවයි සම්‍යක් දෘෂ්ටියෙහි සථිරව පිහිටියේය; බ්‍රහ්මරාජයානෝද මෙසේ පරමී සාධනය කොට තමාගේ බ්‍රහ්මලෝකයටම ගියාහ. මෙසේ සවාම්වූ බුදුරජානන්වහන්සේ මේ නාරද කාශ්‍යප ජාතකය පූර්ව්‍යාපරඝඩි ගළපා චතුරාර්‍යසත්‍ය දෙශනාවෙන් නිමවා වදාරා, උපාසක ජනයෙනි, මේ උරුවෙලකාශ්‍යපයා දැන් මතු දැමූයෙම් නොවෙමි, පෙරත් දමනයකෙළෙම් වේදැයි වදාරා ඒ අඞ්ගාති රජ නම් මේ උරුවෙලකාශ්‍යපයෝය, බ්‍රහ්මරාජයානම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක; ඒ දෙශනාවශානයෙහි බිම්සර රජ තෙමේ පිරිවර අමාත්‍යයන් සමග සෝවාන් ඵලයෙහි පිහිටියේය; රැස්ව සිටි අවශෙෂ ජනයෝද සරණගිලයෙහි පිහිටියාහුය.

ඉක්බිත්තෙන් බිම්සරරජ තෙමේ තමාගේ මනදෙළ පිරුණු බව කියා බුබ ශාසනයෙහි පැහැදී දෙවෙනිදා දවල් දනම ආරාධනාකොට හුනස්නෙන් නැගී බුදුන්වැද ප්‍රදක්ෂිණාකොට

සවකීය රජමැදුරට නියේය. දෙවෙනිදා අළුයම්හි බුදුන් දුටුනුදුටු අවිලොස් කෙළක් පමණ මනුෂ්‍යයෝ බුදුහු දක්නා පිණිස රජඝහනුවරින් නික්ම අවුත් බුදුන් වැඩඋන් උයනට තුන් ගව් පමණ මාගීයෙහි මුහුදු හැලුවාසේ අතුරු සිදුරු නැතිව රැස්ව සිටගත්හ; සිඟලු ඡට්ටවනොද්‍යානයද මනුෂ්‍යයන් ගෙන් ගැවසී ගියේය; මහජනයෝ තමන්ගේ ඇස් පසුරෙන් බුදුන්ගේ රූ මුහුදු පිහිනා පරතෙර නොම දුටුවාහුමය. මෙසේ දෙතිස්මහ පුරුෂ ලක්ෂණයෙන් සැදුම්ලද අසුඅනුව්‍යඤ්ජනයෙන් දිලිසෙන බුදුන්ගේ ශ්‍රී ශරීරය දක්නා මනුෂ්‍යයන්ගේ ඇස් හයාගත නොහි මෙන්ද, සිත් හයාගත නොහිමෙන්ද, පා හයාගත නොහිමෙන්ද, උයනත් මහත් අතුරු නැතිව ගැවසී සිටි කල්හි, එක් පැවිජි කෙනෙකුදු නික්මෙන්නට අවකාශ නැතිවිය; එකල බුදුන්ගේ පුණ්‍යානුභාවයෙන් සක්දෙවිරජතුගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය; එකෙණෙහිම ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ මේ කිමෙක් දෝ හෝයි දිවැසින් බලනුයේ, තමා උපෙක්ෂා වුවහොත් බුදුන් ප්‍රමුඛ මහාසංඝයා සුන්බත් වනබැව් දැන, තරුණවූ මානවක වෙශයක් නිම්මිත කොට ගෙණ සෝළඳඹුකඩක් අතින් ගෙණ තුණුරුවන් ගුණපිළිසයුත් සතුතිවචන කියමින් බුදුන් පෙරමග සිට තමාගේ ශක්‍රානුභාවයෙන් තුන්ගව් පමණ තැන හාත්පසින් පිරිසිවගත් ඒසා මහපිරිස් දෙබැකොට පිරිස් පලා නික්මින; එකල මනුෂ්‍යයෝ මේ තරුණ පුරුෂයාගේ වික්‍රම හා රූප ශොභාවද දැකීනය කොට, මේ දරු ඉතා රිසිතෙනෙක, ඉතා බුහුටි කෙනෙක, මෙවැනි තරුණ පුරුෂයෙකු මෙතෙක් දවස් මේ නුවර අපි නුදුටු විරුම්හ; තෙපි කොයිසිට ආවාහුදැයි විචාරති; එකල ශක්‍රතෙමේ:—

"සොසො සඛබ්බි දෙනෙනා, බුදෙධා අපපටි පුගගලෝ
අරහං සුගතෙනා ලොකෙ, නාසාහං පරිචාරකෝ."

යන මේ ගාථාවෙන්, මම තුන්ලෝ මුදුන් පත් බුදුන්ගේ දාස යෙක්මි සි කියා; එකල බුදුහු ශක්‍රයා විසින් අවකාශකොට දෙනලද ඒ මාගීයයට ප්‍රවිෂටව, දහසක් පමණ මහරහතුන් විසින් පිරිවරණලදුව රජගහනුවර බිම්සර මහීපාලයන්ගේ රාජමන්දිරයට වැඩිසේක.

එකල රජතෙමේ බුදුපාමොක් මහසඟපිරිසට දන් දී, විළඳ අනතයෙහි එකත්පස්ව හිඳ "ස්වාමීනි, මේතැන්පවන් ජීවිතානතය දක්වා තුණුරුවන් විනා වාසයකළ නොහෙමි, සිතූ යම් විවෙක දැක චිදගන්නා කැමැත්තෙමි; යෂට්ඨවනොද්‍යානය ඉතා දුරය, එබැවින් මාගේ මේ කලඳුකනිවාප නම්වූ වෙළුවනය ඉතා ලඟ බැවින් හා බුදුකෙනෙකුන්ට සුදුසු සෙනසුනක් බැවිනුත්, බුදුනට

රිසිසේ වඤ්චනව මාගේ මේ උයන පිළිගතමැනවයි කියා රන් කොතුරැයෙන් සම්ඥයන්වහන්සේගේ ශ්‍රී හස්තයෙහි දක්ෂිණොදක පය හෙළා ඒ වෙළුවනාරාමය පිළිගැන්වූසේක; * එකෙණෙහි බුදුසස්න මුල්බටහිර මහාපෘථිවිය රාව ප්‍රතිරාව දෙමින් කම්පිත විය; බුදුහු වෙළුවනාරාමය පිළිගෙණ රජගව අනුමොදනාකොට හුන්නස්තෙන් නැඟී මහසඟ පිරිස් පිරිවරා වෙළුවනාරාමයට වැඩිසේක.

අග්‍ර සව් දෙනම පැවිදි කරවීම.

රාජගහනුවරට නුදුරු උපතිස්සය, කොලිතය යන බමුණු ගම් දෙකක්විය; එහි දෙකෙහි ශාරිය, මොග්ගලිය යන නම් ඇති බැමිණියන් දෙදෙනාහට දරුදෙදෙනෙක් ඇතිවූහ; ඔවුහු උපතිස්සය, කොලිතය යන ග්‍රාම්‍යනාමයන්ගෙන්ම ප්‍රකටවූහ; බ්‍රාහ්මණ මහාසාරකුලයෙහි උපන් මේ දෙදෙන ඉතා විචක්ෂණවූ වෙදත්‍රයෙහි පරතෙරට පැමිණි විශාරද බුද්ධිමත් තැනැත්තෝ වූහ; වැලිකෙළියේ පවත් යහළුවූ මේ දෙදෙන එක් දිනක් රැගුම් බැලීම පිණිස ක්‍රීඩාමණ්ඩලයකට පැමිණි කල්හි යම්කිසි කරුණක් සඳහා සසර කළකිරී නොසතුටුව, මේ කෙළි නම් සසරින් ගැලවීයන උපායෙක් නොවෙයි, මෙවක් පවත් ක්‍රීඩා වෙහි නොයෙදී නිවන් සොයම්හයි මනත්‍රණයකොට කවරෙකු ගුරු තනතුරෙහි තබා නපස්කරම්ඒහෝසි පරීක්ෂාකොට එසමයෙහි රාජගහනුවර ලාභයෙන් හා යසසින්ද අග්‍රව වසන සඤ්ජය නම් පරිබ්‍රාජකයාගේ තතු අසා ඔහු කරා එළඹ තවුස් වෙස්ගෙන සිප දිනක් උන්කෙරෙහි වැස තමන් බුද්ධිමත් බැවින් ඔහුගේ සමයෙහි නිවන් මගක් නැතිබව දැන දඹදිව මුලුල්ලෙහි ඇවිද, නිවන්මග පානාතරම් ගුරුකෙනෙකුන් නොලැබ ආපසු රජගහනුවරටම පැමිණියෝය.

ධර්මදූතභාවයෙහි යෙදී සඤ්චාරණය කරන්නාවූ අස්සජි තෙරුන්වහන්සේ රාජගහනුවරට පැමිණි දෙවෙනි දින එහි ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසුරුණේය, එකල පෙරකී මිත්‍රයන් දෙදෙන අතුරෙන් උපතිස්සනම් පරිබ්‍රාජකයා අස්සජී තෙරුන් වහන්සේගේ උප සමයෙහි පැහැදී පසුපස්සෙහි හොස් උන් වහන්සේ වළඳා අනතරයෙහි, පරිබ්‍රාජකයා බොහෝ ආදර දක්වා "ස්වාමීනි, ඔබවහන්සේලේ ඉන්ද්‍රියයෝ ඉතා ප්‍රසන්නයහ; ඔබගේ කාය වාක් සමාචාරයද ඉතා හොබනේය; ඔබවහන්සේ නිවන් මග දන්නා සේකැයි හඟිමි, එබැවින් ඔබවහන්සේගේ ගුරුහු කවුරුදැ"යි විමසූයේය එබසට තෙරුන්වහන්සේ, "පින්වත්නි,

* මෙය සම්ඥයන් වහන්සේ විසින් පිළිගනුලැබූ පළමුවෙනි ආරාමයයි.

මාගේ ගුරුහු නම් **සව්තේගෙවාදත්** ලොවුතුරා බුදුරජාණෝයනි වදුලසේක එකල පරිබ්‍රාජක තෙමේ කියන්නේ, "සබ මිනි, එසේවී නම් ඔබගේ ගුරුහු විසින් වදුල අවවාද පදයක් මවද වදුල මැනවැ"සි අසාදැ සිටියේය. එකල **තෙරුන්** වහන්සේ විසින්:—

"සෙඨම්මා හෙතුප්පභවා තෙසං හෙතු තථාගතෝ
ආහ තෙසඤ්ච යෝ නිරොධෝ එවංවාදී මහාසමණෝ."

යන මේ සතරපද ගාථාවෙන් බණ කිකල, හේතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. ඉක්බිති **උපතිස්ස** නම් පරිබ්‍රාජකයා සධකිය යහළුවූ **කොලිත** නම් පරිබ්‍රාජකයා කරා එළඹ මෙපවත් කියා එම ගාථාවෙන් බණ කිකල්හි හේද සෝවාන් ඵලයෙහි පිහිටියේය. ඉක්බිති ඒ දෙදෙන තමන්ගේ ගුරුවූ **සඤ්ජය** පරිබ්‍රාජකයා අත්හැර සිය පිරිස් කැටුව බුදුහු කරා එළඹ ධම්මය අසා පැහැදුනෝය; ඉක්බිති **සම්මැදගන්** වහන්සේ ඔවුන් දෙදෙන එහි භික්ෂුභාවයෙන් **මහණ** උපසම්පද කළසේක; **මුගලන්** මහ තෙරුන් වහන්සේ මහණවූ සත් දවසින් **මගධ රට කල්ලවාල** නම් **ගමදී** බුදුහු විසින් දුන්නාවූ ධාතුකම්මසථානය අසා රහත්වූ සේක. දම්සෙනෙවි **සැරියුත්** මහතෙරුන් වහන්සේද මහණවූ පසළොස් දිනකින් උන්වහන්සේගේ බෑනනුවූ **දිඝනඛ** නම් පරිබ්‍රාජකයන්ට **රජගහ නුවර ගුරුකාල** නම් ලෙනේදී බුදුහු විසින් දෙශනාකළ "**වෙදනාපරිග්‍රහ**" නම් සූත්‍ර දෙශනාව අසා රහත් භාවයට පැමිණියේක; බුදුහු එමද, **සවස්** වේලෙහි ශ්‍රාවකගණයා රැස්කොට, සැරියුත් මුගලන් (සාරිපුත්‍ර මෞද්ගල්‍යායන) දෙදෙනා වහන්සේ අගසව් තනතුරෙහි තබා දෙසිය පණසක් මහරහත් සංඝයා සමග වැඩහිඳ නවන්මස පුණු පොහෝ දවස්හි, සියලු බුදුවරයන්ගේ අත්නොහරණලද චාරිත්‍ර ධම්මයෙක්වූ:—

"සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පද,
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං*"

යන මේ චතුෂ්පදික ගාථාවෙන් ධම්මදෙශනා කළසේක; එතැන් පටන් සැරියුත් මුගලන් අගසව් දෙදෙනා වහන්සේ බුද්ධශාසන නමැති නිලාකාශයෙහි ග්‍රාජමාන වන්නාවූ හිරු සඳු දෙදෙනාසේ බුදුසසුන් හොබවාළු සේක.

---

* මෙසි ගාථාය සියලු පාපකර්මයන් නොකිරීමද, කුශලකර්මයන් ඉපදවීම හා වැඩීමද, තම්හිගේ සිත පිරිසිදු කරගැනීමද යන මේ සියල්ල සකල බුදුවරයන්ගේම අවවාද ශාසනයි.

සම්ඳයන්වහන්සේගේ කිඹුල්වත් පුරප්‍රවේශය.

සිදුහත් කුමරුන් මහබිනික්මන් කළතැන් පටන් තොර තුරු විහාගකරමින් සිටි සුදෙවුන් නරදෙවතෙමේ මපුතනුවූ සිඛාඪී කුමාරතෙම සාවුරැද්දක් මූලුල්ලෙහි දුස්කරක්‍රියා කොට ලොවුතුරා බුබඬියව පැමිණ පවත්වනලද ධම්මචක්‍රය ඇතිව දැන් රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවාසය කෙරේයයි අසා ඉතා සතුටුවූයේ, එක්තරා අමාත්‍යයෙක් කැඳවා "පින්වත්නි තෙපි රාජපුරුෂයන් දහසක් පිරිවරා රජගහනුවර වෙළුවනාරාමයට හොස් බුදුහු දැක වැඳ මාගේ වචනයෙන් මෙසේ කියව්; "සවාමිවූ බුදුරජාණන්වහන්ස ඔබවහන්සේගේ පියවූ සුඬොදන නරශ්‍රේෂ්ඨතෙමේ ඔබවහන්සේ දකිනු කැමැත්තේය"යි කියා, සම්ඳයන්වහන්සේ කැඳවාගෙණ එව"යි කීවේය අමාත්‍යතෙම මැනවයි කියා සුදෙවුන් මහරජතුගේ වචනය මුදුනෙන් පිළිගෙන රාජපුරුෂයන් දහසක් විසින් පිරිවරණලදුව වහාම සැටයොදුන් මගගෙවා රජගහනුවරට හොස් වෙළුවනාරාමයෙහි සිවිපිරිස් පිරිවරා ගුවන්මැද සඳක්සේ වැඩහිඳ ධම්මදෙශනා කරණ බුදුහු දැක රජතුගේ මෙහෙවර අසුන තබා බණ අසාගත මැනවයි සිතා පිරිස් අතතයෙහි සිට බණ අසා සඟපිරිවරින් රහත්ව එහිහික්ෂුභාවයෙන් පැවිදිවිය; රජමට අසුන් මාත්‍රයක් වත් නියා එන එනද නොනෙක් නැත; රජතෙමේ මෙසකාලය ප්‍රාර්ථනාකරණ මයුරරාජයක්හුසේ සම්ඳ නමැති මහාමෙඝය කවර දවසෙක දැක්කෙමිදැ හෝයි ප්‍රාර්ථනාකරන්නේ පෙර මග බලාසිට විඩාව නැවතත් අනික් අමාත්‍යයෙකු කැඳවා දහසක් රාජපුරුෂයන් සමග මගුල්වෙස් ගන්වා පෙරසේම උගන්වා පිටත්කෙළේය; ඒ ඇමතියාද පළමුනියායෙන් බණ අසා රහත්ව එහිහික්ෂුභාවයෙන් පැවිදිවිය; මෙසේ නියමිත දවසින් පසු නියමිත දවසෙහි නවවාරයෙක නවමහ අමාත්‍ය කෙනෙක් නවදහසක් පිරිස්දී පෙරසේම ගැවුවාහුය; මෙසේ නියමිත ඇමතියෝ සඟපිරිවරින් රහත්ව එහි භික්ෂුභාවයෙන් පැවිදිව අසුන්තබා සසුන්වැද මාගීඵල සුවවිඳිනානුය. සුදෙවුන් මහරජානෝ අස්නකුදු ඇරගියන කෙනෙක් නොලදින් එතක් දෙනා අතුරෙහි මව සිතැත්තෙක් නොමැත්තෙන් මට හස්න කුදු ඇර නොගිහ; මා කිවක් කරන්නෙක් කවරහෝයි බලනුවෝ, තමන්ගේ හැම කායසාධනයෙහි ඇතුළත් විශ්වාස ඇති, පුතනුවන් හා එකද, උපන් වැළිකෙළියෙහි පටන්ගණ ඔවුන් හා පුරුදු සබඳ කාලුදායිනම් ඇමතියානන් කැඳවා, පුත කාලුදායිනි, මපුතනුවන් දකිනු කැමැත්තෙන් නව වරෙක නව දහසක් පුරුෂයන් කැටුව නවමහඇමතියන් යව්වෙමි; එකකු අවුත් අස්නකුදු නොගියය; ජීවිතය නම් නියත නැත්මය;

එබැවින් මා ජීවත්ව සිටිතකල මාගේ පුතනුවන්ගේ මහතර ශොභාවන් දකිනු කැමැත්තෙමි; එහෙයින් තොප හා එක කෙළිමඩුල්ලෙහි වැඩුනාවූ තොප හා ඉතා යහළුවූ මපුතනුවන් සිඛාවීඝුමාරඝාතන්, තෙපි රාජපුරුෂයන් දහසක් පිරිවරාගොස් මා ඇස දක්වාලිඅහේදැයි විචාලේය; මහරජ මම ගියෙමි නම් ඔබපුතනුවන් ඇස දක්වාලමි; නුමුත් බුදුහු දවුවිට උන්වහන්සේ කෙරෙහි මහණ වෙන්නව අවසර ලදිමි නම් යෙහෙකැයි කිය; එබසට මහරජ, පුත තොප පැවිදිවූවාහෝ නොවූවා හෝ පුතනුවන් මා ඇස දක්වාලිය යුතුයයි කිවේය. ඉක්බිත්තෙන් කාලුදායි නම් අමාත්‍යයාණෝ රජහු වැඳ සමුගෙණ දහසක් ඇමතියන් හා සමග මගුල් වෙසින් ගොස් බුදුහු දම්දෙසන වේලෙහි පිරිස් අතතෙහි සිට බණඅසා සහ පිරිවරින් රහන්ව එහි භික්ෂුභාව යෙන් පැවිදිවූහ; ඒ උදායි සථවිරයන් වහන්සේ එතනව පැමිණ පැවිදිලත් සත්අට දවසක් අනික්‍රාන්තවූකල මැදින්දින පුර පසලොස්වක් පොහොය දවස සම්ප්‍රාප්තවිය; එදවස්හි උන් වහන්සේ සිතනසේක් දැන් හෙමන්තකාලය ඉක්මගොස් වසන්ත කාලය පැමිණියේය. සියලු භූමිභාගය නිල් පිතතයෙන් ගැවසී ගත; සියලු වනලැහැබද නන්වැදුරුම් මල්පල්ලෙන් සැදී විසිතුරුව සිටගත්හ; එහෙයින් දශබලධාරිවූ බුදුන්ගේ ඤාති සංග්‍රහයට කල්වන්නේයයි දැත භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ පසඟපිහිටුවාවැඳ ශාස්තෘන්වහන්ස්ව අභිමුඛව දෙහොත් මුදුන්දීහිද ගමන් වණිණෙනාකරන්නාවූ සථවිරයන්වහන්සේ:-

"අඝාදිනොදුනිදුමාභදනෙන, ඵලෙසිනෝ ජදනං විපපභාය
තෙඅච්චිමනනාව පභාසඤනති, සමයෝ මහාවීර භගිරථානං
නාතිඝිනං නාතිලණහං, නාතිදුබගිකඤ ජාතඤං
සදදලා හරිතා භූමි, එසකාලෝ මහාමුනි."

මේ ආදි කථා සැවකින් මාහිහ වණිණණාකොට බුදුහු කුලනුවරට එළඹියමනා පරිදිකියා ගමන් පැණවිය. ඉක්බිත් තෙන් බුදුන් කිමෙක්ද උදායිය කවරකාරණයකින් මධුරසමර යෙන් ගමන් වණිනාකරන්නේදැයි විචාරා වදුලකල්හි, උදායි සථවිරයන් වහන්සේ දන්වනසේක්, "සවාමිවූ බුදුරජානන් වහන්ස, ඔබවහන්සේගේ පියවූ සුඛොදන මහරජානෝ ඔබ වහන්සේගේ බුඩ මහිමතාව දක්නාකැමතිව මා ඇතුළුවූ අමාත්‍ය යන් දසදෙනෙකු දසදහසක් රාජ පුරුෂයන් කැටුව දශබාර යෙන ඔබවහන්සේට දූත මෙහෙවර පිණිස එවා, තව දක්වාත් දැකගතනොහී මග බල බලා හිරු උදය ප්‍රාප්තා කරන්නාවූ පියුම්විලක්සේ ඔබවහන්සේගේ දැක්ම ප්‍රාප්තානාකාමව හිඳිති; කවද ඔබවහන්ස්සේ මව් පිය දෙපසඟයෙහිම බන්ධුසමූහයාද

සඳරැස්පතන නොමුදා සමූහයක්සේ ඔබවහන්සේගේ මුඛ වඳුරා ගෙන් නික්මෙන දෙශනා නමැති රශ්මිඝදමඛය පතපතාම හිඳිනේය; ස්වාමීනි ඔබවහන්සේගේ පිය මහ රජාතන් ආදිවූ ඤාතිසමූහයාට අනුග්‍රහ පිණිස කිඹුල්වත්පුරයට වැඩවදුළ මනා කාලය"යි ආරාධනා කළසේක.

එවේලෙහි සම්බුදයන්වහන්සේ, පූර්ව බුදුවරයන් බහුශ්‍රුත සංග්‍රහකළාවූ කාලය මේයයි දැන, මාගේ බුධවංශ චරිතය කෙරෙමිසි සිතා, "මැනව උදායිය බන්ධුසංග්‍රහයඩ යන්නෙමි; එබැවින් ගම්නවත්පුරා නික්මෙනසේ නිඝ්‍රන්ථ තෙපිම ඉහාස් කියා රැස්කරව්ය"යි වදුලසේක. එකල්හි උන්වහන්සේ බුදුන් වදුල බස් මුදුනෙන් පිළිගෙණ, එතෙණෙහි එපවත් නිඝ්‍රන්ථ දන්වා අහු මඟඩ දෙරටින් මහණව රහත්වූ දසදහසක් දෙනා වහන්සේ හා කිඹුල්වත් නුවරින් රජමෙහෙවර පිණිස අවුත් මහණව රහත්වූ දසදහසක් දෙනා වහන්සේයයි, මෙසේ විසි දහසක් රහතන්වහන්සේලාම, එක වචනයෙන් සහනඩවූ යුඩ භව පෙළුක්සේ, අහසට අත්පොවා ඝන වලාපවලයෙන් ඇද ඇද හැර පෙරවහන්නාසේ, ශොභාසම්පන්නවූ සුරකතවූ පාං ඉකුල චීවරධාරීව අවුත් බුදුරජානන් වහන්සේ පිරිවරා සිටගත්හ; එකල සම්බුදයන් වහන්සේ යථොක්ත මහරහතුන් විසිදහස විසින් පිරිවරණලදුව රජගහ නුවරින් නික්ම, රජගහනුවර පවන් කිඹුල්වත් පුරයදක්වා සැවෙයොදුන් මාඝීය සැව දිනකින් යන්නෙමියි සිතා දවස දවස යොදුනකතැන් බැගින් මහ ගෙවා තරුපිරිවැරූ පුන්සඳමඩලක්සේ දුටු දුටුවන් ඇස් නිවමින් අපරිමිත බුඩ ශ්‍රීලාසයෙන් වඩින්ට පටන්ගත්සේක. එකල උදායි සථවිරයන් වහන්සේ බුදුන් නික්මූහ පරිදි සුදොවුන් මහරජා නන්ට දන්වා සතුටුකරවමැයි සිතා, බුදුහු නික්මූහු දෙවෙනිදා උදෑසනම අකාශයෙන් වැඩ රජහුගේ ප්‍රාසාදයෙහි පෙනී ගිය සේක; එකල්හි සුදොවුන් මහරජාණෝ ඒ මහතෙරුන් වහන්සේ දැන ඇඳින පස්වණක් ප්‍රීතියෙන් පිණාගොස් පෙරමගට දිව තෙරුන්වහන්සේ අතින් පාත්‍රයගෙණ සිංහාසනයෙහි වඩා හිදුවා ආගිය කොරතුරු විචාරා තමන්ට පිළිගෙළ කරතිබූ නොයෙක් රසමසවුලෙන් යුත් රාජභොජනයෙන් පාත්‍රය පුරවා තෙරුන් වහන්සේට පිළිගැන්වූහ. ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ ආසනයෙන් නැගිට වඩිනාකාර දැක්වූකල්හි, රජතෙම "ස්වාමීනි වැඩහිඳ දන්වළඳ වදුළ මැනව"යි ආරාධනාකළේය; තෙරුන් වහන්සේ "මහරජ බුදුන් සම්පයවගොස් වළඳන්නෙමැ"යි කී සේක; "ස්වාමීනි දැන්වනාහි මපුතනුවෝ කොතැන්හි වැඩවාස කරණසේක්ද" යි ඇසූකල්හි තෙරුන්වහන්සේ කියනුයේ, "මහ රජ බුදුහු නොප දක්නා පිණිස විසි දහසක් මහරහතුන් විසින්

පුරවරණලදුව වඩිනෝය"යි සැළකෙළේය. එකල්හි රජහුගේ සකල ශරීරයෙහි රෝමාඤ්චතව සිටගත්හ; මෙසේ ප්‍රීතියෙන් හටගත් විතක්කසහගතාන ඇති සුදෙවුන් විහිපල්තෙමේ "සවාමිනි මේ ආහාරය ඔබවහන්සේ විසින් වළඳා වදාළමැනව"යි කියා වැළඳූ අනතරයෙහි ඒ පාත්‍රයෙහි සෝදා සිවදසුන්නෙත් උලා පිරිසිදුකොට පෙර හිඟිව වසා කල අනුභවකොට පුරාදු සුවඳ හැල්සාලේ බත් හා මාංසයෙක් සූපව්‍යඤ්ජන රසයෙන් පාත්‍රය පුරා, මපුතනුවන් මාකෙරෙහි ස්නෙහඇතියානම් අනික් දානයක් කොවළඳා මාගෙන් මයවූබත් වළඳන්ව වදාළමැනවයි ආරාධනා කොට, මේ නුවරව වඩනානාක්ෂණ අතුරුමඟහව මගෙන් පිණ්ඩපාත දානය ඔබවහන්සේම ගෙණයනසේකවයි කියා පාත්‍රය තෙරුන්වහන්සේට අත තබාළැසේක.

එකල්හි තෙරුන්වහන්සේ, මෙතැන්පටන් ආකාශයෙන් මා යන නියාවත්, පාත්‍රය බුදුන්ට පිළිනන්වනතියාත් බුදුහු ඒ දානය වළඳන නියාවත් රජහට පෙනේවයි අධිෂ්ඨානකොට හුනස්නෙන් නැගී හැමදෙනම බලාසිටියදී පාත්‍රය නීලභෘඞ්ග රාජයෙකුසේ රටුව හැර තමන්වහන්සේද පියුම් වනයකට ගමන්ගත් රාජහංසලීලාවෙන් ලීලාපෙතව අහසින්ම වැඩ පාත්‍රයගෙණ බුදුන්ගේ ශ්‍රී හස්තාග්‍රව පිළිනැන්වූසේක; බුදුහු ඒ බතම වැළඳූසේක; මෙම ක්‍රමයෙන් තෙරුන්වහන්සේ දවසක් පාසා බත්පාත්‍රයක් බැගින් පිළිගන්වන්නේය; බුදුහු ඒ බත වළඳා වදාරන්නේය; මෙසේ උදායි සථවිරයන් වහන්සේ දිනපතා රාජමන්දිරයට ප්‍රවිෂ්ටව අද බුදුරජතෙම මෙතෙක්තැන් ඉක්මවා වැඩිසේකැයි යනාදීන් අනෙක ප්‍රකාරවූ බුධගුණ ප්‍රතිසංයුක්ත ධාම්මික කථාවන් කියා කියා සුඛෝදන රජ ප්‍රමුඛවූ සියලු රජ කුලය පැහැදවූසේක; ඒ කාරණයෙන් සම්මඤ්ඤන්වහන්සේ උන්වහන්සේට, "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං කුලපපසාදකානං යදිදං කාළුදායි" යනුවෙන් මේ ශාසන යෙහි කුලඥන් පහදවන්නවුන් කෙරෙහි කාළුදායි තෙරුන් වහන්සේ අග්‍රතැන්පත්කොට තනතුරු දුන්සේක. මෙසේ රජගහනුවරින් මැදින්මස පැලවියදී පිටත්වූ සම්මඤ්ඤන්වහන්සේ දෙමසක් අතික්‍රාන්තකොට සැටයොදුන් මාර්ගය ඉක්මවා වෙසඟ මැදි පුණුපොහොදා කිඹුල්වත්පුරයට (කපිලවස්තු පුරයට) පැමිණිසේක.

සම්මඤ්ඤන්වහන්සේ ඥාතිප්‍රාතිහාර්‍යය දක්වා නෑගන් වැන්දවීම.

තවද එක්ලක්ෂ සැටදහසක් ශාක්‍යරජදරුවෝ අපගේ නෑ උතුමා අද දක්නට ලබම්හයි සතුටින්රැස්ව විසිදහසක් රහතුන් හා සමග අප භාග්‍යවතුන්වහන්සේව විසිමවු විවෙකස්ථානයක්

වීසයුතු බැවින් කවරනම් තැනක් සුදුසුදැ හෝයි පරීක්ෂාකරන්
නානු නිග්‍රොධ නම් ශාක්‍යරජහුගේ උයන ඉතා රම්‍යයයි නිශ්චය
කොට එහි කළමනාවූ රාත්‍රිස්ථාන දිවාස්ථාන වඩක්‍රමනාදී විහාර
කර්මාන්තකරවීමට මන්ත්‍රණයකොට, ඒ හැම ශාක්‍යරජදරුවෝ
සවභාවයෙන්ම මානී බැවින් මෙසේවූ කතිකාවක් කළාහුය;
සිඛාඪිකුමාරයෝ තමන් බුදුවූබවමුත් අප අපගේ බාල මලනු
වෝය, බැණනුවෝය, මුනුබුරුනෝය, එහෙයින් හැමදෙනම
වඳිනව නොහැන්කම්හ; සෙසු ලොකයෙහි මහළු රජදරුවෝද
දැන් උන් වඳිත්මය; මිනිසුන්තබා දෙවියෝ දක්වාත් උන්වඳිත්
මය; එසේ ඇතිකල අපි නොවැඳ සිටියමෝනම් ලොව මහත්
අයසකුදු උපදනේය; අනෝ මීව කුමක් කරමෝදැයි කතිකා
කරන්නාහු; ඔවුන් අතුරෙන් සමහරෙක් කියන්නාහු, මීට සොඳ
උපායෙක් අපි දනුම්හ; අපගේ සියලුම ලදරු කුමාරයන් ඉදිරි
යෙන් සිටුවා ඔහු හැම වඳිනකල්හි අපිද වඳින්නාක්හුමෙන්
ඔවුන්ගේ පිටිපස ලස්වම හිඳගණුම්හ; එවිට මේ අපගේ සිදුරු
කිසිවෙක් නොදක්නේයයි කිවුල; ඒ අසා හැම ශාක්‍යරජදරු
වෝම සම්මාධිව මේ උපාය අතිකක්හට නොහඟවා රැක්කයුතු
යයි සම්මතකොටගෙණ බුදුහු වඩනා මඟ යොදුනක් පමණ
තැන් අලඞ්කාත කරවා පෙරගමන්කරණාහු සියලු අලඞ්කාර
යෙන් ශෝභමානවූ සොළොස්හැවිරිදි සිටුකුමාරයන් හා සිටු
කුමාරිකාවන්ද, එසේම සොළොස්හැවිරිදි ශාක්‍යකුමරුවන්
හා ශාක්‍ය කුමාරිකාවන්ද පන්සිය පන්සියබැගින් සරහා සුවඳ
මල් ධජ පතාකාදි නානාවිධ පූජාභාණ්ඩ ගත් අත් ඇතිව
පෙළින්පෙළ යනසේ සලස්වා තුමූ හැමදෙන නිග්‍රොධ නම්
ශාක්‍යරජහුගේ උයන්හි සියලු ප්‍රාසාද කූටාගාර මණ්ඩපශාලා
රාත්‍රිස්ථාන දිවාස්ථානාදීන් සමලඞ්කාතකොට විහාර කරවා, සිව්
දැහඳ සංමිශ්‍ර නීලවර්ණිණභාමයෙන් උලා ලදපස්මල් විසුරුවා
සුදු වියන් බඳවා සුවඳමල්දම් ආදියෙන් අලඞ්කාත කොට ඒ
උයනද ශක්‍රයාගේ නන්දනෝද්‍යානසේ සරහා නිම්කල්හි, ඒ
හැම රජදරුවෝ තමන්ගේ පිරිවර සමඟ බුදුහු වඩනා පෙර
මගට යියාහුය. සම්බුද්ධයන්වහන්සේ ඒ ආරාමයට වැඩ විසි දහ
සක් රහතුන් පිරිවරා පණවනලද බුද්ධාසන මස්තකයෙහි
බලාකී මණ්ඩලයසේ ශොභාසම්පන්නව වැඩහුන්සේක.

ඒ දැක, බුදුගුණ නොදත් අභිමානයෙන් ඒ හැම ශාක්‍යරජ
දරුවෝ ලදරුකුමරුවන් ලඟට කැඳවා "දරුවෙනි තෙපි අපව
පෙරටුපෙරටුවසිට සිඛාඪිකුමාරයන් වඳිව්; අපි තොප හැමට
පසුවලා නොඅඟවාහිදුම්හ; මේ රහස කාටවත්නොදන්වව්ය" යි
උගන්වාලූහ; එබස්අසාබුදුන්ට වෑසීන් බාලවූ රජ කුමරුවෝ

පෙරවූව සිව බුදුහු වැද මහළු නැඟන්ව අවකාශ නොදීම දහස් ගණනාක් ඉදිරිපිට සිටගත්හ; ඉක්බිති සුඛොදනරාජ ප්‍රමුඛවූ මහළුනැඟෝ තමන්වහන්සේ නොවැද උන්හෙයින් පැත්පැදිස්නා නෙත්සඟලින් සතුසිසමූහයාබලා ඔවුන්ගේ අදහස් දැන මොවුන් මට වඩා වයසින් වැඩිමහල්හෙයිනුත් බුදුබල නොදත් හෙයි නුත් මොහයෙන් මුළාව මා නොවඳනාහුය; පූර්ව සම්බුදුරජෝ සතුන්ගෙන් කෙසේ වැදුම් ලද්දාහුයසි බලනුයේ, ලොව අද්භූතවූ බුදුබල ප්‍රකාශකොට වැදුම්ලද්දාහුදැයි දැන, ඒ බුඩවංශ චාරිත්‍රානුකිරීමෙන් නැඟන්ගෙන් වැදුම ලබම්හයි සිතා වදුරා පිතකසිණ සමාපත්තියටසමවැද දසඳහසක් සක්වල පූර්වක්‍ර වාඩයෙහි පටන් පශ්චිම වක්‍රවාඩය දක්වා අතිශයින් ශොභමා නවූ රුවන්සක්මණක් මවා නහසතලොදහතව සත රත් තදක්සේ සවණක්රැසින් දිලිහිදිලිහි ඒ රුවන්සක්මණට නැගි තමන්වහන්සේට අනිමානයෙන් නොවැදහුන් නැඟන්ගේ යිමි මසතකයෙහි පාදපාංශු පත්තය කරන්නාක්හුසේ එහි සක්මන් කරන්ට පටන්ගෙන ශරීරයෙහි ඒ ඒ තැනින් ගිනිකඳ දියකඳ හරින්වවන්සේක. මෙසේ භාග්‍යවතුන්වහන්සේ තමන් නොව දුම්හයි මාන සහිතවූ සතුසිසමූහයා මඩ්‍යයෙහි අහසටපැන්නැගී රුවන්සක්මණක් නිම්මිතකොට එහි මහත්වූ ශමකප්‍රාතිහාර්‍යය දක්වා දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේගේ ආරාධනාවෙන් බුඩවංශය, අනාගතවංශය යන දෙශනාවය තමැති සඩම් වම්‍රාව වස්වා නැඟන්ගේ සිත්නමැති පැවිවියෙන් නැගි කෙලෙස් නමැති රජස් පහකොට ආකාශයෙන් බස්නා පුන් සඳක්සේ බැස පළමුව වැඩහුන් බුඩාසනමස්තකයෙහි වැඩහුන් සේක; ඒ ආශ්චර්‍යය දුටු සුදොවුන් නරශ්‍රෙෂ්ඨයෙමේ සතුටු කදුලුවගුරුවමින් මේ මාගේ තුන්වෙනි වැඳීමයයි කියා සම්බුදුයන්වහන්සේට නමසකාරකළේය; රජහු වැඳිකළ අවශෙෂ සතුන්හුද නමසකාර කළහ. එකම රජෙකුදු සම්බුදුයන්වහන්සේට නමසකාර නොකර සිටීමට අපොහොසත් විය.

සම්බුදුරජාන්වහන්සේ පියමහරජහුගේ මාලිගාවට පැමිණීම.

මෙසේ සම්බුදුයන්වහන්සේ එදා බඹුසමාගමයෙහි මුදුන් පැමිණ සඩම්මාමෘතයෙන් අභිශෙකය දුන්කල, ඒ ශාක්‍යරජ දරුවෝ බණඅසා නුවරට යන්නාහු, සඩම්ප්‍රීතියෙන් සිහිමදව එකම රජෙකුදුවේවයි රාජමහාමාත්‍යයෙක් වේයයි පසුදින දානය පිණිස ආරාධනානොකළාහුය; සම්බුදුයන්වහන්සේ එදින රෑ නිග්‍රොධාරාමයෙහි දවස්යවා අරුණෝදයමන වේලෙහි මහා කරුණා සමාපත්තියෙන් නැගිසිට, බිරුරශ්මින් ප්‍රබෝධවන

පද්මයක්සේ දෙඉනාරශ්මීන් ප්‍රබොධවන්නාවූ ආර්‍යභූමියට අවතීර්ණවීමට යොග්‍යවූ විනෙය පුද්ගලයන් බලාවදුරා, උපස්ථායකයන්ව අනුග්‍රහසඳහාද ශරීරයට සුවසඳහාද දැවටි කෘත්‍යය නිමවා නිඝ්‍යාටන වේලාව දක්වා විවිධනවූ ආසනයෙහි වැඩහිඳ සමවත්සුවෙන් කල්යවා නිඝ්‍යාටනවේලාවෙහි, ලාඝ්‍යාරසයෙන් තෙත්වූ අභිනව ප්‍රබුධ කොබෝලීලමල් පෑඟැනි සුරක්තවූ දෙපට අඳනා සිවුරෙන් ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනයෙන් සකසාගැඳ, ඊමතු පිට පටිදබැඳ, ශමන්ගත් පූණිච්චඳයා සඞ්ඝ්‍යා වලාපවලයකින් වසන්නාසේ නිග්‍රොධ ඵල සමවණ්ණවූ සුගත්මහපවුල් සඟල සිව්වර පොරවා පාත්‍රය අතින්ගෙණ විසිදහසක් මහරහතුන් පිරිවරා අනන්නාපරිමාණ ප්‍රාතිහාර්‍යඍද්ධ්‍යාදේශනාවෙළින් පිවුපිණිස හැසුරුණුසේක. එකල්හි ආරාධනාකිරීමය, පාත්‍රය ගැණීමය යනාදී ව්‍යවහාර දන්නන් නැතිසෙයින් හැම මනුෂ්‍ය ලෝම බුදුහු දැක විෂමයපත්ව බලබලාම සිටිති; බත්සැන්දක් ගෙණ එනාසේක් නොදනිති; පාත්‍රය ගන්නාසේක් නොදනිති; ඒ වේලෙහි දෙමහල්තුන්මහල්පස්මහල් සත්මහල්ප්‍රාසාදයන්හි බිසෝවරුන් හා කුලසත්‍රීහුද අපහිම් සිඳුහන් කුමරු පිඩුසිහසියි යනු අසාසිව්මැදුරු කවුළුවව්වෘතකොට දිගුපුළුල් නුවන්නමැති නීලොත්පලයෙන් හා දත් නමැති කොදකැකුලෙන් හා මුඛ නමැති පද්මයෙන්ද බුදුන්ව පූජාකරන්නවුන්සේ සඳමඬුලු රන් කැමපත් බඳුවූ මුඛමණ්ඩලයන් පිවත්කොට බුඬ ශ්‍රී විද විද බැලීමෙහි ව්‍යාවෘතවූහු. එකෙණෙහි රාහුලමාතෘවූ යසොධරාදේවි තොමෝ බුදුහු දෙර දෙර පිඩු සිඟතියි යනු අසා සිඬාඹී කුමාරයෝ පෙර මෙම නුවර සියලු අලඞ්කාරයෙන් නෙඹියාවූ රථයකට ආරුඪව, සූසැවක් ආභරණ පැළඳ, රුවන්රැසින් දිලී සෙන මිණිකිරුළක් හිස පැළඳ, ලක්ෂයක් අඟනා මුත්හරයකින් උරමඬලපුරාගෙණ අමාත්‍යගණයා හා නළුපිරිස් පිරිවරා ශක්‍ර දෙවෙන්ද්‍රලීලාවෙන් රාජ්‍යශ්‍රී විඳිමින් ඇවිද්දහුය; දැන් ඒ මාගේ සවාමිදරුවා නෝ කෙස්වැටිය කපා හිසමුඩුකොට දැළිරුවුළු බහා කාෂායවස්ත්‍රධාරීව මැටිපාත්‍රයක් අතින්ගෙණ මෙම නුවරම මෙම ජාතියෙහි දෙර දෙර පිඩු සිඟමින් සිටියේලු, ඔහු මහණවන්ට හිඳද මා නොමැරී ජීවත්වූ හෙයින් මෙබඳු ලාමකවූ කණට අමිහිරිවූ සිතට අමනොඥවූ හඳවත ඇසුණුකරන්නාවූ නෙපුලක් ඇසීමි; කිමෙක්දෝහෝ සිඬාඹීකුමාරයන් දුටු යම් කෙනෙක් ඔහුගේ මහත්වූ ආනුභාවය කියති; ඔහුගේ සිඟමනුත් ඉතාම රිසියයි කියති; ඒ වෙසම ඕහට හොබීදේ නොහොබීදේ නෝයි අද මා විසින් බැළුව මැනව" යි සිතා, සියගණන් තරුණ සත්‍රීන් විසින් පිරිවරණලද්දී පරමරමණීයවූ සත්බුවූ මහපායෙහි සීමැදුරු කවුළුව හැර මරකත මාණික්‍යමයවූ කවුළුදෙර

විවරයෙන් නික්මුණුවූ උවන්මඩුළුඇත්තී සීරසාභරයෙන් හිස දිගුකළ ශ්‍රීකාන්තාවසේ කරදිගුකොට බලන්නී, බුදුන්ගේ නන් විසිතුරු ප්‍රභාවෙන් උජාලිතවූ සිරුරු රැසින් පුර මහාවිජිය එකාලොක කරමින් බ්‍යාමප්‍රභායෙහි හැළිසිටි අසූඅනුව්‍යඤ්ජන යෙන් බබලන දෙහිස් මහාපුරුෂලක්ෂණයෙන් සැදුම්ලත් රූප කායඇති බුඩශ්‍රීන් විරාජමානව විසිදහසක් මහරහතුන් පිරිවරා පිඬුපිණිස හැසිරෙන්නාවූ බුදුහුදුක, සඳඋදයින් පුබුදිනාවූ ඇඹුලමල් විලක්මෙන් සතුටුසිත් ඇත්තී, අනෝ සිඛාවිකුමාර යෙනි! එදා මධ්‍යම රාත්‍රියෙහි මාවැනි පඤ්චපාත සත්‍රියෙකුවත් නොහඟවා රාහුලකුමාරයන් වැනි එක්වන් පුතනුකෙනෙකුන් දැක උන් අතඟා සිඹසනහාත් නොපියා සොරාම පලාගියේ මෙසේවූ ආශ්චර්‍යත්‍වයත් ගමනකවද? පෙර නුඹගේ එශ්වර්‍ය රාජ්‍යයව වඩා දැන් නුඹගේ සිහත රාජ්‍යයම මට ඉතා රිසිඅයි කියමින් "සනීඛ නීල මුදුකුඤ්චිත කෙසෝ" යනාදි කරසිඛ භාථා අවකින් බුදුන්ගේ හිස පවන් දෙපතුල් දක්වා රූප වර්ණනා කොට, එ හසම මසිලනුවන්වූ සුදොවුන්රජ කරු පැමිණ වැඳ, "සඛාමිනි මසිලනුවන්වහන්ස, සත් අවුරුද්දකින් මෙත්‍රවරව ආ පුතනුවූ සිඛාවිකුමාරයාත්ව එක දවසකුත් නොසිඟා බත්දීලිස නොහෙන්නේද? නුඹ සිඟාකෑ කෙනෙක්ද? ඔහු දැන් අතුරුවේ බැස පිදූ සිඟමින් සිටියෝය; නුඹසේවූ දරුවන්ව දැකිකෙනෙක් නැත; නුඹ හෙයිඟිද කුමක්කරන් නොහිදැ" යි දෙඩිය. ඉක්බිත්තෙන් හැමරජුන් මුදුන්පත් මුනි රාජපිතෘවූ සුදොවුන් නරාධිපතිතෙමේ එවේලෙහි බුදුන් ප්‍රමුඛ විසිදහසක් රහතුන්ට පැනනුමුසු වතුමධුරයෙන් කිරිපිදූ පිස වමින් සිටියේ, ගෙහෙළිනියන් අතින් පුතනුවෝ සීහනිසි යන බස් අසා, කඳුලු පිරුණු ඇස් ඇතිව ඉතාමහත්වූ ලජ්ජාඇතිව බුදුහුකරා දිවගොස් වැඳ, "සඛාමිනි මට මේඝාමහත් පරිභවයක් කුමක්නිසාකොට වදාළසේක්ද? අද මේ මුලු දඹදිව තෙඇට දහසක් රාජධානිවල සියලුසෙනඟ ආවේවීනම්දු පැන්නොවිකා සුවදහැල්සාලේ කිරිඛත් පිසවා දෙත් නුමුදු පොහොසත්මි; මෙතෙක් රහතුන් හා ඔබවහන්සේටත් බත්දීලිය නොහැකියයි සිතුසේක්ද"යි කියා; එවේලෙහි සම්මඤ්ජයන්වහන්සේ, "මහරජ මේ මාගේ වංශයෙහි සිරිතෙක්මය"යි වදාළසේක; එබසට රජ කියනුයේ, "පුතනුවන්වහන්ස, ඔබවහන්සේගේ වංශයනම් මහාසම්මතාදී සුඛ සූකරවංශය වන්නේය, ඒ වංශයෙහි තුන්ලක්ෂ සූනිස්දහස් පත්සිය එකානුවක් මා ඇතුළුවූ රජුන් අතුරෙන් ඔබසේ සිඟාකෑඑහෙද රජෙකුත් නැත; එහෙයින් වංශවාරිත්‍රයෙ කැයි මාගේ වංශයට කුමක්කියා නිහාකරන්නේදැ" යි විචාළහ; එකෙණෙහි සම්මඤ්ජයන්වහන්සේ, "මහරජ මේ වනාහි නුඹගේ

මහා සම්මතවංශය වන්නේය; මාගේ දීපඞ්කරාදී බුඩවංශයෙහි හැම බුදුහුම කුලගම ගෙපිළිවෙළින් සිහුවාහුය; එසේහෙයින් නුඹගේ රාජවංශයය; මාගේ වංශයවූකලී බුඩවංශයෙ"යි වදාරා පියමහරජාණන් මුහුණ බලා, අතඇවිළුණු නිධානයක්ලත් පුතකු කෙනෙකුන් එයින් අහගිවූ රුවනක් තෝරාගෙණ පියානන් දැක පළමුව දුටු සතුවුපඬුරක් දෙන්නාසේ, සඩම්ම නමැති මහා නිධානයෙන් රුවනක් දෙනුකැමැතිව:-

"උතතිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතංචරෙ
ධම්මචාරී සුඛංසෙති අස්මිං ලොකෙ පරම්හිච"

යනමේහාථාව වදාලකල්හි, රජානෝ සකෘදාගාමී මාර්ගඵලයට පැමිණ, බුදුහු අතින් පාත්‍රාවගෙණ විසිදහසක් චීතරාගීන් හා සමග බුදුහුද රජමාලිගාවෙහි වැඩහිඳුවා මධුරවූ ආහාරයෙන් වැළඳවූහ; වළඳා අන්න යෙහි ෂඩ්ඵෝධණදෙවිය හැර සෙසු දහස් ගණන් ශාක්‍ය නාවක සත්‍රිහු බුදුන් සුලුමැනිවූ මහාප්‍රජාපති ගොතමීන් හා සමග දිව අවුත් බුදුන්වැඳ එකත්පස්ව සිටිකල්හි, සුඛොදන රජතෙමේ යෙහෙළනියන් බණවා, පුතඩ නොපිත් බුදුන් දැක වැඳ ශොඛ සංසිදුවා ගනුවයි කියාගැවීය; එකල්හි යශොධරා දෙවිතොමෝ සිතන්නී, සිඛාඊකුමාරයෝ ඉතා දැඩිය; මවතොඛහවා තපසට පලාගියහ; මම ඔහට පක්ෂපාතව විසියෙම්නම්, ඔහු මා කෙරෙහි සැඛැගුණයෙක් ඇතිසේක් නම්, ඔහුමාගේ ගෙවම එති; එකල වඳින්නෙම්වේදැයි කියා නොගියාඇ; සුඛොදන රජානෝ මෙපවත් බුදුන්ට සැලකළහ; එකල්හි බුදුහු, යශොධරාදෙවීන් පෙර බොහෝකලක පක්ෂපාතවම ආ නියාවත් එම යශොධරාදෙවීන් මුල්කොට පාරමිතාවන් කුළු ගැන්වූ නියාවත් කියා, කෘතොපකාරයෙහි මුදුන් පැමිණිය මනාවේදැයි සිතා, සම්බුදයන්වහන්සේ බුඩාඝතඤඤන් නැගිට, "මහරජ මම යශොධරාවන්ගේ ගෙටයෙම් නුඹ පාත්‍රය ගණුව"යි වදාරා මහරජ අතව පාත්‍රයද්දී, රජහු පළමුකොටලා තමන් වහන්සේ සෑදියුන් මුහළුන් දෙනම හා සමග පස්සෙහි වඩනා සේක්, "මහණෙනි, මම්රුගාදිකෙලෙස් මුහුදු පිහිතා ගොඩදැන හිටියෙමි; යශොධරාදෙවිය එසේනොවෙයි, ඔතොමෝ මට සසර බොහෝ දුක්ගෙණ මා කෙරෙහි දීඝී කාලයක් නොනැසී පැවැත්නාවූ මහත්වූ ප්‍රෙම සම්බඤයක් ඇත්තීය; ඇ සසරින් ගොඩනඟා ගන්නාතෙක් ඇගේම චාරිත්‍රයෙන් ඇම සන්තොෂ කරවිනු කැමැත්තෙමි; ඇගේ සිත්සේ හඩාවැටෙන ආසවාදඤක් නොලදින්නම් මා කෙරෙහි සොවකින් ලය පැළී මියෙයි; එසේ හෙයින් ඇ සිත්සේ වැඳ වැළඳ ශොඛ තුනීකරගන්නාතුරු කිසිවක් නොවළක්වව්"යි වදාරා, දෙවීන්ගේ ශ්‍රී යඤන්ගඛඩාවට ප්‍රවිෂ්ටව පණවනලද බුඩාඝතඤයෙහි වැඩහුන්සේක; බුදුහු දුටු

සම්පණයෙකීම යශොධරාදෙවිතොමෝ සාරාසඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි ආවරණයක් නැතිව සමගින් දිව්වාවූ පෙම්වතුර රදවාගත නොහැකිව කඳුලු බිඳු ගිමෙන් තෙත්වූ දුහුල් සළු ඇත්තී "මම සත්‍රියෙක්මි, මේ ලොවුතුරා බුදුහු වේද"යි සලකා ගත නොහී ප්‍රේමයෙන් උමතුව සිහි එලවාගණු අපොහොසත්ව බුදුහු සමීපයට දිවගොස් මුලින්සිදහෙළු රන්ලියක්සේ ශ්‍රී පාද මූලයෙහි වැටී බුදුන් දෙපය ගොප්මස අල්වාගෙණ පාපිට හිස තබා හඬ හඬා වැඳ නොක සන්සිදුවාගෙණ, නැවත බුදුන් කෙරෙහි හා මසිලනුවන් කෙරෙහිද උපන් මහත් ලජ්ජාවෙන් වීළි ඇතිව "මාකළේ කුමක්දෝ"යි භය ඇතිව ප්‍රාර්ථනාවූ මාග ධෙනුවක් මෙන් එකත්පස්ව උන්නාය. ඉක්බිත්තෙන් සුධොදන රජ කියනුයේ, "මාගේ යෙහෙළිනියෝ මහත්වූ ගුණ ඇතියහ; ඉතා සුශික්ෂිතයහ; ඔබවහන්සේ වෙන්වීමෙන් පීඩිතවූ තැනැත්තී ඔබවහන්සේ කෂාවත් හඳිනබැව් අසා කසාපිළිම හැන්දය; එක්වේලෙහි වළඳනබැව් අසා ඇද එක්වේලේ වළඳන්නීය; රත්බදුන් හැර මැටිබදුන්වලම ආහාර අනුභව කළාය, උසසුන් මිහඅසුන්වල නොසැතපීය; මල්සුවඳ නොපැළඳීය; ඔබවහන්සේ තාපස භූමියට ප්‍රයාණය කළබැව් අසා බොහෝ රජදරුවන් විසින් "ශශොධරාවන් අපිරකුමහ; අපි රකුම්හ"යි කියා බොහෝ පඬුරු එවිකල ගිවිස්නා තබා ඇතෙන් තෙපුල් පමණකුදු නොදී ඔබවහන්සේව පක්ෂපාතවම විසීය; එබැවින් මේ ආදී නොයෙක් ගුණයෙන් යුත් මාගේ යෙහෙළිනියන් නොදුනකළ වරද ක්ෂමාකළ මැනව"යි යාචිකුකෙළේය. එවේලෙහි සම්මුදයන් වහන්සේ, ඈ රහත්වන ජාතියෙහි තොපවැනි මිථිල්රජක්හු විසින් කරණලද ආරක්ෂා ඇතිව මිට පක්ෂපාතව විසීම අරුමයක් නොවන්නේය; පෙර මා සඳකිඳුරුව උපන්කලද මා කෙරෙහි ප්‍රේමයෙන් මාගේ ජීවිතදානය කෙළේත් මේ යශොධරා දෙවිමයයි කියා වඤ්චකනගර දෙශනා නමැති ජලප්‍රවාහයෙන් විශොග නමැති ගිනිකිවා වදුළසේක. එවේලෙහි යශොධරා දෙවීන්ගේ ශොකයද සුධොදන මහ රජාණන්ගේ භයද සන්සිදුනේය; ඉක්බිත්තෙන් සම්මුදයන් වහන්සේ හුනස්කෙන්නැගී මිහරහතන් කැටුව නිග්‍රොධාරාමයට පෙරලා වැඩිසේක.

නන්දකුමාරයන් පැවිදි කිරීම.

ඉක්බිති නිග්‍රොධාරාමයට වැඩි දෙවෙනි දින සම්මුදයන්වහන්සේගේ කුඩාමව්වූ මහාප්‍රජාපති දෙවීන්ගේ පුත්වූ නන්ද කුමාරයන්ගේ අභිෂෙක මඞ්ගල්‍යයද, ගෘහප්‍රවෙශ මඞ්ගල්‍යයහා ජනපද කල්‍යාණිකම් රජකන්‍යාව සරණෙණෙණ මඞ්ගල්‍යයද යන මේ

Printed & Published by K D. PERERA & SON, *Vidyadarsa Press, Colombo.*

මඞ්ගල්‍යපාත්‍රයම් එක්විට පැමිණියේය. එකල සම්බුදුරජාණන් වහන්සේ එපවත්දැන මාගේ මල් නන්දකුමරු ජනපදකල්‍යාණියගේ ශරීර සුඛයම ලද්දේවීනම් මාවැනි බුදුවරයන් දහසක් විසිතුදු සසරින් මුදවාගත නොහැක්ක; එබැවින් දැන්ම ගොස් ඔහු මහණකරව, ගණිමැයිසිතා, මහත්වූ බුධශ්‍රීන්විරාජමානව නන්දකුමාරයන්ගේ මහුල් මාලිගාවට වැඩ පණවනලද බුඩාඝන මතුයෙහි වැඩහිඳ:-

"යථාපොච බ්‍රහ්මචරියංච අරියසච්චානි දස්සනං
නිබ්බාණසච්ඡි කිරියාච එතං මඞ්ගලමුත්තමං"

ඉතාදි මඞ්ගල්‍ය ධර්මය වදාළසේක; ඉක්බිති සම්බුදුරජාණන් වහන්සේ දන්වළඳ, අනතරයෙහි පාත්‍රය නන්දකුමාරයන් අතට දිගු කොට වදාළසේක; එතැණෙහිම, මංගලවිධානයෙන් සම්භාරණ විභූෂිතව සිටි නන්දකුමාරතෙමේ බුදුහු කෙරෙහි ගෞරවයෙන් ඔහුවෙත යොමුකරණලද පාත්‍රය ආදරයෙන් ගෙණ දෙඅත් ලෙහි තබාගත්තේය; එකල සම්බුදුරජාණන්වහන්සේ බුඩාඝනයෙන් නැගි ඔහු සමඟ විහාරයට යනු කැමැතිව නික්මුනුසේක; නන්දකුමාරයෝ බුදුහු දැන් දැන් පාත්‍රය ගන්නාසේනැයි සිත සිතා පසුපස්සෙනිගියෝය; සම්බුදුරජාණන්වහන්සේ පසුතොබලාම වඩනාසේක් නුමුත් උන්වහන්සේ කෙරෙහි ඇත්තාවූ මහත්වූ ගෞරවය හෙතුකොටගෙණ පාත්‍රය අතට ගැණීමට සංඥා නොකළේය; නන්දකුමාරයා විවාහකරගැණීමට ගිවිසගෙණසිටි ජනපදකල්‍යාණියනම් රාජකන්‍යාතොමෝ, හිමිකුමරු පාත්‍රය ගෙණ බුදුහු කැටුව වඩනාබැව් අසා වහ වහා දිවගොස් තමා වසන පහයෙහි සිවිමැදුරු කවුළුදොර විවෘතකොට තමාගේ සඳමඩලවන් මුවමඩල සිවිමැදුරු කවුළුවෙන් පිවතවදමා, වලා ගැබකින් නිකුත් විදුලියක්සේ ලීලාපෙතුවූ සුකුමාලකඝනය දිගුකොට නිලුපුල්වන් ඇස් සඟලින් නන්දකුමාරයානන් මුහුණ බලා, "ආර්‍යපුත්‍රයෙනි ඔබ නොරඳ වහා අවමැනව" යි කිව; එතෙපුල් අසා කුමාරයාගේ ළය කම්පිතවිය; එසේදවුවත් බුදුහු කෙරෙහි ඇති ගෞරවය නිසා පාත්‍රය ගතමැනවයි කියනොහී නොකැමැතිව වෙහෙරටම ගියහ; ඉක්බිත්තෙන් සම්බුදුරජාණන් වහන්සේ නන්දකුමාරයන් ලඟට කැඳවා, "නන්දය සත්දවසින් ලැබෙන චක්‍රවර්ත්ති රාජ්‍යය හැරපියා මාවැනියන් මහණවූකල, තා වැනියන්ට ගිහිගෙයින් කවර ප්‍රයෝජනයක්ද? එබැවින් දැන්ම මහණ වෙව" යි වදාළසේක; නන්දකුමාරතෙම මුවෙන් නොබැණ ජනපද කල්‍යාණියගේ රූපලාවණ්‍යය සිත සිතාම සිටියේය; එකල බුදුහු නන්දකුමාරයා මුවෙන් නොබැණ සිටි හැටින් පැවිදි කරවූසේක; මෙසේ සම්බුදුරජාණන්වහන්සේ කිඹුල්වත්පුර වැඩවදළ තුන්වෙනි දින නන්දකුමාරයන්ගේ ප්‍රව්‍රජ්‍යාව ඊය.

රාහුලකුමාර ප්‍රව්‍රජ්‍යාව හා පැවිදිකිරීමට අනුදැන වදාළ පරිදි.

සම්බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩි සත්වෙනිදා විසිඳහසක් රහතන් පිරිවරා සවණක් රැසින් දිලිහි දිලිහී පියරජහුගේ මාලිගාවට දන්වැළඳීම පිණිස වැඩිසේක; එකල ආනන්ද ජලයෙන් ඇලලෙනලද ඇස් ඇති යශොධරාදෙවි තොමෝ සත්හැවිරිදි රහල් කුමරුවන් ඇකයෙහි වඩාහිඳුවා ගෙණ, සිඹ සනසා පුත "රාහුලකුමාරයෙනි" නොප පියාහන් වහන්සේගේ සතරමහා නිධානයෙක් ඇත, උන්වහන්සේ මහණවූ තැන්පවත් ඒ සතරමහානිධානය කොතනකබවත් නොදනිමි; තවද තොපගේ චක්‍රවර්ති රාජ්‍යය හා සත්රුවනකුත් ඇත; පියන්හිමි සමපක් දරුවන් හිමිවේදැ" යි කියා තොප පියාහන් කරා ගොස් සතරමහා නිධානය හා චක්‍රවර්ති රාජ්‍යයද ඉල්වා ගණුව" යි කීය. එකල රාහුල කුමාරයෝ මුතුන් රජ්ජුරුවන් අදුනන බවමුත් පියානෝ කවරෙක්දැ"යි යන බැවි නොදන්නා හෙයින්, "අම්ම මපියානෝ නම් කවුරුදැයි විවාලහ; බ්‍රහ්මාබිසව් තොමෝ පුතනුවන් වඩාගෙණ සිවිමැදුරු කවුළුවෙහි දෙරහැර, රාජවීථියෙහි දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන් සමලඬකෘතවූ කසුන්කදක්සේ සවනක් රැසින් දිලිහි දිලිහි වඩනා බුදුහු, පුතනුවන්ට අනදිගුකොට පෙන්වා:—

1. "වණ්ණාවරංකිත රත්තසුපාදෙ
ලක්ඛණ මණ්ඩිත ආයත පණ්හි
චාමර ඡත්ත විභූසිත පාදෙ
එසහි තුයහ පිතා නරසීහෝ.

2. සඛ්‍ය කුමාර වරෝ සුබු මාලෝ
ලකඛණ වුත්තිත පුණ්ණ සරීරෝ
ලොකහිතාය ගතෝ නර වීරෝ
එසහි තුයහ පිතා නරසීහෝ.

3. පුණ්ණසසංකනි හොමුඛ වණ්ණෝ
දෙවනරානපි යෝ නර නාගෝ
මත්තගජින්ද විලාසිත ගාමී
එසහි තුයහ පිතා නරසීහෝ.

4. ඛත්තිය සම්භව අගග කුලීනෝ
දෙවමනුස්ස නමස්සිතපාදෙ
සීල සමාධි පතිට්ඨිත චිත්තෝ
එසහි තුයහ පිතා නරසීහෝ.

Printed & Published by **K. D. PERERA SON,** *Vidyadarsa Press, Colombo.*

5. ආයත යුත්ත සුසණ්ඨිත නාසෝ
ඒගාපමුඛෝ අනිනීල සුනෙත්තෝ
ඉන්‍දධනු අනිනීල හමූකෝ
එසඝි තුයා පිතා නරසීහෝ.

6. විටට සුමටට සුසණ්ඨිත ගීවෝ
සීහ හණුම්ඝ රාජ සරීරෝ
කඤ්චන සුවණ්ණ උත්තම වණ්ණෝ
එසඝි තුයා පිතා නරසීහෝ.

7. සතිඛ සුගම්භිර මඤ්ජුසු සෝසෝ
හිඛුල බන්ධු සුරත්ත සුජිවෙහා
වීසති වීසති සෙත සුදන්තෝ
එසඝි තුයා පිතා නරසීහෝ.

8. අඤ්ජන වණ්ණ සුනීල සුකෙසෝ
කඤ්චන පට්ට විසුඛ ලලාවෝ
ඔසධි පණ්ඩර සුඛසු උණ්ණෝ
එසඝි තුයා පිතා නරසීහෝ.

9. ඔවඤ්ඡති නීල පථෙවිය වන්තෙ
තාරගණා පරිවෙසිත රූපෝ
සාවඛා මඤ්ඡඛගතෝ සමණීන්දෙ
එසඝි තුයා පිතා නරසීහෝ."

ඉතාමේ නරසීහ ගාථා උගන්වා "පුත රාහුලයෙනි තොප පියාතෝ නම් අල්පසවල්පවූ කෙනෙක් නොවෙයි; දෙපතුල් පුරා සිටි දෙසිය සොළසක් මගුල් ලකුණෙන් හා රන්තෙලිතුඩ බඳුවූ සිනිදුවූ ඇඟිලි පෙළින් හා, ක්‍රමොන්නතව රන්වන්වූ ජඞ්ඝා යුගමයකින් හා, රන්බාදක් බඳුවූ බුදුබදෙකින් හා, කල්පද්‍රැම ශාඛා යුග්මයක් බඳුවූ ශ්‍රී හස්ත යුග්මයකින් හා, පුන්සඳක් බඳුවූ ශ්‍රී මුඛයකින් හා විදුලිය දෙකක් බඳුවූ කන්වැල් සඟලින් හා, සවණ්ණාඛකුශඨක් බඳුවූ උත්තුඞ්ග නාසිකාවකින් හා පස්වණක් පැහැයෙන් දිලිසෙන ඉඳුනිල්මිණිවන් අක්ෂි යුගමයකින් හා දෙව්දුනු දෙකක් බඳුවූ ශ්‍රීමත්වූ බැම සඟලකින් හා, රන්මිනිඹක් වැනිවූ ග්‍රීවා වෘත්තයකින් හා රන්කුළුදෙකක් වැනිවූ උරසඟලකින් හා රන්පියුම්පෙත්තක් බඳුවූ ජිහවාවකින් හා තාරකා පඞ්ක්තියක්සේ ශොභමානවූ සමසතළිස් දන්ත පඞ්ක්තියකින් හා, මිණිඹඩම් දෙකක්සේ සුරක්තවූ අධරයුගමය කින් හා වලා ඇඹකින් නිකුත් වන්‍දමරීචින්මෙන් ශ්‍රී මුඛයෙන් නිකුත් සුදු බුදුරැස් කලඹකින් හා, කඤ්චන පට්ටයක්බඳුවූ නළල් තලයකින් හා රන්ගල් මිදුනෙක දිලිසෙන පුන්සඳක් බඳුවූ උණ්ණාරෝමයකින් හා නිල්වලාකඩක් බඳුවූ ඉදුනිල්වන් සිරස කින් හා, හුදු කරුණාවෙන් මවාළූ රූවක්සේද හුදු මුදිතාවෙන්

මවාළැරුවක්සේද, හුදු උපෙක්ෂාවෙන් තනාළු රැවක්සේද, බඳුවද මල්රැසකින් වැසූ චිත්‍රකූටපර්වත රාජයාසේ සුරක්කතවූ පාංශුකූල චීවරයකින් ශ්‍රී ශරීරය වසාගෙණ හිරු පැරැසූ තෙජසින් හා චන්ද්‍රයාසේ සොම්නුණින්ද යුක්තවූ, දෙව්බඹ කැලන්ගේ කිරුළුකුළුවිණිරැස් නමැති අමා ජලයෙන් තමන් සිරිපතුල් පරිෂේචනය කෙරෙමින්, පුතඩ තෙල මහ රහතුන් පිරිවරා මෙහි වඩනේ තොපපියානන් වහන්සේය"; යනාදීන් උගන්වා නැවත තුමූ මතුමඟලට නැගී සිංහපඤ්ජරයෙන් බල බලා සිටියාය.

එකල බිම්බාදේවීන් විසින් දුන්නා ඉල්ඛන පිණිස යවනලද කුමාරාහරණයෙන් විභූෂිත ඒ රාහුලකුමාරතෙම බුදුන්කරා දිව හොස් මුහු මපියානෝය යන පෙනහයෙන් සොම්නසින් යුක්ත වූයේ බුදුන්ගේ සිවුරුකොණ අල්වාගෙණ මුහුණ බලා, "මහණ මම නුඹගේ දරුවෙක්ල, නුඹ මාගේ පියෙක්ල, නුඹ මා උපන් දවස් මා දුරදී දැක මා සහ මවත් නොනකා සොරාම තපසට ගියෝල; එසේ නුඹ දැනිවූවත් නුඹගේ සතරමහා නිධානය හා චක්‍රවර්ති රාජ්‍යයද මට දෙව; මහණ නුඹගේ සෙවන මට ඉතා සිනිල, නුඹගේ රූපය මට ඉතා ප්‍රියකරුය; නුඹගේ ඇඟින් දිවන රශ්මිය මට ඉතා සුවපහස් දෙන්නේය; එබැවින් නුඹ මාගේ පියානෝමය" යි කියා කියා ලදබොලඳ තෙපුල් බිණිය. එකල බුදුහු රාහුල කුමාරයන්ගේ ඇඟිල්ල ශ්‍රී හස්තයෙන් අල්වාගෙණ, "වරෙව දරුව තව දායාද දෙන්නෙමිවේදැ"යි වදාරා සුද්ධොවුන්මහ රජහුගේ රාජභවනයට වැඩ දන් වළඳා අනතයෙහි, බුඩාසන යෙන් නැගී තරුණ රවිකිරණයෙන් දීලියෙන කනක ගිරිශිඛර යක්සේ නික්මුණුසේක; රාහුලකුමාරයෝද බුදුන්ගේ සිවුරු කොණ අල්වාගෙණ "ශ්‍රමණය දායාද දෙව"යි කියමින් බුදුහු අනුවම ගියෝය; බුදුහු "රාහුල කුමාරය සිටුව" යි කියාත් නොවදාරණසේක; රාහුලකුමාරයන් නවතාලන්න එකම කෙනෙ කුදු නැත්තේමය; එකල යශොධරාදෙවි තොමෝ සිංහපඤ්ජර යෙන් බලා සිටින්නී, බුදුහුකැටුව යන පුතනුවන් දැක කිමෙක්ද නැඳුකුමරුවා සේම මපුතනුවන් ගෙණ ගොස් මහණ කරවා ගන්නා උපායෙන් ඇත්තෝ, දායාද තබා මපුතනුවන් පමණක් වත් ලදින්නම් යෙහෙකැයි සිත සිතා හඬමින් සිටියාය; බුදුහු රාහුලකුමාරයන් වෙහෙරට කැඳවාගෙණගොස්, දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේට ආමන්ත්‍රණය කොට "ශාරිපුත්‍රය" මේ රාහුලයා මා අතින් දායාද සම්පත් ඉල්වයි; මොහු මට දරුබවත් සැබෑය, මා මොහුට පිය බවත් සැබෑය, එහෙයින් මෝහව නොනස්නා දායාද සම්පත් දීලනු කැමැත්තෙමි, දෙන

ධනයක් ඕගෙන්ම දෙනුකැමැත්තෙමි, මා බෝමැඩදී ලද්දාවූ සප්තවිධවූ ආර්‍ය්‍ය ධනය මෝහට දුනමැනව, ලොවුතුරා දැයාද යෙහි හිමිකළ මැනව, එබැවින් දැන්ම මොහු මහණකරව"යි වදාළසේක; එවේලෙහි රාහුල කුමාරයෝ ඊට කිසි පිළිතුරක් නොදී මවියානන්වහන්සේ අදමට කොතන්නා උතුම් දායාදයක් දෙනසේක්වනැයි සිත සිතා සතුටු සතුටුවම සිටිසේක; එකල "ශාරිපුත්‍ර සථවිරයන් වහන්සේ, සවාමීනි, කොසේ රාහුලයා පැවිදි කරම්ද"යි විචාලහ; ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ නිඝ්‍රන්ථ ආමන්ත්‍රණයකොට අනුජානාම් භික්ඛවෙ තිකි සරණාගමනෙනි සාමණෙර පබ්බජ්ජං" යනාදීන් "මහණෙනි තුන්සරණයෙන් සාමණෙර ප්‍රව්‍රජ්‍යාව අනුදනිමි"යි වදාරා, ඔන්තෙහිදු "මහණෙනි පළමුකොට හිසකේ දැළිරුවුල් බහා කාෂායවස්ත්‍රයක් හඳවා එකාංශිකය එකාංශකොට පොරවා නිඝ්‍රන්ථගේ පා පන්දවා උක්කුටුකාසනයෙන් හිඳුවා ඇදිලිබඳවා "බුද්ධං සරණං ගච්ඡාමි" යනාදීන් දශවිධ ව්‍යඤ්ජන සම්පත්තිය නොපිරිහෙලා තුන්සරණ ගන්මා පැවිදිකළ යුතුය"යි වදාළහ. ඉක්බිත්තෙන් ශාරිපුත්‍ර සථවිරයන්වහන්සේ රාහුලකුමාරයන්ගේ ඉසකේ බහා බුදුන් වදාළ නියාමෙන් පැවිදිකළසේක. සුදොවුන් මහරජානෝ මුණුබුරන්නන් මහණකළහයි යනු අසා, මහත්වූ ශොක ඇතිව බුදුහු කරා දිවගොස් වැඳ එකත්පස්ව හිඳ, "සම්බුදුයන්වහන්ස, ඔබවහන්සේගේ ශාසනය මව්පියන් කෙරෙහි සරු නොකරණ ශාසනයෙක්ද? ඔබවහන්සේ සැඟවීම ගොස් මට නොකියා මහණවූ බැවින් නොමදවූ දුකට පැමිණියෙමි; මාගේ කුඩා පුතනුවන් නන්දකුමාරයන් උදුරාගෙණ මහණ කොට ගත් බැවින් එසේම බලවත් දුකට පැමිණියෙමි; ඔබ දෙදෙනා වහන්සේම නැතිවූ බැවින් මා මුණුබුරු රාහුලකුමාරයන් කෙරෙහි ඇත්තාවූ ප්‍රේමයද ඉතා දැඩිවිය; එබැවින් ඔහු මහණනාළසේ නොයෙදෙයි යනාදීන් මැසිවිලි කිහ; එකල බුදුහු රජහට බණවදාරා ශොක සංසිඳුවා වදාළකල්හි, රජතෙම "ඔපුත නුවන්වහන්ස අදමට උපන්නාවූ දරුශොකය දරුවන් ඇති සියලු දෙමව්පියන්වම නොවෙනු කැමැත්තෙමි, එබැවින් මට එකම වරයක් දුනමැනව"යි යාච්ඤාකෙළේය; එකල භාග්‍යවතුන් වහන්සේ "මහරජ බුදුවරයෝ වනාහි වර නොදෙන්නාහුය"යි වදාළසේක; එවිට සුදොවුන් මහරජ නැවතත් යාච්ඤාකොට, "සවාමීනි ඉදින් මාගේ වරය බුදුවරයන්ට කැපවීනම් දුන මැනව"යි කියේය; "එසේවීනම් නොපවිසින් ඉල්ලන වරය කුමක්දැ"යි විචාලකල්හි, සවාමීනි, ඔබවහන්සේගේ මේ ශාසනයෙහි ආර්‍ය්‍යයන් මව්පියන් පිසින් අනුනොදන්නාලද දරුවන් පැවිදි නොකිරීම සඳහා ශික්ෂාපදයකින් මට වරයක් දුනමැනව"යි ආරාධනා කළහ.

එකල භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට, "න හිකඛවෙ අනනුඤ්ඤාතො මාතාපිතූහි පුත්තෙහා පඛඛාජේතබබා නොපඛඛාජේතබබා නොපසම්පාදෙතබබා නිජ්ඣාපනතිඛුකතඤ්ඤ" යනාදීන් "මහණෙනි මව්පියන් විසින් නොඅනුදන්නාලද දරුවන් පැවිදි නොකළ මනාය; යමෙක් මව්පියන් ජීවත්ව සිටියදී අවසරනුදුන් දරුවෙක් පැවිදිකළේවිනම් දුකුලා ඇවැත්වේ"යි යන මේ ශික්ෂාපදය පණවා වදාළසේක. මෙසේ සම්බුදුන්වහන්සේ කිඹුල්වත්නුවරට වැඩිය සත්වෙනිදා රාහුල කුමාරයන් පැවිදිකරවා අටවෙනිදා නිකුම්භඛ්‍යයාත් පිරිවරා පියරජතුමාගේ රාජමන්දිරයට ප්‍රවිෂ්ටව පණවනලද බුඩාඝනමස්තකයෙහි වැඩහුන්සේක; එකල සුඛෝදන නරාධිපතිතෙමේ බුදුන්වැඳ එකත්පස්ව සිට, "ස්වාමීනි ඔබවහන්සේ දුෂ්කාරක්‍රියාකාරණ සමයෙහි එක්තරා දෙවතාකෙනෙක් රාත්‍රිභාගයෙහි මාගේ ශ්‍රියහන් ගබඩාවට ප්‍රවිෂ්ටව කියන්නේ 'මහරජ තොපපුතනුවෝ සිඛාපිකුමාරයෝ නිරාහාරවසිටීමෙන් ශරීරය විඳලී සක්මන් කෙළවර වැටී මළහ"යි කිය; ඔනු කිඹස් අසා මම "මාගේ පුතනුවෝ ලොව්තුරා බුදුවමුත් නොමියති"යි කීම්; බුදුහු එතෙපුල් අසා "මහරජ දැන් මා බුදුවන ජාතියෙහි මා මළහයි කිඹස් නොකිව්ස්සේ අරුමයක් නොවෙයි; පෙරත් කොනිව්ස්සේම වේද"යි යනමේ කාරණා අවිච්ඡාපත්තිඝකාට ගෙණ මහාඛම්පාලජාතකයෙන් දහම්දෙසුසේක; එකලසුදෙවුන් මහරජානෝ අනාගාමි ඵලයට පැමිණිසේක; සුදෙවුන් මහරජු වනාහි බුදුහු පළමුවසිහාවැඩිදා විටියෙහිදී වදාළ ගාථාදෙක අසා සෝවාන් සැදැහැම්විය; මේ ඛම්පාලජාතකය අසා අනාගාමි විය මෙසේ සම්බුදුන්වහන්සේ විසමරජානන් තුන්මහ තුන් ඵලයෙහි පිහිටුවා ඉක්බිති සඟපිරිස් පිරිවරා කිඹුල්වත් නුවරින් නික්ම රජගහනුවර, මියුරුවූ භෘඞගනාදයෙන් ගායනාකරණු ලැබූ පූජා සහිතවූ ලපලුපත් භාරයෙන් භරිතවූ නොයෙක් ලියවම්යන් විසින් වෙළෙප්හි වළඳනාලද උතුම්වූ වෘෂභනාමැති වලලහයන්ගෙන් ගහනවූ නිනාවනයෙහි වැඩවාසයකළසේක.

ජේතවනාරාමය පිළිගැන්ම.

තවද අනාථපිණ්ඩික නම් සිටුතෙම පන්සියයක් ගැලින් බඩු ගෙන්වාගෙණ රජගහනුවර තමාගේ මිත්‍ර සිටුගෙයකට එළඹ, බුදුහුලොව පහළවූකයි යනු අසා මහත්වූ සොම්නසට පැමිණ ප්‍රභාතකාලය ඝෝසිසිතා රාත්‍රියෙහිම නික්ම දෙවතානුභාවයෙන් විවෘතවූ දොරටුවෙන් සීතවනයට ගොස් අලුයම් වේලෙහි අභ්‍යවකාශයෙහි සක්මන් කරන්නාවූ අනිනවොදාත සරද සමයෙහිවූ සදමඬලක් සෙසින් බබලන්නාවූ නයනානන්ද කරවූ සම්බුදුන්වහන්සේ දැක, උන්වහන්සේගේ පාද රශ්මිය

සිරසින් පිළිගෙණ, ජරාරහිතබැවින් අජරවූ, මරණ නැති බැවින් අමර වූ, රාගාදි මලරහිත බැවින් අමලවූ, කිසිවකට සමානොකළ හැකි බැවින් අතුල්‍යවූ, සමීපරිදාහයන් නැති බැවින් ශාන්තවූ, දණ්ඩ දූ භීතාදි ආදිභය රහිත බැවින් අභයවූ, ප්‍රත්‍යූපස්ථාන නොවන බැවින් අසඞ්ඛතවූ, සියක්වර පැලූ අස් ලොම් කෙළ වරක් සෙයින් සියුම්වන බැවින් නිපුණවූ, අතෘප්තිකරණාදී යෙන් හෝ ප්‍රධාන භාවයට පමුණුවන බැවින් ප්‍රණීතවූ, දිය පොළවසේ හැඹුරු බැවින් ගම්භීරවූ, පවිතයකින් වසාතිබූ දිරහමිණක්සෙයින් නොදැක්කහැකි බැවින් දුර්දර්ශිවූ, එම් ලොකොත්තර සැපදායක උතුම්වූ ධර්ම්මශ්‍රවණයකොට සොතා පත්‍ති ඵලයෙහි පිහිටියේය; දෙවෙනි දින බුදුන් ප්‍රමුඛ මහා සංඝයාව, නානාප්‍රකාරවූ බාද්‍ය විශෙෂාදීන් හැවසිඟත් වණීඝන්ධ රස සම්පන්නාවූ, ලෞකික ලොකොත්තර සුඛදායක නීධානවූ දන්දී, "ස්වාමීනි භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්ස! භික්ෂු සංඝයා හා සමග සෑවක්නුවර වස්විසීම ඉවසා වදාළමැනව"යි යාචඤ්ඤ කොට, බුදුහු විසින් "ගෘහපතිය තථාගතයෝ ශූන්‍යාගාරයෙහි (ගිහිජනයාවිසින් ශූන්‍යවූ ස්ථානයෙහි) අභිරමණය කෙරෙති"යි වදාරණලදුයේ "ස්වාමීනි, මාවිසින් අභිප්‍රාය දන්නාලදැ"යි කියා පිවත්ව ගියේය.

රජගහනුවර පවින් ශ්‍රාවස්තිපුරය දක්වා පන්සාළිස් යොදුනෙක්විය; ඒ මාර්ගයෙහි යොදුනෙන් යොදුන ලක්ෂය ලක්ෂය බැගින් ධන විය්‍යම්කොට පන්සාළිස් වෙහෙරක් කරවා සෑවැන් නුවරට ගොස් බුදුන්ගේ වාසයට මහ වෙහෙරක් කරවනු පිණිස නුවර හැමතැන ඊට සුදුසු ස්ථානයක් සොයා ඇවිදිනාහු, ජායා වෙන් හා උදකයෙන් සම්පන්නාවූ පරමරමණීයවූ තපස්වීවර යන්ගේ වාසයට යොග්‍යවූ භූම්ප්‍රදෙශ ඇති "ජේත" නම් රාජ කුමාරයාගේ (තමහට සතුරු ජනයාහෙන් ජයගන්නා බැවිනුදු පියරජහු ශත්‍රුවිජයකළ දවස ජාතවූ හෙයිනුදු මඞ්ගලකාමාදී යෙනුදු) ජේතවන නම්වූ එම උයන දැක ඔහුකරා ගොස් අවලොස්කෙළක් මසුරන් මිළදී ගණුලැබුවේය; ඒ ජේතවනය විනාහි මෙස පටලයෙන් සුඛුනාලද ශිබරමාලා ඇති කෙලාශ පර්වතය සෙයින් අති ධවලවූ පවුරුවලල්ලෙන් වටක රණලද විජයුත්පා සෙයින් නොයෙක් මාලින් යුකතවූ දෙරටු ඇති, අනෙකාකාරවූ පඨපෙලින් ජනයන්ගේ මනතුවන් පැහැර ගන්නාක්වැනිවූ විපුලාගේ රුස් කළඹක් සෙයින් සුදුවූ මැදුවූ වැලිතෙලෙන් අභිරම්‍යවූ සුවඳකුසුම් ඇති, නොයෙක් දෘඹරාජ යන්ගෙන් ආකීර්ණවූ කුරඞ්ගමෘග සාරඞ්ගමෘග සරභමෘග රුරු මෘග වාමරමෘගාදි මෘගයන්ගේ සඤ්චාර ඇත්තාවූ, මත්වූ

මොණර, සියයන්ගේ මිධුරනාද ඇත්කාවූ, භ්‍රමර සමූහයාගේ හඬින් දෙබම්ලුවූ මී අඹරුක් ඇති, කෙවිලි සමූහයාගේ මනොඥවූ හඬින් කොලාහල ඇති, සුවඳවහනයවන්නාවූ සුපිපි මල්කැන්හි රේණුයෙන් රන්වන්වූ, ඒ ජේතවන නම් උයන්මැද බුදුන්ට විසිතුරුවූ ගඳකුටියක් කරවා, එහි වටා සෙනසුන් කරවා, පව්රු දෙරටුශොබා, සඛ්‍යාරාම රාත්‍රිසථාන සක්මන්හල් පිරිපොකුණු ආදිඝකරවා, අවලොස්කෙළක් ධන විසදා මනරම් කොට වෙහෙරක් නිම්වාළුහ; එකල ජේතනම්රාජ කුමාරයෝද සිවානන් කරන්නාවූ උදුරතර ඒවිහාරකම්මානන්තයන් දැක පැහැද, සිවක්හුගේ සම්පත් රජක්හට සිදැ? ඔහු දුන් මිළ ඔහුගේ විහාරයටම පරිත්‍යාගකරමැයි සිතා, ඒ විහාරයෙහි සතර වහසල්කඩ එක්සිය විසි රියන් අඨම්විතරුහි සත්මහල් මහා ප්‍රාසාද සතරක් ශොඛනාංවා, බිම විකුව ගත් අවලොස්කෙළක් මසුරන් එම වහසල් කම්මානතයව පරිත්‍යාගකළහ; මෙසේ සියලු විහාරකම්මානතය නිමිකල්හි අනේපිඬු මහසිටු තෙමේ බුදුහු කරා පරිජනයන් හැවිය; එකල්හි බුදුරජානන්වහන්සේ සියලු භික්ෂු සංඝයා පිරිවරා රජගහනුවරින් නික්ම අනුක්‍රමයෙන් සැවැත්නුවරව වැඩියාහ; එකල අනේපිඬු මහසිටුහු වෙහෙර උතුම්කොට සරහා, බුදුහු දෙව්රම් වෙහෙර වඩිනා දවස් සව් බරණින් පුතු සරහා, එසෙයින්ම සැදිපන්සියක් කුඩාදරුවන්ද බුදුහු පෙරමගව යැවූහ; ඔවුන් පසුපස්සෙහි මහාසුභද්‍රා චුල්ල සුභද්‍රා යන නම් ඇති දෙසිටුදූහු එසේම සව්බරණින් සැදි කුඩා දූරියන් හා සමග පුන්කලස්ගෙණ නික්මුණාහ; ඉක්බිති සිටු තෙමේද තම පිරිසත් කැටුව පෙරමුණව එළඹ භික්ෂු සඞ්ඝයා සමග සම්ඵෙයන් වහන්සේද පිළිගෙණ ජේතවනාරාමයව වැඩම කරවූයේය; ඉක්බිත්තෙන් අනේපිඬු මහසිටුහු බුදුන් වැඳ, "සවාමිනි මේ වෙහෙර කෙසේ පුදම්දැ"යි විචාළහ; එකල සම්බුදු යන්වහන්සේ, "සිටානෙනි, මේ විහාරය මෙතනට පැමිණි නොපැමිණි සියළු භික්ෂූන් උදෙසා සාංඝිකකොට පූජාකරව"යි වදාළේය; එකෙණෙහි අනේපිඬු මහසිටාතෝ සවණ්ණෙනිඛ්කාර යෙන් පැන්ගෙණ, "ඉමං ජේතවන විහාරං ආගතානාගතස්ස චාතුද්දිසස්ස බුඩපමුඛස්ස සංඝස්ස දමම්" යන මේ වාක්‍යයෙන් සතරදිගින් වඩනා බුදුපාමොක් මහසඟනට දෙමිකියා බුදුන්ගේ ශ්‍රීසසනාඥව දැසම්ණොදකය වත්කළහ; මෙසේ බිම්ගත් මිළය විහාරකම්මානතකරවූ මිළඇදුන පූජාව පිණිස වියදම්කළ මිළයයි සිවිපණස් කෙළක් ධන බුදුහු උදෙසා එකම ජේතවනාරාමයව වියදම් කළහ.

ගිහිවිනය ධර්ම.

එක් සමයෙක්හි අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර ගොදුරුගම්කොට මේළුවනාරාම විහාරයෙහි වැඩ වාසයකර වදුරණසේක; එසමයෙහි නිධානකොට තබනලද සතළිස්කෙළක් ධන ඇති එක් ගෘහපතියෙකුගේ සිඟාලක නම් පුත්‍රයෙක්විය; ඔහුගේ මව්පියෝ දෙදෙන සෝවාන්ව ගිහිගෙයි වෙසෙති; ඒ සිඟාලකනම්වූ පුත්‍රයා වනාහි බුද්ධාදි රත්නත්‍රය කෙරෙහි ශ්‍රද්ධා නැත්තේය; අප්‍රසන්නය. ඉක්බිත්තෙන් ඔහුට මව්පියෝ දෙදෙන, "දරුව ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ කරා එළඹෙව, දම්සෙනෙවි සැරියුත්මහතෙරුන් වහන්සේ කරා එළඹෙව, මුගලන්මහතෙරුන් වහන්සේකරා එළඹෙව, මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කරා එළඹෙව, අසූමහාසව්වන් වහන්සේ කරා එළඹෙව" යි මෙසේ නිරන්තරයෙන් අවවාද කරන්නාහුය; එකල්හි ඒ සිඟාලක නම් ගෘහපතිපුත්‍රතෙම, "තොපගේ ශ්‍රමණයන් කරා යාමෙන් මට කවයුක්තක් නැත්තේය; ශ්‍රමණයන්ගේ සමීපයට ගොස් වැන්දයුතුවෙයි නැමී වඳින්නාහුගේ පිට රිදෙන්නේය; දෙදන රළුවන්නාහුය, බිම හින්දයුතුවන්නේය. ඒ බිම උන්නාහුගේ අදිනා පොරෝණා වස්ත්‍රයෝ කිළුටුවන්නාහුය, දිරන්නාහුය; සමීපයෙහි උන්කල්පවන් කථා සල්ලාප ඇතිවෙයි. ඒ කථා සල්ලාපය ඇතිකල්හි විශ්වාසභාවිය උපදින්නේය, එකල ආරාධනාකොට චීවර පිණ්ඩපාතාදිය දිය යුතුවෙයි. එසේවූකල ධන හානිවන්නේය, ඒ හෙයින් තොපගේ ශ්‍රමණයන් කරා එලඹීමෙන් මට කවයුත්තක් නැහැ" යි කියන්නේය. මෙසේ ඒ සිඟාලකනම් ගෘහපති පුත්‍රයාහට මව්පියෝ ජීවිතානන්තය දක්වා අවවාදකරන්නාහුද ඔහු බුද්ධශාසනයෙහි පහදවන්ට නොහැකිවූවාහුමය; ඉක්බිති ඒ සිඟාලක නම් ගෘහපති පුත්‍රයාගේ පියානෝ මරණ මඤ්චකයෙහි හොත්තේ තම පුත්‍රයාහට අවවාදකරන්ට විටිනේයැයි සිතා නැවතද මෙසේ සිතීය:-පුත්‍රයානෙනි, දිශාවන්ට නමස්කාර කරවයි කියා මෙසේ ඔහුට අවවාදකරන් නෙමී, හෙතෙම එහි අර්ථය නො දන්නේ පූජ්‍ය පශ්චිමාදි දිශාවන්ට නමස්කාරකරන්නේය; එකල්හි ශාස්තෘන් වහන්සේ හෝ ශ්‍රාවකයන්වහන්සේලා හෝ ඔහු දැක, කුමක් කරන්නෙහිදැයි ඔහුගෙන් විචාරණසේක; එකල ඔහුගේ පියානෝ දිශාවන්ට නමස්කාර කරවයි කියා මට අවවාද දුන්හයයි කියති; එකල්හි උන්වහන්සේලා, තොගේ පියා මේදිශාවන්ට නමස්කාර නොකරවූයේය, මේ දිසාවන්ට වනාහි නමස්කාර කරවූයේයයි කියා ධර්මදේශනා කරණසේක; හෙතෙම එකල්හි සර්ගඥශාසනයෙහි ගුණදැන පින්කිරීමෙහි

යෙදෙන්නේයයි සිතූහ; මෙසේ සිතා ඉක්බිති ඒ තමන්ගේ සිගාලක නම් ගෘහපති පුත්‍රයා කැඳවා—"දරුව, අලුයම්වේලෙහි නැගිට සදිසාවන්ට නමස්කාරකරව"යි කියේය. මරණමඤ්චක යෙහි හොත්තාහුගේ අවවාදයෙන් දිව්‍යලෝකයට පුතු වන්නේයයි සිතූ ඒ සිඟාලක නම් ගෘහපතිපුත්‍රතෙම පියාණන්ගේ ඒ වචනය පරිද්දෙන් අලුයම් වේලෙහිම හොත් යහතින් නැගිට රජගහ නුවරින් නික්ම තෙත්වූ වස්ත්‍ර හා හිසකෙහෙ ඇතිව තබනලද දෙහොත්මුදුන් ඇතිව පූර්ව පශ්චිම දකුණු උතුරුයන මතුයන ශබ්දිශාවන්ට නමස්කාරකරන්නවන; එසමයෙහි අප භාග්‍යවතුන්වහන්සේ අළුයම් වේලෙහි ලොවබලා වදාරණ සේක් සිඟාලකනම් ගෘහපති පුත්‍රයාගේ සදිසා නමස්කාරය දැක, අද මේ ගෘහපති පුත්‍රයාහට;ගිහිවිනය නම්වූ සිඟාලෝවාද සූත්‍රය නම් ධර්මයක් දෙශනා කෙරෙමියි ඒ දෙශනාව මහජනයාහට සඵලවන්නීය, ඒ දෙශනාවශානයෙහි සිඟාලකනම් ගෘහපතිපුත්‍ර තෙම රතනත්‍රයෙහි සරණ පරායණව සතලිස්යොළක් ධනයද බුඩ ශාසනයෙහි විසුරුවන්නේය; ඒ හෙයින් මා විසින් එහි යායුත්තේයයි සිතා වදාරා අළුයම්හි ශරීරචින්තාවෙන් නික්ම පාසිවුරුකෙණ රජගහනුවරට පිණ්ඩපාතය පිණිස වැඩ වදාළ සේක; එසේ වැඩියාවූ භාග්‍යවතුන්වහන්සේ සදිසාවන්ට නමස්කාර කරන්නාවූ සිඟාලකනම් ගෘහපති පුත්‍රයා දැක සුදුසු රශ්මියෙන් ප්‍රබොධවන්නාවූ මහපියුමක් වැනි ශ්‍රී මුඛය විවෘත කොට 'එම්බා ගෘහපති පුත්‍රය තෝ, කුමක් පිණිස මෙසේපූර්ව දිශාවආදි සදිසාවන්ට නමස්කාරකරන්නෙහිදැ"යි විචාලසේක; එවිට ඒ ගෘහපති පුත්‍රතෙම කියනුයේ:—"සවාමීනි භාග්‍යවතුන් වහන්ස! මියපරලොව යන්නාවූ මාගේ පියානෝ, 'දරුව! සදිසාවන්ට නමස්කාර කරව'යි කියා මට අනුසාසනා කළසේක; ඒ මම වනාහි පියානන්ගේ වචනයට සත්කාර ගරුකාර බුහුමන් කිරීම් වශයෙන් මෙසේ සදිසාවන්ට නමස්කාර කරමි"යි සැළ කෙළේය; එකල්හි භාග්‍යවතුන් වහන්සේ, "එම්බා ගෘහපති පුත්‍රය, ආර්‍යයන්ගේ විනයෙහි මෙසේ සදිසාවෝ නමස්කාර නොකටයුත්තා හුය"යි වදාළකල ගෘහපති පුත්‍රයා විසින් ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ මෙසේ විසතරකොට වදාළසේක.

"එම්බා ගෘහපතිය, නිගිව වසන තොප විසින් චතුර්විධ කර්ම ක්ලේශ කෙනෙක් දුරුකටයුත්තාහුය, සතර කාරණයකින් පාපකර්මයෝ නොකටයුතුය; වස්තූන්ගේ විනාශවීමට හේතුවූ කාරණා සයක් හැරියයුත්තේය, අමිත්‍රයෝ සතරදෙනෙක් දුරු කටයුතතාහුය; මිත්‍රයෝ සතරදෙනෙක් සෙවනය කටයුතතාහුය,

ෂට්දිශාවෝ වැඳියයුතුය, එසේ ඇතිකල්හි ගෘහවාසයෙහි වසන්නාවූ කුලපුත්‍රයන්ට මෙලෝ පරලෝ දෙක්හිම වන්නාවූ දණ්ඩමුදුරාදී නොයෙක් භය හා භයානක දුගීගති භය ආදිවූ නොයෙක් භයොපද්‍රව දුරුවීමෙන් ජයගැණීම පිණිස මේ කාරණයෝ වන්නානුය; එසින් ප්‍රථමකොට දැක්වූ:—

චතුර්විධ කර්මක්ලේශයෝ නම් කවරහයක්?

"පාණාතිපාතෝ අදින්නාදානං මුසාවාදෙව වුච්චති
පරදාර ගමනඤ්චෙව නප්පසංසන්ති පණ්ඩිතා"

ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය යනමේ පාපකර්මයන් කිරීමට නුවණැත්තෝ නිතුකෙරෙති; ඒ පාපකර්ම හෙතුකොටගෙණ තම තමන්ගේ කය බිළිබඳවූ ඡාඝාවමෙන් ජාතියක් ජාතියක් පාසා කැටුව ලුහුබඳවා යන කර්මය කිලුටුවන හෙයින් ඔවුහු කර්මක්ලේශයෝතම් වෙති; මෙහි විස්තර මෙසේයි:—ප්‍රාණඝාතයයි කියනුලද ශොඩදිස වසන යම්කිසි සත්වයෙකු දැන දැන තමන් විසින් මැරීම හෝ අනුන්ලවා මැරවීමද, අදත්තාදානයයි කියනුලද වසතු හිමියා විසින් නුදුන් මොනයම් දෙයක්වත් වඤ්චාවෙන්වත් බලෙන් කාරණෙන්වත් තමා විසින් දැන දැන ගැණීම හෝ අනුන්ලවා ගැන්වීමද, පරදාර සෙවනයයි කියනුලද මව්පිය නෑ සහොදර සවාමි පුරුෂාදීන් විසින් ආරක්ෂා කරණ්ලබන්නාවූ හෝ ආවාහ පිණිස නියමව සිටින්නාවූද පරස්ත්‍රීන් සමඟ දැන දැනම අනාචාර යෙහි යෙදීමද, මුසාවාදයයි කියනුලද තමන් නිසාවත් සතුනි මිත්‍රාදි අනිකෙක් නිසාවත් යම්කිසි වසතුවක් නිසාවත් සරදම් පිණිසවත් දැන දැන බොරුකීම හෝ අනුන්ලවා කියවීමද, යන මේ කාරණා සතරෙන් එකක්වත් පවත්වන අයගේ කර්ම දෙලොවින්ම කිළුටුවන හෙයින් හෙවත් පිරිහෙන බැවින් මේ සතර කර්ම ක්ලේශයෝයයි කියනුලැබත්.

(දශ අකුසල් නම් කවරහයක්?)

"කායකම්මං තිධා වුත්තං වාචාකම්මං චතුබ්බිධං
මනසා තිවිධඤ්චෙති දසකම්ම පථා ඉමෙ
පාණඝාත පරදද්ධං පරදාරඤ්ච කායතෝ
මුසා පෙසුඤ්ඤ ඵරුසංච සම්ඵප්පලාපි වාචතෝ
අභිජ්ඣාවෙව ව්‍යාපාදෙ මිච්ඡා දිට්ඨිච මානසෝ"

යනුහෙයින්, කායපිළිබඳ කායකර්ම අකුසල්තුනක, වචනය පිළිබඳ වාචාකර්ම අකුසල් සතරක, සිත පිළිබඳ මනොකර්ම අකුසල් තුනක, යන මේය දශ අකුසල කර්මපථය නම්වේ; මෙහි

ශරීරයෙන් වන පව් තුනකම්, ප්‍රාණයඇති සතෙක් දැන දැන ජීවිතයෙන් නොරකිරීමයයි කියනු ලබන ප්‍රාණඝාතයද, අන්‍ය යන්ට අයත් වස්තු සොරසිතින් ගැණීමයයි කියනුලබන අදත්තා දානයද, අනුන් අඹුවන් සෙවනය කිරීමයයි කියනුලබන කාමේසු මිච්ඡාචාරයද, යන මේ තුන කයින්ම සිඳවන නිසා කායකම්ම අකුසල් තුන නම්වේ; වචනය පිළිබඳ වාචාකම්ම අකුසල් සතරනම්, බොරුකීමයයි කියනු ලබන මුසාවාදයද, උනුනුන් භෙදකරවීමට නිසි කේලාම් කීමයයි කියනු ලබන පෙසුණ්‍යයද, අන්‍යයන්ට ඇසීමට නොසතුටුවූ නොකන්කළුවූ බැණීමයයි කියනුලබන ඵරුස වචනයද, නිෂ්ඵලවූ හිස්බස් බිණීමයයි කියනුලබන සම්ඵප්පලාපයද, යන මෙය වචනයෙන්ම සිඳවන නිසා වචීකම්ම අකුසල් සතර නම්වේ; සිත පිළිබඳ මනොකම්මික අකුසල් තුනනම්, අනුන්ගේ සම්පත්තියෙහි විෂම ලොභ සිතින් ඔවුන්ට නැතිවෙත්වයි මට උනොත් යෙහෙකැයි කියා කල්පනාකිරීමයයි කියනලද අභිධ්‍යාවද, අනුන් නැසෙත්වා වධයට පැමිණෙත්වා විනාශ වෙත්වා ඔවුන්ගේ සම්පත් නැතිවෙත්වා නොහොත් මට වෙත්වා යනාදීන් සිතන ලද ව්‍යාපාදයද, දෙනලද දානයෙහි ඵලවිපාක නැත කරණලද කුශලාකුශලයෙහි ඵලවිපාක නැත මේලොව සිටියාහට පර ලොව නැත පරලොව සිටියාහට මෙලොව නැත යනාදි වශ යෙන් වරදවා කල්පනාකිරීමයයි කියනලද මිථ්‍යාදෘෂ්ටියද, යන මෙය සිතින්මසිඳවනනිසා මනොකම්මික අකුසල්තුන නම් වේ:

සතර අගතිය.

"ඡන්ද දෙසා භයා මොහා යෝ ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසෝ කාලපක්ඛෙව චන්දිමා"

මෙහි ප්‍රකාශවන ඡන්දය, දෙෂය, භයය, මොහය යන සතරට සතර අගතියයි කියනුලැබේ; ඡන්දාගතිය නම් යමෙක් මේනෙම මාගේ මිත්‍රයාවයි කියා හෝ නැයෙකැයි කියා හෝ අල්ලස්දිනැයි කියා හෝ ඡන්දාදි වශයෙන් හිමියන් අහිමිකොට අහිමියන් හිමිකොට දීමෙන් ඡන්දයෙන් අගතියවහොස් කරණ පාපකම්මයවේ; දෙෂාගතිය, නම් යමෙක් මේනෙම මට වෛර එකෙකැයිසිතා ප්‍රකෘතිවෛර වශයෙන් හෝ ඒක්ෂණයෙහි උපන් ක්‍රොධ වශයෙන් හෝ හිමියන් අහිමිකෙරේද, අහිමියන් හිමි කෙරේද එසේ දෙෂයෙන් අගතියට හොස් කරණ පාපකම් වෙෂාගතියයි; යමෙක් මේනෙම රාජවල්ලභයෙකැයි කියා හෝ මට අනර්ථ කෙරෙයිසිතා හෝ භයපත්ව අහිමියන් හිමිකෙරේද හිමියන් අහිමියන් කෙරේද හේනෙම භයාගතියටහොස් පව්කරන්නේ නම්වෙයි; යමෙක් වනාහි තෙමේ තුවණ මදව මොහයෙන්

මුළා බැවින් යම්කිසි මූඩාරූඪවූ දෙයක් කියා ඇතිලෙස සුකති විනිශ්චය කිරීමෙහි අසමර්ථව මෝඩකමින් හිමියන් අහිමිකෙරේද අහිමියන් හිමිකෙරේද, හේතෙම මොහාගතියට පැමිණ පව් කරන්නේය; එසේම කිසිවක් බෙදනුයේද මේතෙම මාගේ මිත්‍රයෙක නැයෙක යනාදි වශයෙන් ප්‍රෙම උපදවා අධිකකොට දේද, මේතෙම මට වෛරයයි වෙෂ වශයෙන් අඩුකොටදේදා මුළාබැවින් දුන් නුදුන් අය නොදන කිසිවක්හට අඩුකොටද කිසිවක්හට අධිකකොටද දේද, මේ තෙම මේය නුදුන්කල්හි මට අනර්ථ පවුණුවායයි භයපත්ව කිසිවක්හට අධිකව දේද හේතෙම ඡන්දාදි සතර අගතියටම හොස් පවිකරන්නේනම් වන්නේය.

මෙසේ සතර අගතියෙන් අගතියට හොස් සවභාව ධර්මය ඉක්ම පැවැත්වීමෙන් යමෙක් පාපකර්ම කරන්නේවේද ඔහුගේ යස පිරිවර සම්පත් කෘෂ්ණපක්ෂයෙහි සඳමඬලමෙන් පිරිහීමට යේ; යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් තෙම මේ සතර පවිටු කාරණයෙන් වෙන්ව ක්‍රියාකරන්නේද එහෙයින් හෙතෙම සතර කාරණයකින් පාපකම් නොකරන්නේ නම්වේ; එහි ආනිසංස මෙසේයි:— "ගෘහපති පුත්‍රය, මෙසේ මේ සතර අගතියෙන් අගතියට හොස් පවිනොකරණ ඒ පුද්ගලයාගේ භිරණ්‍ය සවර්ණී දාසි දාසාදි වස්තු වර්ධනවීම හා මිත්‍රාමාත්‍යාදීන්ගේ සතුති සොෂාවන්ගේ වශයෙන් ඕහට අභිවෘද්ධියද වන්නේය' පිරිහීමක් නොවන්නේය; තවද ඡන්දයෙන් වෙෂයෙන් භයින් මොහයෙන් යමෙක් අගතියට හොස් පාපකම් නොකරන්නේද, ඔහුගේ යසපිරිවර ආදි සියල්ලම පුරපක්ෂයෙහි චන්ද්‍රමණ්ඩලය මෙන් සම්පූර්ණ වන්නේය.

වස්තු විනාශයට හෙතු කාරණා සය.

තවද "එම්බා ගෘහපතිය, වස්තූන්ගේ විනාශවීමට ප්‍රධාන හෙතුවූ කාරණා සයක් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සෙවිනය නොකරන්නේය; එනම්, * රහමේර පානය කිරීමය, නොකල්හි වීථි ආදියෙහි සඤ්චාරණය කිරීමය, නෘත්‍ය ගීත වාද්‍ය දියදක්නට යාමය, දූකෙළියෙහි යෙදීමය, පාපමිත්‍රයන් හා එක්වීමය, අලසවීමය යන මේයි; මේ කාරණයෝ සදෙන මෙලොවදී සර්වයන් විසින් ගොවිතැන් වෙළඳුම් ආදිය කොට අනෙකොත්‍යාහයෙන් අඹු දරු ආදි පොෂ්‍යයකිරීම පිණිස උපදවාගත් උපභොග පරිභොග වස්තූන්ගේ ක්ෂයවීමට ප්‍රධානවූ කාරණය"යි මාතෘකා වශයෙන් සඞ්ක්ෂපයකොට වදාරා නැවත ඒ අවිකාරණයන්ගේ විස්තර වෙන් වෙන් වශයෙන් විදාරණයේක්:—

---

* මුත්වීමට හෙතු සියලුම පාපවලින් මීට ඇතුළුනි.

මත්පැන් පිළෙහි ආදීනව.

උපයාතුබ්බ ධන විනාශවීමද, කලහ වැඩීමද, අසීරොගාදී ඒ ඒ රෝගයන්ට ආකරවීමද, මත්වීම කරණකොටගෙණ දෙමව්පිය ගුරුවරුදීන්ට පවා දණ්ඩනිග්‍රහකිරීම් වශයෙන් නොයෙක් අකතීව්‍ය කිරීමද, මහත් අයස උපදවීමද, එසේම අනෙක වීම් කොටි සහශ්‍රයෙහි නරකයෙහි පැසී එයින් මිදුනු කලැ උමතුවීමද, ලජ්ජා රහිතවීමද, දීනවීමද, දුඃඛිතවීමද, ශොකී වීමද, විරූපදෙක ඇතිවීමද වෙත්.

එහෙයින් කීහ:—

"උම්මත්තකා විගත ලජ්ජ ගුණා භවන්ති
දීනා සදු ව්‍යසනසොක පරායණාව
ජානා භවෙසු විවිධෙසු විරූප දෙහා
පිබා භලාභල විසංව සුරං විපඤ්ඤූ"යි

සුරාපානයෙන් මත්වූවාහු විසින් හින පිළිනැතිව, ලජ්ජාව හෙතුකොටගෙණ වැසියයුතු අවයවාදිය නොවැසීමෙන් ලජ්ජා භය දෙක නැසීමද, සියලු අභිවෘඩියව කාරණවූ ප්‍රඥව දුරු කොට අඥතවීමද ඇත මේ සය මද්‍ය පානයකරණ පුද්ගලයා විසින් එම ආත්මභාවයේදීම දුක්භායුතු ආදීනව වේ.

---

* වෂතු පරිභොග කටයුතු විධි.

යමෙක් විසින් උද්‍යාන සඞ්ඛ්‍යාත විහාරයෙන් දූහැමින් උපදවා ගත් භොගයෝ යුතුලෙස අනුභවකරණ ලද්දාහුද, පොෂ්‍යයකළයුතු මව්පිය අඹුදරු ආදීහු පොෂ්‍යයකරණ ලද්දාහුද, රජ සොර සතුරු ආදීන්ගෙන් ආපදාවක් පැමිණිකල්හි එය දුරු කිරීම පිණිස විශෙෂයෙන්ම වසතු වියදම්කරණ ලද්දේද, මතු ඵලවිපාක දායකවූ දානමය පුණ්‍ය තොමෝ දෙනලද්දීද, පඤ්චබලි කර්මයෝ † කරණලද්දාහුද, කායවාක් සංයම සහිතවූ සිල් වතුන්ට විවරාදී සිව්පසයෙන් උපස්ථාන කරණලද්දේද, එසේ ගිහිගෙයි වැසි ඒ ප්‍රඥවන්ත පුදගලතෙම දෙලොව වැඩපිණිස භව භොගාදි වස්තුව උත්සාහවත්ව සැපයුයේද එයින් ගතයුතු අර්ථය තමාට පමුණුවාගන්නා ලද්දේදවේ; තමා විසින් අවශෙෂ

---

* මෙය ප්‍රාසාදකර්ම සූත්‍රයේ ආ නිදානයෙන් දතයුතුයි.

† පඤ්චබලි කර්මයතම:— මව්පිය දෙපක්ෂයෙහි නැයන් වෙසුවෙන් ඒ ඒ කාලයෙහි වස්තු වියදම්කිරීමෙන් දියයුතු ඤාතිබලියද, තමන් හෙදෙරට පැමිණි ආගන්තුකයන්ට කටයුතු සත්කාරාදිය කිරීම් වශයෙන් කරණ අථිති බලියද, පරලෝගිය නැයන් උදෙසා මහණබමුන්දීම් වශයෙන් කරණ පූර්ව්‍රෙත බලියද, රජුන්ට සුංකම් වශයෙන් දියයුතු රාජබලියද, කුලප්‍රවෙණියෙන් පැවත එන ආරක්ෂක දෙවියන්ට දියයුතු දෙවතාබලියද යන මේ බලි පසයි.

කුසල්ද කරණලද්දේවෙයි; මෙසේ මේ කාරණයන් ඉෂ්ටකරන් නාවූ සම්මතෙම ආර්‍යධර්ම සඞ්ඛ්‍යාත නිත්‍ය පඤ්චශීලයෙහි හා පොහෝ අෂ්ටාඞ්ගශීලයෙහි පිහිටියේද, එසේ පිහිටියාවූ හේ පණ්ඩිතයන්ගෙන් මෙලොවද ප්‍රශංසා ලබන්නේය, පරලෝකයෙහිද පස්කම් සැපයෙන් අග්‍රභෙයින් සවර්ගයයි නම්ලද දෙවිලෝ ඉපිද සැපයෙන් ආඝ්‍යව සතුටුවන්නේය, නැවත සෝවාන් ආදි මාර්ගඵල ලැබීමෙන් අජරාමර සඞ්ඛ්‍යාත අමෘතමහා නිර්වාණසම්පත්ති ප්‍රතිලාභයවද පැමිණෙන්නේය.

නොකල්හි විපිසඤ්චාරණයෙහි ආදීනව.

නොකල්හි භෙවත් රාත්‍රිභාගයෙහි ඇවිදිනා කෙනෙත්තේ තමා නොකී නොකළ නොයෙක් වරද පැමිණීමෙන් ආත්මයද රැකගත නොහෙයි, තමා බාහිරගිය හෙයින් අඹුදරුවෝද රැක්ක නොහෙත්, ඔවුහු කැමැතිසේ පිටත හැසිරීමෙන් අනය ව්‍යසනයට පැමිණෙත්, තුමූත් අඹුදරුවනුත් පිටත හැසිරෙණ බව දැන සොරු සිස්හෙට වැද වසතුව ගෙණයෙති, මෙසේකල සම්පත්ද රැකගත නොහෙයි; අනිකෙකුකළ වරදෙහා විනුමුත් අසවල්අය මේ සම්පයේ රාත්‍රිභාගයෙහි ඇවිද්දේදයයි ඔහුකෙරෙහි සැකකරන්වද හිඳිවෙයි; නොකළ වරදවී නුමුත් ඔහුකෙරෙහි පිහිටයි, කණු කටු සර්‍ප යක්ෂාපද්‍රවාදි නොයෙක් දුඃඛකාරණ පූර්‍ණාඞ්ගමවෙයි; මේ සය වනාහී නොකල්හි විපිසඤ්චාරණයෙහි දෝෂයෝයි.

නානා දර්‍ශනය පිණ්ඩ යාමෙහි දෝෂ.

නැටුම් හි ආදිය ඇතිතැනට යෙමිසි මල් සුවඳ පිළි අනහා පානාදිය සපයාගැන්මෙනුත් එහි කිපදිනක්ම ප්‍රමාදව බලා සිටිනා හෙයිනුත් ඒ ඒ කාලවලදී තමා විසින් කළමනා හොවි තාන් වෙළඳුම් ආදි ප්‍රයෝජන කවයුතු පිරිහීමෙන් අවිකානි වීමත, ගේහැර පිළිත ගියහෙයින් රන් රිදී මසුරන් ධාන්‍යාදි වස්තූන් හා කෙත් වත්වල තුබූ ඵලාඵල ආදියෙහි රැකවල් නැතිවීමෙන් සොරුන්ගෙන් උවදුරු පැමිණීමද යන මෙය නැටුම් දැක්මව යාමෙහි විපාකවේ.

දූ කෙළියෙහි දෝෂ.

අෂ්ඨුනී පුරුෂතෙම තමා දූ කෙළීමෙන් දිනුවහොත් සෙස්සෝ වෛර කෙරෙත්, පැරද ගියේනම් වසතුහානියවීමෙන් ශොකයට පැමිණේ, රැස්කළ ධනය විනාශවෙයි, සභායෙහි ඔහුගේ බස නොගන්නේය, මිත්‍රාමාත්‍යාදීන් විසින් හෙළාදක්නා ලැබෙයි, දූ කෙළියෙහි නියුක්ත කෙනෙත්තේ අඹුදරුවන්

පොෂ්‍යය කිරීමවද අපොහොසත්යයි කිසිවෙක් ඔහු හා සමඟ ආවාහ විවාහ කිරීමවද නොකැමැතිවෙයි, මෙය වනාහි දුකොළි යෙහි නියුක්ත තැනැත්තාහට වන දෙෂයි.

පාපමිත්‍ර සංසර්ගය.

ජනයෝ පාපමිත්‍ර සංසර්ගයෙන් දුර්ජනවෙති, කල්‍යාණමිත්‍ර සංසර්ගයෙන් සජ්ජනවෙත්; එසින් වදාළහ:—

"යාදිසං කුරුතෙ මිත්තං යාදිසං උප සෙවති
සොපි තාදිසකෝ හොති සහවාසෝහි තාදිසෝ"

යම් බඳු කෙනෙක් සමඟ මිත්‍රව වාසයකෙරේද යම්බඳු කෙනෙක් සෙවනයකෙරේද සේවකතෙමේද එබඳුවෙයි සමඟ එකතුව විසීම එබඳුවෙයි යනු මෙහි භාවයි.

"පූතිමච්ඡං කුසගෙනන සොනරෝ උපනයහති
කුසාපි පූතිවායන්ති එවං බාලූපසෙවනා"

යමෙක්තෙම කුණු මාංශයක් කුස සඞ්ඛ්‍යාත තෘණයෙන් වෙළා බැඳිද; ඒ බැඳීම හෙතුකොටගෙණ එහි තෘණයෙන් කුණුගඳ වහනයවෙයි; එමෙන්ම යහපත් මනුෂ්‍යයෙක් තෙම අසත්පුරුෂ බාලයෙකු සෙවනය කෙළේනම් හෙතෙමේද අසත් පුරුෂයෙක් වන්නේමැයි.

පාපමිත්‍ර සංසර්ගයෙන් හෙවත් පව්කිරීමට භය ලජ්ජා නැති අය හා මිත්‍රව වාසයකිරීමෙන් යුක්තවූ පුරුෂතෙම දුකොළි යෙහි නියුක්ත අය සමඟ මිත්‍රවීමද, සත්‍රීධූර්ත හෙවත් වෛශ්‍යා කම්යෙහි යෙදෙන අය හා මිත්‍රවීමද, මද්‍යපානයෙහි නියැලිවූ සුරාධූර්තයන් සමඟ මිත්‍රවීමද, අභිමුඛයෙහි මෙනම් දෙයක් දෙම් කරම් කියා අනභිමුඛයෙහි වඤ්චනාකරණ නෛකෘතිකයන් සමඟ මිත්‍රවීමද, තඹ පිත්තලාදිය රන් රිදීකොට අඟවන වඤ්චනික යන් සමඟ මිත්‍රවීමද, මිනිමැරීම් මං පැහැරීම් ආදි පාපකර්මයෙහි භයනැතිව සාහසික ක්‍රියාකරණ අය හා මිත්‍රවීමද, යන මේ හෙතු කොට දෙලොවින්ම පිරිහීමටයේ; එබැවින් සත්පුරුෂතෙම මොවුන් හා කිසිකාලෙකත් භජනය පර්‍යුපාසනයට නොයන්නේයි; පූර්ව්වෝක්ත පාප පුද්ගලයන් හා එක්ව විසයකරණ පුරුෂතෙම ග්‍රාම සූකරාදීන් අසුචියට දුවන්නාසේ ඉහතකි පාපින් හා කැවිවම ඇලෙන්නේය.

කුසීත භාවයෙහි දෙෂ.

කුසීතභාවයෙහි හෙවත් අලසවීමෙහි දෙෂයෝ සදෙනෙක් වෙති; එනම්:—දැන් ඉතා ශීතයයි කියාත් කවුරුත් කර්මාන්ත නොකෙරේ; දැන් ඉතා උෂ්ණයයි කියාද කර්මාන්ත නොකෙරේ;

දැන් ඉතා සවිස්ව ගියේයසිද, දැන් ඉතා උදැසනයසිද, දැන් ඉතා සුළුඩා ඇත්තෙමි (බඩගිනි) යසිද, දැන් ඉතා පිපාසයෙමියයසිද කියාත් කම්‌ාන්‌තා නොකරන්නේය; මෙසේ මේපිඩා සලකා කාමි කම් වණීක්කම්‌ාදියෙහි හෝ තමතමන් විසින්කටයුතු වෙතයම් කම්‌ානනාදියෙහි හෝ ප්‍රමාදව වාසයකරන්නාහට නුපන් හොඟ යෝ නොම උපදින්; උපන් හොඟ ක්‍ෂයභාවයට (විනදම්වීමට) යාමෙන් ධන හීනයෙක්වේ.

උසසුර සෙය්‍යා පරදාර සෙවනා
වෙරප්‍ප සංගොව අනත්‌ථනාව
පාපාව මිත්‍තා සුකුදරියනාව
එතෙ ජඩානා පුරිසං ධංසයන්‌ති''

හිරු උදයවනතුරු නිදහැණීමද, අන් අඹුවන් සෙවනය කිරීමද, අන්‍යයන් හා බඩ වෛරයද, පරහව අනථ පමුණුවීමද, දුර්‌ජනයන් හා මිත්‍රත්වයද, තද මසුරුකමද, යනමේ ෂට්විධ කාරණයෝ සත්වයා දෙලොවෙහිදීම විනාශයට පමුණුවත්.

''අක්ඛිත්‌තසෝ වාදාණී නච්චගීතං
දිවාසොපපං පාදි චරියා අකාලෙ
පාපාව මිත්‍තා සුකදරිය නාව
එතෙ ජඩානා පුරිසං ධංසයන්‌ති''

දූකෙළිවලයෙහි ගෙදීමද, පරදාරසෙවනයද, මද්‍යපානයකිරීමද, නැටීම් ගී කීම් ආදි ක්‍රීඩාවෙහි ගෙදීම හා එය බලන්ට ගැමද, දහවල් නිදීමද, රාත්‍රිභාගය අකාලයෙහි වීථිසඤ්චාරණයද, අසත් පුරුෂ සමාගමද, දුනයට සිතනැති තද මසුරුබවද, යන මේ කාරණකොටගෙණ සත්වයා කාලපක්‍ෂයෙහි සඳමෙන් සියලු යස ඉසුරුවලින් පිරිහෙයි, ගෘහවාසයටද අපොහොසත්වෙයි.

දුරුකටයුතු මිත්‍රයෝ.

අසදසදාදුහරය, වච්පරමය, අනුප්පියභාණිය, අපායසහාය යන මෙකී මිත්‍ර ආකාරයෙන් පෙණිසිටින අමිත්‍රයෝ සතරදෙන දුරුකටයුත්තාහ; මිත්‍රයාගේ හෙව සිස්අතින් අවුත් එකානන යෙන් යම්කිසිදෙයක් හෙණයන කලපනාවම ඇතිවූ අසදසද දාදුහර නම් මිත්‍රයාද, මෙනම් දෙයක් දෙමි කරමැයි වචනයෙන් පමණක් සඩ්‌ගහකොට නැවත එය නොහරණ වච්පරම නම් මිත්‍රයාද, තවද ප්‍රාණඝාතාදි පාපක්‍රියාවෙහි සහ දානධර්‌මාදිපුණ්‍ය ක්‍රියාවෙහිද යෙදෙමුයයි විවාළකල, ඉන්වන වැඩ අවැඩහැණ කිසිත් පරීක්‍ෂාවක් නොකොට යහළු එය කළමනාකමයයි කියා සථිරකරන්නේද, මිතුරාගේ අභිමුඛයෙහි ගුණ කියන්නේද,

අනතිමුඛයෙහි අතුණ ප්‍රකාශ කරන්නේද යනමේ සතරකාරණ යකින් අදහස් බලබලා අනුකූලවූ පියවචන කියන අනුප්පිය භාෂී නම් මිත්‍රයාද, තවද අක්ඛධූර්‍ත සුරාධූර්‍ත ස්ත්‍රීධූර්‍ත නොකල්හි වීථිසඤ්චාරණය හා නාට්‍යගීත වාදනාදිය දැක්මට යාමය යන මේ සතරකාරණයකින් අපායට ගෙණයාමට උපකාරවන්නාවූ අපායසහාය නම් මිත්‍රයාද යනමේ මිත්‍රාකාරයන් හඟවන එකාන්තයෙන් අමිත්‍රවූ සතරදෙනම දුරුකටයුත්තාහුය.

එහෙයින් වදාරණලදී:—

"එතෙන අමිත්තෙන චතුආකාරෙන ඉතිවිඤ්ඤාය පණ්ඩිතෙන
ආරකා පරිවජ්ජයෙථ මග්ගං පභි භයං සප්පාති"

පණ්ඩිතතෙතම මේ අමිත්‍රවූ සතරදෙන දැන හැඳින සොරුන් විසින් හා සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින්ද ආකුලවූ මාර්ගයසේ මේ පාප මිත්‍රයන් දුරුකොට හළයුතුය යනු මෙහි අභිප්‍රායයි.

ඉෂ්ට මිත්‍රයෝ සතරදෙන.

"උපඛාදෙව සොමිත්තෙනා සොචමිත්තෙනා සුඛෙ දුඛෙ
අඤ්ඤඛාසිව සොමිත්තෙනා සොචමිත්තෙනානුකම්පකොති"

යමෙක් මත්පැන් පීමෙන්මත්ව හෝ විෂමූර්ච්ඡාදි කිසිවකින් හෝ මිත්‍රයා ප්‍රමාදවූකල ඒ විපතින් මිදෙනතාක් ඔහු රක්නේද, මිත්‍රයා මුළාවූ බව දැක ඔහුගේ වසතු සොරු පැහැරගණිත්දෝ හෝයි සිතා සම්පත් රක්ෂාකරන්නේද, භයක් පැමිණිවිට "නොබව මැනව මම ඊට පිහිටවෙමැ"යි කියා අභයදානය කිරීමෙන් සහායවන්නේද, මෙවෙනි මාගේ කවයුත්තක් ඇතැයි යමක් ඉල්වාඅකල ඔහු ඉල්වූවිතරට දිවුණක් දෙන්නේද යන මේ සතර කාරණයෙන් තමහට උපකාර ඇති උපකාරිනම් සුහෘත් මිත්‍රයාද, තවද තමරහස් ඇතිසැටිමිත්‍රයාවකියාද, මිත්‍රයා කි රහස් අනුන්ට මදකුත් නොහඟවා රක්ෂාකෙරේද, වසතු විනාශාදි යම් ආපදාවක් පැමිණිකල මිත්‍රයා නොහැර එක්වවිද හණිද, යමකදී තමාගේ ජීවිතය පවා මිත්‍රයා උදෙසා පරිත්‍යාග කිරීමෙන් සිය මිතුරා රැකහැණීමට තැත්කරන්නේද යන මේ සතර කාරණයකින් සුවදුක් දෙකෙහි සමව පවත්නා මනා සිත් ඇති මිත්‍රයාද; තවද තමන්ගේ මිත්‍රයා ප්‍රාණඝාතාදි පඤ්ච දුශ්චරිතයෙන් වළක්නේද දානශීලාදි කුසල ක්‍රියාවෙහි යොදවන්නේද; පෙර නොඇසූ සඟමොක් සැප සාධක ධර්ම අස්වන්නේද; සවගීමොක්ෂගාමී මාගීඵලාභවීවට හිසි පිළිවෙත් කියා දෙන්නේද යන මේ සතර කාරණයෙන් යහපතක්ම ඉටුකර දෙන අඤ්ඤඛාසිනම් සුහෘත් මිත්‍රයාද; තවද මිත්‍රයා අනාථවූ

දූපපන්ව කියකල තමහට වූවක්මෙන් දෙම්හසට පැමිණේද මිත්‍රයාට ලාභයක් සැපයක් පැමිණිකල තමාලද දෙයක් මෙන් සතුටුවේද, මිත්‍රයාගේ අගුණ කියනු අසා මා මිතුරු කෙරෙහි එවෙනි නුගුණ නැත එසේ නොකියව යනාදිවශයෙන් වලකාද ගුණ කියනු අසා මාගේ මිතුරුගේ ඇති ගුණමය යනාදී ගුණ කථනය කිරීමෙන් සතුටුවේද, යන මේ සතර කාරණයෙන් යුකතවූ අනුකමපක නම් සුහෘත් මිත්‍රයාද; යා මෙකී සත්ගුණ ධාරී මිත්‍රයන් සෙවීමෙන් මෙලෝ පරලෝ දෙකවම හිතවේ; එහෙයින් වදුරණලදී.

"එතෙ මිතෙන චත්තාරෙ ඉති විඤ්ඤාය පණ්ඩිතෝ
සක්කච්චං පයිරුපාසෙය්‍ය මාතා පුත්තංව ඔරසං"

මෙසේ මේ මිත්‍රයන් සතරදෙන පණ්ඩිතතෙම නුවණින් දුන හැඳින මව්පියන් සම්පයට පැමිණි පුත්‍රයෙකුමෙන් ආදර ගෞරවයෙන් මෙබදු මිතුරන් සෙවනය කරන්නේය යනු මෙහි භාවසි.

ආරක්ෂාකටයුතු සදිසාවෝ.

"මාතා පිතා දිසා පුබබා ආචරියා දකකිණා දිසා
පුත්තදාරා දිසා පජා මිතතා මච්චාව උත්තරා
දූසකම්ම කරා හෙටඨා උඩං සමණ බ්‍රාහමණා
එතා දිසා නමස්සෙය්‍ය අලමත්තෝ කුලෙගිහි"

දෙමව්පියෝ තමාට පූර්වයෙන් උපකාරිවූ හෙයින් පූර්වදිශා භාගය හෙවත් නැගෙණහිර දිශාභාගය වැන්න, තමා විසින් කරණලද වැඳුන මානනාදිඟට සුදුසු හෙයින් ආචාර්‍යවරයෝ දකුණුදිශාභාගයවැන්න, සවාමිපුරුෂයාහවපසුව අනුචපමත්තා හෙයින් අග්‍රුදරුවෝ පශ්චිම දිශා වැන්න ව්‍යසන ප්‍රාපතවූකල ඒ ඒ දුකින් එතර කරණ හෙයින් මිත්‍රාමාත්‍යයෝ උතුරුදිශා වැන්න, සවාමියාහට යවත්ව පවත්නා හෙයින් දැසිදස් කම්කරුවන් හා පිරිවරජනයෝ යදිදිශා වැන්න, ශීලාදි ගුණධර්මයන් තමහට උතතරිතරව සිටි හෙයින් සුසිල්වත් ශ්‍රමණ බ්‍රාහමණවරු උඩදිශාව වැන්න, මෙසේ මේ ෂඩ්දිශා නම්ලද දෙමව්පිය ගුරුවර අග්‍රුදරු නෑ මිත්‍රාමාත්‍ය දැසිදස් කම්කරු පිරිවරජන ශ්‍රමණ බ්‍රාහමණ යන මෙකී සියල්ලන් කෙරෙන් හෝ මෙලෝ පරලෝ දෙකින් අවැඩනොව වැඩවනසේ හැමදෙන විසින්ම ඔවුනොවුන් කෙරෙහි පක්ෂවොපකාරයෙන් සඞ්ග්‍රහ කටයුතුසි.

දෙමව්පියන්ට කටයුතු උපස්ථාන.

මම වනාහි මාගේ මව්පියන් විසින් මා බිහිවූකැන් පටන් රෑ දවල් දෙක්හි මහ දුක්විඳ ප්‍රේමයෙන් පිළිකුල් නොව මුවෙන් සෙම් සොටු මලමූත්‍ර හැරදමා නහවා කිරිපොවා අදුන් කිරිතෙල්

ගල්වා අතපය හඹා වඩනාලද්දෙම්, මම දැන් වැඩිහිය බැවින් ඊට ප්‍රත්‍යුපකාර වශයෙන් වැඩවයසට පැමිණි මව්පියන් අත්පා වැඩිම්, නැහැවීම්, කෑදබක් දීම්, ආදියෙන් රක්ෂාකරම්යයිද මාගේ කටයුතු තිබ්යදී දෙමව්පියන්ගේ ඒ ඒ කටයුතු කෙරෙම් යයිද, මව්පියන්ගේ කුලවංශය නොනසා පවත්වම්යයිද, මව් පියන් සතු සිඳලූ වඤ්වල නිශ්චල දේපලාදිය දූකෙළීම් ආදී දුසිරිතෙහි යෙදීමෙන් නොනසා රක්ෂාකොට මව්පියන්ට කළ මනාතාක් කටයුතු නොපිරිහෙලා කොට දැයාද භාගයෙහි හිමිවෙම්යයිද, දෙමව්පියන් දිවි ඇතිකල ඔවුන් සිත්හෙණ වාසයකොට, මළකල දැනඩම්දී පුණ්‍යක්‍රියාකොට පින්දෙම් යයිද සිතා මේසේ පස් ආකාරයෙන් දරුවන් විසින් දෙමව් පියන්ට සත්කාර කටයුතුසි.

දරුවන්ට කටයුතු පංචෝපචාර.

දෙමව්පියන් විසින් දරුවන්ට කටයුතු උපස්ථාන නම්- ප්‍රාණඝාතාදි පාපක්‍රියාවෙන් වන ආදීනව කියාදී ඉන් වැලැක් වීමය, අනේපිඬු සිමුහුමෙන් අත්ලස් දීමෙන්වත් දැනශීලාදිකුශල කරණයෙහි යෙදවීමය; තමන්ගේ පරම්පරාගත ශිල්පයෙහි හික්මවීමය, තමන්ගේ වංශවාරිත්‍රානුශතව සුශික්ෂිතවූවන් හා ආවාහ විවාහයන් සම්බන්ධකිරීමය, *නිත්‍ය සමය කාලසමය යන විප්‍රකාර කාලයෙහි දැයාද දීමය යන මේ සඞග්‍රහ පසයි.

ගුරුවරයන්ට කටයුතු උපස්ථාන.

ශිෂ්‍යයන් විසින් ආචාර්‍යවරයන්ට පස්කාරණයකින් උපස්ථාන කටයුතුසි, එනම් දුරින්ම එන්නාවූ ගුරුහු දැක හුනස්නෙන් නැගිට පෙරහමන්කොට අතතුබූ කිසිවක් හැර ගෙණ තබා ආසන පනවාදි හුන්කල පයසෝදවා තෙල් ගල්වා පවන්සලා සුවදුක් විචාරීවෙන් වතාවත් කිරීමද, අකුරු උගෙණන කාලය හැර දවස තෙවිටක් ගුරුහුකරා එළඹ කටයුතු උපස්ථානාදිය කිරීමද, ගුරුහු විසින් කියනලද ඔවා තෙපුල් ආදරගෞරවයෙන් ශ්‍රවණය කිරීමෙන් සිත්හි ධාරණයකොට ඒ අනුසාරයෙන් අඛණ්ඩව පිළිපැදීමද, උදැසනම අවදිව ගුරුහු කරා එළඹ මුවඳෝවනය පිණිස හුණුපැන් සිහිල්පැන්ද දැවිටිද දීමාදියෙන් ආචාර්‍යෝපස්ථාන කිරීමද, ආචාරීන් කෙරෙන් වරක් කියවාගත්දෙය බොහෝව හැදෑරීමෙන් මනාව ඉගෙණ ආචාර්‍යයන්ට වණපොත්දීමද යන මේ පසයි.

---

*නිත්‍යසමය නම් යම් යම් ප්‍රසංගවලදී, මේ මේ දෙය ගණුව මේ කොපව විය යුතුමය, මෙසින් කුසල්කරන්නටය කියා දෙනලද දීමනාවලයි; කාලසමය නම් ශිල්ප ඉගෙණීමෙහි යෙදිසිටින අවස්ථාවලදීද ආවාහවිවාහ කාලයෙහිද සවකීය මරණාසන්නකාලයේහිද දැයාදවශයෙන් සම්පාදීමයි.

ශිෂ්‍යයන්ට කටයුතු පඤ්චෝපකාර.

මේ ආකාර නිදුව මේ ආකාර සිටුව මේ මේ සැටියේ කව බොව පඤ්චදුශ්චරිතයෙහි ගැලුනාවූ පාපිෂ්ට මිත්‍රයන් සෙවනය නොකරව උගත් ශිෂ්ටාචාර මිත්‍රයන්කරා එළඹෙව යනාදි සියලු යහපත් චාරිත්‍ර ධර්මයන් උගැන්වීමෙන් නික්මවීමද, ශිෂ්‍යයන්ට උගන්වන ශාස්ත්‍ර උන් සිතව හැඟෙනතාක් අර්ථයෙන් පාළියෙන් ප්‍රයෝජන මනාකොට දැක්වීම් හා පෙර සඟකිය ආචාර්‍යවරයා ගෙන් දැන උගත් ශාස්ත්‍රය නොසඟවා ඇතිසැටියේ කියාදීමද; ශිෂ්‍යයන්ගේ නෑ සමූහය ඉදිරියෙහි හා මිත්‍රාමාත්‍යාදීන් අභිමුඛ යෙහිදීද තම අන්තෙවාසිකයාගේ ව්‍යක්තභාවය සහ බහුශ්‍රැතත්ව යන් ප්‍රකාශකිරීමෙන් ගුණනුවණ වැණීමද, ඒ ඒ දිශාවාසීන් අතර තම ශිෂ්‍යයාගේ උගත්කම ගැණ ප්‍රකටකරවීමෙන් ගිය ගිය දිහ පූජ්‍යවී උපස්ථානාදිය සහ ආරක්ෂාවල් ලබාදීමද යන මෙයැයි.

භාර්‍යාවට කටයුතු උපස්ථාන.

සවාමිපුරුෂයා විසින් පශ්චිමදිශා සඞ්ඛ්‍යාත භාර්‍යාවට උපස්ථානකරණ කාරණා පසතමි:- සවකීය භාර්‍යාවට කථා කරණකල දැසින්ව කියන්නාක්මෙන් "මෙසේ වර" "තෙල කරව" යනාදීන් අගෞරව වශයෙන් නිඟා නොකොට ප්‍රිය ඵලවන කන්කලු රසවදනින් ආමන්ත්‍රණය කිරීමද දැසි දස් කම්කරුවන්ට මෙන් පරිභව බිණීමෙන් තාඩන පීඩන වධ බන්ධනාදිය නොකිරීමද, සිය භාර්‍යාව ඉක්මවා පරදාර සෙවනය නොකිරීමද, තමාගේ ගෙහි ඇතිතාක් සියලු ඓශ්වර්‍ය සම්පත් පාවාදීමද, තමන්ගේ වසතුවට අනුරූප පරිද්දෙන් හෙළුත් තමන් පොහොසත් තරමින් ආභරණ සම්පාදනය කරදීමද යන මෙයයි.

සවාමිපුරුෂයාහට කටයුතු උපස්ථාන.

භාර්‍යාව විසින් සවාමිපුරුෂයාහව කවයුතු පඤ්චෝපස්ථාන නම්:—තම සවාමියාහට කෑදබත් පිසීම් ආදිය කරණ කාල නිය මය ෙනාසිස්මවා ඒ ඒ ආහාර පාන සූපව්‍යඤ්ජනාදිය රසවත් කොට කලට වේලාවට සාදාදීම සහ සවාමිහුගේ දුක්සැප දෙක ගැණ නිතොරම ව්‍යාවෘතව සිටීමද, සවාමිහුගේ සහ තමන්ගේත් නෑදෑ මිත්‍ර පිරිවර වැඩකාර දැසි දැසාදීන් සිත් නොකළකිරවා ඔවුන් හැමදෙන සිත්ගන්නා පරිද්දෙන් ආදර සංග්‍රහ කිරීමද; සිය සැමියාහැර අන් පුරුෂයන් හා අසඞ්ගියෙහි යෙදෙනු තබා මනසින්වත් නොසිතීමද, උපයා රැස්කොට ගෙහි තුබ්බධන

ධන්‍යාදි සම්පත් නිරීක්ෂකව විශ්වාස නොකට සුරැකිකොට තැබීමද, ආහාර පිසීම් හූ කැවීම් වැසීම් මැනීම් සහ වෙනත් හෙදෙර කළමනා කටයුතු ආදිය අලසනොව උත්සාහවත්ව කිරීමද යන මේ ආදියයි.

ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට කටයුතු උපස්ථාන.

දුරදී දුටුකල අදර උපදවා හුනස්නෙන් නැගී පෙරමගට යාම් වැදීම් පිදීම් පැන් පරහා දුවටිදඬු කැපකරදීම් ආදිවූ මෛත්‍රී යෙන් යුක්තවූ කායකර්මයද, "ස්වාමිනි පහසු අපහසු කිමෙක්ද? යමක් කැමතිනම් එය මට වදුලමැනව"යි ස්නාදීන් ආදරයෙන් පිළිසඳර යථාකිරීමවූ මෛත්‍රීයෙන් යුත් වචීකර්මයද, අපගේ කල්‍යාණමිත්‍රවූ කුළුපග සථවිරයන්වහන්සේ නිදුක් නිරොගිව සුඛිත වේවයි සස්තොහි උකටළී නොව ගුණානුවණින් වැඩෙවයි යනාදි මෛත්‍රියෙන් යුක්තවූ මනඃකර්මයද, තමාගේ හෙදෙරව සිල්වත් ගුණවත් භික්ෂූන් වඩිනා දුරදී දුටුකල දෙර නොවසා හෙයි නැතැයි නොකියා වැඩිබවට දෙම්නස් නොව මෙවැනි සිල්වතුන් අපගේ හෙට වැඩියේ යහපතැයි ප්‍රීති උපදවා කුළුණු නුවණින් යෙදී ආදර දක්වා අත පාත්‍රය ඇත එයගෙණ ඇතුළු හෙට වැඩියේ යහපතැයි හෙට අවුත් අසුන් පණවා වඩාහිඳුවා පත්ල සෝදා පවන්සලා දුහනිවා පැන්පිපාසා විවාරා කැමතිලව පැන් වළඳවා වැඩි අදහස් දැන ඒ කටයුතු පොහොසත් තරමින් සැපයීමද, පෙරබත්කාලයේ වැළඳීම පිණිස දියයුතු ආමිෂයන් එලවීමද යන මේ කුලපුත්‍රයන් විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට කටයුතු පඤ්චූපස්ථානයි.

කුලපුත්‍රයන්ට කටයුතු උපස්ථාන.

ප්‍රාණඝාතාදි පවිටු කම්කිරීමෙන් වැලැක්වීමය, දානශීලාදි කුශල ධර්මයෙහි පිහිටුවාලීමය, ප්‍රත්‍යයදායකයින් ප්‍රධානකොට ඇති හැම සත්හුම සුඛිතවෙත්වායයි මෛත්‍රී සිතින් අනුකම්පා කිරීමය, මින් ඉහත නොඅසනලද කුශලාකුශල විභාගවූ ධර්මය නියා ඇස්වීමය, ඇසූ ධර්මයෙහි ග්‍රන්ථිස්ථානයන්හි අර්ථ කියාදීමෙන් ශංකා විනොදනය කොට පිරිසිදුකිරීමය, සවණියෙහි ඉපදීමට මහදැක්වීමවූ ආශංසී අභ්‍යාඛ්‍යිකාමාශීර්වාදිවූ මනොහර ධර්මයන් කියාදීමය යන මේ ෂට් ආකාරයෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් කුලපුත්‍රයන්ට සංග්‍රහ කටයුතුයි.

මිත්‍රාමාත්‍යාදින්ට කටයුතු උපකාර.

කුලපුත්‍රයා විසින් මිත්‍රාමාත්‍යාදීන්ට කටයුතු සඞ්ග්‍රහ පස නම්; තමන් ගෙදොරට පැමිණි මිත්‍රාමාත්‍යාදීන්ට ආදර ගෞරව සහිතව ඉදුම් හිටුම්දී වතාවක්කොට ආහාරපානවශීාදියදීමෙන් සඞ්ග්‍රහ කිරීමය, පිළිසඳර කථාවෙන් යුක්තවීමය, ඔවුන්ට ලාභ ඓශ්වර්‍යාදියක් ලැබීමට නිසි යමක් පැමිණිකල ඊට පසුනොබැස ප්‍රතිඥාධාරවීමය, සුව දුක් වශයෙන් තමන් හා සමකොට කල්පනා කිරීමය, ඔවුන් විසින් යමක්කරව යමක් දෙවයි කියන ලද කල්හි, එය යොඞ්‍යතම් ශක්‍යතිතරම්න් කරදීමය යන මේයයි.

කුලපුත්‍රයන්ට කටයුතු උපකාර.

මිත්‍රාමාත්‍යාදීන් විසින් කුලපුත්‍රයන්ට කටයුතු පඤ්චෝප කාර නම්:—යම් ආපදාවක් පැමිණීමෙන් දුකින් සිහිමුළාවූ තම මිත්‍ර කුලපුත්‍රයා රක්ෂාකිරීමය, නොරවයෑම් රොගාතුරවීම් ආදී යමකින් ප්‍රමාදවූ ඔහුගේ අඹුදරුවන් සහිත ඔහු සතු ධනය රක්ෂාකිරීමය, අග්නි උදක රාජ චොර ශත්‍රු ආදීන්ගෙන්වන භය ගැණ පිටුවහල් වීමය, ධන හානි වීමාදි යමකින්වන විපතකදී ඔහු අත් නොහැර පිහිට වීමය, ඔවුන්ගේ අපරප්‍රජාවගේ*ආවාහ විවාහ මඞ්ගල්‍යවලදී වස්තු පරිත්‍යාගකිරීමෙන් උපකාරවීමය යන මෙයයි.

දැසිදසුන් විසින් සවාමීන්ට කටයුතු උපස්ථාන.

දාසකර්මකාරාදීන් විසින් තම සවාමීන්හට කටයුතු පඤ්චෝ පස්ථානනම්:— තම සවාමියා අවදිවීමට ප්‍රථමයෙන් අඑයම් කළ මනා තාක් කර්මාන්ත සලකා නැගිසිට කිරීමය, හැමකටයුතු නිමවා පෙරයම සවාමිහු සැතපුනුකල හෙවත් සවස ආහාර අනු භවකොට නිදන්ට වන්කල්හි තුමූ පසුව හෝ වීමය, සවාමිහු නුදුන්දෙය සොරා නොගෙණ දුන්දෙය පමණක් ගැන්මය, තමන් කරණතාක් කර්මාන්ත නොවරදවා අතපසු නොකරකිරීම සහ 'මෝවුන්ගේ කර්මාන්ත කිරීමෙන් අපට කවර ඵලද?'' සි, නොසිතා සවකීය කටයුත්තන් සෙයින් සලකා එයින් වන ලාභ යට හානි නොවනසේ යහපත්ව කිරීමය, තමන් ගියනාක් තැන 'අපි අප දැසබව නොදතුවන් වැන්නම්හ මව්පියන් හෙයි වසන්නාවුන් වැන්නම්හ අපගේ සවාමියා වැනියෝ කවුරුඇද්ද යනාදි වශයෙන් සවාමිහුගේ ගුණකථනය කිරීමය යනා මෙහුයි.

* අපර ප්‍රජාව නම් දූදරු මුණුපුරු ආදිහුයි.

සඞ්ඝමිත්‍රා විසින් දැසිදසුන්ට කටයුතු උපකාර.

දැසභාවයෙහි සිටින අයට ඔවුනොවුන්ගේ බලයට වයසට තරමට සුදුසු ආකාර කම්කාන විධාන කිරීමය හෙවත් තරුණයන් විසින් කටයුතුද මහල්ලන් ලවාද මහල්ලන් විසින් කටයුතුද තරුණයන්ලවාද ස්ත්‍රීන් විසින් කටයුතුද පුරුෂයන්ලවාද පුරුෂයන් විසින් කටයුතුද ස්ත්‍රීන්ලවාද යන මේ ආකාරයෙන් විපරීත නොකොට අන්‍යොන්‍යයන්ගේ කාලයට සහ තත්‍වයටද සුදුසු ආකාර වැඩ නියමකිරීමය, ඔවුනොවුන්ගේ වෙහෙස මහන්සිය සහ ප්‍රමාණාදි සවරූප බලා දුම්මා බත්විසදම් (වැටුප්) නිහනොහිටවා දීමය, දැසකම් කාරයන් වයොවෘඬවූකල හා රොගාතුරවූකලද ඔවුන්ට කම්කාන නියමකොට ඒ ඒ අවසථාවට සුදුසු ප්‍රතිකාර කරවීමෙන් උපසථානකිරීමය, මධුරවූ අපූපීවූ කනබොන්ද ලන්කල තමා පමණක් අනුභවනොකොට නොසඟවා මදමදවත් ඔවුන්ටත් බෙදාදී අනුභව කිරීමය, දිනමුළුදු වැඩකිරීමෙහි නියුක්තවූවන්ට ඔවුන් දුම්ල නොවනසේ නිවාඩුකාලයක් නියමකිරීම සහ සමය මඞ්ගල්‍ය පූජොත්සව මඞ්ගල්‍ය සරණමඞ්ගල්‍ය නැකැත්කෙළි අවුරුදුමඞ්ගල්‍යාදි එක්තරා මඞ්ගල්‍යොත්සවදිනක් පැමිණිකල්හි ඔවුන්ගෙන් මෙහෙනොගෙණ, ඒ ඒ කටයුත්තට උවමනාද විචාරා වී කාල් ආදි උපකරණ සපයාදීමෙන් උපසථම්භකවීමය, යන මේ පස්කාරණයෙන් දැසිදස් කම්කරු ආදීන්ට උපකාර කටයුතුයි.

විසතුව ප්‍රයොජන ගතයුතු ආකාරය.

"පණ්ඩිතෝ සීල සම්පන්නෝ ජලං අග්ගිව භාසති
භොගෙ සංහර ඨානඤ්ච ගම්මරසෙව ඉදිච්චතෝ
භොගා සන්නිචයං යන්හි වම්මිකෝ වූපචීයති
එවම්භොගෙ සමාහනන්තා අලම්පඤ්ඤා කුලෙගිහි"

යනු වදාළහෙයින් ඉහත දැක්වූ ක්‍රමයෙන් ශීලසම්පන්නවූ ප්‍රඥාවන්ත පුද්ගලතෙම ඝනාන්ධකාර රාත්‍රියෙක්හි දැල්ලූ මහත්වූ ගින්නක් මෙන් දීප්තිමත්ව බබලන මහා වහනිසකඛඝක්මෙන් භ්‍රාජමානවන්නේය; පරහට සහ තමහටත් පිඬානොවනසේ ධර්මයෙන් රැස් කරණලද වස්තු ඇති ඔහුගේ ධනය මහත්බවට පැමිණෙයි; කෙසේදැයි යත්හොත්? යම්සේ භාඛාතෙම පුෂ්පයන්ගේ වර්ණ ගන්ධාදී නොනසා තම තුඩින් හා පියාපතිනුත් මුවරදගෙණ රියරෝද ප්‍රමාණ මධුපටලයන් නිර්මාණයකරන්නේවේද එමෙන් ධනරැස්කරන්නේය; තවද වේයන් විසින් අනුක්‍රමයෙන් බඳනා ලද තුඹිස යම්සේ වර්ධනයවේද; එමෙන් කල්‍යාණශීලවූ ඒ කුල පුත්‍රයාගේ ධනයද ක්‍රමක්‍රමයෙන් රාශිභූතවීමෙන් වැඩෙන්නේය;

එකල හෙතෙම ගෘහවාසයෙහි විසතව පොහොසත් වන්නේසි, එසේ රැස්කරණුලද වයතුව ප්‍රයෝජන ගතයුතු ආකාරය කෙසේදයත් ?

"චතුධා විභජේ භොගෙ සබෙමිත්තානි ගච්ඡති
එකෙන භොගෙ භුඤ්ජය්‍ය විභාමමං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති"

ගිහිතෙම තමසතු සියලුවස්තුව සතරකොටසකට බෙදා, ඉන් කොටසක් කෘෂිකර්ම වණික්කර්මාදි ධාර්මිකකර්මානතවල යොදන්නේය, සෙසු කොටස රාජ චොර අග්නි උදක යන මේ ආදිවූ යමකින් කිසියම් ආපදාවක් පැමිණිකල වියයුතුයයි සිතා සුරැකිව තබන්නේය *

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සිඟාලකනම් ගෘහපති පුත්‍රයා හට මේ සිඟාලොවාදසූත්‍රයෙන් ධර්මදෙශනාකොට නිමවා **රජගහ නුවරට** පිණ්ඩපාතය පිණිස වැඩිසේක; ගෘහපති පුත්‍රයාද මේ දෙශනාව අසා සොවාන්ව සරණශීලයෙහිපිහිටා සතළිස්කෙළක් ධනය බුදුශාසනයෙහි විසුරුවා පින්කම්කොට සවඟීපරායණවිය.

භාරවාජ සථවිර කථාව.

එක් සමයෙක්හි අප සම්බුදුන් වහන්සේ **මගධදෙශයෙහිවූ එඛනාලනම්** බ්‍රාහ්මණ ග්‍රාමයෙහි දක්ෂිණාගිරි මහාවිහාරයෙහි වැඩවාසය කරණසේක; එසමයෙහි වනාහි (කෘෂිකර්මානතයෙන් ජීවත්වන හෙයින් හා භාරද්වාජනම් ගොත්‍රාද්භූත හෙයිනුත් ලබතලදනම් ඇති) **කසිභාරවාජ බ්‍රාහ්මණයාගේ** (කැකුලමව) වැපිරීමක්විය, එයද පළමු මඟුල් වප්දවසවිය; ඉක්බිති අප භාග්‍යවත් සම්‍යක් සම්බුධයන්වහන්සේ න්‍යාග්‍රොධ ඵලවණ්ණවූ දෙපට අඳනා සිවුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනයෙන් සකසා හැඳ පෙරව සුපිපි පියුම් දෙකක් මැදට වදනා හෘඛරාජයෙකු වැනි ඉඳුනීල මාණික්‍යයක් බදුවූ ශෛලමය පාත්‍රය හස්තාවයෙන් ගෙණ කසිභාරවාජබ්‍රාහ්මණයාගේ කර්මාන්තසථානය සමීපයෙක් හිද එතනට හුදකලාව එළඹිසේක. එසමයෙහි කසිභාරවාර

---

* මෙහි අප සම්බුදුන්වහන්සේ විසින් කුසල්කිරීම පිණිස කොටසක් නියම නොකරණ ලද්දේ කුශලක්‍රියා කිරීමෙහි ප්‍රමාණයක් කිරීම නුසුදුසු බැවිනි; ලොභ මෙෂ මොහාදි අකුසල් චෙතනා ඇතිකාන්ම සඟයන් විසින් දැන සීල භාවනාදි පුණ්‍යක්‍රියා මෙපමණක් කටයුතුයයි නියමයක් නොමැතිසි; එබැවින් ශ්‍රද්ධාඇති පුද්ගලයන් විසින් තම තමන් ශක්තිය තරමින් කුශලක්‍රියා වෙහි වසතු විය දම් කටයුතුසි, කුසල් කිරීමට ශ්‍රද්ධා ප්‍රඥාදෙක ප්‍රමාණවාඹිඹ අන් කිසි වසතුවක් ප්‍රමාණනොවේ.

බ්‍රාහ්මණයාණන් අනුභවකිරීම පවතීයි හෙවත් ආහාරකෘත්‍යය පිණිස රජත සුවර්ණාදී භාජනයන් නොණ හුන් පන්සියයක් ගොවිදරුවන්ට රන්සැන්දක් ගත් බ්‍රාහ්මණ දෙව්යගේ බෙදාදී අනුභව කරවීමවිය; බමුණුතෙමේද එහි සමීපයෙහි සිට අසවල් දෙයබෙදව අසවල්දෙයබෙදවයි කියා විධාන කරමින් හැසිරෙයි; එකල සම්‍යක්සම්බුදුන්වහන්සේ ආහාරඅනුභවකිරීම යම්තැනෙක්හිද එතනටවැඩ එකත්පසෙක සිට හෙවත් යම් තැනෙක්හි වැඩසිටි බුදුහු බ්‍රාහ්මණතෙමේ දකිද එසෙවූ උච්චසථානයක වැඩ සිට ශ්‍රී බුඩශරිරයෙන් රශ්මිමාලා හරින්නවත්; ඉක්බිත්තෙන් ආහාරානුභවකරමින්හුන් මහාජනයා සුවර්ණපළිතයක්මෙන් සුවර්ණක්ෂණ බුඩරශ්මි වාලාවෙන් ජාලිනව හිඤ්ඡාව පිණිස වැඩසිටියාවූ බුදුහු දැකළන්වහන්සේ පිරිවරා සිටියාහුය. කාසිභාරවාජ බ්‍රාහ්මණතෙම මෙසේ ඔවුන් විසින් පිරිවරනලදුව පිඬුපිණිස වැඩසිටියාවූ සම්‍යක්සම්බුදුන් වහන්සේ නිරීක්ෂණයකොට, ''මෙසේ කීවේය; ශ්‍රමණභවත් ගෞතමයන්වහන්ස, මම වනාහි සාමි වපුරම් කර්ෂණය කොට ගෙණද වපුරනෙණද අනුභව කරන්නෙමි; භුඩවහන්සේද කර්ෂණයකළමැනව වපුළමැනව සාගෙන වපුරගෙණ වැළඳුව මැනව''සි කීයේය; කවර කරුණකින් මෙසේ කීයේදයත්? සම්‍යක්සම්බුදුන්වහන්සේගේ දෙහළීය දර්ශනය කිරීමෙන් තෘප්තියට නොපැමිණි මහාජනයාදැක, මේ ශ්‍රමණතෙම මෙහි පැමිණීමෙන් මාගේ කර්මාන්තයට බාධාවන්නේය. ඉදින් මේ තෙමේත් මාසේ කර්මාන්තකරයි නම් සියලු දඹදිව ජනයන්මත පැළඳි කිරීවයක් බඳුවෙයි, කුසිනභාවය හෙතුකොටගෙණ කර්මාන්තනොකරවා අන්‍යයන්ගේ වප්මගුල් ආදියෙහි සිහා කුමින් හැසිරෙන්නේයයි නොසතුටුවය.

එකල සම්‍යක්සම්බුදුන්වහන්සේ නමන්වහන්සේගේ අග්‍ර කර්ෂක භාවය වදාරණසේක් ''එම්බ්‍රාහ්මසිභාරවාජබ්‍රාහ්මණය, මමද සාමි වපුරම් සාගෙණ වපුරගෙණ අනුභවකරමු''සිවදාළසේක; මෙසේ වදාළකල ඒබමුණුනට මෙබඳු කල්පනාවක් පහළවිය, මේ ශ්‍රමණභවත් ගෞතමතෙම තමන් සාවපුරගෙණ අනුභවකරණ බවක් කියයි, එහෙත් මේ ශ්‍රමණයාගේ එබඳුවූ වියදණ්ඩක් හෝ නඟුලක් හෝ සිවැලක් හෝ කැවිටක් හෝ ගෙරින් හෝ අපි නොමදුටු වෙමු, එබැවින් මේනැණ විචාළයුතුයයි සිතූ බ්‍රාහ්මණතෙම මෙසේ ගාථාවෙන් සැළකළේය:—

''කස්සනෝ පටිජානාසි නවයස්සාමි තෙ කසිං
කසිං නෝ පුච්ඡිතෝබ්‍රූහි යථා ජානෙමු තෙ කසිං

ශ්‍රමණභවත් ගෞතමයන් වහන්ස, භුඩවහන්සේ කර්ෂක යෙකැයි (සිසාන්නෙකැයි) කියා වදාරන්නෙහිය, භුඩවහන්සේ

යුග තහුල් ආදි කෘෂිභාණ්ඩ උපකරණ අපි තුදුවුව්රුම්හ, තුබ වහන්සේගේ කෘෂිභාණ්ඩ කාවරේදයි ඔම්පරිද්දෙකින් අපි දැන ගන්නෙමුද, එපරිද්දෙන් දෙශනාකොට වදුළමැනවයි අයැදිය; එකල සම්බුදුහන්වහන්සේ වදාරණසේක්:—

"සද්ධාබීජං තපෝ වුට්ඨි පඤ්ඤා මේ යුග නංගලං
හිරි ඊසා මනෝ යොත්තං සතිමේ ඵාල පාචනං
කාය ගුත්තෝ වචී ගුත්තෝ ආහාරේ උදරේ යතෝ
සච්චං කරෝමි නිද්දානං සෝරච්චං මේ පමෝචනං
විරියමේධර ධොරයහං යොගක්ඛේමාධි වාහනං
ගච්ඡති අනිවත්තන්තං යත්ථ ගන්ත්වා න සෝචති"

"එම්බාබ්‍රාහ්මණය බෝරදිය පහදන උදක ප්‍රසාදමාණික්‍ය යක් මෙන් චිත්තයාගේ පැහැදීමවූ ශ්‍රද්ධානොමෝ බිජුවට වන්නේය, ඉන්ද්‍රිය සංවර ශීලය හෙවත් ඇස් කන් නාසා ජිව්හා කාය මනස් යන ඡඬි ඉන්ද්‍රියයන් ලොභ වෙෂ මොහාදි අකුශලචෙතනා වන් හටගැණීමට අවකාශනොදී සිහිනුවණින් යුකතව සංවර කිරීම හෙවත් වසාගැණීමයයි කියනුලබන ඉන්ද්‍රිය සංවරශීලය වනාහි බීජාඩකුර හටගැණීමට කාරණයවූ වර්‍ෂාව වන්නේය, මාගේ කාමාවචරාදි ප්‍රභෙද ඇති ප්‍රඥතොම ලොකොත්තර ධර්‍ම නමැති සියට වියනගුල් වන්නේය, අකුශල ධර්‍මයන් කිරීමට ලජ්ජාවන්නාවූ පිළිකුල්වන්නාවූ හිරිතොම නගුලිය වන්නේය, මාගේ සමාධිතොම ප්‍රඥනමැති විය තහුල් හා වියඹ නමැති ගවයන් බැඳීමකරණ ඒඃබානවන්නේය; සිහිකටයුතුවූ විදර්‍ශනා මාගීය හා සම්ප්‍රයුක්තවූ (යෙදුනාවූ) මාගේ සමෘතිතොමෝ නාඟේ සීවැල හා කැවිටමෙන්, කෙලෙස් නමැති පාංශු පිණ්ඩප්‍රදලනය කරනාඊයෙන් සීවැල හා කැවිලි වන්නේය"යි වදාළසේක.

නැවතද වදාරණසේක්,"එම්බා, බ්‍රාහ්මණය යම්සේ නෝ බිජුවට වපුරු ශස්‍යපරිපාලනය පිණිස කටුවැටක් හෝ අන්කිසි ප්‍රාකාරයක් හෝ කරවීමෙන් ගොමිහිංසාදීන්ගේ ගමන් වලක්වාද එමෙන් මමද චිත්තසන්තානයෙහි ශ්‍රද්ධා නමැති බිජුවට වපුරු අනෙකාකාර කුශල ශස්‍යයන් පරිපාලනය පිණිස ත්‍රිවිධ කාය සුචරිතයද චතුර්විධවාක්සුචරිතයද රක්ෂාකෙළෙමි, චතුර්විධප්‍රත්‍ය යෙහි නෙවත් උදරඅසි ගන්නාලද කුක්ෂියට අනුභවකරණ බාද්‍ය භොජ්‍යාදිචතුර්විධ ආහාරාදියෙහි අකුශල ප්‍රවෘත්තින්නැවැත්තේ වෙමි හෙවත් **ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, 2 ආජීවපාරිශුද්ධිශීලය, 3 ප්‍රත්‍යය සංනිශ්‍රිත ශීලය** යන මෙය රක්ෂාකිරීමෙන් ත්‍රිවිධ

---

1. බුඞ් ප්‍රඥප්තිවලට අනුව පැවතීමෙන් රකින ශීලය.

2. සන්සුන්ව කුලදරුවන්ට අනුලොම් නොවූ පැවතුම්වලින් දුරුව ධාර්මික ලෙස ජීවිකාව කිරීමෙන් රක්නා ශීලය.

3. දැහැමෙන්ලද සිවුරු ගිලන්පස පිණ්ඩපාත සෙනසුන් යන සිව්පසය, සැරසිම් ආදිය පිණිස නොව විලිවැසීම් ආදි ඒ ඒ ප්‍රයෝජනය පමණක් සලකා පරිභෝගයකිරීමෙන් රක්නා ශීලය.

ප්‍රාකාරය බැන්දෙමි, එහෙයින් රාගචෛත මෝහාදී අකුශල චිතකී නමැති නො මහිමෂ සමූහයා ප්‍රවේශවීමට නොහැක්කෙන් කුශල ශස්‍යය රැකිනවන්නේය; යම්සේ කෘෂිකාර්මාන්ත කොට ශස්‍ය දූෂණයකරණ තෘණාදී පැලෑටි අතින් උදුරාදමා හෝ කඩුවකින් ඡේදනය හෝ කරන්නේ වේද එමෙන් ආධ්‍යාත්මික කෘෂි කර්මයකොට කුශල ශස්‍යය දූෂණය කරණ මිථ්‍යාදෘෂ්ටි සඤ්ඤාත තෘණයන් මාගේ සතුණ සත්‍ය නමැති ඛඩ්ගයෙන් සිදහැරීම්, නවද තාගේ මිදු ගවයෝ නැවත සායාහ්න සමයෙහි හෝ දෙවෙනි දවසෙහි හෝ යොදන්නේ නුමුත් මාගේ කායික චෛතසික ප්‍රධාන වීර්‍යය, එනම් නුපන් අකුසල් නොඋපදවන්නා වූද උපන් අකුසල් නසන්නාවූද නුපන් කුසල් උපදවන්නා වූද උපන් කුසල් වර්ධනයකරන්නාවූද යන මේ චතුස්සම්‍යක් ප්‍රධාන වීර්‍ය නමැති බලිවර්දියන් (ගවයන්) මිදීම එසේ අතර ඇතිකොට නොවන්නේය, මම වනාහි දීපඞ්කර සම්බුදුන් වහන්සේගේ කාලයෙහි පටන් නොනවත්නේ ප්‍රඥුනමැති නඟුලෙහි වීර්‍යනමැති ගවයන් යොදා මහාකර්ෂණය කරන්නෙමි යම්තාක් කලකින් බොධිවෘක්ෂමූලයෙහි අපරාජිත පර්‍යඞ්කා රූඪව වැඩඋන්නාවූ මට සර්ව්ඥගුණ පරිවාර ප්‍රවර අග්‍රත් ඵලය ලැබුනේද, එකල්හි මා විසින් කරණලද සියලුම වීර්‍ය සංසිද්දි මට පැමිණියෙන් චතුස්සම්‍යක් ප්‍රධාන වීර්‍ය නමැති බලිවර්දියන් මිදුයෙමි, නැවත යෙදියයුතු බවක් නොවන්නේය; නැවතද වදුරණසේක්, "එම්බා බ්‍රාහ්මණය විඤ්ඤාණනාම ඤෙත්‍රය ප්‍රඥා නමැති නඟුලෙහි සම්‍යති නමැති සීවැල යොදා, හිරි නමැති නඟුලිය මත්තෙහි ප්‍රඥා නමැති වියදණ්ඩ තබා සමාධි නමැති යොතින් බැඳ චතුස්සම්‍යක් ප්‍රධාන වීර්‍ය නමැති ගවයන්යොදා සම්‍යති නමැති කැවිමෙන් කැවිවිකරමින් කර්ෂණයකොට එහි ශ්‍රද්ධානමැති බීජවල වපුරා එය මලාතික නොවීම පිණිස ඉන්ද්‍රිය සංවර සිල් නමැති ජල සිඤ්චනයකොට ප්‍රාතිමෝක්ෂ සංවරශීලය ආජීව පාරිශුද්ධිශීලය ප්‍රත්‍යය සංනිශ්‍රිත ශීලය යන මේ ත්‍රිවිධ ශීල නමැති ප්‍රාකාරයෙන් හාත්පස වටකොට මිථ්‍යාදෘෂ්ටි නමැති තෘණයන් සතුණසත්‍ය නමැති කඩුවෙන් සිඳ මෙසේ රක්ෂාකරණ ලද ශ්‍රද්ධා බීජයෙන් නිර්වාණ නමැති අමාඵල ලාභීවන්නේය"; එහෙයින් වදුරණලදී:—

"එව මෙසා කසි භවතා සාහොති අමතප්ඵලා
එතං කසිං කසිත්වාන සබ්බදුක්ඛා පමුච්චති"

යථොක්ත ප්‍රකාරවූ ඒ මේ උත්තරාඥ්‍ය කෘෂිකර්මය ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීවූ යම් කිසිවෙක් කෙලේවිනම් හේ පුද්ගලතෙම සකල දුඃඛයෙන් මිදෙන්නේය හෙවත් නිර්වාණ නුමැති ක්ෂේම පුරයට පැමිණෙන්නේය යනුයි.

මෙසේ රාග ද්වේෂ මොහාදි අකුශලධර්මයන් සහනාකරණලද අර්හත්වයෙන් හුනවත් නම්වූ සම්බුදුරජාණන්වහන්සේ කසිභාරද්වාජ බ්‍රාහ්මණයාහට අනිත්‍යඵලය කුළුහන්වා නිර්වාණය අවශානකොට ධර්මදේශනා කළසේක; මෙසේ මේ ගම්භීරඥානාන්විත ධර්මදේශනාව ශ්‍රවනයකිරීමෙන් චිත්තප්‍රසාද ඇතිවූ ඒ බමුණුතෙමේ තමා උදෙසා සම්පාදනය කරණලද සර්පිර් ඔදු ශක්කරාදි සංස්කාරවූ ඒ ක්ෂීරපායාසය සම්බුදුරජාණන්වහන්සේට පිළිගන්වනු කැමැත්තෙන්, "භවත් ගෞතම සම්බුදුරජාණන්වහන්ස, ඔබවහන්සේ අමෘත ඵල ඇති කෘෂිකර්ම කරණසේක් බැවින් මහා කර්ෂක තෙනෙක එහෙයින් මේ ක්ෂීරපායාසය වළඳා වදාළසේක්ව"යි එලවූයේය, එකල සම්බුදුරජාණන්වහන්සේ වදාරණසේක් "බ්‍රාහ්මණය මා විසින් ගාථා කිහා ගුණවර්ණනාකොට ලබනලද ආහාරය, නාට්‍යකාදීන් විසින් ශිරෝභූෂණාදිය ලබනලද භෝජනයවැනි බැවින් අකැපවූ ඒ ආහාරය පිළිනත නොහැකිය"යි වදාළසේක්ය. මෙසේ වදාළකල සම්බුදුරජාණන්වහන්සේට දන්දීමට නොලත් හෙයින් බ්‍රාහ්මණයාගේ සිතෙහි දෞර්මනස්‍යයක් පහළවිය; ඒ උපන් දෞර්මනස්‍ය පහකරණු පිණිස, "එම්බා බ්‍රාහ්මණය, සම්බුදුරජාණන්ගෙන් පරිපූර්ණවූ මහත් ශීලස්කන්ධයක් දරණ සෙයින් මහර්ෂිවූ දුරුකරණලද සකල ක්ලේශයන් ඇති රහතුන්ට ක්ෂීරපායාසයෙන් අන්‍යවූ බාදුහොජ්‍යාදී ආහාරපාන වර්ගාදියෙන් උපස්ථාන කරව, පින් කැමැත්තාහට ඒ පුණ්‍යක්ෂේත්‍රයම ප්‍රමාණය"යි වදාළසේක; එකල බ්‍රාහ්මණතෙම, "භවත් ගෞතමයන්වහන්ස එබැවින් මේ ක්ෂීරපායාසය මම කවරෙකුට ප්‍රදානයකරම්දැ"යි විචාළේය; සම්බුදුරජාණන්වහන්සේ වදාරණසේක් "බ්‍රාහ්මණය, මේ ක්ෂීරපායාසය සම්බුදුවරයෙක් හෝ සම්බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවක තෙනෙක් හෝ හැර මෙය දිරවීමට පමුණුවානතහැකි ගකාධිසම්පන්නවූ අන් කිසිවෙක් මාගේ බුද්ධඥානයෙන් නොමදකිමි, එබැවින් මෙය හට නොගත් නිල්තණ ඇති භූමියක හෝ දමව, මහා ජලසංඝයක හෝ උපුල්වා පියව"යි වදාළසේක; ඉක්බිති කසිභාරද්වාජ බ්‍රාහ්මණයා විසින් සම්බුදු අනුශාසනාව පරිද්දෙන් එම ක්ෂීරපායාසය ජලයෙහි ප්‍රක්ෂේප කරණලද්දේ "චිට්චිට චිට්චිට" යන අනුකරණයෙන් ශබ්ද පවත්වමින් හාත්පසින් ධූමයෙන් ගැවසී ගන්නේය; මෙය දැනගනු බ්‍රාහ්මණයාහට ධර්ම සංවේගය උපදවනු පිණිස සම්බුදුරජාණන්වහන්සේගේ අධිෂ්ඨානයවූ පරිද්දෙන් වියසී දහයුතුසි; මේ බැව් දුටු බ්‍රාහ්මණයාගේ සිත සන්සිඳුවීමට පැමිණියෙන් සකල ශරීරයෙහි ලොමොදහතවිය; නැවතද බ්‍රාහ්මණතෙම බුදුහු කරා එළඹ සම්බුදුරජාණන්වහන්සේ විසින් දෙශිත උත්තරාශ්‍රවවූ ධර්මයෙහි ගුණවර්ණනාකොට අනාතුරුවද උපමා සතරකින් ධර්මය සතුටුකරනුයේ, "භවත් ගෞතමයන්වහන්ස

අධොමුඛකොට තබනලද බදුනක් උඩුකුරු කොට තබන්නේ යම්සේද, එමෙන් ඔබවහන්සේගේ ජනමනොරඤ්ජනීයවූ ධර්මය වාදයන් ශ්‍රවණයකිරීම හෙතුකොටගෙණ අසද්ධර්මයෙහි ගැලී සිටියාවූ මා නිර්මලවූසද්ධර්මයෙහියොදවීමෙන් ගොඩලූසේක, නෘණ පණිවිදින් ප්‍රතිවිජ්ඣාවූ යම් කිසි වස්තුවක් විවෘතකොට දක්වන්නේද, එමෙන්ම මිථ්‍යාදෘෂ්ටි නමැති තෘණජණ්ණාදියෙන් ප්‍රතිවිජ්ඣාවූ මට එය සමුලොද්ඝාතනය කිරීමෙන් සම්‍යග්දෘෂ්ටිය ප්‍රකාශකළසේක; යම්සේ මංමුළාවීමෙන් නොමග යන්නාවූ පුරුෂයෙක්හට මේ මාර්ගයයි කියාදෙන්නේද එමෙන්ම මිථ්‍යා දෘෂ්ටි වීමෙන් නොමගට පැමිණියාවූ මාහට මේ සත්‍යමාර්ගයයි සවර්ගීමොක්ෂ මාර්ගය දක්වාළූසේක; යම්සේ චතුරඞ්ගයකින් සමන්විත ඝනාන්ධකාරයෙහි "ඇස් ඇත්තාවූ රූපයන් දකින්ව"යි කියා මහාප්‍රදීපයක් දල්වන්නේද එමෙන්ම මොහාන්ධකාරයෙහි නිමග්නවීමෙන් බුද්ධාදි රූප නොදැක විසූ මට දෙශනා නමැති මහා ප්‍රදීපාලොකයෙන් බුද්ධාදි රත්නත්‍රය නමැති රූප දක්වා වදාළසේකැ"යි සතුති කෙළේය; මෙසේ කියා ඉක්බිති ඒ කසීභාරවාජ බ්‍රාහ්මණතෙම, "භවත් ගෞතම සම්බුද්ධයන්වහන්ස නුබවහන්සේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව සම්පදුදෙවා වදාළ මැනව"යි ආයාචනාකෙළේය; සම්බුද්ධයන්වහන්සේද ඔහුගේ අයැදුම පරිද්දෙන් පැවිදි උපසම්පන්දී වදාළසේක; රහත් භාවයට පැමිණි මහාශ්‍රාවකයන් අතුරෙන් **ආයුෂ්මත් භාරද්වාජ ස්ථවිරතෙමේ** එක් නමකි.

සප්පායසී ධනය.

එවද එක් සමයෙක්හි අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **ශ්‍රාවස්ති** නම් පුරප්‍රවරය ගොදුරුගම්කොට ජේතවනාරාමයෙහි වැඩවාසය කරණසේක්, එසමයෙහි වනාහි භගවතුන් කරණලද **රාග** ද්වේෂ **මොහ** මක්ඛ **පලාස** ඊර්ෂ්‍යා **මාත්සර්‍ය මායා සාඨෙය්‍ය** ස්තම්භ **මාන අතිමාන මද ප්‍රමාදාදි** සියලු උපක්ලෙශ ධර්මයන් ඇති හෙයින් "භගවා" යයි වාච්‍යවූ අප සම්බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේ පිරිවරාහුන් නිර්විඝ ශික්ෂායෙහි සුශික්ෂිතවූ ඒ මහා භික්ෂුසංඝයා වහන්සේලාට මෙසේ වදාළසේක:—

"මහණෙනි, රූප පොර ශත්‍රු ආදීන් විසින් පැහැර ගත නොහැක්කාවූ ආර්‍යධනයෝ සත්දෙනෙක් මෙති, ඒ කවරහුදයත්? ශ්‍රද්ධාධනය, ශීලධනය, හ්‍රීධනය, ඔත්තප්පධනය, ශ්‍රැතධනය, ත්‍යාගධනය, ප්‍රඥාධනය, යන මොහුයි; මේ සප්ත විධවූ ආර්‍යධන අතුරෙන් ශ්‍රද්ධාධනය තෙම කවරේදයත්?

මහණෙනි, මේ ලොකයෙහි හෙවත් නිමිලවූ සසීඳුශාසන යෙහි යම් ආයර්‍ය ශ්‍රාවකයෙක්තෙම, ඉතාදුන් ගණන් මාත්‍රීය නෙවා නොස් ශීලාදි ගුණයෙන් සමලඬකෘතවූ ආයර්‍ය පුද්ගලයන් දැකිනු කැමැතිවේද, මහත් විෂසොර සමීඝන් විසින් සවකීය දරුවන් දෂටකළ කල්හිදු නම ශරීරය වෙලනකල්හිදු එයට සිත නොහෙලා ධම්ශ්‍රවණයෙහිම ඇලුම් ඇති වේද, ලොභ චෙතනාවෙන් දුරුව තමාසතු සියලුම වසතු හෝ ප්‍රියවූ අඹුදරු ආදීන් පවා හෝ දුගි මගි යාචකාදීන්ට දන්දීමෙහි ආශා ඇති වේද, "ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුඩෝ" යනාදි වශ යෙන් සසීඳුගුණානුසමරණශකොට අදහසිද, තථාගතයන්වහන් සේ විසින් ශ්‍රොතාපත්‍යාදි චතුර්විධ මාර්ඝඥය මනාකොට අවබොධ කරණලදුයි ශඛකා රහිතව අදහන්නේවේද, එසේවූ පුද්ගලතෙම ශ්‍රඛාවතන නම්වෙයි, හේ වනාහි ශ්‍රඛා ධනයයි කියනු ලැබේ.

යම් ආයර්‍යශ්‍රාවකයෙක්තෙම, පරපණ වැනසීමයයි කියනු ලබන සත්ඵඝාතනයෙන් වැලැක්කේවේද, අනුන් අයත් වසතු සොරා ගැණීමයයි කියනු ලබන අදත්තාදානයෙන් වැලැක්කේ වේද, අනුන් අඹුවන් සෙවීමයයි කියනු ලබන පරදාර සෙවන යෙන් වැලැක්කේ වේද, බොරු කීමයයි කියනු ලබන මෘෂාවාද යෙන් වැලැක්කේවේද, මදප්‍රමාදයට හෙතුවූ මත්පැන් පිමඹයි කියනු ලබන සුරාපානයෙන් වැලැක්කේවේද? මෙය වනාහි ශීල ධනයයි කියනු ලැබේ.

යම් ආයර්‍යශ්‍රාවකයෙක්තෙම, ප්‍රාණඝාත අදත්තාදාන කාම මිථ්‍යාචාර සඞඛ්‍යාත ත්‍රිවිධවූ කායදුශ්චරිතයවද, මෘෂාවාද පිසුනාවාච පරුෂවාච සම්පප්‍රලාප සඞඛ්‍යාත චතුර්විධ වාග්දුශ්ච රිතයවද, අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂටි සඞඛ්‍යාත ත්‍රිවිධ මනෝ දුශ්චරිතයව සහ අනිකුදු අකුසලකම් කිරීමට ලජ්ජාවන්නේද පිළිකුල්වන්නේද මෙය වනාහි හිරිධනයයි කියනු ලැබේ.

යම් ආයර්‍ය ශ්‍රාවකයෙක්තෙම සතුන්මැරීමය, සොරකම් කිරී මය, පරදාරි හැසිරීමය යන තුන්වැදරුම්වූ කායදුශ්චරිතයවද; බොරුකීමය, කේලාම්කීමය, රළුබස් බිණීමය, සම්පප්‍රලාපය හෙවත් වැඩ නැසී බස් කථාකිරීමය යන සතර වැදරුම්වූ වාග් දුශ්චරිතයවද; අන්සතු ධනය තමහට විනම් යෙහෙකැයි කියා සිතන්නාවූ විෂම ලොභයද, අනුන් නසිත්වා වධයට පැමිණෙත් වායයි සිතන ව්‍යාපාදයද, මේ ලොකය දෙව්ලොකු විසින් නිමින කරන ලද්දේය කුසලාකුසලයෙහි ඵලවිපාක නැත, පුනරුත් පත්තියක් නැත යනාදි වශයෙන් ගන්කාවූ මිථ්‍යාදෘෂටියද යන මේ ත්‍රිවිධාකාරවූ මනොදුශ්චරිතයවදුයි යන මේ තුන ගැණ හයට නැතිනැන්මට පැමිණේද හේ වනාහි ඔත්තප්පධනයයි කියනු ලැබේ.

යම් ආර්‍ය ශ්‍රාවකයෙක් තෙම තවාඔහ ශාස්තෘශාසන පර්‍යාපන්න ධර්මය බොහෝකොට අසා දැනගත්තේවේද, සිදුරුනුවූ කලයක වත්කළ ජලය සෙසින් උගත්දෙය නොනසා සිතෙහි දරන්නේවේද, යමෙක්හු විසින් අසා දරණලද බුඩවචනය ශිලා ලෙඛනයක් මෙන්ද රන්බදනෙක වත්කළ සිංහ තෙලයක් මෙන්ද, බොහෝ කලක් සිතෙහි දරන්නේවේද, මහා ප්‍රදීපා ලොකයකින් දක්නා ප්‍රදීපයක් සෙයින් හදුරණලද ධර්ම සිතින් නැවත නැවත කල්පනා කිරීමෙන් ප්‍රඥාචක්ෂුසින් දක්නා ලද්දාහු වෙද්ද මෙය වනාහි **ශ්‍රුතිධනයයි** කියනු ලැබේ.

යම් ආර්‍ය ශ්‍රාවකයෙක්තෙම හරණලද රාග වෙෂාදි මල හා දුරුකරණලද ලොභ චෙතනාවෙන් යුක්තාවේද, සමුද්‍රමඩ්‍යයෙහි හුනුවාවූ බඩුවෙහි ආලය හරින්නාක්මෙන් වසතු ලොභ නොකොට අවඛක ශ්‍රඩ්ධ්‍යාශයෙන් දැනධර්ම කරන්නේද, සකස් කොට දෙය ධර්මයන් දීමෙන් ධෛනහඤ්ඤයන් ඇත්තේද හෙවත් අශ්‍රඩ්ධාවනතයාගේ හඤ්ඤය සියවරක් සෝදාද මලිනවෙහි ශ්‍රඩ්ධාවනතයාගේ වනාහි මලිනහඤ්ඤවූයේද දුනාහිලාභ ඇතිහෙයින් පිරිසිදුවෙයි, එබැවින් දන්දීමෙහි යෙදෙනලද ශ්‍රඩ්ධාහඤ්ඤයන් ඇත්තේවේද, දන් නොදී නොවැළදීම සඞ්ඛ්‍යාත විභාගයෙහි නියුක්තාවේද, ඉමය වනාහි **ත්‍යාගධනයයි** කියනු ලැබේ.

යම් ආර්‍යශ්‍රාවකයෙක් තෙම රූපවෙදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාන සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයන් නත්‍යබාධී වශයෙන් දැන ගැණීමට සමර්ථවූ ප්‍රඥාවෙන් සමන්විතවන්නේද හේ වනාහි **ප්‍රඥාධනයයි** කියනු ලැබේ. මහණෙනි, බුදුආදී මහා පුරුෂයන් විසින් සාක්ෂාත්කෘත සප්තාර්‍ය ධනයෝ නම් මොහුමයයි සකල සුරනරවර නයන රසායන සම්මාර කොශරීන්ද්‍රායමානවූ සම්‍යග් යන්වහන්සේ විසින් තමන්වහන්සේගේ තීක්ෂණ ප්‍රඥාවෙන් පිරිසිදු දැන මෙම සූත්‍ර දෙශනාව නිමවා වදාළසේක.

"සද්ධාධනං සීලධනං හිරිඔත්තප්පියං ධනං
සුතධනඤ්ච චාගොච පඤ්ඤා මෙ සත්තමං ධනං
යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්සවා
අදලිද්දෝති තං ආහු අමොඝං තස්ස ජීවිතං
තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්ම දස්සනං
අනුයුඤ්ජේථ මෙධාවී සරං බුද්ධා න සාසනං"

තවද මේ ශ්‍රඩ්ධා ශීල හිරි ඔත්තප්ප ශ්‍රුති ත්‍යාග ප්‍රඥා යන සප්තවිධ ධනයෝදාමූ ගම්බදුවූ (**"ඉත්ථියා පුරිසස්ස"** යනුවෙන් දුටුදෙය කැමැතිවන අර්ථයෙන් ස්ත්‍රීනාම්වූ සත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ඇතිවේද්ද, ඒ සප්තාර්‍ය ධනයෙන් යුක්තවූවාහට

සහල්කැයලිකුදු කහවනුවක් පමණකුදු නැත්තේවීනමුත් ශ්‍රද්ධා දිවූ සප්ත ධනයෙන් යුක්තවෙසින් දිළිඳු නොවේයයි බුදුරදුන් මහෝත්තමයෝ කීහු; ඒ සප්තවිධ ධනයෙන් යුක්තවූවාහුගේ ජීවිත ප්‍රවෘත්තිය සිස් නොවන්නේසි; එබැවින් සම්බුද්ධියන් සරණා කරයෙන් අවබෝධකළාවූ සද්ධර්මයන්ගේ අනුශාසනාව අනව රතයෙන් සිහිකරන්නාවූ නුවණැති පුද්ගලයෙම ශ්‍රෝතාපත්ති මාර්ග ප්‍රතිවේධයෙන් අධිගන්තව්‍යවූ ආර්යශ්‍රද්ධාවද, ශ්‍රෝතාපන්න ආර්යශ්‍රාවකයා විසින් රක්ෂිතව්‍යවූ ශීලයද, බුද්ධ ධම්ම සංඝ සංඛ්‍යාත රත්නත්‍රයෙහි ප්‍රසාදයද, දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරෝධසත්‍යය මාර්ගසත්‍යය යන චතුරාර්යසත්‍ය ධර්මයන්ගේ දැක්මද, යන මේනි දිවාරාත්‍රි දෙක්හි යෙදී අප්‍රමාදව වාසය කරන්නේය''යිද සම්බුදුරජාණන්වහන්සේ වදාළසේක.

මහා පරිනිර්වාණ කථාව.

සම්බුදුරජාණන්වහන්සේ ගිලන්බවට පැමිණීම.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ කැමැති කාලයක් අම්බපාලි ගණිකාවගේ ආම්‍රවනොද්‍යානයෙහි වැඩවාසයකොට ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්වහන්සේට කථාකොට, ''ආනන්දය එවයමිහ, බෙලුවග්‍රාමක යම්තැනෙක්හිද එතැන්හි එළඹෙමිහ''යි වදාළසේක; මෙසේ වදාරා මහත්වූ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලදුව බෙලුවග්‍රාමයට එළඹිසේක; ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට, මහණෙනි, තෙපි වේසාලාමහ නුවර හාත්පස්හි තමතමන්ගේ මිත්‍රවූ යම් භික්ෂුහු ඇත්තාහු නම් ඒ භික්ෂූන් සමීපයෙහි වස් එළඹෙව; මම වනාහි මේ බෙලුවන ග්‍රාමයෙහි වස් එළඹිමි''යි වදාළසේක; එසමට භික්ෂුහු ''මැනව ස්වාමීන්වහන්ස''යි කියා භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචනදී වේසාලාමහනුවරට පැමිණ තමතමන්ගේ මිත්‍ර භික්ෂූන්කෙරෙහි වස් එළඹියාහුය; භාග්‍යවතුන්වහන්සේ වනාහි එම බෙලුව ග්‍රාමයෙහිම වස් එළඹ වැඩවසනසේක්, උන්වහන්සේට අතිශයින්ම ක්‍රූරතරවූ දරුණු විසභාගරෝගයක් උපන; මරණ ප්‍රාප්තකිරීමට තරම්වූ ඒ භයානක විෂභාගරෝගය සම්මෝහ යන්වහන්සේ සිහි එළවා දැන බලවත්වූ ඒ දුඃඛවේදනාව ඉවසා වදාළසේක; ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේට මෙසේවූ කල්පනාවක් විය; එනම් මම වනාහි උපස්ථායකයන්ට කථා කොට පිරිණිවන්පෑ වේවිනම් සුදුසු නොවෙයි; එහෙයින් මම බලවත්වූ වේදනා ඇති විසභාගවූ මෙම රෝගය පලසමාපත්ති වීර්‍යයෙන් මැඩපවත්වා ඒ ජීවිත සංස්කාරය තබාකොට සිටුවීම් වශයෙන් පවත්වා ජීවිතය තැබීමට සමර්ථවූ පල සමාපත්තියට සමවැදී වාසය කෙළෙම් නම් යෙහෙතැයි සිතුසේක; ඉවසේ සිතූ කෙණෙහිම ඒ ආබාධය යටපොකුණු වීර්‍යයි බලයෙන්

මැඩපවත්වා ගිලන්කමින් නැගී නොබොකලකින් එම විහාරයෙන් නික්ම පිටිපසෙහි පණවන්නලද බුබාසන මසනකයෙහි වැඩහුන්සේක; එකල ආනන්ද ස්ථවිරතෙම සවීඥයන්වහන්සේ කරා එළඹ වැඳ එකත්පස්ව සිට කියනුයේ,"සවාමීවූ භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේගේ ආබාධයාගේ සහය දක්නාලද්දුවූ මම වනාහි අපමණවූ විශ්වාස ප්‍රීතියට පැමිණියෙමි, භාග්‍යවතුන්වහන්ස යම්තාක්කල් භික්ෂුසංඝයා අරබයා පශ්චිමාවවාදී *වදූරණ සේන්ද ඒතාක්කල් පිරිනිවන් නොපාවදුළුමැනවැසි ආයාචනා කෙළේය; එබසට බුදුහු වදූරණසේක්"ආනන්දය භික්ෂුසංඝතෙම කුමක් නිසා මා ප්‍රාර්ථනාකරන්නේද? ආනන්දය මා විසින් ධර්මය වශයෙන් හෝ පුද්ගලවශයෙන් හෝ දෙභාගයක් නොකොට අභ්‍යන්තර බාහිර නොකොට ධර්මය දෙශනාකරණලද්දේය; ඒ ධර්මයෙහි තථාගතයන්වහන්සේගේ ආචාර්යමුෂ්ටියයි යන එබදු කාරණයක් නැත්තේය; තවද මම වනාහි ලොකස්වභාව වශයෙන් මේ ප්‍රඥාවෙහි ජරාවෙන් ජීර්ණයෙමි, වයොවෘද්ධවීමි, ජාතියෙන් මහලුභාවයට පැමිණියෙමි; බොහෝවූ කාලයක් අති ක්‍රාන්තකෙළෙමි; වයසෙහි කෙළවරට පැමිණියෙමි; සම්සේ රථය වෙත මිශ්‍රකයෙන් යාපනය වේද එමෙන් මාගේ මෙම දෙහයද අහිත්පල වෙහයෙන් යාපනය වන්නේය; ආනන්දය, බිඳීගිය නැවක් ඇති සතුන්හට ප්‍රතිඝ්‍යාධාරවූ දිවයිනක්මෙන් තමාම පිහිට කොටගෙණ වාසයකරව්; ධර්මයම දිවයිනක්මෙන් පිහිටකොටගෙණ වාසයකරව්; ධර්මය සරණකොටගෙන වාසය කරව්; අන්‍යගතික නොවව්; ආනන්දය මාගේ ශික්ෂාකාමීවූ යම් කිසි භික්ෂූකෙනෙක් ඇතිවේද්ද, ඔවුන් අනුපෙරෙන් උත්තමභාව ප්‍රාප්ත භික්ෂුහු නම් සතරසතිපට්ඨාන ධර්මයන් ගොවරකොට ගෙණ සුශික්ෂිතව ශික්ෂාකාමීව වාසයකරන්නාවූ භික්ෂුහුමය, ඔව්හු අශ්‍රද්ධන්නාහුය ශ්‍රද්ධාවන්නාහුයයි වදූළසේක.

මාරයා පිරිනිවනට ආරාධනාකිරීම.

නුවද පෘථිවූ වගවතීනිමාරතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ බුදුහුකෙරෙන් පහව ගියකල එතැන්හි එළඹ එකත්පස්ව සිට කියනුයේ, සවාමීවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, දැන් වනාහි ඔබවහන්සේගේ පිරිනිවීමට කල්වන්නේය; එබැවින් පිරිනිවන්පා වදූළමැනවැ"යි අයැද සිටියේය; එකල සවීඥයන්වහන්සේ "එම්බා පාපිවූ වශවර්තිමාරය, මාගේ භික්ෂු භික්ෂුණී උපාසකඋපාසිකා යන සිව්පිරිස යම්තාක් සවීඥධර්මයෙහි ව්‍යක්ත නොවන්නාහුවේද්ද ඒතාක්කල් පිරිනිවන් නොපාන් නොමි"යි වදූළසේක; මාරතෙම සවීඥයන්වහන්සේගේ එම වචනය සිහනබැන්දෙණ අන්තර්ධානව හියේය; ඉක්බිති සවීඥයන්

*වදූරණාසන්න කාලයෙහිදියයුතු අවවාද පන්හිමාවමාද නම්වේ,

වහන්සේ පන්සාළිස් වසීයක් මුලුල්ලෙහි වර්‍ෂාකරවනාලද සඞ්ඝීමෘත ප්‍රවාහයෙන් භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකාදීන්ගේ පිපාසා සන්හිඳුවා, ඔවුන් සම්බුඩ ධර්‍මයෙහි ව්‍යක්තයන්කොට විශාලාමහනුවර චාපාල නම් යක්‍ෂයාගේ වාසභවනයෙහි චාපාල නම් චෛත්‍යස්ථානයෙහි වැඩසිටියේක; එකල පෙරලෙසම වසවත් මරු පැමිණ භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකාදී සියලු පිරිසම සම්බුඩ ධර්‍මයෙහි ව්‍යක්තව සිටින හෙයින් සර්‍වඥයන් වහන්සේගෙන් පිරිනිවන්පා වදාරණලෙස අයැද සිටියේය; එකල බුදුහු තුන්මාසයක්හුගේ ඇවැමෙන් පිරිනිවන්පානබැව් මාරයාට වදාරා, මෙවක් පටන් තෙමසක් කල් සමවත් සමවැද එසින් මතු සමාපත්තියට සමනොවදිමිසි යන සිතෙන් අයුෂ්සංස්කාරය හැර වදාළසේක; **ඒ ක්‍ෂණයෙහිම මහා පෘථිවි නොමෝ කම්පාවූවාය.** එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම සර්‍වඥයන්වහන්සේ කරා එළඹ වැඳ එකත්පස්ව සිට "සර්‍වඥාභිවූ භාග්‍යවතුන්වහන්ස, දැන් මේ භයඞ්කරවූ පෘථිවිචලනයට හෙතු කවරේදැයි විචාළේය. එකල බුදුහු වදාරණසේක්, ආනන්දය ධාතුඍද්ධාභයෙන්ද; පින් වතුන්ගේ සෘද්ධ්‍යානුභාවයෙන්ද, මහබෝසතාණන්ගේ මව්කුස ඉපදීමෙහිද, බිහිවීමෙහිද, බුදුවීමෙහිද, ඞ්ඝබලය ධර්‍මදෙශනා වෙහිද, සර්‍වඥයන්වහන්සේගේ ආයුෂ්සංස්කාරය හැරීමෙහිද සර්‍වඥයන්ගේ පිරිනිවන්පෑමෙහිදැයි යන මේ අවකාරණයෙන් පෘථිවි කම්පාවන්නිය"යි වදාළසේක. එකල ආනන්ද ස්ථවිර යන්වහන්සේ බුදුහු ආයුෂ්සංස්කාරය හළසේක්වනැයි මහත් ඛෙදයට පැමිණ, "සර්‍වඥාභිවූ බුදුරජාණන්වහන්සේ ලොකානුකම්පාව පිණිස තවකපක්කල් මුලුල්ලෙහි වැඩසිට වදාළ මැනව"යි ආරාධනාකළසේක; එකල සර්‍වඥයන්වහන්සේ, "ආනන්දය්, මම වනාහි ඍද්ධිබලයෙන් කල්පයක් හෝ අඩි කල්පයක් හෝ ජීවත් වීමට පොහොසත්වෙමි; එසේදවුවත් දැන්ඊට කල් නොවන්නේ යයි ප්‍රතික්‍ෂෙපකොට **එයින් නික්ම** මහාවනයේ කූටාගාර ශාලාවට වැඩ **විශාලාමහනුවර** වසන සියලු භික්‍ෂූන් එහි රැස් කරවා පණවනලද බුඩාසන මඤ්ඤකයෙහි වැඩහිඳ **"භාවදුනි භික්‍ඛවෙ ආමන්තයාමි"** යනාදියෙන් "මහණෙනි සියලු සංස්කාර ධර්‍මයෝ නස්නාසුළුය, එබැවින් අප්‍රමාදවීමෙන් ශ්‍රමණධර්‍මය සම්පාදනයකරව්, තථාගතයන්ගේ පරිනිර්‍වාණය නොබෝකල කින්ම වන්නේය; මෙයින් තුන්මසක්හුගේ ඇවැමෙන් තථාගත තෙමේ පිරිනිවන් පාන්නේය"යි වදාළසේක; ශාස්තෘවූ බුදුරජ තෙම මෙසේ වදාරා, නැවතද වදාරණසේක්:—

"පරිපක්කා වයෝ මය්හං පරිත්තං මම ජීවිතං
හාමි වෝ ගම්මිස්සාමි කතමෙව සරණං මමතනෝ

අප්පමත්තා සතීමන්තෝ සුසීලා හොථ භික්ඛවෝ
සුසමාහිත සංකප්පා සචිත්ත මනුරක්ඛථ
යෝ ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තෝ විහෙස්සති
පහාය ජාති සංසාරං දුක්ඛස්සන්තං කරිස්සති"

"මහණෙනි, මාගේ ආයුෂ්‍යතෙම මුහුකිරිම්වශයෙන් පරිපාකයට පැමිණියේය, මාගේ ජීවත්වීම සවලපමාත්‍ර කාලයක්ම වන්නේය, මට පිහිට මා විසින්ම කරගන්නාලද්දේය, තොප හැර නිවන් පුරයන්නෙමි; තවද මහණෙනි, යහපත් සිතියෙන් යුක්තව අප්‍රමාදව සුශීලවන්තයෝවව්, මනාකොට සන්සිදුනාවූ චිත්ත සංකල්පනා ඇතිව තමතමන්ගේ සවකීයචිත්ත සුරක්ෂිත කරව්, තවද යම් පුද්ගලයෙක් තෙම මාගේ මේ ධර්මවිනය දෙක්හි අප්‍රමාදව වාසයකරන්නේවේද, හෙතෙම ජාතියයි කියනලද භවොත්පත්තිය හෙවත් සසර හැසිරීමද හැර භයඞ්කරවූ සංසාර දුඃඛය කෙළවර කරන්නේය"යි වදාළසේක; සම්බුදුරජාණන්වහන්සේ තෙමසකින් පිරිනිවන්පා වදාරණ බැව් ඇසූ එහි රැස්ව සිටි පෘථග්ජන භික්ෂූහු ශොකය ඉවසාගතනොහී හඬන්ට වන්හ; ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාද ධර්මසංවේගයට පැමිණියාහුය.

චුන්දනම් කම්මාරපුත්‍රයාගේ දානප්‍රතිග්‍රහණය හා පිරිනිවන්පෑමට කුසිනාරානුවරට වැඩමවීම.

තවද සම්බුදුරජාණන්වහන්සේ එදවස් සවස්වේලෙහි විශාලාමහනුවරින් නික්ම, **ඡණ්ඩගාමයට** වැඩ එහිදී බොහෝ භික්ෂූන්ට ධර්මානුශාසනාකොට එයින් නික්ම **හත්ථිගාමය, අම්බගාමය, ජම්බුගාමය,** යන ග්‍රාමයන් පිළිවෙළින් පසුකොට නැවත **භොග ග්‍රාමය** යම්තැනෙක්හිද එතැනට එළඹ එතුවර පිහිටි **ආනන්ද චෛත්‍යයෙහි** කැමැති කාලයක් වාසයකොට එයින් නික්ම **පාවා** නම් නගරාසන්නයෙහිවූ චුන්දනම් කම්මාරපුත්‍රයාගේ ආම්‍රවනොද්‍යානයෙහි වැඩවාසයකළසේක; චුන්දනම් කම්මාරපුත්‍ර තෙමේ සකල සම්පත්තියෙන් ආඪ්‍යවූ සම්භාවනීකාරයෙක්හුගේ පුත්‍රයෙක; හෙතෙම වනාහි සම්බුදුරජාණන්වහන්සේගේ ප්‍රථම දර්ශනයෙන්ම බණ අසා සෝවාන් ඵලයෙහි පිහිටා තමාගේ ආම්‍රවනොද්‍යානයෙහි අතිරම්‍යවූ විසිතුරු විහාරයක් කරවා භාග්‍යවතුන්වහන්සේට පූජා කළේය; තවද, හෙතෙම බුදුන් පිරිනිවන්පාන දිනයෙහි බුදුන්ට අන්තිම දානය දෙනු පිණිස කරණලද ප්‍රාර්ථනා ඇති බැවින් සම්බුදුරජාණන්වහන්සේ **පාවා** නම් නුවරට වැඩවදරා ඕහට අනුග්‍රහ පිණිස ඔහු විසින් කරවා පිලිගන්වනලද ආම්‍රවනොද්‍යාන

විහාරයෙහි වැඩවාසය කරණසේක්; මෙසේ වසන සමයෙහි චුන්දනම් කමීාරපුත්‍රතෙම තමාගේ අඹලයනෙහි බුදුහු වැඩවාසය කර වදුරණසේකැයි අසා වහවහා ගොස් බුදුන්වැඳ එකන්පස්ව සිටියේය; එකල භගවන්වහන්සේ චුන්දනම් කමීාරපුත්‍රයාට ධම්ප්‍රතිසංයුක්ත වූ කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා වදුළසේක; ඉක්බිති චුන්දනම් කමීාරපුත්‍රතෙම භාග්‍යවත් බුදුරජාණන්වහන්ස, සෙටදින දානය පිණිස වැඩියමැනවැ''සි ආරාධනාකොට, සවකීය ගෘහයට ගොස් ප්‍රණීතවූ බාදෘහොජ්‍යාදියද, බොහෝරසඛහා සකස්කරණලද සූකරමද්දවයද පිළියෙළකරවා දානය පිණිස වැඩියමනා කාලයයි භග්වන්වහන්සේට කල් දන්වා යැවුවේය. ඉක්බිත්තෙන් භග්වන්වහන්සේ පූර්වාහ්න කාලයෙහි මනාකොට හැඳපොරවා පාසිවුරුගෙණ භික්ෂුසංඝයා හා සමග චුන්දයාගේ වාසභවනයට වැඩ පණවනලද බුද්ධාසන මඤ්ඤකයෙහි වැඩහුන්සේක; එකල චුන්දනම් කමීාරපුත්‍රතෙම බුදුපාමොක් මහසඟනට දන්වැළඳවූයේය; එම දානයෙහි සූකර මද්දවයද ඇතුළත් නුමුත් භග්වන්වහන්සේගේ නියමයවූ පරිද්දෙන් එම සූකරමද්දවය අවශෙෂ සංඝයාට නොවැළඳවූයේය; තවද භග්වන්වහන්සේ චුන්දනම් කමීාරපුත්‍රයාගේ දානය වැළඳූ ඉක්බිති පෙරත් වැළඳි ධ්‍යානබලයෙන් නවකාශීති ආඛ්‍යඛශ නැවතත් බලවත්විය; එකල භග්වන්වහන්සේ සපරිවරින් කුසිනාරානුවරට වඩනාසේක් අතරමගදී ඉදිරියට පැමිණි ආලාරකාලාමයන්ගේ ශ්‍රාවකවූ පුක්කුස නම් මල්ලව පුත්‍රයාට ධම්දෙශනාකොට ඔහු සරණසිලයෙහි පිහිටුවා ඔහු විසින් පූජනලද රන්වන්වූ වස්ත්‍රයුගලය පිළිගෙණ හැඳ පෙරව කුකුත්ථ නම් නදියකරා එළඹ ඒ ගඟින් ඇලසනානායකොට පැන්වළඳා එම නදීතීරයෙහිවූ ආම්‍රවනොද්‍යානයට වැඩ එහි මඳක් සැනපී හුන්සේක; එකල්හි බුදුහු ශ්‍රීපාද සමීපයෙහි හුන් ආනන්ද සථවිරයන් වහන්සේට කථාකොට, ''ආනන්දය නිරුත්තරවූ සම්‍යක්සම්බොධියට පැමිණෙන දවස්හි සුජාතා නම් සිටුදුවනියන් විසින් දෙනලද පූර්වදානයද, අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පාන කාලයෙහි චුන්ද නම් කමීාරපුත්‍රයා විසින් දෙනලද අන්තිම දානයද යන දාන දෙක සමසමවූ ඵලවිපාක ඇත්තාහ, සෙසු පිණ්ඩපාතයන්ට වඩා මේ පිණ්ඩපාතයම මහත්ඵල මහානිශංස වන්නේය''සි වදුරා, එසින් නැගිට පාවානුවර පටන් කුසිනාරානුවර දක්වා තුන්ගව් පමණ මාගීයෙහි සියලු සංස්කාර ධම්යන්ගේ අනිත්‍ය ස්වභාව දක්වනු පිණිස පස්විස් තැනක වැඩහිඳ මහත් උත්සාහයෙන් ශ්‍රීපාදයෙන්ම වැඩ ගිරණ්‍යවති නම් ගඟින් එතරව කුසිනාරා නුවර මල්ලරජදරුවන්ගේ උපවර්තන නම් ඔගුල් සල්වනයට සූකරීසා අසතඛහතවන සමයෙහි සඛ්‍යාකාල යෙහි භික්ෂුසංඝයා සමග වැඩිසේක.

පිරිනිවන් මඤ්චකයෙහි සිංහශය්‍යාවෙන් සැතපීම.

මෙසේ සවීඥයන්වහන්සේ මල්ලරජදරුවන්ගේ උපවර්තන නම් ශාලාවනොද්‍යානයට ප්‍රවිෂ්ටව "ආනන්දය ඉතා කලාන්ත යෙමි, නෙපි මෙමයුගම ශාලවෘක්ෂයානන්තරයෙහි උතුරට හිසලා සැතපෙනාකාරකොට අස්නක් පණවව්; මම එහි සයනය කෙරෙමි"යි වදුළසේක; එකල ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරතෙම "යහපතැ"යි හිවිස ඒ ශාලවෘක්ෂ අතුරෙන් උත්තර ශීර්ෂකොට අස්නක් පැණවූයේය; සවීඥයන්වහන්සේ ඒ සයන මඤ්චකයෙහි උතුරට හිසලා දකුණු ශ්‍රීපාද මඤ්චකයෙහි වාම ශ්‍රීපාදය කබා දකුණැලයෙන් නැවත නැගිනොසිටිනා සංඥාවෙන් උතුම්වූ සිංහශය්‍යාවෙන් සයනයකර වදුළසේක; සවීඥයන්වහන්සේ මෙසේ මහත්වූ උත්සාහයෙන් කුමක් නිසා මෙහි වැඩිසේක්දැයි යතහොත් මහාසුදර්ශන සූත්‍රාන්ත ධර්මදේශනාවගේ අවෝසානයෙහි යද, සුභද්‍ර නම් පරිබ්‍රාජකයාගේ පැවිදිවීම හා අර්හත්ඵලයට පැමිණීමද, අන්‍යස්ථානයක පිරිනිවන්පෑකල්හි උන්වහන්සේගේ ධාතු බෙදුගැණීම අරබයා ලේ ගඹගාවක් වෙතතරම් භයානකවූ කලහ වැළැක්වීමද යන මේ කාරණත්‍රය දිවසින් දැක, මේ ත්‍රිවිධකාරණය නිසා ලොකයාහට ත්‍රිවිධ සම්පත්ති ප්‍රදායකවනු සඳහා කුසිනාරානුවරට වැඩවදුළබැව් දතයුතුයි.

භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහි සැතපුණු ක්ෂණයෙහිම යමක ශාලවෘක්ෂයන් දෙදෙන අකාල පුෂ්පයෙන් ගැවසිනත්නාහ, ඒ පුෂ්පයෝ සවීඥ ශ්‍රී දෙහයෙහි පතිතවන්ට පවන්ගත; තවද දසදහසක් සක්වළ සියළු දිව්‍යබ්‍රහ්මසෙනාවෝ නොයෙක් දිව්‍යමයවූ සුගන්ධ කුසුමාදිය ගෙණ අහස්කුස පිරිසිට බුදුන්ගේ ශ්‍රී දෙහයෙහි ඒ සුගන්ධ කුසුමාදිය වහුරුවාලීමෙන් පූජාකළහ; දිව්‍යමයවූ පඤ්චතූර්‍යනාදයෝද අවකාශයෙහි නිරන්තරයෙන්ම වාදනවන්නාහුය; තථාගතයන්වහන්සේට පූජාපිණිස දිව්‍යමය සංගීතිකාද අහසෙහි පවත්නාහුය; මෙසේ අනෙක පූජාලබ්ධීන් යමක ශාලාභ්‍යන්තරයෙහි වැදහොත් සවීඥයන්වහන්සේ ඒ සියල්ල දැක වදාරා, ආනන්ද ස්ථවිරයන් කැඳවා, "ආනන්දය මෙසේ ආම්ෂපූජා පැවැත්වූ පමණකින්ම තථාගතවූ බුදුන් පිදුයේ නොවෙයි; යම්කිසි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදි කෙනෙක් නවවිධවූ ලොකොත්තර ධර්මයට අනුධර්මවූ ප්‍රතිපත්තියට පැමිණ වාසයකරන්නේ වේද, එම පූර්වභාග ප්‍රතිපදාවම ඊට යොග්‍යවන බැවින් සාම්චි ප්‍රතිපදාව පිළිපන්නේ වේද එම පූර්වභාග ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත අනුධර්මයෙහි හැසිර පිරීමෙන් අනුධර්මචාරිවූයේද, ඒ පුද්ගලයා විසින් උතුම් පූජාවෙන් මම පුදනලදුයේ නම් වෙමි;

Printed & Published by **K. D. PERERA & SON,** *Vidyadarsa Press, Colombo.*

ආනන්දය, මෙසේ උතුම්වූ පූජාවෙන් පුදන්නාහු මාගේ ශාසන නමැති නහෝ මඬුයෙහි ත්‍රාජමාන්වන්නාවූ පූර්ණචන්ද්‍රමණ්ඩල යක්මෙන් බබලන්නාහුය''යි වදාළසේක.

නවද භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහි සැතපී වසනකල **උපවාන**ස්ථවිරතෙම සවිඥයන්වහන්සේට පවන්සල මින් ලඟම සිටියේය; එකල සවිඥයන්වහන්සේ, ''මහණ තොප මා ඉදිරියෙන් පහවෙනුමැනවැ''යි කියා උපවානස්ථවිරයන් වහන්සේ එතනින් පහකළසේක; උපවානස්ථවිරතෙම දීඝී කාලයක පටන් සවිඥයන්වහන්සේ ලඟ හැසිරෙමින් උපස්ථාය කව සිටියේය. ඒ හෙයින් ''මේ පශ්චිමකාලයෙහි කවර කරුණක් නිසා උපවානස්ථවිරයන්ට සවිඥයන්වහන්සේ සම්පයෙහි සිට උපස්ථානකිරීමට අවකාශනොදී අහිමුඛයෙන් පහකළසේක්ද''යි විචාළේය. එකල්හි බුදුරජානන්වහන්සේ වදාරණසේක් 'ආනන්දය, අදරාත්‍රි පශ්චිමයාමයෙහි මාගේ පිරිනිවන්පෑම වත නිසා, තථාගතවූ මා දක්නා පිණිස අරුතල අසංඛ්‍යතලයන් හැර දසදහසක් සක්වළින් මේ සක්වළට රැස්වූ දෙවියෝ ඉතා බොහෝය; කුසිනාරානුචර පටන් මේ මල්‍ය රජදරුවන්ගේ උපවර්තන නම් ශාලවනොද්‍යානය දක්වා ඉතා සියුම් වෙස්මවාගත් දෙවතාවෝ අතුරු සිදුරු නැතුව පිරිසිටිනාහ; මා අහිමුඛයෙහි සිටි උපවානයන් ක්ෂීණාශ්‍රවයෙක්වූ හෙයින්ද, පෙර **කාශ්‍යප** බුදුන්ගේ ධාතුචෛත්‍ය රක්ෂාවෙහි නියුක්ත මහානුභාව සම්පන්න දෙවතාකෙනෙක්වූ හෙයින්ද, පෘථග්ජනයන්ගේ ශරීර විනිවිද දක්නා පරිද්දෙන් රහත්වූ මොහුගේ ශරීරය විනිවිදගෙණ දෙවියන්ගේ ඇස්වළට පවා යමක් නොපෙණෙන බැවින් දෙව සමූහයා කෙරෙහි උපන් මහාකරුණාව හෙතුකොටගෙණ උපවානයන් මා අහිමුඛයෙන් ඉවත්කෙළෙම්ය''යි වදාළසේක.

නැවතද ආනන්දස්ථවිරයන්වහන්සේ, ''අපි * මාගමුන් කෙරෙහි කෙසේ පිළිපදිමෝදැ''යි විචාළේය; එකල බුදුහු වදාරණසේක් ''ආනන්දය, යම් මේ මාගමුන්ගේ නොදැක්මෙක් ඇද්ද ඒ නොදැක්මම උතුම්වූ ප්‍රතිපත්තියෙකැ''යි වදාළසේක; භාග්‍යවතුන් වහන්ස, භික්ෂාවගැණ එළඹි සථානාදියෙහි යම්හෙයකින් දක්නා ලැබුවොත් කෙසේ පිළිපදිමෝදැ''යි විචාළසේක; ''ආනන්දය තූෂ්ණීම්භූතවීම උතුමැ''යි වදාළේය; ''සවාමීනි, යම් හෙයකින් ඔව්හු අප සමග කථාකරන්නාහුනම් කෙසේ පිළිපැද්ද සුත්තේදැ''යි පිළිවිසූවිට, ''ආනන්දය, ඔතා භගිනි ධිතෘ සථානීයවූවන් කෙරෙහි මෙන් සළකා ක්‍රියාකටයුත්තය''යි වදාළසේක; ඉක්බිත්තෙන් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කියනසේක් ''සවාමීවූ භාග්‍යවතුන්වහන්ස, ඔබවහන්සේගේ පිරිනිවීමෙන් පසු ඒ අවෙතනික

* ස්ත්‍රීන්.

බුඬශරීරයෙහි අපිකෙසේ පිළිපදිමෝදැ''යි විචාළේය; ''ආනන්දය තෙපි වනාහි උත්තමාර්‍ථවූ අර්හත්ඵලයට පැමිණීම පිණිස ප්‍රතිපත්ති පිරීමෙහි නිෂ්ඵාදකවේවි, අර්හත් ඵලය පිණිස අප්‍රමාදව වාසයකරව්, ආනන්දය තථාගතයන්කෙරෙහි අතිශයින් ප්‍රසන්නවූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති පණ්ඩිතයෝද ඇත්තාහුය; ඔව්හු සරීරදෙහ පූජාවෙහි ව්‍යාවෘතවන්නාහුය''යි වදළ සේක; නැවතද ආනන්දස්ථවිරතෙම, ''බුඬමෘතදෙහයට කුමක් කටයුතු ද''යි විචාළේය; එවේලෙහි සරීඳුයන්වහන්සේ, ''ආනන්දය චක්‍රවර්ත්ති රජ්ජුරුවන්ගේ මෘතශරීරයෙහි පිළිපදිනා පරිද්දෙන් තථාගත මෘතදෙහයෙහිද පිළිපැද්ද යුතුය''යි වදළසේක; චක්‍රවර්ත්තිරජහුගේ මෘතදෙහයෙහි කෙසේ පිළිපැද්ද යුත්තේදැ''යි විචාළේය; ආනන්දය, චක්‍රවර්ත්ති රජහුගේ මෘතශරීරය වනාහි අලුත්වූ කාසික වස්ත්‍රයෙන් වෙළති, ඉක්බිති මනාකොට නගා පාදනලද කපුපුළුන් පෙදවලින්වෙළා, නැවතද අලුත්වූකාසික වස්ත්‍රයෙන් වෙළන්නාහුය; මෙපරිද්දෙන් බොහෝ වරක්වෙළා, එම මෘතදෙහය සවණ්ණමයවූ තෙල්දෙණක ද්‍රෝණිකොට, එබදුවූ අන්‍ය රන්දෙණකින් වසා, සියලු සුවඳදරින් දරසැයක්කොට, ඊ මධ්‍යයෙහි යථොක්ත මෘතදෙහය නැන්පත්කොට ආදාහනය කරන්නේය; චක්‍රවර්ත්ති රජෙකුගේ මෘතකලෙබරයකට කරන්නාවූ කටයුතු බුඬමෘතදෙහය කෙරෙහිද කටයුතුය''යි වදාරා, සරීඳුයන්වහන්සේගේ ථූපය සතරමංසන්ධියෙක්හි ගොඩනගා ලිය යුතුබවත්, යම්කෙනෙක් ඒ සරීඳු චෛත්‍යයට බුදුන් සිහිකොට ශ්‍රද්ධාව උපදවා මල්හඳවිලවුන් ආදියෙන් පූජාකරන්නාහු වෙද්ද, මනාකොට වැඳීමෙන් සිතහෝ පහදවා ගන්නාහුවෙද්ද, එබන්දන්ට ඒ කුසලබලය දීර්ඝකාලයක් හිතසැප පිණිස කාරණාවන්නේය''යි වදළසේක.

සරීඳුයන්වහන්සේගේ මෙබස් ඇසීමෙන් ශොකහරිතවූ ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම **මණ්ඩලමාළ විහාරයට** ප්‍රවිෂ්ටව කපිශීර්ෂයයි කියනාලද දෙරබෑ කෙළවර පිහිටි අගුල්රුක එල්බගෙණ හඬ හඬා සිටානසේක්, ඔම චානාහි අහෙතුක හුදකලා එකෙකුවීමී; මාගේ අනුශාසක ශාස්තෘවූ සවාම්දරුවානෝ අදැ අලුයම්වේලෙහි පිරිනිවන්පා වදාරණසේක; එබැවින් මම සෙට පටන් කවරෙක්හට මුවදෝනා පිණිස දෑහැවිපැන් දෙම්ද, කවරෙක්හුගේ පාද ධෝවනය කෙරෙම්ද, කවරෙක්හුගේ සෙනසුන් ප්‍රතිජාගරණය කෙරෙම්ද, කවරෙක්හුගේ පාසිවුරු ගෙණ හැසිරෙම්දැයි යනාදී වශයෙන් විලාප කියා හඬන්වවනි; ඉක්බිති සරීඳුයන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණාකොට ''ආනන්ද කොයිදැ''යි විචාළසේක; එකල භික්ෂූහු ආනන්දස්ථවිරයන්වහන්සේ අගුළුකණුව එල්බගෙණ හඬමින් වැඩසිටින බැව්

සැළකළෝය; එකල සවීඥයන්වහන්සේ අන්‍ය භික්ෂූනම්කව් කථාකොට ආනන්දස්ථවිරයන් කැඳවාගෙණ එනලෙස වදාළේය; ආනන්දස්ථවිරයන් අවුත් බුදුහු වැඳ එකත්පස්ව සිටිකල "ආනන්දය, සියලුම ප්‍රියමනාප වස්තුවෙන් වෙන්වීම් වශයෙන් අන්‍යත්වයකට පැමිණෙනබව මා විසින් පළමුකොට කියන ලද්දේ නොවේද, එබැවින් ඇඬීමෙන් හා ශොක කිරීමෙන් ප්‍රයොජනයක් නැත; එහෙයින් තෙපි නොහඬව්, ශොක නොකරව්; ආනන්දය උපන්නාවූද වුනාවූද කරණලද්දවූද යම් දෙයක් විද්‍යමානවූනම් එය නොනැසේවයි යන වැළැක්මක් නොමැත්තේය, එහෙයින් ලොක සවභාවයට අයත්වූ සවීඥ දෙහයද එසේමවෙයි, එය නොනැසේය යනදෙයක් නොමැතිය" යනාදි වශයෙන් අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධම්ය දෙශනාකර වදාළසේක.

ඉක්බිති සවීඥයන්වහන්සේ එදා රෑ පශ්චිමයාමයෙහි පිරිනිවන්පාන බැව් අසා බුදුහු දැකීම පිණිස පැමිණි * සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට ධම්දෙශනාකොට පැවිදි උපසම්පදා කරවූසේක; හෙතෙම එම ශාලවනොද්‍යානයෙහි එක් පාර්ශ්වයක සක්මන් කරමින් විදර්ශනා වඩා එකෙණෙහිම සිව්පිළිසිඹියා හා සමග අර්හත්ඵලයට පැමිණියේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මධ්‍යමයාමය අතික්‍රාන්තවූ පශ්චිමයාමය පැමිණිකල්හි භික්ෂුසංඝයාට ආමන්ත්‍රණයකොට, "මහණෙනි, නොපෙ අතුරෙන් එක භික්ෂුවකටවත් බුදු ධම් සඞ්ඝ මාර්ග ප්‍රතිපත්‍යාදියෙහි යම් සැකයක් හෝ විමතියක් හෝ ඇත්නම් විචාරව්; සවීඥයන් වහන්සේගේ සම්මුඛයෙන් විචාරන්ට නොහැකිවූම්හයි කියා විපිළිසරනොවවිය"සි වදාළසේක. මෙසේ භාග්‍යවතුන්වහන්සේ තුන්වළක්ම වදාළමුත් භික්ෂූහු තූෂ්ණීම්භූතවූහ; පසුවද සවීඥයන් වහන්සේ, "ආනන්දය, අභිසම්බෝධියෙහි පවත් පිරිනිවන් පෑම දක්වා පන්සාළිස් අවුරුද්දක් ඇතුළත මා විසින් දෙසන ලද අසූසාරදහසක් ධම්ස්කන්ධය නොපව අනුශාසනා පිණිස සිටිනේය. මම එකළාව පිරිණිවන් පාමි, මා පිරිනිවිකල්හි ඒ අසූසාරදහසක් ධම්ස්කන්ධයෝ නොපව අනුශාසනා කරන්නා හුය"සි වදාරා නැවතද වදාරණසේක්, **"හඳදැනි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ"** යනුවෙන් "මහණෙනි, **සියලු සංස්කාර ධම්මෝ විනාශවන සවභාව ඇත්තාහුය; එහෙයින් සිහියෙන් යුක්තව අප්‍රමාදව විසිමෙන් සවිකාන්‍යයන්ම සම්පාදනය කරව්**" යයි වදාරා, පන් සාළිස් වර්ෂයක් මුළුල්ලෙහි දෙනලද අවවාද සියල්ලම දැන් මේ

* මේතෙමේ සවීඥයන්වහන්සේගේ අන්තිම ශ්‍රාවකයාබැව් දතයුතුයි,

පිරිනිවන් මඤ්චකයෙහි වැදහෙව, මේ එකම අප්‍රමාදපදයෙහි ඇතුළත්කොට වදාළසේක; සර්ඥයන්වහන්සේගේ මේ පශ්චිමාව වාදය වෙයි; මින්පසු එකම වචනයකුදු නොවදාළසේක.

සිරිඤ්වන්පෑම, දෙවියන් අනිත්‍යලක්ෂණ මෙනෙහිකිරීම ආදහනය, ද්‍රෝණනම් බ්‍රාහ්මණයා කළහ සංසිඳවා ධාතු බෙදුවිම.

සකලලෝක ශිවඞ්කරවූ භාග්‍යවන් තිලෝගුරු බුදුරජානන් වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහි වැදහෙව සියලු භික්ෂූන්ට අප්‍රමාද පදයෙන් අවවාදදී වදාරා, ප්‍රථමධ්‍යානයට සමවැදුනේය, එසින්පසු විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය යන රූප ධ්‍යාන සමාපත්තිසතරට පිළිවෙළින් සමඟැද එසින් නැගිට ආකාශානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්ඤඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, යන අරූපධ්‍යාන සමාපත්ති සතරට එසේම පිළිවෙළින් සමවැද, එසින්නැගී සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට සමවැද වදාළසේක. එකල්හි සළුඳයන් වහන්සේගේ ආශ්වාස ප්‍රාශ්වාස නැවතුනුබැව් දුටු **ආනන්දස්ථවිර තෙම,** තමා පෘථග්ජන හෙයින් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේ ගෙන් "බුදුහු පිරිනිවියේක්දැ"යි පිළිවිසිය; එකල අනුරුද්ධ ස්ථවිරතෙම, තමා බුදුහුසේ ප්‍රථමධ්‍යාන සමාපත්තියේහි පවත් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය දක්වා සමවැද හිය හෙයින්ද දැන් නිරෝධ සමාපත්තිය තුළ චිත්තය පවතිමින් සිටිකල්හි කාලක්‍රියාකිරීමෙක් නැතැයි දැනගත් හෙයින්ද ආනන්දස්ථවිරයන්ට කථාකොට, "ආනන්දය, සර්ඥයන්වහන්සේ පිරිනිවන් පෑසේක් නොවෙයි; සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට සමවන්සේකැයි" දැන්වීය; ඉක්බිත්තෙන් සර්ඥයන් වහන්සේ ප්‍රතිලෝම වශයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙහි පවත් ප්‍රථමධ්‍යානය දක්වා සමවැද, නැවත අනුලෝම වශයෙන් ප්‍රථමධ්‍යානයෙහි පවත් චතුර්ථධ්‍යානය දක්වා සමවැද, මෙසේ සූදිසි කෙළලක්ෂයක් පමණ සමාපත්තීන්ට සමවැදීමෙන් සියලු සමාපත්ති සුඛානුභවකොට, කලියුග වර්ෂයෙන් දෙදහස් පන්සිය පණස් අවවෙනි වර්ෂයෙහි වෙසඟපුර පුණු පොහෝදින අරුණෝදගමනයට පෙරවුව දස දහසක් සක්වල කම්පාකරවා පිරිනිවන් පෑ වදාළසේක.

එකෙණෙහිම **සහම්පති මහාබ්‍රහ්මරාජතෙම** මේ ගාථාව් භාෂේය:—

"සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතාලොකෙ සමුස්සයං
යථා එනාදිසෙ සත්ථා ලොකෙ අප්පටිපුග්ගලෝ
තථාගතෝ බලප්පත්තෝ සම්බුද්ධෝ පරිනිබ්බුතෝ"

"සත්ත්වලොකයෙ සකල සත්ත්වයෝම යම්පරිද්දෙකින් ජීවිතෙන්ද්‍රිය ප්‍රහීනවීමෙන් ශරීරනික්ෂෙපය කරන්නාහු වෙද්ද, එපරිද්දෙන්ම මේ ලොකයෙහි තමන්වහන්සේ හා සදෘශවූ පුදගලයෙක් නැතිබැවින් අප්‍රති පුද්ගලවූ, සියලු දෙවිමිනිසුන්ට අනුශාසනා කරණහෙයින් ශාස්තෘ නම්වූ, තථාගතත්වාදී කාරණයෙන් සමන්විතවන බැවින් තථාගතවූ, දශවිධ ඤාණබලාදි අනන්තාප්‍රමෙය ගුණොපලක්ෂිතවූ සම්‍යක්සම්බුද්ධ සර්වඥ ජෝතිස්මත්‍යාණන්වහන්සේ පිරිනිවන්පෑ වදාළසේක" යනු භාවයි.

දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍රදිව්‍යරාජ තෙමේද අනිත්‍යතා ප්‍රතිසංයුක්තවූ මේ ගාථාව කීයේය.

"අනිච්චාවත සඞ්ඛාරා උප්පාදවය ධම්මිනෝ
උපජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසංවූප සමොසුඛෝ

"සියලු සංස්කාරධර්මයෝ හෙවත් සත්ත්වාදීහු එකාන්තයෙන් අනිත්‍ය වන්නාහ; ඉපිද නැසීම සභාවකොට ඇත්තාහුය; ඔව්හු ඉපද නිරුඹවන්නාහුය; ඒ සියලු සංස්කාර ධර්මයන්ගේ ව්‍යුපශමනය කිරීමයයි කියනලද ලොකොත්තර නිර්වාණ සම්පත්තියම සැපවේ" යනු භාවයි.

සර්වඥයන්වහන්සේ පිරිනිවන් පෑ කල්හි ආශ්වාස ප්‍රශ්වාස නිරුද්ධවූබැව් අනුරුද්ධස්ථවිරයන්වහන්සේ එහි රැස්ව සිටි භික්ෂු සංඝයාට වදාළේය; එවිට රහන්භාවඋපන්නොපැමිණි පෘථග්ජන භික්ෂූහු බිමවැටී හිස අත්බැඳගෙණ "අහෝ අපගේ බුදුරජතෙම අතිශීඝ්‍රව පිරිනිවිඳිස්ක, මේ ලොකයෙහි සුවිසුද්ධවූ බුද්ධ නමැති අමෘතාක්ෂිය ඉතා වහාම අන්තර්ධානවූයේය," යනාදී වශයෙන් අදෝනා නෙපුල් කියා අඬන්ට වන්හුය. කෙලෙසුන් නැසුවාවූ වීතරාගී භික්ෂූහු සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාව මෙනෙහිකළාහුය; එකල අනුරුද්ධස්ථවිරතෙම හඬන්නාවූ භික්ෂූන්ට කථාකොට, **"ඇවැත්නි, සියලු ප්‍රියමනාප වස්තූවෙන් සම්පයුත් වෙන්වන බව සර්වඥයන්වහන්සේ ජීවමානව සිටිකාලයේදී වදාරණලද්දේනොවේද? එබැවින් උපදින්නාවූද වන්නාවූද කරණුලබන්නාවූද සම්දෙයක්ඇද්ද ඒසියල්ලම විනාශවන සුභාව ඇත්තේය. එය විනාශ නොවේයයි කියා වලකාලිය නොහැක්කේය"** එබැවින් හැඩීමෙන් හොකකිරීමෙන් කම් නැතැයි වදාළේය; සර්වඥයන්වහන්සේ පිරිනිවන් පෑ ඉක්බිති ඉතිරි රාත්‍රිකාලය අනුරුද්ධස්ථවිරයන්වහන්සේද අප්‍රමාත්වූ

ආනන්දස්ථවිරයන්වහන්සේද ධර්මාන්විතවූ කථාවෙන් අතික්‍රාන්ත කළාහුය. ඕරුද්ධවූකල ආනන්දස්ථවිරතෙම අනුරුද්ධස්ථවිරයන් වහන්සේගේ නියමය පරිද්දෙන් **කුසිනාරානුවරට** වැඩ මල්ල රජදරුවන්ට බුදුහු පිරිනිවන් පෑබව වදාළේය; එපවත් ඇසූ කුසිනාරානුවර සැටදහසක්පමණ මල්ලරජදරුවන් හා ඒ නුවර බ්‍රාහ්මණ ගෘහපති ආදී සෙනාවෝද මහත්වූ බෙදයට පැමිණ, ඒ ආදාහන කෘත්‍යය පිණිස සියලු පූජාවිධි සාදාගෙණ **උපවත්තන** නම් ශාලවනොද්‍යානයට ප්‍රවිෂ්ටව සියලු පූජා පැවැත්වීමෙන් සත් දවසක් අතික්‍රාන්තකොට, සත්වෙනිදින ඒ බුඩ මෘතදෙහය අගිනව කොසෙය්‍ය වස්ත්‍රයකින් වෙළා ඊමතු පාදාගලද කපු පුළුන්වලින් වෙළා මෙම ක්‍රමයෙන් සියයක් සළුපටයකින් හා සියයක් පුළුන්පටයෙන්ද බුඩශ්‍රීදෙහය වෙළා සුවඳතෙල් පිරූ රන්දෙනකටවඩා අනික් රන්දෙණකින් වසා දිගින් එක්සියඹිසි රියන් පමණවූ උසින් සත්විසිරියන් ඇති සඹුගඩ සංමිශ්‍රවූ දරුසෑයක් බඳවා, මහත් පෙළහරින් සම්භාදෙහය ඒ සෑයට වඩාලූවෝය.

එසමයෙහි වනාහි ආයුෂ්මත්වූ **මහාකාශ්‍යපස්ථවිරතෙම** මහත්වූ ශ්‍රාවක සමූහයා විසින් පිරිවරණලදුව **පාවා** නම් නුවර පිඬු පිණිස හැසිර එයින් නික්ම **කුසිනාරා** නුවරට යන පිණිස අන්තර මාර්ගයට පිළිපන්නේය; ඉක්බිති මහාකාශ්‍යපස්ථවිර තෙම මඟින් ඉවත්ව මධ්‍යාහ්නි වේලෙහි මදක් සැතපී ශරීර කලාහත දුරුකොට සවස්වේලෙහි කුසිනාරා නුවරට වැඩදශබල ධාරිවූ සම්බුදුන්වහන්සේ දැකගණිමැයි සිතා එක්තරා වෘක්ෂමූල යෙක වැඩහුන්සේක. එකල එක්තරා ආජීවකයෙක් තෙම මඳරා මලක් ගෙණ දණ්ඩක අවුණා කුඩයක්මෙන් හිසට අල්වාගෙණ කුසිනාරානුවරින් පාවානගරයට යන දිඹිමාර්ගයට පැමිණියේ එහි රුක්මුල වැඩසිටි මහාකාශ්‍යප ස්ථවිරයන් දැක, "ස්වාමිනි අදට සත්දිනකට ප්‍රථම ශ්‍රමණගෞතම තෙම පිරනිවන්පෑ වදාළේය; මා විසින් මෙම මඳරා මල ඒ ස්ථානයෙන් ගෙණෙන ලද්දේය"යි සැළකළේය; මෙබස් ඇසූඒභික්ෂූපජීවකයා සිටි පෘථග්ජන භික්ෂූන් හිස අත්තගා හඬන්ට වන්හ; නුමුත් ඒ භික්ෂූපිරිස මධ්‍යයෙහිසිටි **සුභද්‍රතම්** බුඩසංඝජීවිතතෙම:- "භික්ෂූනී, කුමට හඬව්ද ? ඒ මහාශ්‍රමණයා කෙරෙන් දැන් අපිමනාකොට මිදුනෝ වුම්හ; මහාශ්‍රමණයා මේ දෙය නොපම කැපය; මේදේ නොපට කැපනොවන්නේය යනාදි වශයෙන් ගැහැට කරන්නේය; දැන් අපි යමක් කැමැති නම් ඒදේ කරම්හ; යමක් නොකැමැති නම් ඒදේ නොකරම්හ; එබැවින් මේ ගැණ ශොක නොකරව්" යනාදි වශයෙන් අනදර තෙපුල් බිණිය. *ඉක්බිති ආයුෂ්මත්වූ

---

* උතුම් පිරිස් මඩනයෙකිද ඇතැම්විට දුෂ්ට පුද්ගලයන් ඇතිවිමු ඉල්ලාශ්‍රු ඛ්‍රීතාමකි.

මහා කාශ්‍යප සථවිරයන්වහන්සේ භික්ෂුසංඝයා කැටුව කුසිනාරා නුවර මල්ලරජදරුවන්ගේ *මකුට බන්ධන චෛත්‍යස්ථාන යෙහිවූ දරුසෑයකරා පැණියේය. මෙසේ දරුසෑය කරා එළඹ සිවුර එකාංශකොට පොරවාගෙණ ඇදිලිබැඳීමෙන් නමස්කාර කොට, තුන්වරක් දරුසෑය සිසාරා ප්‍රදක්ෂිණාකොට ඇවිද භාග්‍ය වතුන් වහන්සේගේ ශ්‍රීපාදය පිහිටිදිශාවෙන් රන්දෙණහා වන්දන චිතකය විවෘතකොට භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රී පාදචයට නමස්කාර කළසේක; මෙසේ නමස්කාරකළ ඉක්බිති දරුසෑය තෙමේම ගිනිදැල්වීගියේය. †

එකල්හි අප භාග්‍යවතුන්වහන්සේගේ අධිෂ්ඨානයවූ නියා යෙන් සතර දන්තධාතූන්, දෙඅකුධාතූන්, ලලාටධාතූන්සයි යන මේ සප්තධාතූහු විසිර නොගියාහුය; අවශෙෂ ධාතූහු සමීප ප්‍රමාණ යටද, කඩසහල් ප්‍රමාණයටද මුන්බියලි ප්‍රමාණයටද විසිර ගියා හුය මෙසේ සම්බුදුන්වහන්සේගේ ශ්‍රීශරීරය ආදාහනව ධාතු පමණක් ශෙෂවූකල්හි අහසින් ජලධාරා අවුත් දරුසෑයෙහි ගිනි නිවාගියේය. ඉක්බිත්තෙන් කුසිනාරානුවරවැසි මල්ලරජ දරුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන්, නුවර මධ්‍ය යෙහිවූ සන්ථාගාර ශාලාව දිව්‍යවිමානයක්මෙන් අලංකෘතකොට සරහා, සියලු නෘත්‍යාලඞ්කාරයෙන් සරහාලද මගුලැන්හු පිට ඒ සධාතුක රන්දෙණ තබා මහත්වූ පූජොත්සවයෙන් සන්ථා ගාරශාලාවට වැඩමවාගෙණවුත් එහි උතුම්වූ පයස්ඨිඞ්කයෙක්හි ඒ සධාතුක රන්දෙණ තබා ධවලච්ඡත්‍ර නංවා පළමුකොට කඩු ගත් අත් ඇති ශොධ පුරුෂයන් ලවා හාත්පසින් වටකොට ආරක්ෂා පිහිටුවා, එසේම දුනුහීගත් ධනුර්ධරයන්ගේ ධනුප්‍රාකාර යෙන් හාත්පසින්වටකොට නොයෙක්ප්‍රකාර ආරක්ෂා සංවිධාන කෙරෙමින්, සත්දවසක් මුලුල්ලෙහි, නෘත්‍යගීතවාදිතාදියෙන්ද, සමන් සපු නා ආදි අපමණ සුවඳමලින් හා සඳුන් අගරු ආදි මාහැගි සුනඹ විලෙපනාදියෙන්ද ධාතු පූජාකළාහුය; එවේලෙහි මගධෙශ්වරවූ අජාසත්රජ තෙමේද, විශාලාමහනුවරවැසි ලිච්ඡවිරජදරුවෝද, කපිලවස්තුපුරයෙහිවූශාක්‍යරජදරුවෝද අල්ලකප්පනුවරවාසි බුලය නම් ක්ෂත්‍රිය රජහුද, රාමග්‍රාමයෙහි වාසඝකරන්නාවූ කෝලියරජදරුවෝද, වෙඨදීපකම්නුවරවාසී වෙඨදීපනම් බ්‍රාහමණතෙමේද, පාවෙය්‍යකනුවරවාසී රජදරු වෝද, යන මේ රජදරුවන් හා මහාසෙනාවෝද දිවගොස් ඒ කුසිනාරානුවර වටකොටගෙණ "ධාතු හෝ අපට දෙව නැත හොත් යුධ හෝ කරන්නෙමුය"යි ඔවුනොවුන් වහසිබස් කියා සිටියාහුය; එබස් ඇසූ මල්ලරජදරුවෝ කියන්නාහු, "අපගේ නුවර යම් රුවනෙක් උපන්නේ නම් එය අපටම හිමිය, නොප කිරිබොනදු අපි මෝරුනොපුම්හ, අපි ධාතු නොදෙම්හ; නෙපි යුඞ්කරණු නැමැත්තාහුනම් අපිත්කැමැත්තම්හ"යි මන්වඩනා වහසිබස් කියා කලහ වැඩූහ.

එසමයෙහි වෙදතුයෙහි පාරප්‍රාප්තවූ මුළු දඹදිව්තෙලෙහි රජදරුවන්ට ආචාර්‍යභාවයෙහි හැසිරෙමින්, අප බුදුන්හෙන්

---

*මකුලු බඳින සථානය.

†සම්භූමෘතදෙහය තබා කාරණලද එම දරුසෑය ඉඹිම ගිනි ඇවිළීම දෙවියන්ගේ අධිෂ්ඨානයෙන් වූබැව් දතයුතුයි.

බණ අසා සෝවාන් ආදි මාගීඵලයට හා ඵලත්‍රයටද පැමිණ සිටි **දෝණ නාම බ්‍රාහ්මණතෝම**, දෙලොස්දහසක් පමණ පදුලඛීණාශ්‍රව ශ්‍රාවකඛ්‍යාවකින් බුදුගුණ කථනයකිරීමෙන් රජදරුවන්ට අවවාදකොට ධාතුබෙදුදෙනු කැමතිව:—**"සුණාතු මෙ භොතා මම එකවාක්‍යං"** යනාදීන් "පින්වත්වූ රජදරුවෙනි, මා කියන්නාවූ මේ එකම වචනයක් අසත්වා; සම්මාසම්බුද්ධ ප්‍රදීපය මාහාවූ අපගේ සර්වඥජ්‍යෝතිර්මතෙම බොධිසත්ත්වභූමියෙහි ක්ෂාන්තිවාදි ආදි ජාති ශතසහස්‍රයෙහි අන්‍යයන්කෙරෙහි ක්‍රොධ නොකොට ක්ෂාන්ති සම්බන්ධ මෛත්‍රියම පුරුදුකළසේක; එහෙයින් ඒ මහොඝතීර්ණන්ගේ ශාරීරික ධාතු කොට්ඨාසය හෙතුකොටගෙණ, කලහවැඩිම යුතුනොවන්නේය; සියලු පින්වන්හුම ඔවුනොවුන්කෙරෙහි හිතෛෂිභාවයෙන් යුකතව, මෛත්‍රී චිත්ත පූර්වකව සාමග්‍රී ධර්ම ආරක්ෂාකරමින් සර්වඥයන් වහන්සේගේ ශාරීරික ධාතූන් අටභාගයක් කොට බෙදුගෙණ ඒ ඒ දිග්භාගයන්හි චෛත්‍යයන් පිහිටුවව්ය"යි කියා අවවාද කොට, ඒ රජදරුවන් සමගිකරවා ධාතු බෙදීමට පටන්ගත. එකල ඒ රජදරුවන්ගේ යම් කිසි ප්‍රමාදයක් බලා ඒ බ්‍රාහ්මණතෙම දකුණු දළදුවහන්සේ ඔවුන් නොදැනුවත්වම ගෙණ *ශිරොවෙෂ්ඨනයෙහි සඟවාගත; † ඒ බැව් දුටු සක්දෙව් රජතෙමේ දකුණු දළදුවහන්සේ පුදන්ට මේතෙම සුදුස්සෙක් නොවේයයි සිතා, සියුම්වූ අතක් මවා ඒ දළමඬුල්ලෙහි සඟවා තුබූ ධාතුව ගෙණ සත්රුවන් කරඬුවකට වඩමවා ශක්‍රභවනයට ගෙණගොස් **සිළුම්ණිසෑය** නම්වූ චෛත්‍යයට වඩා මේ අද දක්වාත් පූජාසත්කාර කරන්නේය; ඉක්බිත්තෙන් බමුණුතෙම මගධඤ්ජනපදයෙන් දෙනැළිය බැඟින් ධාතු අටකොටසක් කොට රජදරුවන්ට බෙදදී, පසුව ඉස අතගාබලා දකුණුදළදු නොදැක ශොකයෙන් ධාතු බෙදූ සඛණ්ඩනාළිකාව රජදරුවන්ගෙන් ඉල්වාගත්තේය; එකල පිප්පලිනුවර **මෝරිය** රජදරුවෝ බුදුන් පිරිනිවීබැව් අසා පසුව අවුත් ධාතු නොලත් හෙයින් ආදාහන ස්ථානයෙන් අඟුරු ගෙණ ගියාහුය. මෙසේ ධාතු බෙදූ ඉක්බිති මගධෙශ්වරවූ අජාසත් මහරජතෙම සියනුවරට ප්‍රවිෂ්ටව එහි මහානඝීවූ චෛත්‍යයක් කරවා එහි ධාතු නිදන්කර උදුරතර පූජාසත්කාර කෙළේය, අවශෙෂ රජදරුවෝද තමතමන්ලත් ධාතුකොට්ඨාසයන් සකීය සකීය නුවරවලට ගෙණගොස් එහි මහත්වූ දගැබ්බදවා ධාතුනිදන්කොට යථාශක්තීන් පුදපූජා පැවැත්වූහ. **දෝණතෝම** බ්‍රාහ්මණ තෙමේද තමන් ලත් සඛණ්ඩනාළිකාව සියනුවරට ගෙණ ගොස් **කුම්භට්ඨ** නම් චෛත්‍යයක්ද පිප්ලි මෝරිය රජදරුවෝ දරුයෙහි අඟුරු නිදහන්කොට **අඞ්ගාරට්ඨ** නම්වූ දගැබක්ද කරවා පොහොසත් පමණින් පුදපූජා පැවැත්වූහ. මෙයේ දෙව්මිනිස් සහිත සර්වලොකයාහට උත්තම ගෞරවස්ථානීයවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේගේ ශාරීරිකචෛත්‍ය අටක්වූවෝය. කුම්භට්ඨය හා අඞ්ගාර චෛත්‍ය යන් සමග චෛත්‍ය දශයක් වූහයි දතයුතුයි.

---

*හිස්වෙළුම් මාළුවන් හලප්පාම.

†අවඩක ග්‍රන්ථාඛ්‍යානයෙ පූර්වකාල සම්බුද්ධාතු තමන්ගේ සඟවාගැණීම අදන්නා දුනයට ඇතුළත්නොවෙයයි දක්වනුලදි

බුඩාගම ලංකාවේ පිහිටුවීම.

මෙසේ සම්‍යක්සම්බොධියට පැමිණියන්සාළිස්වසක් මුලුල්ලෙහි ගණනපථාතික්‍රාන්ත දිව්‍ය මනුෂ්‍යයන්ට නිර්වාණසම්පත්ති ප්‍රතිලාභය දෙවමින් ලෝවැඩකර වදාළාවූ භාග්‍යවතුන්වහන්සේ තුන්වරක් මේ ශ්‍රී **ලඞ්කා**ද්වීපයට වැඩ මේ දිවසිනට අනුග්‍රහකර වදාළේය. මහේ කෙසේදයත්? සර්ව්ඥයන්වහන්සේ **උරුවෙල්කස්සප්** නම් ජටිලයාගේ මහාශ්‍රාගය ඵලඹ සිටිකල්හි, තමන් නොඒමෙහිවූ ඔහුගේ ඉච්ඡාචාරය දැන උතුරුකුරු දිවසිනෙන් පිණ්ඩපාතය ගෙණවුත් **අනවතප්ත** නම් විල සමීපයෙහිදී වළඳා තමන් වහන්සේ සවස්වේලෙහි සම්‍යක් සම්බොධියෙන් නවවනමස දුරුතු පුර පසළොස්වක්හි ලඞ්කාද්වීපය ශුද්ධිකරණු පිණිස ලක් දිවට පැමිණිසේක. සර්ව්ඥයන්වහන්සේ විසින් ලක්දිව සසුන් බබලන තැනෙකැයිද යකුන්ගෙන් පිරුණු ලක්දිව යකුන් බැහැරකළ මැනවැයිද දැන ලංකාද්වීප මධ්‍යයෙහිවූ **මහානාගවන** නම් උයන්හි **මහියඞ්ගණ** ථූපයාගේ අග්‍රස්කුඹ වැඩසිට වර්ෂාවාතාන්ධකාරාදිය මවා යකුන් බියගන්වා ගිරිදිවසිනට යකුන් එළවා රැස්වූ දෙවියන්ට ධර්මදේශනාකොට එහිදී සෝවාන්වූ **සුමනදිව්‍යරාජයා**ගේ අයදුම පිළිගෙණ හිසපිරිමැද කෙශධාතු මිටක් දුන්සේක; දිව්‍යරාජතෙම කරඬුවකින් ඒ කෙශධාතු පිළිගෙණ එහි වඩාහිඳුවා **මහියඞ්ගණ**ථූපය කෙළේය; උන්වහන්සේ පිරිනිවිපසු **සැරියුත්තෙරුන්ගේ** ශිෂ්‍යවූ **සුරඟු** නම් රහත්තෙනෙකුන්වහන්සේ විසින් බුදුන්ගේ දරසෑයට අනලා සෑඞ්ගෙන් **ගෙණෙත්තලද** රන්මිහිඟු බෙරශ්ක් වැනිවූ ත්‍රිවාධාතුවද මේ දැගැබෙහිම නිදහන්කෙළේය; ඉන්මැතභාගයෙහි දුට්ඨගැමුණුරජු විසින් ඒ දැගැබ වසා අසූරියන් **ඝණඵුඩා චෛත්‍යයක්** කරණලද්දේය; මේ සර්ව්ඥයන්වහන්සේගේ පළමුවන ගමනයි.

ඉක්බිතිව බුදුවූ පස්වෙනි වර්ෂයෙහි සර්ව්ඥයන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවාසය කරණසේක් ලක්දිව්වැසිවූ **මහොදර** **චූලොදර** යන නාරපුත්තුන්ගේ මිණිපළඟ නිසා හවගත් මහත් යුඬභය දැක බක්මස අමාවක් පොහොදින **නාගදීවසිනට** වැඩිසේක. ඉක්බිති ඔවුන් කලහඉපදවූ මිණිපළඟ බුදුන්ට පුදා දෙසෙනඟ සමගිවූහ; එකල බුදුහු ඔවුන්ට ධර්මදේශනාකොට අසූකෙළක් නයින් සරණසීලයෙහි පිහිටුවා තමන්වහන්සේගේ පාරිභෝගික චෛත්‍යවූ කිරිපළඟරුක හා මිණිපළඟද නයින්ට චෛත්‍ය පිණිස දී නයින් සමගිකරවා ජේතවනයටම වැඩිසේක; මේ බුදුහු ලක් දිවට වැඩි දෙවෙනි ගමනයි.

ඉක්බිති ඊට තුන්වෙනි වර්ෂයෙහි **මණිඅක්ඛික** නම් නාරජු විසින් **දෙව්රම්වෙහෙරට** ගොස් බුදුන් ප්‍රමුඛ මහාසංඝයාට ලක් දිව් වඩනා **පිණිස** ආරාධනා කරණලදුව ඒ ආරාධනාව පිළිගත් භාග්‍යවත් තෙමේ බුදුවූ අවවෙනි වර්ෂයෙහි පන්සියයක් මහ රහතුන් විසින් පිරිවරණලදුව වෙසඟමැදිපොහෝදින දෙව්රම් වෙහෙරින් අහසටනැගී අවුත් **කැළණිදිය** පිහිටිතැන කරණ ලද රතනමණ්ඩපයෙහි පණවනලද ඒ උතුම් මිණිපළඟෙහි වැඩ හිඳ නාරජුන් විසින් පිළිගන්වනලද දිව්‍යභෝජනය වළඳා ධර්ම දේශනාකොට අනන්තරවැඩසමනන්තකූටපබ්බත මස්තකයෙහි ශ්‍රීපාද ලක්ෂණය දක්වා ඒ පර්වතපාදයෙහි **දිවාගුහාවෙහි** දිවාවිහරණය කොට, එතනින් **දිගාවැවටද** එතනින් **මහමෙවුනා උයන** පිහිටි තැනටද එතනින් දකුණු ශාඛාව පිහිටි තැනටද එතනින් මහ සෑය පිහිටි තැනටද එතනින් **චූළාරාමය** පිහිටිතැනටද එතනින් **ශෛල චෛත්‍ය**ස්ථානයටද වැඩ සමාධි සැපයෙන් මොහොතක් බැගින් කල්යවා දෙව්රම් වෙහෙරට වැඩිසේක; මේ තුන්වනවර ලඞ්කාද්වීපයට බුදුන්ගේ පැමිණීමයි.

මෙසේ තුන්වරක් ලඞ්කාද්වීපයට බුදුන් වැඩිය බැවින්ම මේ ද්වීපය උතුම් ද්වීපයක් වූයේයි. සර්ව්ඥයන් වහන්සේ පන්සාළිස් වසක්ලොකා සිසිඩියකොට යමක ඤාලානාගරයෙහි පිරිනිවන්පාන **පිණිස** වැදහොත් දවස්හි සිංහපුරයෙහි සිංහබාහුරජු පුත් විජය කුමාරතෙම **සත්සියයක්** යොධයන් විසින් පිරිවරණලදුව ලඞ්කා ද්වීපයට ගොඩබැස යකුන් හා යුද්ධකොට ජයගෙණ **නම්මැන්න** නම් නුවර ඉදිකොට **මදුරාපුරයෙන්** සමකුල **බීසවක්** ගෙන්වා අභිෂේකකොට ලඞ්කාරාජ්‍යයට පැමිණියේය. ඉක්බිති **දඹදිව ධර්මා ශෝක රජු හා** ලඞ්කාද්වීපයෙහි **දෙවනපැනිස්** රජුන් අදහමින්වූව රාජ්‍යඅභිෂේකසමයෙහිදඹදිව **පැලඳුප්නුවර මොග්ගලිපුත්තතිස්ස** සර්වඥයන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා ධර්මාශෝක රජුගේ සහායත්වයෙනුත් කරණලද තුන්වෙනි ධර්මසඞ්ගායනාවශාන යෙහි ප්‍රත්‍යන්තනගර ශාසනය පිහිටුවනු පිණිස මහරහතුන් වහන්සේලා පිටත්කර යවනුයේ, මේ ලඞ්කාද්වීපයට ධර්මාශෝක රජුගේ එකම පුත්‍රවූ **මහාමහෙන්ද්‍ර සර්වඥයන්** ප්‍රමුඛකොට පස් නමක් පිටත්කොට එවිසේක; උන්වහන්සේලා මහමෙවුනා උයනට බැස එහිදී දෙවනපැනිස් රජු දැක ධර්මදේශනා කොට බුද්ධශාසනයෙහි පහදවා ඒ දෙවනපැනිස් නරශ්‍රේෂ්ඨයාන්ගේ ආධාරයෙන් හා මහාමහෙන්ද්‍ර සර්වඥයන්ගේ ප්‍රධානත්වයෙනුත් ලඞ්කාශාසනය පිහිටුවාළසේක; **අනුරාධපුරයෙහි** දෙවනපැනිස් මහරජහුගේ ආධාරයෙන් මහාමහෙන්ද්‍රසර්වඥයන් ප්‍රමුඛ සඞ්ඝයා විසින් පළමුකොට මහාසීමාව බඳනාලද්දේය. ඒ සීමාවේ ඉම්ගල් මෙසේයි:- **පොලොන්නරුය** පහන්තොට පහණෙහි **කුඹාවලවද එතනින් කුම්බලනම්** වලඅගටද **එතනින් මහදූවටද** ගියේය;

එතනින් **කුඹුක්වෙලටද** එයින් මහමළුවටද එතනින් **කුදුමිරුක** වද එතනින් **මරුක** පොකුණටද එතනින් **ධිජයාරාම** නම් ලය නෙහි උතුරු දෙරකොටුවට හියේය; එතනින් **ගජකුඹු** නම් ගලවද එතනින් **තුසවැඩියමැදින්** අබාදයනෙහි **කොග්ගලලවද** ගොස් මහසොහොන මැදට හියේය; එතනින් දිගුපහණට ගොස් කුමාරදෙවයාගේ බඩහැලට වමින් නුගමළුවට ගොස් හියගල සමීපයෙහි ගිනිකොණ **දියවස්** බමුණාගේදෙවාලස්වද එතනින් නෙළුන්පෙළටද එතනින් තාලවතුඤාණටද එතනින් අස්මඩුල්ලට වමින් **සසවාණඝට** ගොස් එතනින් බොරළුකොටවද එතනින් මත්තෙහි නදියටද හියේය; පළමු සෑයෙන් නැගෙණ හිරද කොලොම්ගස් දෙකාක්වූහ; එහි ජීවමානවූ කොලොම්රුක සීමාවට ඇතුලුකොට මල කොලොම්රුකපිහිටි ඉවුරෙන් සීමාව උඹුවහාගයට පත්විය; මහෙසුදු සථවිරතෙමේ **සිංහස්නාන** නම් තොටින් උඩට පැමිණ ඉවුරෙන් වඩනේ පහන්තොටට පැමිණ නිමිති ගැලපූසේක; නිමිත්තෙන් නිමිත්ත ගැලපූකල්හි සස්න මොනවටපිහිටියේයයි දෙවිමිනිස්සු සාධුකාරපැවැත්වූහ; දෙවනපෑතිස් රජතෙමේ ඇතුන් දෙදෙනෙකුට **රන්නගුළක්** යොදා තෙරුන්වහන්සේගේ **පසුපස්සෙහි** හිඳීට දෙමින් ගොස් සීමාව සලකුණු කොළේය, මේ සීමා බඤ්ඤාවශානයෙහි **මහ** පොළව කමපාවූවාය; ඉක්බිති ඒ රජතෙමේ මහ නදුන් ලය නෙහි **කාලප්‍රාසාද** නම් පිරිවෙණක්ද **මහඅබ්භගෙයක්ද ලෝවා මහාපාසාදක්ද ලහඅබ්භගෙයක්ද** බත්හලක්ද **සුණ්ණාගාර**පිරිවෙණ නම් විහාරයද දිස වඩකමන නම් පිරිවෙණද **එලගහ** පිරිවෙණද **මරුගණ** පිරිවෙණද **දික්සදසෙනෙවිසා** පිරිවෙණද කරවා බුදසාසනය පිහිටුවාළේය.

ඉක්බිත්තෙන් ඒ මහාමහෙසුදු සථවිරයන්වහන්සේ **සුමන** නම් සාමනෙරයන් කැඳවා ඔහුගේ මුත්තනුවූ ධර්මාශොක මහ රජුකරු යවා සවීඳුයන්වහන්සේගේ පාතුධාතුව හා ඒ පාතුය පුරා සවීඳු ශාරීරික ධාතූන් ගෙන්වා නැවත **එම** සාමණෙරයන් වහන්සේලවා සථවිරයන්වහන්සේගේ අණපරිද්දෙන් ශකුහවන යෙන් සවීඳුයන්වහන්සේගේ දකුණු අකුධාතුවද ගෙන්වා **දෙවා නංපියතිස්ස** රජහට දුන්නේය; දෙවානංපියතිස්ස රජතෙමේ ඒ දකුණුඅකුධාතුව පිහිටුවා **ථූපාරාම චෛත්‍යය**කෙළේය; එදවස්හි ඒ අකුධාතුන්වහන්සේ අඟසට පැණනැගී බුදුන්ගේ අධිෂ්ඨානය පරිද්දෙන් යමාමහපෙළහරකොට අහසින් බැස **නිධානගබ්භ** යෙහි පිහිටියේය; ඒ ධාතුව චෛත්‍යයෙහි පිහිටනකල්හිද අද්භූතවූ භූමිකම්පාවක්වූවාය; ඒ ප්‍රාතිහාර්‍යය දුටු **මහානාග** නම් **රජකුමාරතෙම** සැත්තෑහි පැහැද දහසක් පුරුෂයන් හා සමග

පැවිදිවූයේය; එසේම **වෙනාපි** නම් ගමින් පන්සියයක් කුල දරුවෝද **දෙරමඬලු** නම් ගමින් පන්සියයක් කුලදරුවෝද **හල්ලිමියෙන්** පන්සියයක් කුලදරුවෝද **උපතිස්ස** නම් ගමින් පන්සියයක් කුලදරුවෝද එදවස්හි පැවිදිවූහ. ඊට මෑතභාග යෙහි දෙවනපෑතිස් රජහුගේ බෑණාවූ **මහාරිට්ඨ** නම් ඇමතියා රාජසන්දෙශයන් දී ධර්මාශොක **මහරජානන්කරු** යවා දක්ෂිණ ශාඛා මහාබොධිය හා **සංඝමිත්‍රා** සථවිරින්වහන්සේද ලක්දිවට වැඩමවාගෙණ ආයේය; නේ කෙසේද යත්? ධර්මාශොක මහරජතෙම නවරියන් අවට ඇත්තාවූ නැඹුරෙන් පස්රියන්වූ තුන්රියන් විජෘතාමහයෙන් යුක්තවූ අටඟුල් ඝනවූ, තරුණ ඇතෙකුගේ සොඬ පමණ මුවවිට ඇත්තාවූ ලහිරුම්බලකට බදු කානහි ඇත්තාවූ රන්කවාරම ගෙන්වාගෙන සිව්රහසෙනග පිරිවරා මහාසංඝයා හා සමග **පාලඵල්නුවරින්** සත්යොදුන් දුරවූ මහාබොධිවෘක්ෂය කරා එළඹ, සවීඥයන්වහන්සේගේ අධිෂ්ඨානයවූ පරිද්දෙන් රන් තෙල්ලෙන් රත්සිරියෙල් ගෙණ රෙඛා අඳිනලද සථානයෙන් නොමෝම සිදී අවුත් රන්කවාරමෙහිවූ සුවඳමඩෙහි පිහිටා එකෙණෙහිම මුල් සියයකින් සථිරවිය; ඒ සථානයෙහි පහළවූ **ප්‍රාතිහාර්‍යයන්** කරණකොටගෙණ ප්‍රසන්නවූ ධර්මාශොක රජතුමා සවකීය රාජ්‍යයෙන් මහාබොධිය පිදූයේය; **ඉක්බිති** මහරජතෙම මහබෝ රක්නා පිණිස අවලොස් **කුලයක** දෙවියන්ද අවලොස්කුලයක ඇමතියන්ද අවකුලයක බමුණන්ද අට කුලයක කෙළඹියන්ද ගොපළුකුලයන් හා තරස් කුලයන්ද කලිඟුකුලයන්ද පෙහෙරකුලයන් හා කුඹල්කුලයන්ද සියලු සෙනා සමඛ්‍ය කුලයන්ද නාග යක්ෂයන් **සමඛ්‍ය** කුලයන්ද අට අට සමග **ගඞ්ගානම් නදියෙහි** සරසතලද නැවට මහබොධිය නංවා එතළොස්නමක් පිරිවර මෙහෙණින්නන් සහිතවූ සංඝමිත්‍රා නම් මහතෙරණින්ද නැවට නංවා පිටත් කරවූයේය; මහත් ප්‍රාතිහාර්‍යයෙන් වඩාගෙණ එන ලද්දවූ බොධිය දෙවානංපියතිස්ස රජතෙමේ මහත් **සොම්නසින්** පිළිගෙණ අනුරාධපුරය දෙව්පුරයක්සේ සරසා බොධිශාඛාව මෙහි වැඩම්වාගෙණවුත් **මහමෙවුනාඋයන** මහබෝ පිහිටුවාඑළෙස්ක; මේ මහාබොධිය ලඞ්කාවට නෙණඑනලද්දේ ධර්මාශොක රජහට අටළොස්වන හවුරුද්දෙහිය.

ඉක්බිති සෑහිරියෙහි තබනලද සවීඥ ශාරීරික ධාතූන් වඩා යොදුනෙන් යොදුනට දෙගැප් කරවා ප්‍රාතුධාතූන්වහන්සේ රජ වාසල තබා පූජාකෙළේය; මේ දෙවනපෑතිස් රජතෙමේ ඊට මෑතභාගයෙහි මහාවිහාරය **සෑගිරි ථූපාරාමය** මහ බෝ පිහිටු විමය මහසෑ තැන්හි ගල් වැඹක් පිහිටුවීමය **ත්‍රිවාධාතුව මහි ඝඞ්ගානෙහි** පිහිටුවීමය **ඉසුරුමුනි විහාරය තිසාවැව පලමු සෑය වෙස්සගිරිවිහාරය උපාසිකා විහාරය හත්තාලගක් විහාරය**

179760

මහාපාළිනම් බත්හලය **නාගදීවසිනා දඹකොළවෙහෙරය තිස්ස මහාවිහාරය පාචිනාරාමය** යන මෙතෙක් වෙහෙර විහාර කරවා අවුරුදුපතා දහසක් භික්ෂූන්ට පවාරණ දානය දුන්නේය; මහා මහෙළුසඵවිරයන්වහන්සේ සියලු ආකාරයෙන් ලංකාශාසනය බබුළුවා සැටවස් පිරුණුසේක් සැහිරියෙහිදී පිරිනිවන් පෑසේක. උන්වහන්සේගේ ශාරීරික ධාතු මහාසෑ ව නුදුරුව බඩමාලක නම් සථානයෙහි කොටසක්ද සැහිරියෙහි කොටසක්ද නිදන් කොට **උත්තිය** නම් රජහු විසින් චෛත්‍ය කරවනලද්දේසි. සංඝ මිත්‍රානම් මහාසඵවිරිතොමෝ නොයෙක් ශාසනාභිවෘඩිකොට එකුන්සැටවස් ඇත්තී **උත්තිය**නම් රජහුට නවවන වළඳියෙහි පිරිනිවන් පෑවාසේ; උත්තිය රජතෙමේ උන්වහන්සේගේ මෘත ශරීරයද ථූපාරාමයට නැගෙණහිර චිත්තශාලා සමීපයෙහි ආදාහන පූජාකරවා ධාතූන් ගෙණ එහිම සෑයක්කරවූයේය. ඊට මෑත භාගයෙහි බුදුන් පිරිනිවි තුන්සිය අසූතුන්වන වළඳියෙහි සැඩ දෙමළුන් පරදවා ලඞ්කාවිපය එකාතපත්‍රකොට රජපැමිණ දුටුගැමුණු මහරජු විසින් සංඝයාට නොතබා අනුභවකරණලද එකම මිරිස්වැටියකට දඹිවම් පිණිස යුඞ්කාලයෙහි පෙරමුණේ ගෙණගිය ධාතු සහිතවූ කුන්තායුධය නිධානකොට මිරිසවැටි දාගැබ හා විහාරයද කරවූයේය; ඒ මිරිසවැටි දාගැබ කරවීමට පටන්ගත් තැන්පටන් විහාරපූජාව අවසන්කොට ධාතු නිධාන යෙහි නිදන්කරවූ අනර්ඝවස්තූන් හැර වියදම්කළාවූ ධනය පමණක් කහවනු එකුන්විසිකෙළක් වන්නේසි.

ඉක්බිති දුටුගැමුණු මහරජතෙමේ **ලොහප්‍රාසාද** නම්වූ පොහෝගෙයක්ද නවමහල්කොට කරවූයේය; හේ කෙසේදයත්? **සරණී** නම් දිව්‍යකන්‍යාවට පහළවූ ආකාශසථ විමානයෙහි ආකාරය රහතුන් විසින් දැහිගුලෙන් වස්තුයෙක සිතියම්කොට රජහට ගෙණවුත්, දුන්නේය; රජතෙමේ දිගින් පුළුලින් හා උසිනුත් දහසක් දහසක් රියන් ප්‍රමාණවූ ප්‍රාසාදය නවමහල කින් යුකතකොට කරවූයේය; එක එක මාලයෙහි කුළුගෙවල් සියයබැගින් නවසියයක් කුළුණවලින් යුකතවිය; ඒ සියළු කුළු ගෙවල් රිදීයෙන් නිමවා ඒ කූටාගාරයන්ගේ ප්‍රවාලමයවූ පිළිකඩ නානාවිධ රත්නයෙන් අලඞ්කෘතකෙළේය; ඒ පිළිකඩ සමඟඛි පියුම්ද නානාවිධ රතනයෙන් විචිත්‍රවූහ; ඒ වෙදිකාවෝ රජතමය කිකිණිපෙළින් පරික්ෂිප්තවූහ. ඒ පහයෙහි මනාකොට සදනලද ගබඩා දහසක් නානාවිධ රත්නයෙන් ඔබ්බන ලද්දාහ; වෛශ්‍රවණ දිව්‍යරාජයාගේ **නාටිවාහන** නම් යානාවේ සටහන අසා එබඳුවූ රත්නමණ්ඩප යක් ප්‍රසාද මඛ්‍යයෙහි කරවූයේය; ඒ යානාවේ සටහන් ඇති මණ්ඩපයේ වනාහි සිංහ ව්‍යාඝ්‍ර දෙවතාදි රූපයන් ඇත්තාවූ මැඹින් අලඞ්කෘතවූයේය මණ්ඩපානතයෙහි භාත්පස මුතුදැලින් වටකරණලද වෙදිකාවක්විය; මේ මණ්ඩප

මධ්‍යයෙහි පලිඟුඅතුළ සිත්කළු පළඟක් පිහිටුවා ඒ පළඟෙහිද දළකඩමිස පිටාටුවක්ද රණ්හිත්කළ හිරුමඬලක් හා රිදීයෙන් කළ සඳමඬලක්ද මුතුපෙළින්කළ තාරකාරූපද පිහිටුවනලද්දු හුය; නානාරත්නමය පියුම්ද තොයෙක් ජාතකකථාද එහි රතනයෙන් නිමකරණලද්දේය; ඒ පළඟ මතුයෙහි දළකඩමය විජිනිපත් හා මත්තෙහි රිදීමිටකින් යුකත සේසතක්ද පිහිටුවූ යේය; මේ ප්‍රාසාදය දෙව්ලොව සුධර්මානම් දිව්‍යසභාව පරයන් නක්විය; මේ වනාහි තඹ ලෝ උළුවලින් වසනලද බැවින් ලෝවාමහාපාසාදයයි ප්‍රසිඛවිය. මේ ප්‍රසාදයට පිදුවාවූ අනාගී වඥතුන් හැර විසඳම්කළ ධනය නිස්කෙලක් කහවනුවන්නේසි.

ඊට මැතභාගයෙහි මහසැතන්හි පිහිටුවනලද ගල්මැඳුක රුවන්වැලිමහසෑය කරවනුකැමතිව මහජනයා පොළඹා මහ සෑයකරණ උපාය සිතසිතා වසනකල දෙවානුභාවයෙන් අනුරාධ පුරයට යොදුනක්දුරවූ ගම්හිර නම් ගංඉවුරේ විශ්වකර්මයා විසින් ගඩොල්මවා දුන්නේය; එම නුවරට ඉසාණදිගින් තුන් යොදුන් පමණ දුරවූ අාචාරවිසි නම් ගම සඛණිණබීජයෝ උපන්හ; නුවරට ඉදුරුදිග සත්යොදුනකින්දුර තඹරවිනම් ගම තඹලෝ උපන්හ; නුවරට හිතිකොන සතර යොදුන් දුර සමන්වැවිනම් ගම මැණික් උපන්හ; නුවරින් දකුණුදෙස අටයොදුන් දුර අඹඋකොලනම් දනව්වෙහි ලෙණක රිදී උපන, නුවරින් බටහිර උරුවෙල් නම් පටුනෙහි මහඇඹුලුපල පමණවූ මුතු සහ පබළුත් මුහුදින් ගොඩනැංගාහ; නුවරින් උතුරුදිග පෙලවැවි නම් ගම ඇඹරුම්ගල් පමණවූ උතුම් මිණරුවන් සතරක් පහළ වූහ; උත්තර සහ සුමණසාමණේරයන් දෙදෙනා සාඩියෙන්ගොස් උතුරුකුරු දිවයිනෙන් ධාතුනඛාය පිණිස අසුරියන්දිගපුළුල්වූ හිරුමඬලුසේ බබලන අටඟුල් බොලය ඇති ගැටපුප්බදුමේවන් පහන්සයක් ගෙණවුත් දුන්හ; ඉන් එකක් උඩවද එකක් යටවද සතරක් සතර හිතහිය වද තබා නිධාන ගඹ්හය සැදූහ; ඊමැද නවරතනයෙන් කරණලද අටලොස්රියන් උසැති බෝරුකක් පිහිටුවා ඒ බොධියට පිවලා වැඳහිඳින ආකාර නවරත්න මහා ප්‍රතිමාවක් පිහිටුවා රිදී සෙවතවඡතුයක් ගත් මහාබ්‍රහ්මයාය, ජය තුරුසකක්ගත් ශක්‍රයාය, වීණාවක්ගත් පන්සිළු දිව්‍යපුත්‍රයාය, නාටිකාවන්සහිත මහකලනාරජය, නාලාගිරිඇතු හා පිරිවර සහිත දහසක් අත් ඇති මාරයාය, යන මොවුන්ගේ රූප නව රත්නයෙන් කොට පිහිටුවනලද්දේය; බොධියට ඉසලා කෙලක් අගනා මහසය්නයක් පණවනලදී; සුවිසිවිවරණය සත්සතිය බ්‍රහ්මාරාධනාවය දම්සක්පැවැත්වීමය යස සත්‍රියන් පැවිදිකර වීමය භද්‍රවගීගියකුමරුවන් පැවිදිකරවීමය ජටිලදමනය බිම්සර රජුගේ එළඹීමය රාජගෘහ නගරප්‍රවේශය වෙළුවනය පිළිගැන්ම අසුමහ සව්වෝහ කිඹුල්වත් ගමනය රුවන්සක්මිණය රාහුල

නාඳුකුමරුවන් පැවිදිකරවීමය දෙවිරම් පිළිගැන්මය යම්මහ පෙළහරය දෙවිලොව විජම් දෙසීමය සකස්පුර දෙරට බැසීමය ප්‍රශ්න සමාගය මහාසමය සුත්‍රානන්තසමාගමය රාහුලොවාද සූත්‍රානන්තසමාගමය මහාමඞ්ගල සූත්‍රානන්තසමාගමය ධනපාලසමාගමය ආලවකදමනය අඟුල්මල්දමනය අපලාලදමනය පරායන සමාගමය ආයුසංස්කාරය හැරීමය පිරිනිවන්පෑමය සූකර මාංස ප්‍රතිග්‍රහණය ශාඛි සඛණී වණී වසුත්‍රයුග්මය පිළිගැණීමය පහන්දිය වැළඳීමය දෙවිම්නිසුන්ගේ විලාපය කසුප් තෙරුන්වහන්සේගේ පා වැඳීමය දරසැයෙහි දැවීමය ගිනිනිවීමය එහි සත්කාරය ධාතු බෙදීමය වෙසඟන්තර ජාතකය තුසිපුරය පවන් බෝමැඬ දක්වා කථාප්‍රවෘත්තිය හා වෙනත් සමහර ජාතක කථාය ඝන මොවුන් නවවිධ රත්නයෙන්මකොට නිධානනඞ්ගයෙහි පිළිවෙළින් තබා හාත්පස සතරවරම් දෙවිරූපය නෙතිස් දිව්‍යපුත්‍ර රූපය නෙතිස් දෙවිකුමරි රූපය අටවිසි යක්සෙනෙවි රූපය ඉන්මත්තෙහි ඇදිලිබැඳගත් දෙවතාරූපය ඉන්මත්තෙහි මල්සහිත පුන්කලස් ගෙණ නවන දෙවතාරූපය තුසිතපවත්වන දෙවතා රූපය කැඩපත්ගත් දෙවතා රූපය මල්අතුනත් දෙවතාරූපය පිසුම් ගත් දෙවතාරූපය කඩුගත් දෙවතාරූපය යන මෙතෙක් රූප යන්ගේ පඞ්ක්තිකෙළවරවූ මත්තෙහි පාත්‍ර හිසින්ගත් දෙවතා රූප පඞ්ක්තියක්කොට සුවඳ තෙලින් පාත්‍ර පුරවා පස්රියන් පවපහන්වැටි දල්වා ශාසනාභිනඞ්ගය දක්වා නොනිමි පවත් නාසේ රහතුන්ගේ සෘඞ්යෙන් ආලොකකළේය; තවද සතර පැත්තේ දිලිසෙන මැණික්ගොඞසතරක් කෙළේය; සතර හිතහි යෙහි ආලොකවත් විදුලි සමාන මැණික් අල්ලන ලද්දේය; මේසේ ධාතුගර්භය හිරුදහසක් නැංගාක්මෙන් නිතර බබලන්නේය; මේ සියලු කර්මානයෙන්ම ඉතා යහපත්වූ රණින් හා රිදී යෙනුත් සපා රත්නයෙනුත් ඉදඟුහුනක මහරහතුන්වහන්සේගේ විධානයෙන්කරණලදී; ඉක්බිති ශාරීරිකධාතු ද්‍රෝණඅමෙන්. රාමගම කොළිය රජුන් විසින් සත්කාර කරණලදුව එයින් නාලොවට පැමිණ නසින්විසින් පුදනලදුව බුදුන්ගේ අධිෂ්ඨාන බලවූ පරිද්දෙන් සොණුත්තරත්‍රනම් රහතුන් විසින් ගෙණදෙන ලද්දේ මේමහසෑයෙහි නිදන්කරණලදී; එදවස ධාතූහු රජතුගේ හිසින් අහසවහැරී බුදුකයක් මැවී යම්මහ පෙළහර දක්වා නැවත කරඬුවට වැඩියෝය; රජතෙම ධාතුගෙණගොස් ධාතු ගර්භයෙහි පණවණලද සත්රුවන් මහාසනයට වඩා "ශ්‍රී නිවන් මඤ්චකයෙහි වැදහොත් ලීලාවෙන් වැඩහෝනාසේක්වා" යි ආරාධනාකෙළේය; ඉක්බිති පිරිනිවන් මඤ්චකයෙහි වැඩහොත් ලීලාවෙන් බුදුකයක් මවා සැනපුණුසේක; එහෙයින් ලොකයෙහි සඤ්ඤාමාලී නම් මේ මහසෑයට සමාන කළැකි

P-2014/01/23

චෛත්‍යයක් නැත්තේයයි දනයුතුයි. ඉතුරුවූ ද්‍රෝණ අෂ්ට පමණවූ ධාතූන් අජාසත් රජුවිසින් නිදන්කොට කරවනලද මහානිධාන ගර්භය ධර්මාශොක රජු විසින් බිඳපියා ධාතුගෙණ දඹදිව සුවාසූදහසක් චෛත්‍යයන්හි නිදන්කොට දැගැප්කරවන ලදී. සතර දළදූවන් අතුරෙන් එක්දළදූවක් ධාතුබෙදීමේදීම ලඞ්කාවට ලැබී **ඡේරුවාවිල** චෛත්‍යයෙහි **සොමවතිනම්** බිසව විසින් නිදන්කොට චෛත්‍යකරවී, එකක් නාලොවට හා එකක් දෙව්ලොවට අයිතිවිය; ඉන් මැතභාගයෙහි **අනුරාධපුර** නුවර **කිත්තිශ්‍රීමෙඝවණ්ණරජුදවස දන්තකුමාරයා** සහ **හෙමමාලා**නම් කුමරියන් විසින් ගෙණඑනලද **ගඞ්ගාරම** දළදූව මේ දක්වා **සෙංකඩගලනුවර** * මහාප්‍රාසාදයෙහි වැඩහිඳිනේය. මෙසේ ලඞ්කාවිපය ඕසදිටු යුරොපීයයන්ට අත්පත්වනතුරු නොයෙක් සියගණන් සිංහල රජුන් විසින් ගණනපථාතික්‍රාන්ත චෛත්‍ය ප්‍රතිමාගාරවිහාරාරාමාදියකොට බුඞ්ධශාසනය බබලවනලදී; එසේම ත්‍රිපිටකය මෙහිදී පුස්කාරූඪ කොට මහරහතුන් විසින් සිංහල අටුවා ලියනලදී; ඒ අටුවා **බුඞ්ධඝොෂාචාර්‍යයන්** විසින් මාගධිභාෂාවෙන් නැවත ලියනලදී; ඉක්බිති ත්‍රිපිටකයට අයත්වූ ටීකානුටීකා **ප්‍රකරණ** සඞ්ග්‍රහාදි සියගණන් ග්‍රන්ථයනුත් මේ විෂයෙහිම තෙවළාදත් උතුම් පණ්ඩිතයන් විසින් ලියනලද බැවින් **ලංකාවිපය බුඞ්ධාගම නමැති කෙඟරීතෙලය ඔහාතුබූ සඞ්ඝාරාමය චඤ්චාඔක් වැනිය**"යි දනයුතුයි.



* දැනට මහනුවර යන නාමින් ප්‍රසිද්ධයි.